# වාර්ෂික වාර්තාව
# 2018





ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# දැක්ම

## "සේද මාවතේ විශිෂ්ටතම සමුද්‍රීය සේවා සැපයුම්කරු බවට පත්වීම"

ශ්‍රී ලංකාවේ වරායයන්හි අනාගතය කෙරෙහි අවධානය යොමු කරමින්, අභියෝග මෙන්ම අවස්ථාවන් රාශියකට මග සලසන ජාත්‍යන්තර වෙළඳාමේ උත්පාතය අපේක්ෂා කරමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි විශිෂ්ටතම, බහළු කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ අදහසේ සිට ගෝලීය වශයෙන් සේවා සැපයුම්හි විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය දක්වා වර්ධනය වෙමින් සිටී. ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීමෙහිලා, ජාතික හා අන්තර්ජාතික වශයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග සෑම අංශයකින්ම පවත්වාගෙන යාම සඳහා, සියළු තොරතුරු ක්ෂණිකව ලබාගැනීමේ සේවා සැපයුම ක්‍රමවත් ප්‍රවාහයක් ලෙස ශක්තිමත් කිරීමටද ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කර සිටී.

# මෙහෙවර

## "තිරසර පරිසරයක් තුළ ජාත්‍යන්තර මට්ටමේ සමුද්‍රීය සේවාවන් සැපයීම"

ශ්‍රී ලංකාව තුළ ගෝලීය සැපයුම් කේන්ද්‍රීය වරායක් නිර්මාණය කිරීමේ අදහසින්, විශිෂ්ට සමුද්‍රීය ප්‍රවේශයකින් යුත් ගැඹුරු මුහුදක් සහිත වරායක් ඉදි කරමින්, සේවා සැපයුම් ක්‍රියාවලි සමුදායක් ඒකාබද්ධ කරන බහුමානික සැපයුම් පද්ධතියක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කරයි.

වරාය සහ කලාපය යන අංශ දෙකෙහිම සංඛ්‍යාත්මක සීග්‍ර වර්ධනයක් අපේක්ෂා කරමින්, අනාගත ව්‍යාප්තිය සඳහා, විභව්‍යතාව හා වපසරියක් සහිත, නාගරික සීමා මායිම් වලින් විනිර්මුක්ත නවීනතම වරායක් ලෙස වරාය, නාවික, කාර්මික හා සේවා සැපයුම් යන සියළු අංශයන්හි දැවැන්තයින් හට සේවා සැපයීම සඳහා අවශ්‍ය වේදිකාව නිර්මාණය කිරීමට හා කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කරමින් සිටී.

ජාතියට මහඟු සම්පතක් වෙමින්, වරායයන්හි සහ පර්යන්තයන්හි පහසුකම් අතින් අංග සම්පූර්ණ, ආර්ථික වශයෙන් කාර්යක්ෂම හා මනා පරිසරයකින් යුතු වරායක් ලෙස මෙහෙයුම් සිදුකිරීම තුළින්, අප විසින් සේවය සලසන දහස් ගණනක් වූ පරදු භාරකරුවන් වෙත උසස් මට්ටමේ සේවාවක් ලබාදෙමින්, වරාය අධිකාරිය විසින් ප්‍රතිඥා දී ඇති ගුණාත්මකභාවය තවදුරටත් රැකගනිමින් ඉදිරියට ගෙන යනු ඇත.

# පටුන


| | |
|---|---|
| අභිලාෂයන් | **3** |
| සාමූහික අරමුණු | 4 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය යනු | 5 |
| මෙහෙයුම් වැදගත් තොරතුරු | 6 |
| මූල්‍ය වැදගත් තොරතුරු | 9 |
| අපේ අමාත්‍යවරයා | 10 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 11 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 13 |
| කළමනාකාරීත්ව සහ විගණන කමිටුව | 18 |
| ව්‍යාපාර සංවර්ධන | 20 |
| වැදගත් සංධිස්ථාන | 22 |
| මෙහෙයුම් සමාලෝචනය | 28 |
| මූල්‍ය සමාලෝචනය | 76 |
| මානව ප්‍රාග්ධනය | 80 |
| ආයතනික සමාජ වගකීම් | 81 |
| ආයතනික පාලන වාර්තාව | 82 |
| වරාය සංඛ්‍යාලේඛන | 87 |
| මූල්‍ය ප්‍රකාශනයන් | 92 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 93 |
| මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 95 |
| විගණන කමිටු වාර්තාව | 96 |
| ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය | 97 |
| වැදගත් මෙහෙයුම් කරුණු | 98 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 99 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 100 |
| ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය | 101 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 102 |
| පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති | 103 |
| මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන් | 116 |
| ප්‍රස්ථාරික සමාලෝචනය | 138 |
| විගණකාධිපති වාර්තාව | 140 |
| ආයතනික තොරතුරු | 146 |

## 2020 වනවිට . . . .

- විශිෂ්ට සමුද්‍රීය සේවා සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත්වීම.
- ටොන් මිලියන 200ක නැව් භාණ්ඩ මෙහෙයවීමේ ඉලක්කය සපුරා ගැනීම.
- ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන එකක ආදායමක් ඉපැයීම.
- ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 10 ක ආයෝජනයන් අත්කර ගැනීම. (වරායන් අතර)
- ජාතික ආර්ථිකයේ ප්‍රධාන පෙළේ දායකයෙකු බවට පත්වීම.
- පරිසර හිතකාමී හරිත වරාය මෙහෙයුම්කරුවෙකු බවට පත්වීම.

### උපාය මාර්ග

- කොළඹ නගරයේ යටිතල පහසුකම් සහ සුපිරි ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීම.
- සමුද්‍රීය විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය ලෙස කොළඹ වරායේ ශ්‍රේණිගත කිරීම තහවුරු කිරීම.
- වරාය ක්ෂේත්‍රයට විශේෂිත වූ අළෙවිකරණ සහ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම.
- මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ජාත්‍යන්තර සේවාවන් සපයන කාර්මික හා බහළු මෙහෙයුම් වරායක් ලෙස  සංවර්ධනය කිරීම.
- නැව් භාණ්ඩවල සහ වරාය භාවිතා කරන්නන්ගේ  සුරක්ෂිතභාවය හා ආරක්ෂාව වැඩි කිරීම.
- උපායමාර්ගික මධ්‍යස්ථාන වලදී අපගේ ගෝලීය නියෝජනය සනිටුහන් කිරීම.
- ආයතනික පරිපාලනමය ක්‍රියාපටිපාටි ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රති සැලසුම් කිරීම.
- උසස් මූල්‍ය කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- පරිසරයට මුදාහැරෙන කාබන් ප්‍රමාණය අඩු කිරීම.
- ස්වකීය ශක්තියේ සහ තරඟකාරීත්වයේ වාසිදායක තත්ත්වයන් අනුව අනෙකුත් ප්‍රාදේශීය වරායන් සංවර්ධනය කිරීම.
- ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම.
- තෙල් සහ වායු සැපයුම්  සඳහා පහසුකම් සැලසීම.
- නෞකා ඉලක්ක කරගත් කාර්යක්ෂම සේවාවන් සැපයීම.
- සංස්ථාපිත සමාජ වගකීම්හි අවධානය වැඩි කිරීම.

- ශ්‍රී ලංකාවේ වාණිජ වරායයන් තුළ අති නවීන මෙහෙයුම් පහසුකම් සංවර්ධනය කිරීම හා අඛණ්ඩව පවත්වාගන යාම.

- ඵලදායී සහ කාර්යක්ෂම අයුරින් වරාය සේවාවන් පවත්වාගෙන යාම.

- පිරිවැය ඵලදායී, කාර්යක්ෂම සහ විශ්වාසදායි සේවාවන් සැලසීම තුළින් ආනයන සහ අපනයනකරුවන්ට තරඟකාරීමය වශයෙන් වඩා වාසිදායක තත්ත්වයක් උදාකර දීම.

- නැව්, නැව්බඩු, වරාය සේවාලාභීන් සහ වරාය යටිතල පහසුකම්වල ආරක්‍ෂාව හා සුරක්ෂිතභාවය සහතික කිරීම.

- සියළුම පාර්ශ්වකරුවන් සඳහා හිතකාමී කාර්යය හා සේවා පරිසරයක් සැලසීම.

- රජයේ ජංගම හා ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට දායකවීම.

- නෞකා මෙහෙයුම් වේගවත් කිරීම පිණිස ඵලදායී ප්‍රමිතීන් උසස් මට්ටමින් පවත්වාගන යාම.

- වැඩි රැකියා අවස්ථාවන් උත්පාදනය කරමින් සමුද්‍රීය කටයුතු හා සම්බන්ධ උපයෝගී සේවාවන් වැඩිදියුණු කිරීම.

- උසස් මට්ටමේ පාරිභෝගික සේවා සැලසීම මගින් කාර්යක්ෂම හා විශ්වාසවන්ත වරාය මෙහෙයුම්කරුවෙකු වශයෙන් වාණිජ වාරායයන් තුල ලාභ උපදවන මෙහෙයුම් පවත්වාගෙන යාම හා මනා කීර්තියක් ගොඩනැගීම.

- නැවෙන් නැවට අන්තරාල වෙළඳාම්, බෑදුම්කර කටයුතු හා නැව්වලට අවශ්‍ය වන ආම්පන්න සැපයීම ඇතුළු ප්‍රතිනැව්ගත කිරීමේ අවස්ථාවන් ආකර්ෂණය කිරීම පිණිස බහුළු මෙහෙයුම් සම්බන්ධයෙන් තරඟකාරී හා උසස් මට්ටමේ සේවාවන් සැලසීම සඳහා වරාය ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම.

- සමුද්‍රාසන්න ප්‍රදේශයන්හී සංවර්ධනයේ ගාමක බලය ලෙස ක්‍රියාත්මක වීම පිණිස අවශ්‍ය කරන වරාය පහසුකම් සැලසීම තුළින් ශ්‍රී ලංකාව තුළ කලාපීය සංවර්ධනය උදෙසා දායකවීම.

- අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම හා මිනිස් බල අවශ්‍යතාවයන් තක්සේරු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලනමය හා සංවිධානමය කාර්යයන් පුළුල් කිරීම. විදේශ රැකියා මගින් රටෙහි ආර්ථිකයට සැලසෙන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය හට වැටුප් රහිත නිවාඩු මත විදේශ රැකියා සඳහා යොමුකිරීමේ පිළිවෙත නැවත වරක් ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීම හා මෙමගින් නිර්මාණය වන අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස මහපොළ අභ්‍යාස ආයතනය විසින් කාර්ය මණ්ඩලය තවදුරටත් පුහුණු කිරීම හා නැවත පුහුණු කිරීම.

- මුහුදේ දී සිදුකරනු ලබන සේවාවන්, නෞකා සඳහා තෙල් සැපයීමේ කටයුතු, මිරිදිය සැපයුම් හා බහළුම් අළුත්වැඩියා ආදිය වරාය විෂය ක්ෂේත්‍රයට අදාළ කටයුතු වලට ප්‍රභේද කිරිම.

- උපරිම බදු කාර්යක්ෂමතාවයෙන් යුතු කළමනාකරණයක් පදනම් වූ මූලා ප්‍රතිසංස්කරණ වලදී වඩා හොඳ කාර්ය කළමනාකරණයක් හා දැඩි පිරිවැය පාලනයක් ක්‍රියාත්මක කිරීම.

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් 1979 අගෝස්තු 01 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලද අතර 1984 අංක 7 සහ 35 දරණ පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත.

- නැව් භාණ්ඩ වාහක, නැව්ගත කිරීම් සහ ප්‍රතිනැව්ගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම්, වාප්පු කටයුතු, නෞකා වලට ජලය, ඉන්ධන සහ විදුලිය සැපයීම, නෞකා වලට හා නෞකා වලින් ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ ලිහිසි තෙල් මෙහෙයුම් කිරීම බන්කර් සහ ඉන්ධන ගබඩා අතර කාර්යයන්, නියමු කටයුතු සහ නෞකා බැඳතැබීමේ කටයුතු, කිමිදුම් සහ නෞකා දිය යටදී අළුත්වැඩියා කිරීම හා එවැනි වෙනත් අනුශාංගික වූ ඕනෑම කාර්යයක් සඳහා කාර්යක්ෂම හා විධිමත් සේවා සැපයීම.
- සැසඳුම් හා ආරක්ෂක සේවා කාර්යක්ෂමව හා නිත්‍ය ලෙස සැපයීම.
- වරාය සීමාව තුළ හා වරාය ප්‍රවේශ මාර්ගයන්හි නැව් ගමනාගමනය විධිමත් කිරීම හා පාලනය කිරීම.
- වරාය ගොඩනැගිලි නඩත්තු කිරීම හා ඒවා හි භාවිතය ප්‍රවර්ධනය කිරීම, වරායයන් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම.
- කිසියම් නියමිත වරායක් තුළ රේගු දෙපාර්තමේන්තුවට අදාල කාර්යයන් හැර අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම.
- ඒ ඒ වරායන් තුළට හා ඉන් පිටතට යාත්‍රාකිරීම සඳහා නෞකාවලට මඟ පෙන්වීම හා ආරක්ෂාව සැපයීම සඳහා අවශ්‍ය ප්‍රදීපාගාර හා වෙනත් මාධ්‍යයන් ශ්‍රී ලංකා වෙරළෙහි හා ඉන් ඔබ්බෙහි ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.
- වරාය අධිකාරිය පනත මගින් පනවනු ලබන වෙනත් ඒ හා සමාන කාර්යයන් ඉටුකිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම් ප්‍රතිසම්පාදනය කිරීමටත්, නව ආයෝජන වල යෙදවීමටත්, අධිකාරියේ වියදමට නොඅඩු ආදායමක් ලැබෙන පරිදි වරාය අධිකාරිය පනතේ විධිවිධාන වලට අනුකූලව අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් සුදුසු පරිදි ගාස්තු අයකර ඒවා අධිකාරියේ ආදායමට බැර කර ප්‍රමාණවත් පොදු මූල්‍ය සංචිතයක් ඇති කර පවත්වාගෙන යාමට හැකිවන ආකාරයෙන් වරාය අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සහ;
- වරාය අධිකාරිය පනතෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සියළු විශේෂිත වරායන් බාහිර ආධාර අපේක්ෂාවෙන් තොරව, ඒ ඒ වරාය විසින්ම ස්වකීය ව්‍යවසාය ලෙස පවත්වාගෙන යාමට ප්‍රයන්ත දැරීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව, වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපතිවරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර එහි සමස්ත පරිපාලනය ඔහු භාරයේ පවතී.

**නෞකා පැමිණීම (සියළුම වරායයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 4,329 | 4,331 | 0.0 |
| ගාල්ල වරාය | 87 | 84 | -3.4 |
| ත්‍රිකුණාමල වරාය | 233 | 189 | -18.9 |
| කන්කසන්තුරය, මයිලිඩ්ඩි, පේදුරුතුඩුව හා කරෙයිනගර් | 63 | 59 | -6.3 |
| හම්බන්තොට වරාය | 230 | 270 | 17.4 |
| **එකතුව** | **4,942** | **4,933** | **-0.2** |

**කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය (විස්සේ සම ඒකක)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA)** | | | |
| ආනයන | 208,948 | 174,671 | -16.4 |
| අපනයන | 179,334 | 154,142 | -14.0 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,609,114 | 1,965,987 | 22.2 |
| තැන් මාරු මෙහෙයුම් | 13,306 | 9,734 | -26.8 |
| **එකතුව** | **2,010,702** | **2,304,534** | **14.6** |
| **සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT)** | | | |
| ආනයන | 179,321 | 190,018 | 6.0 |
| අපනයන | 196,623 | 189.921 | -3.4 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,406,265 | 1,644,336 | 16.9 |
| තැන් මාරු මෙහෙයුම් | 27,626 | 42,483 | 53.8 |
| **එකතුව** | **1,809,835** | **2,066,758** | **14.2** |
| **කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT)** | | | |
| ආනයන | 300,903 | 303,713 | 0.9 |
| අපනයන | 318,422 | 330,784 | 3.9 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,726,203 | 1,992,035 | 15.4 |
| තැන් මාරු මෙහෙයුම් | 43,003 | 49,662 | 15.5 |
| **එකතුව** | **2,388,531** | **2,676,194** | **12.0** |
| **කොළඹ වරාය** | | | |
| ආනයන | 689,172 | 668,402 | -3.0 |
| අපනයන | 694,379 | 674,847 | -2.8 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 4,741,582 | 5,602,358 | 18.2 |
| තැන් මාරු මෙහෙයුම් | 83,935 | 101,879 | 21.4 |
| **එකතුව** | **6,209,068** | **7,047,486** | **13.5** |

**නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (සියළුම වරායයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස(%) |
|---|---|---|---|
| සමස්ත නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (මෙ.ටො. මි.) | 93.9 | 105.0 | 11.8 |

**කොළඹ වරායේ නැව්බඩු ගොඩබෑම - ශ්‍රී.ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 14,167 | 15,533 | 9.6 |
| තොග කඩන | 814 | 679 | -16.6 |
| වියළි තොග | 2,501 | 2,826 | 13.0 |
| දියර තොග | 5,759 | 5,929 | 3.0 |
| **එකතුව** | **23,241** | **24,967** | **7.4** |

**කොළඹ වරායේ නැව්බඩු පැටවුම් - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 11,625 | 13,547 | 16.5 |
| තොග කඩන | 29 | 13 | -55.2 |
| වියළි තොග | 0 | 0 | - |
| දියර තොග | 106 | 690 | 550.9 |
| **එකතුව** | **11,760** | **14,250** | **21.2** |

**කොළඹ වරායෙන් මෙහෙයවූ සමස්ත නැව්බඩු ප්‍රමාණය - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස(%) |
|---|---|---|---|
| බහළුගත | 25,792 | 29,080 | 12.7 |
| තොග කඩන | 843 | 692 | -17.9 |
| වියළි තොග | 2,501 | 2,825 | 13.0 |
| දියර තොග | 5,865 | 6,619 | 12.9 |
| **එකතුව** | **35,001** | **39,216** | **12.0** |

**ත්‍රිකුණාමලය වරායෙන් මෙහෙයවූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 3,119 | 2,951 | -5.4 |
| පැටවීම් | 778 | 609 | -21.7 |
| **එකතුව** | **3,897** | **3,560** | **-8.6** |

**ගාල්ල වරායෙන් මෙහෙය වූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 712 | 729 | 2.4 |
| පැටවීම් | 0 | 0 | - |
| **එකතුව** | **712** | **729** | **2.4** |

**කන්කසන්තුරය,මයිලිඩ්ඩි,පේදුරුතුඩුව හා කරෙයිනගර් වරායයන් මගින් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 23 | 18 | -21.7 |
| පැටවීම් | 0 | 0 | - |
| **එකතුව** | **23** | **18** | **-21.7** |

**හම්බන්තොට වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - ( ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 156 | 344 | 120.5 |
| පැටවීම් | 57 | 150 | 163.2 |
| **එකතුව** | **213** | **494** | **131.9** |

**සමස්ත සේවක සංඛ්‍යාව**

| විස්තරය | 2017 | 2018 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 8,625 | 8,948 | 3.7 |
| ත්‍රිකුණාමල වරාය | 401 | 400 | -0.2 |
| ගාල්ල වරාය | 351 | 362 | 3.1 |
| **එකතුව** | **9,377** | **9,710** | **3.6** |

**සියළුම වරායයන්** (රු. මිලියන)

| **විස්තරය** | **★ 2017** | **2018** | **වෙනස (%)** |
|---|---|---|---|
| **ආදායම සහ වියදම** | | | |
| සමස්ත ආදායම | 43,963.0 | 52,282.9 | 18.9 |
| වියදම | (27,967.7) | (30,013.4) | (7.3) |
| **බදු, විදේශ ණය මත පොලී සහ විදේශ විනිමය ලැබීම්/(පාඩු) වලට පෙර ලාභ/(පාඩු)** | **15,995.3** | **22,269.5** | **39.2** |
| විදේශ ණය මත පොලිය | (1,808.1) | (2,256.6) | (24.8) |
| විදේශ විනිමය (ලැබීම්/(පාඩු) | (2,193.7) | (11,316.8) | (415.9) |
| **බදු වලට පෙර සහ විදේශ විනිමය ලැබීම්/(පාඩු) වලට පසු ලාභ/(පාඩු)** | **11,993.5** | **8,696.1** | **(27.5)** |
| **බදු** | | | |
| ආදායම් බදු | - | - | - |
| උපකල්පිත ලාභාංශ බදු | - | - | - |
| විලම්භිත බදු | 102.0 | (4,448.9) | **(4,461.3)** |
| සමාජ වගකීම් බදු | - | - | - |
| **බදු සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු ශුද්ධ ලාභ/(පාඩු)** | **12,095.5** | **4,247.2** | **(64.9)** |
| **ශේෂ පත්‍රය** | | | |
| ජංගම නොවන වත්කම් | 388,451.8 | 383,737.3 | (1.2) |
| ජංගම වත්කම් | 144,978.5 | 57,639.5 | (60.2) |
| ජංගම වගකීම් | 119,212.1 | 17,519.2 | 85.3 |
| ස්කන්ධ සහ වෙනත් ප්‍රාග්ධන | 7,591.4 | 7,591.4 | 0.0 |
| සංචිත හා ප්‍රතිපාදන | 302,654.8 | 302,629.6 | (0.0) |
| ජංගම නොවන වගකීම් | 103,972.1 | 113,636.6 | (9.3) |
| **අනුපාත** | | | |
| ආදායමට මෙහෙයුම් මගින් ලාභ | 34.0 | 40.0 | |
| වාර්ෂික ආදායම් වර්ධනය | 4.3 | 18.9 | |
| ප්‍රාග්ධන යෙදවුම් මත ආදායම | 1.9 | 2.6 | |

★ සසඳා බැලීමේ අවශ්‍යතාවයන් සඳහා 2017 තත්‍ය අගයන්ගෙන් හම්බන්තොට වරාය ඉවත් කර ඇත.

## සාගල රත්නායක
## ගරු වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය

**විග්‍රහය**

සුවිශේෂී ජයග්‍රහණ රාශියක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටට පත්වෙමි. ප්‍රතිඅපනයන කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ස්වකීය තත්ත්වය ශක්තිමත් කරගනිමින් 2018 වර්ෂයේ ඩ්රුවරි සමුද්‍රීය පර්යේෂණයේ ගෝලීය බහළුම් සම්බන්ධිත ශක්‍යතා ශ්‍රේණිගත කිරීමේ දර්ශකයෙහි (Global Container Connectivity Index of Drewry Maritime Research) 11 වැනි ස්ථානය දක්වා ඉදිරියට පැමිණීමට කොළඹ වරාය සමත්වී ඇත. වාර්ෂික බහළු මෙහෙයුම් ධාරිතාවයට අවධානය යොමු කිරීමේදී කොළඹ වරාය ප්‍රථමවතාවට විස්සේ සම ඒකක බහළු (TEUs) මිලියන 07 ක් මෙහෙයුම් කරමින් ගෝලීය ශ්‍රේණිගත කිරීමේ 22 වැනි ස්ථානය දක්වා ඉදිරියට පැමිණි අතර ජාත්‍යන්තර ඇල්ෆාලයිනර් මිනුම් වාර්තාවල වර්ධන අනුපාතයට අනුව කොළඹ වරාය පළමුවන ස්ථානයෙහි ශ්‍රේණිගත කරන ලදී. කලාපීය සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් ලෙස වරායේ කාර්යභාරය ඉටුවන බව සහතික කිරීමට මෙම ජයග්‍රහණ සුවිශේෂී වූ සන්ධිස්ථාන බව සඳහන් කල යුතුව ඇත.

**මූල්‍ය කාර්යසාධනය**

2017 වර්ෂයේ වාර්තා වූ රුපියල් බිලියන 15 ක ලාභය හා සැසඳීමේදී, 2018 වර්ෂයේදී රුපියල් බිලියන 22 ක මෙහෙයුම් ලාභයක් වාර්තා විය. 2017 වර්ෂයේ දළ ආදායම වූ රුපියල් බිලියන 44 සමඟ සැසඳිමේදී රුපියල් බිලියන 08 ක වැඩිවීමක් සහිතව, රුපියල් බිලියන 52 ක දළ ආදායමක් ඉපැයීමට 2018 වර්ෂයේදී හැකි විය. 2018 වර්ෂයේ දී බදු, විදේශ ණය මත පොලිය සහ විදේශ විනිමය ලැබීම්/පාඩු වලට පෙර මුළු වියදම රුපියල් බිලියන 30 ක් වූ අතර, 2017 වර්ෂයේ දී එය රුපියල් බිලියන 28 ක් විය. එය 2018 වර්ෂයේ දී 7% ක වැඩි වීමකි. 2018 වර්ෂයේදී විදේශ ණය මත පොලිය 24.8% කින් ඉහළ යන ලදී. 2017 වර්ෂයේදී විදේශ විනිමය උච්චාවචනය (පාඩුව) රුපියල් බිලියන 02 හා සැසඳීමේදී 2018 වර්ෂයේදී එය රුපියල් බිලියන 11 ක් විය. බදු සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව පවතින රුපියල් බිලියන 4.2 ක වර්ෂ අවසාන ශුද්ධ ලාභයට මෙමගින් සැලකිය යුතු බලපෑමක් එල්ල විය.

**වරාය මෙහෙයුම් සහ සේවා සැපයුම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමාගම සහ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම විසින් වරාය මෙහෙයුම් සම්බන්ධයෙන් ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සහ පොදු කාර්යය ව්‍යූහ පහසුකම් සංවර්ධන මගින් හිමිකරගත් ප්‍රතිලාභ ඉදිරියටද පවත්වාගෙන යාමට අපේක්‍ෂා කරනු ලැබේ. නිමාවූ වර්ෂය තුළදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පර්යන්ත සේවා ගිවිසුම් 5 කට එළැඹි අතර ප්‍රධාන නෞකා සේවාවන් 04 ක් සහ එක් පෝෂක නෞකා සේවාවක් ආකර්ෂණය කර ගැනීමට සමත්විය. මේ සමඟම ඉහළ කාර්යක්‍ෂමතාවයකින් යුතුව මෙහෙයුම් කටයුතු සිදු කිරීමත් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්තයන්හි බහළු මෙහෙයුම් ධාරිතාවය වර්ධනය වීමට දායකත්වය සපයන ලදී. වෙළඳ කටයුතු පහසු කරවීම සඳහා විද්‍යුත් මාධ්‍යයෙන් ලේඛනගත කිරීමේ පහසුකම් සලසා ඇති අතර CFS – I ගුදමේ නියමු ව්‍යාපෘතියක් ලෙස ගුදම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.

**ජාතික වරාය ප්‍රධාන සැලැස්ම**

ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය හා අනුබලය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම අවසන් කරන ලදී. මෙමඟින් ත්‍රිකුණාමල, ගාල්ල සහ කොළඹ යන වරායයන්හි සංවර්ධන කටයුතු වල ඉදිරි අදියරයන් ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කරනු ලැබේ. ඉදිරියේදී දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් තුළ ගාලු වරාය සංචාරක කර්මාන්තය හා සම්බන්ධ අතිරේක පහසුකම් හා පොදු කාර්යය සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කරනු ඇත. ත්‍රිකුණාමලයෙහි සංවර්ධනය කිරීම සඳහා බලශක්තිය, කර්මාන්ත සහ සංචාරක ව්‍යාපාරය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් ඇත. මෙම කටයුතු ක්‍රියාත්මක කිරීමේ අනුපිළිවෙල ඉදිරි මාසවලදී

හෙළිදැක්වෙනු ඇත. නැංගුරම්පළ/ ධාරිතාවය පුළුල් කිරීම, අධිවේගී මාර්ග ජාලය සමඟ වඩා හොඳින් හා කඩිනමින් සම්බන්ධවීම පිළිබඳව හා නැව්බඩු පරිමාව ඉහළ නැංවිය හැකි වියළි වරාය සේවා සැපයුම් කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ඇති කිරීම හා ප්‍රධාන නැව් සේවා සමාගම් වල සහ සැපයුම් සේවා මෙහෙයුම්කරුවන් වෙත කොළඹ වරායේ ආකර්ෂණීයත්වය වැඩි දියුණු කිරීම පිළිබඳව අවධානය යොමු කරනු ඇත.

**නැගෙනහිර බහළු පර්යන්තය - කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය**

සංවර්ධනය කිරීමේ හැකියාව සලකා බැලීමේදී මෙහෙයුම් ධාරිතාවය වර්ධනය කිරීම තීරණාත්මක සාධකයක් වේ. බහළු විස්සේ සම ඒකක මිලියන 2.4 ක වාර්ෂික ධාරිතාවයක් සහිතව, මීටර් 1350 ක දිගින් යුත් ජැටි බැම්මක් සහ ද්‍රෝණිය මීටර් 18 ක ගැඹුරින් යුතුව දකුණු වරායේ ගැඹුරින් වැඩි දෙවන බහළු පර්යන්තය ලෙස නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කෙරනු ඇත. මෙම පර්යන්තය මෙහෙයුම් කිරීමේ ඊළඟ පියවර වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් ජැටියේ මීටර් 440 ක්, යාබද අංගණ ප්‍රදේශය සහ නැගෙනහිර බහළු පර්යන්තයට සම්බන්ධිත පහසුකම් සංවර්ධනය කර ඇත.

**වරාය තුළ ප්‍රවේශ පහසුකම් වැඩිකිරීම**

දකුණු වරාය සංවර්ධනයට සමගාමීව වරාය පරිශ්‍රය තුළ ඇතිවේයැයි අපේක්ෂා කරන වාහන තදබදයට මුහුණ දීම සඳහා ඉඟුරුකඩේ මංසන්ධියේ සිට ගේට්ටු අංක 01 දක්වා ඇති මංතීරු 04 රේ අභ්‍යන්තර වරාය මාර්ගය මංතීරු 06 ක් දක්වා පුළුල් කල යුතුව ඇත. මෙම මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතියත් සමඟ කොළඹ කොටුව ප්‍රදේශයේ පවතින පාලම් 02 සහ වරාය ප්‍රවේශ මාර්ගයේ බ්ලූමැන්ඩල් මාර්ගය හරහා පවත්නා පාලම ද පුළුල් කල යුතුව ඇත. අභ්‍යන්තර වරාය මාර්ගය පුළුල් කිරීමේ කටයුතු අදියරෙන් අදියර සිදු කර ඇත. 2018 වර්ෂය තුළදී, රුපියල් මිලියන 81.79 ක වැඩ කටයුතු (මූල්‍ය ප්‍රගතිය) අවසන් කරන ලදී. 2018 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 847.89 කි.

**සමාප්තිය**

කාලෝචිත ක්‍රියාමාර්ග, ව්‍යාපාර සංවර්ධනය සහ උපරිම කාර්යක්ෂමතාවය තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපාර වර්ධනයක් අත්පත් කර ගෙන ඇත. යහපත් මූල්‍ය කාර්යසාධනය හා ලාභදායීතාවය මෙම පියවරයන්හි ප්‍රතිඵලය වී ඇත. මහජනතාව, යටිතල පහසුකම් සහ තාක්ෂණය යන කරුණු මත සිදු කරන අඛණ්ඩ ආයෝජනයන් සමඟ මෙම වර්ධනය ඉදිරියටම පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සූදානමින් සිටින බව මම විශ්වාස කරමි.

ගරු වරාය හා නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශ නිලධාරීන්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගමෙහි සහ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් සමාගම්හි සේවකයන්, අපගේ සේවාදායකයන් සහ සියළුම පරදු භාරකරුවන් විසින් ලබාදුන් දිරිගැන්වීම සහ සහයෝගය පිළිබඳව මම ස්තූතිය පල කර සිටිමි. අපගේ පරදු භාරකරුවන් සහ සමස්ත වරාය ප්‍රජාව සමඟ සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම මගින් ජාතික ආර්ථිකය වෙත තවදුරටත් දායකවීමට අප හට හැකියාව ලැබෙනු ඇත.



**කාවන් රත්නායක**
**සභාපති**

**ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා**
**සභාපති**

නාවික ආර්ථික විශේෂඥයකු වන ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා 2017 ජූනි 01 වෙනි දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබීය.

2002 වර්ෂයේ ජනවාරි මාසයේ සිට 2004 දක්වා කාල සීමාව තුළ ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිත්වය දැරීය. එංගලන්තයේ Dun & Bradstreet සමාගම විසින් ලැයිස්තුගත කරන ලද රාජ්‍ය ආයතන සහ පෞද්ගලික සමාගම් අතුරින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශ්‍රී ලංකාවේ වඩාත්ම ලාභදායී ආයතනය ලෙස ශ්‍රේණිගත කරන ලද්දේ සිය නිල කාලය තුළදීය.

1911 වර්ෂයේදී ආරම්භ කර 1913 වර්ෂයේදී රාජකීය සන්නස් පත්‍රය පිරිනමනු ලැබූ එක්සත් රාජධානියේ වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ, බ්‍රිතාන්‍ය ජාතිකයකු නොවන එකම අන්තර්ජාතික සභාපතිවරයා ලෙස මෑතකදී ඔහු පත් කරනු ලැබීය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා ලෙස පත්වීමට පෙර ඔහු "එයිට්කන් ස්පෙන්ස් මැරිටයිම්, පෝට්ස් ඇන්ඩ් ලොජිස්ටික්ස්" (Aitken Spence Maritime, Ports and Logistics) සමාගම් සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී ලෙස හා එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී සමාගම් හි (Aitken Spence PLC) ප්‍රධාන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත. වරාය කළමනාකරණය සඳහා විදේශීය සබඳතා ඇති කළ පළමු ශ්‍රී ලාංකීක සමාගම ලෙස හා විදේශීය වරායන් සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් ඇති කර ගත් පළමු ශ්‍රී ලාංකීය සමාගම ලෙසද Aitken Spence Ports International සමාගමට සිය නායකත්වය ලබා දෙන ලදී.

දිසානායක මහතා ක්ෂේත්‍රයට අදාළව දරා ඇති ප්‍රධාන තනතුරු අතර, සේවා සැපයුම් හා ප්‍රවාහන කටයුතු පිළිබඳ වූ වරලත් ආයතනයේ (ශ්‍රී ලංකා) සභාපතිත්වය, නැව් තැරැව්කරුවන්ගේ වරලත් ආයතනයේ (ශ්‍රී ලංකා) සභාපතිත්වය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උපදේශක සභාවේ සභාපතිත්වය, වරාය, ගුවන් හා සේවා පහසුකම් පිළිබඳ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයෙහි සභාපතිත්වය යන මේවා ද ඇතුලත් වේ.

සාමාන්‍ය කළමනාකරණය (General Management) සහ අළෙවි කළමනාකරණය (Marketing Management) පිළිබඳව ඔහු සතු විවිධ අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව, නාවික ක්ෂේත්‍රයේ ඉහළම වරලත් සුදුසුකම වන එක්සත් රාජධානියේ FICS, සේවා සැපයුම්/ ප්‍රවාහනය පිළිබඳ එක්සත් රාජධානියේ FCILT සහ අළෙවිකරණ පිළිබඳ එක්සත් රාජධානියේ FCIM සුදුසුකම් ඔහු සතුව ඇති අතර නෝර්වේ රාජ්‍යයේ නාවික විද්‍යායතනය (Norwegian Shipping Academy) (OSLO) වෙතින් උපාධියක්ද ලබා ඇත.

දිසානායක මහතා, එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ වාණිජ විද්‍යාර්ථයෙකු වන අතරම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ද ආදි විද්‍යාර්ථයකු වන්නේය. තවද ඔහු නොරාඩ් සහ ජයිකා (JICA) හා ඇමෙරිකා එක්සත් ජනපදයේ හාවඩ් Business School හි සාමාජිකත්වයද ලබා ඇත.

**පී ජී දසනායක**
**උප සභාපති**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපතිවරයා වන පී ජී දසනායක මහතා **CICT, SAGT** හා **JCT** හි අධ්‍යක්ෂ මණ්ඩල වල සාමාජිකයකු වශයෙන්ද කටයුතු කරයි.

ඔහු සතු වැව්ලි ක්ෂේත්‍රයේ ව්‍යාකූල දැනුමක් හා පළපුරුද්දක් ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය වැනි රාජ්‍ය වැව්ලි අංශය ආයතනයන්හි උසස් තනතුරු රාශියක් හොබවා ඇත. තවද, වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කිරීම තුළින් සිය දැනුම සහ පළපුරුද්ද ඉහළ නංවාගැනීමට අවස්ථාව හිමි වී ඇත. ඉන්පසු ඔහු පශු සම්පත් හා

කෘෂිකර්ම සමාගමේ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර එම සමාගමේ දියුණුව සහ වර්ධනය වෙනුවෙන් ඔහු ලබා දුන් දායකත්වය විශාල වශයෙන් පිළිගැනීමට ලක් විය.

ඉන්පසු, දසනායක මහතා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සභාපතිවරයා වශයෙන් පත් කරන ලදී. ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය සහ රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ සභාපතීත්වය ද ඔහු විසින් හොබවන ලද අතර එමඟින් සිය දැනුම අත්දැකීමක් ලෙසට පරිවර්තනය කර ගැනීමට ඔහුට හැකියාව ලැබී ඇත.

ඉන්පසුව, ස්වාධීන රූපවාහිනී සේවයේ (**ITN**) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස පත්වූ අතර පසුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (**NAITA**) උප සභාපතිවරයා ලෙසද කටයුතු කරන ලදී. සිය කීර්තිමත් වෘත්තීය දිවිය තුළ ලබාගත් පළපුරුද්ද සහ දැනුම භාවිතයෙන් ඔහු ආයතනයේ සංවර්ධනය උදෙසා ඉමහත් දායකත්වයක් සපයන ලදී. සිය නිල සේවා කාලය තුළ මෙම ආයතනයන් වෙනත් විවිධ කර්මාන්තයන්හි යෙදවූ අතර, එමඟින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලදී.

**කපිතාන් අතුල හේවාවිතාරණ මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂ**

කපිතාන් අතුල හේවාවිතාරණ මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගාල්ල වරායේ සහකාර හාබර් මාස්ටර්වරයා/ නාවික නියමුවරයා ලෙස 1997 වර්ෂයේදී සේවයට බඳවා ගන්නා ලදී. 2004 වර්ෂයේදී එම තනතුරට අතිරේකව, ඔහු ගාල්ල වරායේ වැඩ බලන නේවාසික කළමනාකාර තනතුරටද පත් කරන ලදී.

2007 වර්ෂයේදී ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය හාබර් මාස්ටර්වරයා ලෙස පත් කරන ලද අතර ඉන්පසු 2017 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හාබර් මාස්ටර් තනතුරට උසස් කරන ලදී. 2018 දෙසැම්බර් මාසයේදී ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට උසස් කරන ලදී.

අ.පො.ස (උ/පෙළ.) විභාගයෙන් පසු ඔහු ගල්ෆ් ඊස්ට් ෂිප් මැනේජ්මන්ට් (Gulf East Ship Management) ආයතනයට අයත් "Eastern Academy" නම් වූ අභ්‍යාස නෞකාවට බැඳුනු අතර ඔහු එහිදී මාස 18ක පුහුණුවක් ලබා ගන්නා ලදී. 1984 වර්ෂයේදී ඔහු දෙවන නාවික නිලධාරී තනතුර (Second Mates) ඉන්දියාවේ බොම්බාය නගරයේදී ලබාගත් අතර 1991 වර්ෂයේදී ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේදී පළමුවන පන්තියේ නෞකාධිපති තනතුර (Master Class I) ලබා ගන්නා ලදී.

ඔහු 1983 වර්ෂයේදී ලංකා නැව් සංස්ථාවේ සේවයට බැඳුනු අතර පසුව ජර්මානු සමාගමක් වන "නෝර්ඩ්" (Nord) ආයතනයේ සහ මර්කන්ටයිල් ෂිපින් (Mercantile Shipping) සමාගමෙහි නාවුක යාත්‍රාවන්හි සේවයේ නියුතු විය. 1997 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්බන්ධ වීමට පෙර ඔහු කෙටි කාලයක් සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මුවරින් මාස්ටර්වරයා (Mooring Master) ලෙස සේවය කරන ලදී.

කපිතාන් අතුල හේවාවිතාරණ මහතා එක්සත් රාජධානියේ නාවික විද්‍යායතනයේ (National Institute of UK) ආශ්‍රිත සාමාජිකයෙකු ද (Associate Fellow of the Nautical Institute) වේ.

**නිලාන් වික්‍රමසිංහ මහතා**
**විධායක අධ්‍යක්ෂ**

ආගන්තුක සත්කාරක හා සංචාරක ක්ෂේත්‍රයේ වසර 30 කට වැඩි පළපුරුද්දකින් පෝෂිත වූ නිලාන් වික්‍රමසිංහ මහතා ක්ෂේත්‍රයේ පවතින ඉහළ ඉල්ලුමට ප්‍රතිචාරයක් ලෙස 1999 වර්ෂයේදී "සුළු ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයට" යන තේමාව යටතේ ලයන් රෝයල් ටුවරිසම් හෙවත් "රාජකීය සිංහ

සංචාරක ව්‍යාපාරය'' සමාගමක් ලෙස නිර්මාණය කළේය. ප්‍රංශ සහ ජපන් සංචාරක ව්‍යාපාරය පිළිබඳ විශේෂඥතාවයෙන් යුත් මෙම සමාගම අද වන විට වික්‍රමසිංහ මහතාගේ සභාපතීත්වය යටතේ සම්මාන ලාභී ව්‍යාපාරයක් ලෙස පිළිගැනීමට ලක්ව ඇත. නිවාඩු විවේකයේ සාම්ප්‍රදායික අදහසට විප්ලවීය වෙනසක් සිදුකරමින් ඔහු ලයන් රෝයල් නිවාඩු නිකේතන හා සම්භාහන මධ්‍යස්ථාන ආරම්භ කළේය.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ආර්ථික වර්ධනයට වික්‍රමසිංහ මහතා දැක්වූ දායකත්වය අගයනු පිණිස ඔහු ජාතික හා අන්තර් ජාතික මට්ටමින් ගෞරව සම්මානයට පාත්‍ර කරන ලද අතර, කුසලතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ආගන්තුක සත්කාර හා සංචාරක ව්‍යාපාරය භාර අධ්‍යක්ෂවරයා ලෙස එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලදී. එම නිල කාලය තුළ 2016 වර්ෂයේදී වෙනිසියුලා බොලිවේරියන් ජනරජයේ මාගරීටා දූපතේ පැවති නොබැඳි ජාතීන්ගේ සමුළුවටද විශේෂ නියෝජිතයෙකු ලෙස සහභාගී විය.

වික්‍රමසිංහ මහතා මේ වනවිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජියෙකු ලෙසද, ජය බහළු පර්යන්තයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද, හම්බන්තොට ජාත්‍යන්තර වරායේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද, හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් (HIPS) හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද, හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෘෘප් (HIPG) හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද පත් කර ඇති අතර, මාගම්පුර පෝට් මැනේජ්මන්ට් කන්සල්ටන්සි සර්විසස් (MPMC) ආයතනයෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරමින් සිටී.

**ජී එස් එම් චාල්ස් මහත්මිය**
**අධ්‍යක්ෂිකා**

වත්මන් රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුර හොබවන ජී.එස්.එම්. චාර්ල්ස් මහත්මිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියකි.

ප්‍රථම ශාස්ත්‍රපති උපාධිය (ගෞරව) 1983 දී ලබාගත් අතර පසුව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, විද්‍යාවේදී උපාධිය සහ කළමනාකරණවේදී උපාධිය සමත් වී ඇත.

1992 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී වව්නියාව හා මඩකලපුව දිස්ත්‍රික්ක වල දිසාපති වශයෙන්ද කටයුතු කර ඇත.

වව්නියාව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරිය වශයෙන් කටයුතු කළ අවධියේ, රටෙහි දරිද්‍රතාවය තුරන්කිරීමේ වැඩපිළිවෙලේ වව්නියාව දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ඉහළම අනුපාතිකයක් ලඟා කර ගැනීමට ඇය සමත්වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් 2.3% ක් විය.

චාර්ල්ස් මහත්මිය ලෝක ආපදා කළමනාකරණ නායකත්ව ජාලයේ පූර්ණ සාමාජිකත්වය දරමින් කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පැවති සිවිල් යුද්ධයේ අවසන් අදියරෙන් පසුව අභ්‍යන්තර අවතැන් පුද්ගලයින්ගේ අවශ්‍යතා ඉටුකිරීමේ මානුෂීය සම්බන්ධීකාරකවරිය මෙන්ම, අපදා අවදානම් කළමනාකරණයේ දිස්ත්‍රික් පරිපාලන නිලධාරිනිය වශයෙන්ද චාර්ලිස් මහත්මිය කටයුතු කලාය.

ඇය විසින් යුනිසෙෆ් ආයතනයේ සහයෝගය ඇතිව අවතැන් වූ ළමුන් සඳහා පවුලේ ඥාතීන් සෙවීමේ හා නැවත සම්බන්ධ කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර එමඟින් විශාල පවුල් සංඛ්‍යාවක් නැවත එක්කිරීමට හැකිවිය.

ඇය මඩකලපුව දිස්ත්‍රික්කය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කිරීමේ කාර්යයෙහි නියුතුව සිටි අතර දිස්ත්‍රික්කයේ කාන්තා ව්‍යවසායකයින්ගේ දියුණුව ලඟාකර ගැනීමේ අරමුණ ඇතිව දිස්ත්‍රික්කයේ කාන්තා ස්වයං රැකියා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමේ හා මඟ පෙන්වීමේ කටයුතු මෙහෙය වූවාය.

මඩකලපුව නගරය අලංකරණය කිරීමේ ව්‍යාපෘතිය හා කොටුව ප්‍රදේශය අලංකරණය කිරීමේ ව්‍යාපෘතිය සහ වෙනත් සංවර්ධන ව්‍යාපෘති රාශියක් භාරව කටයුතු කළ චාර්ල්ස් මහත්මිය මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්වභාවික විපත් අවම කිරීමේ ව්‍යාපෘතිය භාරව ද කටයුතු කර ඇති අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ සංචාරක සංවර්ධන කටයුතු වල කැපීපෙනෙන කාර්යයන් රාශියක් ඉටුකර ඇත.

කාන්තා කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද වාර්ෂික දීප ව්‍යාප්ත සම්මාන ප්‍රදානෝත්සවයේදී 2012/2013 වර්ෂයේ විශිෂ්ටතම කාන්තාවට හිමි සම්මානයෙන් චාල්ස් මහත්මිය පිදුම් ලැබුවාය.

### එච් ජී සුමනසිංහ මහතා
**අධ්‍යක්ෂ**

2016 වර්ෂයේදී සුමනසිංහ මහතා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරන ලදී. ඊට අමතරව, 2015 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නියෝජිතයා ලෙසද පත්කරනු ලැබ ඇත. මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබීමට ප්‍රථමයෙන් ඔහු මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්(මානව සම්පත් සංවර්ධන) වශයෙන් සේවය කර ඇත.

මීට පෙරාතුව සුමනසිංහ මහතා ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ ආනයන අපනයන පාලක ජනරාල්වරයා ලෙස කටයුතු කර ඇත. ඊට ඉහත දී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශයේ සහාය අධ්‍යක්ෂ ආදී ලෙස මහා භාණ්ඩාගාරයේ විවිධ තනතුරු දරා ඇත.

සුමනසිංහ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා මූල්‍ය පීඨයෙන් වාණිජවේදී උපාධිය ලබා ඇති අතර, ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් (Flinders) විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත.

### නිශාන්ත වික්‍රමසිංහ මහතා
**අධ්‍යක්ෂ**

දැනට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) තනතුර හොබවන නිශාන්ත වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබ ඇත.

### සුරංග පී හිදැල්ලාරච්චි මහතා
**අධ්‍යක්ෂ**

සුරංග පී හිදැල්ලාරච්චි මහතා ශ්‍රී ලංකාවේ පරිපාලන හා සංවර්ධන අංශයන්හි විධායක කාර්යයන්හි නියැලීමෙන් ලද පලපුරුද්ද සහිතව වසර 2002 සිට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ මහතා යටතේ සේවය කර ඇති අතර ඔහු කම්කරු හා විදේශ රැකියා, ආපදා කළමනාකරණ හා මානව හිමිකම්, වැවිලි කර්මාන්ත, මුදල්, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ වරාය හා නාවික යන

අමාත්‍යාංශ ඇතුළුව රාජ්‍ය ආයතනයන්හි සම්බන්ධීකරණ ලේකම්, මාධ්‍ය ලේකම්, පුද්ගලික ලේකම්, සභාපති සහ අධ්‍යක්ෂ යන තනතුරු වල කටයුතු කර ඇත.

සුරංග මහතා 2011 සිට 2012 දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ "තුරු සවිය" අරමුදලෙහි සභාපති ලෙස සේවය කර ඇති අතර එම කාලය තුළ කුඩා රබර් වතු හිමියන් සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට ණය ක්‍රමයක් හඳුන්වාදීමට ඔහුට සමත්වූ අතර රබර් මිල සහ නිෂ්පාදනයන්හි තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාණ්ඩ වශයෙන් රබර් පදම් කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදී. ඔහු ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ (NIPM) සභාපතිවරයා ලෙස කටයුතු කරන ලද අතර ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික පාසලෙහි (NSBM) අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරන ලදී.

**රාජ් ඔබේසේකර මහතා**
**අධ්‍යක්ෂ**

ඔබේසේකර මහතා ස්ටැසන් සමාගම් සමූහයේ ආරම්භක අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කර ඇත.

වෙළඳ හා වාණිජ, ක්‍රමෝපායික කළමනාකරණ හා ආයතන සංවර්ධනය මෙහෙයුම් ප්‍රධානී ලෙස වසර 35 කට අධික පළපුරුද්දක් ඔබේසේකර මහතා සතු වේ.

ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශයේ හිටපු සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිටපු නියෝජ්‍ය සභාපති ලෙසද කටයුතු කර ඇත.

**එස් ඒ එස් කේ ජයසේකර මහත්මිය**
**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**

## කළමනාකරණ කණ්ඩායම

ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා
**සභාපති**

පී ජී දසනායක මහතා
**උප සභාපති**

කපිතාන් අතුල හේවාවිතාරණ මහතා
**කළමනාකාර අධ්‍යක්ෂ**

නිලාන් වික්‍රමසිංහ මහතා
**විධායක අධ්‍යක්ෂ**

ඩී යූ ඩබ් ද සොයිසා මහතා
**අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ**

ශිරාණී වන්නිආරච්චි මිය
**අධ්‍යක්ෂ (මුදල්)**

පී ඒ ඒ හේවාගීගන මහතා
**අධ්‍යක්ෂ (දකුණු වරාය සංවර්ධන)**

ඩී ඒ ජේ අයි පෙරේරා මහතා
**අධ්‍යක්ෂ (වරාය මෙහෙයුම්)**

ආචාර්ය ඩී පී එස් ලොකුගේ මහතා
**අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති)**

මේජර් ජනරාල් ගාමිණී හෙට්ටිආරච්චි
**අධ්‍යක්ෂ (ආරක්ෂක)**

ඩී ජී අයි සී ලොකුහේවගේ මිය
**අධ්‍යක්ෂ (තාක්ෂණික)**

පී රණතුංග මහතා
**අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)**

එල් ප්‍රේමසිරි ද සිල්වා මහතා
**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

වෛද්‍ය ඩී රාජකාන්තන් මිය
**ප්‍රධාන වෛද්‍ය නිලධාරිනී**

ඒ ඒ එස් ආර් අබේසිරිවර්ධන මහතා
**ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන)**

ආර් එම් ඒ එස් රත්නායක මහතා
**ප්‍රධාන කළමනාකරු (පරිපාලන)**

උපුල් ජයතිස්ස මහතා
**ප්‍රධාන කළමනාකරු (අලෙවිකරණ හා ව්‍යාපාර සංවර්ධන)**

එච් ඒ එන් එස් ප්‍රනාන්දු මහතා
**ප්‍රධාන ඉංජිනේරු (විදුලි - II)**

ඩබ් එම් ඩී බී විජේකෝන් මහතා
**ප්‍රධාන ඉංජිනේරු (විදුලි - I)**

ඩබ් එන් ජයතිස්ස මහතා
**ප්‍රධාන කළමනාකරු (සාම්ප්‍රදායික නැව්බඩු)**

ජී වී ටී නානායක්කාර මහතා
**ප්‍රධාන ඉංජිනේරු (නාවික)**

අපර්ණා තිලකරත්න මිය
**ප්‍රධාන නීති නිලධාරිනී**

එයාර් කොමදෝරු ඩී සී ප්‍රේමරත්න
**ප්‍රධාන ආරක්ෂක කළමනාකරු**

කාන්ති ගුණවර්ධන මෙනවිය
**ප්‍රධාන මූල්‍ය කළමනාකරු**

අයි කේ ඥාණතිලක මහතා
**ප්‍රධාන කළමනාකරු (බහළු මෙහෙයුම්)**

එච් එම් ප්‍රභාත් ජයන්ත මහතා
**ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්)**

නිර්මාල් ද ෆොන්සේකා මහතා
**ප්‍රධාන මානව සම්පත් කළමනාකරු**

ජේ ඒ චන්ද්‍රරත්න මහතා
**ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ වැඩ)**

ඩී එල් ආර් වීරසිංහ මහතා
**ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා)**

එම් එස් ඒ පතිරගේ මහතා
**ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ)**

ඩබ් එම් නලින් අපොන්සු මහතා
**ප්‍රධාන කළමනාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා)**

පී ඒ ආර් ඩී පතිරාජ මහතා
**ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ)**

ඩී ජී ආර් එම් පතිවිල මහතා
**ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්)**

එස් එස් දේවප්‍රිය මහතා
**ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)**

කේ ජී එස් දයානන්ද මහතා
**ප්‍රධාන අභ්‍යාස කළමනාකරු**

දර්ශක පෙරේරා මහතා
**ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති)**

කපිතාන් කේ එම් එන් පී සිල්වා
**හාබර් මාස්ටර්**

**විගණන කමිටුව**

එච් ජී සුමනසිංහ මහතා
**සභාපති**

පී එස් එම් චාර්ල්ස් මහත්මිය
**සාමාජික**

නිලාන් වික්‍රමසිංහ මහතා
**සාමාජික**

කේ පී ජී හේමරත්න මහතා
**සාමාජික**

ශිරාණී වන්නිආරච්චි මහත්මිය
**සාමාජික**

ඩී යූ ඩබ් ද සොයිසා මහතා
**සාමාජික**

ඩී ඒ ජේ අයි පෙරේරා මහතා
**සාමාජික**

එල් ප්‍රේමසිරි ද සිල්වා මහතා
**ලේකම්**

## 2018 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වෙනස්වීම්

**විශ්‍රාම ගැනීම්**

**එච් ඩී ඒ එස් ප්‍රේමචන්ද්‍ර මහතා,** කළමනාකාර අධ්‍යක්ෂවරයා ඔහුගේ සේවා කාලය අවසන් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.
**ඒ ඩී ටී ගුණසේකර මහතා**, අතිරේක කළමනාකාර අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.
**එච් එම් යූ බී ගලගොඩ මහතා**, ප්‍රධාන කළමනාකරු(තොරතුරු පද්ධති) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

**පත්කිරීම්**

**කපිතාන් අතුල හේවාවිතාරණ මහතා,** කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
**ඩී යූ ඩබ් ද සොයිසා මහතා,** අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
**පී රණතුංග මහතා** අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) ලෙස පත් කරන ලදී.
**ඩී එල් ආර් වීරසිංහ මහතා** ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා) ලෙස පත් කරන ලදී
**එස් එස් දේවප්‍රිය මහතා** ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) ලෙස පත් කරන ලදී.
**ඩී ජී ආර් එම් පතිවිල මහතා** ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්) ලෙස පත් කරන ලදී.
**කේ ජී එස් දයානන්ද මහතා** ප්‍රධාන අභ්‍යාස කළමනාකරු ලෙස පත් කරන ලදී.
**දර්ශක පෙරේරා මහතා** ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති) ලෙස පත් කරන ලදී.
**කපිතාන් කේ එම් එන් පී සිල්වා මහතා** හාබර් මාස්ටර් ලෙස පත් කරන ලදී.

## අන්තර්ජාතික ජයග්‍රහණයන් - කොළඹ වරාය

♦ **2018 වර්ෂයේ වඩාත්ම වේගවත් වර්ධනයකින් යුත් වරාය**

2018 වර්ෂය තුළදී ලෝකයේ විශිෂ්ටතම බහළු මෙහෙයුම් වරායන් 30 අතුරින් වඩාත්ම වේගයෙන් වර්ධනය වන වරාය ලෙස කොළඹ වරාය ශ්‍රේණිගත කර ඇත. 2018 වර්ෂයේදී වාර්තා අභිබවායමින් කොළඹ වරාය විස්සේ සම ඒකක මිලියන 07ක් මෙහෙයවන ලද අතර මෙය 2017 වර්ෂයට සාපේක්ෂව 13.5% ක වර්ධනයකි. 2017 වර්ෂය හා සැසඳීමේදී ජය බහළු පර්යන්තය විසින් ඉහළම වර්ධන අනුපාතය වන 14.6%ක් වාර්තා කරන ලද අතර සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමාගම විසින් 14.2% ක් සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම විසින් 12.0%ක වර්ධනයක් වාර්තා කරන ලදී. ජය බහළු පර්යන්තයේ ප්‍රතිනැව්ගත කිරීම් වර්ධනය 22.2% ක විශිෂ්ට අගයක් වාර්තා කරන ලදී. ඇල්ෆාලයිනර් ශ්‍රේණිගත කිරීමට අනුව, ඉතිහාසයේ ප්‍රථම වතාවට කොළඹ වරාය අංක 01 ස්ථානයට ශ්‍රේණිගත කර ඇත.

♦ **වරාය සම්බන්ධිත දර්ශකය (Port Connectivity Index)**

ඩ්රූවරි සමුද්‍රීය පර්යේෂණය (Drewry Maritime Reseach) මගින් 2018 වර්ෂයේ තුන්වන කාර්තුව සඳහා සකසන ලද ගෝලීය බහළු සම්බන්ධිත වරාය දර්ශකයේ කොළඹ වරාය 11 වැනි ස්ථානයේ ශ්‍රේණිගත කර ඇත. 2017 වර්ෂය හා සසඳා බැලීමේදී මෙය ශ්‍රේණි දෙකක ප්‍රගමනයකි.

♦ **ගෝලීය වරාය සංසදය (Global Ports Forum) මගින් පිරිනමන ලද "වසරේ වරාය අධිකාරිය" සඳහා වන සම්මානය**

කැපවීමෙන් ඉටුකරන සේවාවන් වෙනුවෙන් කොළඹ වරාය ගෝලීය සමුද්‍රීක සිතියමෙහි ඉහළට නැංවීම පිණිස ගෝලීය වරාය සංසදය මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත "වසරේ වරාය අධිකාරිය" ට හිමි සම්මානය පිරිනමන ලදී.

## වෙනත් වරායයන්ගේ කාර්යසාධනය

♦ 17.4%ක වර්ධනයක් වාර්තා කරමින් හම්බන්තොට වරායට නෞකා 270 ක් පැමිණ ඇති අතර 2017 වර්ෂයට සාපේක්ෂව නැව්බඩු මෙහෙයුම් ප්‍රමාණය 131.6% කින් ඉහළ යන ලදී.

♦ හම්බන්තොට වරායේ මෝටර්රථ මෙහෙයුම් 115.9% ක වර්ධනයක් වාර්තා විය.

♦ 2018 වර්ෂයට සාපේක්ෂව ගාල්ල වරායට පැමිණි නෞකා සංඛ්‍යාව 3.4%කින් අඩු වුවද එහි මෙහෙයුම් කරන ලද නැව්බඩු ප්‍රමාණය 2.5%කින් ඉහළ යන ලදී.

♦ ත්‍රිකුණාමල වරායට පැමිණි නෞකා සංඛ්‍යාව -18.9%කින් අඩු වූ අතර මෙහෙයුම් කරන ලද නැව්බඩු ප්‍රමාණය -8.7%කින් අඩුවිය.

## ව්‍යාපාර සංවර්ධනය උදෙසා ගන්නා ලද මූලික ක්‍රියාමාර්ග

♦ **අවබෝධතා ගිවිසුම – 2018 මාර්තු**

2018 මාර්තු මාසයේදී කොළඹ වරායේ පර්යන්ත මෙහෙයුම් ත්‍රිත්වය වන ජය බහළු පර්යන්තය (JCT), සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) යන ආයතන විසින් කොළඹ වරායේ සංවර්ධනය සඳහා සාමූහිකව මෙහෙයුම් සිදු කිරීමට අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදී. තවද, නව ගිවිසුම මගින් සියළුම බහළු නෞකා

මෙහෙයුම් කටයුතු සඳහා වරායේ රැඳී සිටින සමස්ත කාලය (Total Turnaround Time) අවම කිරීමට අපේක්ෂා කරනු ලබයි.

♦ **කොළඹ වරාය සම්මාන ප්‍රදාන රාත්‍රිය - 2018 ජූලි**

2018 වර්ෂයේදී මෙම ප්‍රාරම්භය ගනු ලැබුවේ කොළඹ වරායට පැමිණෙන ප්‍රධාන නැව් සේවාවන්හි ඉහළ පෙළේ විදේශ නිලධාරීන් 30කට අධික පිරිසක් ඇගයීම සඳහාය. එහි ප්‍රතිඵලයක් ලෙස "කොළඹ වරාය සම්මාන ප්‍රදාන රාත්‍රිය" ජය බහළු පර්යන්තය (JCT), සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) යන ආයතන සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සංවිධානය කරන ලදී. බහළු මෙහෙයුම් කිරීමේදී කොළඹ වරාය හා සම්බන්ධ ප්‍රධාන නැව් සේවාවන් 22ක් සහ පෝෂක නැව් සේවාවන් 08ක් මගින් ලබා දෙනු ලබන විශිෂ්ට සේවාව මෙම සම්මාන ප්‍රදානෝත්සව රාත්‍රිය මගින් ඇගයීමට ලක් කරන ලද අතර ප්‍රධාන නැව් සේවාවන් 05ක් සහ ප්‍රධාන පෝෂක නැව් සේවාවන් 05ක් සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකාව කලාපයේ විශාලතම කේන්ද්‍රීය වරාය බවට පත් කිරීමට යන ගමනේදී කොළඹ වරායේ මෙහෙයුම් වැඩි කිරීමට දිරිගැන්වීමක් ලෙස "කොළඹ වරාය සම්මාන ප්‍රදානෝත්සවය - 2018" හැඳින්විය හැක.

1505 පෘතුගීසීන් විසින් නාවික කඳවුරක්/වරායක් ලෙස භාවිතයට ගැනීම ආරම්භ කිරීමෙන් පසුව කොළඹ වරාය අපරදිග රටවල ප්‍රසිද්ධියට පත්විය.

1875 VII එඩ්වඩ් රජු විසින් දෙසැම්බර් 09 වන දින නිරිත දිග දියකඩනයට මුල් ගල තබන ලදී.

1882 කොළඹ වරාය පරිපාලනය කිරීම සඳහා වරාය මණ්ඩලය පිහිටුවන ලදී.

1885 මීටර් 1285 ක් දිග නිරිත දිග දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1898 මීටර් 335 ක් දිග ඊසාන දිග දියකඩනයේ ඉදිකිරීම නිම කරන ලදී.

1899 වියළි තටාකාංගයේ ඉදිකිරීම් ආරම්භ කිරීම.

1906 මීටර් 814 ක් දිග අයිලන්ඩ් දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1906 වියළි තටාකාංගනයේ ඉදිකිරීම නිම කිරීම.

1909 වියළි තටාකාංගය සඳහා මීටර් 250 ක් දිග නියමු පාලම ඉදිකර නිමකිරීම (පළමු වැනි ගැඹුරු දිය අද්දර නැංගුරම් පොළ).

1912 වත්මන් ජයබහළු පර්යන්තය පිහිටි ස්ථානයේ ගල් අඟුරු ජැටි 18 ක් ඉදිකර නිමකිරීම.

1912 නිරිත දිග දිය කඩනයේ මීටර් 550 ක් දිග දිගුව ඉදිකර නිමකිරීම.

1913 වරාය සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභාව පිහිටුවීම.

1922 ඛනිජ තෙල් මෙහෙයුම් පහසුකම් සැලසීමේ කාර්යය නිම කිරීම.

1950 මීටර් 9-11 දියඹක් සහිත අද්දර නැංගුරම්පළවල් පහළොවක් සහ මීටර් 7.5 ක දියඹක් සහිත වෙරළාසන්න යාත්‍රා නැංගුරම් පොළවල් දෙකක්ද, වර්ග මීටර 55.800ක යාබද මාර්ගස්ථ බඩු ගබඩා සහ ගුදම් ඉඩ පහසුකම් ඉදිකිරීම ආරම්භ කිරීම.

1954 නිරිතදිග දිය කඩනයෙහි ඉදිකර නිමකළ අද්දර නැංගුරම්පළවල් II වැනි එළිසබෙත් මහ රැජිණ විසින් විවෘත කිරීම සහ එය “එළිසබෙත් රැජින ජැටිය” යනුවෙන් නම් කිරීම. (“ගොතික්” රාජකීය රුවල් යාත්‍රාව එළිසබෙත් රැජිණ ජැටියෙහි නැංගුරම් ලෑ පළමු යාත්‍රාව විය)

1956 අද්දර නැංගුම්පළවල් 17 ක්, මාර්ගස්ථ බඩු ගබඩා හා ගුදම් තනා නිම කිරීම.

1958 කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කර වරාය (නැව්බඩු) සංස්ථාව පිහිටුවීම.

1964 ගාලු වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1967 වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව පිහිටුවීම.

1967 ත්‍රිකුණාමලය වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1979 කොළඹ වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංස්ථාව සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීම.

1980 කොළඹ වරාය සඳහා ප්‍රධාන සැලැස්ම ජපන් රජයේ සහයෝගය ඇතිව පිළියෙළ කිරීම.

1980 එළිසබෙත් රැජිණ ජැටියේ නව පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

1982 පළමු වැනි ග්‍රැන්ට් දොඹකරය - ටැන්ගෝ 80 සේවය සඳහා යෙදවීම.

1982 නව බහළු පර්යන්ත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ජපානයේ පෙන්ටා ඕෂන් වකවිකු ඒකාබද්ධ සමාගම සමඟ අත්සන් කිරීම.

1983 සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ I වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

1984 සම්පූර්ණ උපකරණ සහිත අංග සම්පූර්ණ බහළු පර්යන්තයේ II වැනි අදියරෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

1984 එළිසබෙත් රැජිණ ජැටියේ බහළු නැංගුරම්පොළෙහි "හිටාචි" හුවමාරු දොඹකර හතරක් (04) සේවය සඳහා යොදා ගැනීම.

1985 ජයබහළු පර්යන්තයේ 1 වැනි අදියර උත්සවාකාරයෙන් විවෘත කිරීම.

1987 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කිරීම.

1987 ජයබහළු පර්යන්තයේ II වැනි අදියර විවෘත කිරීම.

1988 වෙරළෙන් ඔබ්බෙහි ඒක ලක්ෂිත බෝයා නැංගුරම්පළ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.

1994 නව වරාය ප්‍රවේශ මාර්ගය තනා නිම කිරීම.

1995 ජයබහළු පර්යන්තයේ III වැනි අදියර විවෘත කිරීම.

1996 ජයබහළු පර්යන්තයේ IV වැනි අදියර විවෘත කිරීම.

1998 සමඟි බහළු පර්යන්තය ආරම්භ කිරීම.

1998 අනුබද්ධිත වරාය සමුළුව පැවැත්වීම.

1999 නැගෙනහිර වෙරළ තීරයෙහි ඔලුවිල් ප්‍රදීපාගාරය ක්‍රියාත්මක කිරීම සහ ඔලුවිල් සමුද්‍රීය අභ්‍යාස පුහුණු ආයතනය විවෘත කිරීම.

1999 රැජිණ බහළු පර්යන්තයේ සවුත් ඒෂියා ගේට්වේ ටර්නමිල් (SAGT) සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

1999 ත්‍රිකුණාමල වරායේ අද්දර නැංගුරම්පළ ව්‍යාපෘතියේ ඉදිකිරීම ආරම්භ කිරීම.

2000 දකුණු කොළඹ වරාය ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කිරීම.

2000 ගාලු වරායේ නව නැංගුරම්පොළක් ආරම්භ කිරීම.

2000 පෑලියගොඩ බහළු නැව්බඩු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2000 කළාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම.

2000 උතුරු පාලම සංවර්ධන ව්‍යාපෘතියෙහි II වැනි අදියර ආරම්භ කිරීම.

2000 තනි-නැවතුම් ලේඛණ කටයුතු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2001 ගාලු වරායේ නව ජැටිය ආරම්භ කිරීම.

2003 ඔලුවිල් වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ආරම්භ කිරීම.

2003 අර්ධ පූර්ණ බහළු (LCL) සහ තොග-කඩන නැව්බඩු සඳහා ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2003 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමුද්‍රීය කෞතුකාගාරය විවෘත කිරීම.

2003 සිවිල් වැඩ කටයුතු සම්පූර්ණ වීමත් සමඟ සමඟි බහළු පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 25 වන සංවත්සරික උත්සවය පැවැත්වීම.

2004 මහා පරිමාණ සේවා අංශයේ ජාතික ඵලදායීතා සම්මානය ජයබහළු පර්යන්තය විසින් දිනා ගැනීම.

2004 කොළඹ වරායේ බහළු දසලක්ෂ 2 ක් (මිලියන 02 ක්) මෙහෙයවීම.

2005 ඔලුවිල්හි වරාය හා නිවාස යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

2005 මධ්‍යම පරිමාන සේවා අංශය යටතේ කුසලතා සහතිකයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය වෙත ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කිරීම.

2006 කොළඹ වරායේ බහළු ආරක්ෂක උපනයනයන් සහ මෙගා පෝර්ට් උපනයනයන් ක්‍රියාත්මක කිරීම.

2006 කොළඹ දකුණු වරාය ඉදිකිරීම සඳහා යෝජිත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

2006 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි අදියර I සඳහා විස්තරාත්මක සැලසුම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

2007 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම හා මූල්‍ය ගිවිසුම අත්සන් කිරීම.

2008 ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම.

2008 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වීම.

2008 හම්බන්තොට වරායෙහි නැව් තෙල් සැපයීමේ පහසුකම් සැලසීම සඳහා සහ තෙල් ටැංකි සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම.

2009 හම්බන්තොට වරායේ නැව්තෙල් සැපයීමේ පහසුකම හා තෙල් ටැංකි ව්‍යාපෘතිය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

2009 ජයබහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය “NAVIS” පද්ධතිය දක්වා වර්ධනය කිරීම.

2010 2010.08.15 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ වරාය ද්‍රෝණියට මුහුදු ජලය පිරවීමේ උත්සවය.

2010 2010.11.18 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2010 ජයබහළු පර්යන්තයේ බහළු මිලියන 02 ක් මෙහෙයුම් කිරීම.

2010 කොළඹ වරායේ බහළු මිලියන 04 ක් මෙහෙයුම් කිරීම.

2011 නව ග්‍රැන්ට් දොඹකර 06 ක් සහ හුවමාරු දොඹකර 30 ක් වරායට ගෙන ඒම.

2011 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ පිහිටි තෙල් පර්යන්තයේ ධාරිතාවය වැඩිකිරීම.

2011 පර්යන්ත ට්‍රැක්ටර් 50 ක් වරායේ සේවය සඳහා යෙදවීම.

2011 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සඳහා ගිවිසුම අත්සන් කිරීම.

2011 නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2011 දකුණු බහළු පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2012 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ රෝ - රෝ නෞකා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම

2012 බ්ලුමැන්ඩල් තෙල් ටැංකි සංකීර්ණයේ සිට කොළඹ වරාය දක්වා වූ ඉතා අබලන් තත්ත්වයේ පවතින ඉන්ධන නළ මාර්ගය නැවත එලීම.

2013 කිලෝ මීටර් 6.8 අතිවිශාල දියකඩනය සහ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමඟ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 ඔලුවිල් වරාය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 නැව්බඩු කළමනාකරණ පද්ධතියේ ආනයන පූර්ණ බහළු පැටවුම් මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

2013 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පරිපාලන ගොඩනැගිල්ල උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ නැව් තෙල් සැපයීමේ පහසුකම් සහ තෙල් ටැංකි සංකීර්ණය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

2015 නැගෙනහිර බහළු පර්යන්තය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2015 තත්ත්ව කළමනාකරන පද්ධතිය සඳහා ISO 9001 – 2008 තත්ත්ව සහතිකය ලබා ගැනීම.

2015 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය දෙවන අදියරෙහි වරාය ද්‍රෝණියේ කරදියවර පිරවීමේ මංගල්‍යය පැවැත්වීම.

2015 කොළඹ වරාය තුල බහළු විස්සේ සම ඒකක මිලියන 05 මෙහෙයවීම.

2016 CFS 1මෙහෙයුම් මධ්‍යස්ථානය ප්‍රති ස්ථාපිත කිරීම. (2016.08.10)

2016 යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය මගින් ජයබහළු පර්යන්තයේ උසින් අඩු නව ට්‍රේලරයක් නිෂ්පාදනය කිරීම. (2016.08.31)

2016 විශාලතම බහළු නෞකාව වන MSC Maya කොළඹ වරායේ, කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය වෙත පැමිණීම. (2016.09.16)

2017 පූර්ණ වශයෙන් නැවත ඉදි කරන ලද බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේ 01-**(**CFS-01) මෙහෙයුම් ආරම්භ කිරීම (2017.05.31)**.**

2017 හම්බන්තොට වරායේ වරාය මෙහෙයුම් සඳහා චීනය සහ ශ්‍රී ලංකාව අතර සහන ගිවිසුම අත්සන් කිරීම (2017.07.29)**.**

2017 19 වැනි Internaltional Network of Affliated Ports (INAP) සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනුග්‍රහය දැක්වීම. (2017.11.07-08)**.**

2017 හම්බන්තොට වරායේ කොටස්කරුවන්ගේ ගිවිසුම (Shareholders Agreement) සහ ඉඩම බදු දීමේ ගිවිසුම (Land Lease Agreeement**)** අත්සන් කිරීම (2017.12.08)**.**

2017 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් සමාගම අතර හම්බන්තොට වරාය සහන ගිවිසුම යටතේ පළමු ගෙවීම සිදු කිරීම (2017.12.09)**.**

2017 කොළඹ වරාය විසින් විස්සේ සම ඒකක මිලියන 06 ක් මෙහෙයවීම (2017.12.20)**.**

**2018** ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සී/ස චයිනා මර්චන්ටස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කරගත් හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ 02 වන ගෙවීම උත්පාදනය කිරීම.

**2018** කොළඹ වරාය සාමූහිකව සංවර්ධනය කිරීම සඳහා සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අවබෝධතා ගිවිසුමකට එළඹීම.

**2018** 2018 වසරේ හොඳම වරායට හිමි සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෝලීය වරාය සංසදයේදී (Global Ports Forum) දිනා ගැනීම.

**2018** ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට්ස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කර ගන්නා ලද හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ ගෙවිය යුතු අවසන් කොටස (last tranche) උත්පාදනය කිරීම.

**2018** කොළඹ වරාය විසින් ප්‍රථම වරට පවත්වන ලද " Colombo Port Award Night" සම්මාන ප්‍රදානෝත්සව රාත්‍රිය සංවිධානය කිරීම.

**2018** 2018 වසරේ පළමු භාගයේදී ලෝකයේ වැඩිම බහළු ප්‍රමාණයක් මෙහෙයවන වරාය ලෙස කොළඹ වරාය ශ්‍රේණිගත කිරීම - ඇල්ෆාලයිනර් ශ්‍රේණිගත කිරීමට අනුව.

**2018** කොළඹ වරාය විස්සේ සම ඒකක මිලියන 7ක් මෙහෙයවීමට සමත්වීම.



# මෙහෙයුම් සමාලෝචනය

## වාර්ෂික වාර්තාව 2018

# කොට්ඨාශයන්හි කාර්යසාධනය

## මෙහෙයුම් සේවා

### මෙහෙයුම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කොට්ඨාශය විසින් 2018 වසරේ දී අත් කරගත් ඵලදායීතා මට්ටම ඉහළ නැංවීමට සහ ජය බහළු පර්යන්තය විසින් මෙහෙයවන බහළු ධාරිතාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- 2017 වර්ෂයේ මෙහෙයවන ලද විස්සේ සම ඒකක 2,010,702 හා සසඳා බැලීමේදී 2018 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්ත (JCT/UCT) මගින් බහළු විස්සේ සම ඒකක 2,304,534ක් මෙහෙයවන ලදී. එය කොළඹ වරායේ බහළු පර්යන්ත අතර 14.6%ක ඉහළම ධාරිතා වර්ධනයක් ලෙස වාර්තා වී ඇත. තවද, ප්‍රතිනැව්ගත බහළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරයේ පර්යන්ත විසින් 22.2% ක වර්ධන අනුපාතයක් අත්කරගෙන ඇත.

- 2017 වසරේදී 27.2ක් ලෙස වාර්තා වූ ප්‍රධාන නැව් සමාගම්වල නෞකා සම්බන්ධයෙන් වූ දළ දොඹකර ඵලදායීතාවය, 2018 වසරේදී 26.63 (පැය එකකට මෙහෙයුම්) ලෙස 2.1%ක සුළු අඩුවීමක් සහිතව වාර්තා විය. 2017 වර්ෂයේ 24.28 හා සන්සන්දනය කිරීමේදී පෝෂක නැව් සමාගම් සම්බන්ධයෙන් වාර්තාවූ දළ දොඹකර ඵලදායීතාවය 23.09ක් ලෙස 4.9%ක සුළු අඩුවීමක් සහිතව වාර්තා විය. සමස්ත වාර්ෂික බහළු ධාරිතාවය 14.6%කින් වැඩිවී තිබියදී වාර්තා වී ඇති අඩු වීම නිරීක්ෂණය කිරීම සුළු කොට තැකිය නොහැක. පැරණි උපකරණ භාවිතා කිරීම අපේක්ෂා නොකල ආකාරයට ඵලදායීතාවයේ පහත වැටීම් වලට හේතු වී ඇති අතර සංගත නොවන ආධාරක පද්ධති මගින් මෙහෙයවන උපකරණ භාවිතය ද මෙම තත්ත්වය තීව්‍ර වීමට හේතු වී ඇත.

- සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් පර්යන්තයන්හි මෙහෙයුම් කරන ලද සමස්ත වියළි තොග නැව්බඩු ටොන් ප්‍රමාණය 2017 වර්ෂයේදී 2,501,363 සිට 2018 වර්ෂයේදී 2,825,454 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 13% වැඩිවීමක් ලෙස වාර්තා විය. තවද, මෙහෙයවන ලද සමස්ත ද්‍රව තොග ටොන් ප්‍රමාණය 2017 වසරේ 5,865,240 සිට 2018 වසරේ 6,618,328 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 12.8%ක වැඩිවීමක් ලෙස වාර්තා විය.

- කොළඹ වරාය මගින් මෙහෙයවන ලද සමස්ත නැව්බඩු ටොන් ප්‍රමාණය (බහළු, තොගකඩන, වියළි තොග, ද්‍රව තොග) 2017 වර්ෂයේදී 89,034,541 සිට 2018 වර්ෂය තුළ 100,151,715 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 12.5% ක වැඩි වීමක් ලෙස වාර්තා විය.

- ජාත්‍යන්තර නැව් සේවා මගින් අපේක්ෂා කරන පරිදි උසස් මට්ටමේ සේවාවක් සපයන ආකාරය හා තරඟකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ සාර්ථකත්වය අත්කර ගන්නා ආකාරය පිළිබඳ සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් නොකඩවා පවත්වන ලදී. 2018 වර්ෂයේදී මෙන්ම ඉදිරි වර්ෂ තුළදී ජය බහළු පර්යන්තය මුහුණ දෙන අභ්‍යන්තර හා බාහිර අභියෝග ජය ගන්නා ආකාරය පිළිබඳව ද මෙම වැඩසටහන් වලදී සාකච්ඡා කරන ලදී.

- පර්යන්ත මෙහෙයුම් වල ආරක්ෂක ක්‍රියාපිළිවෙත් සහ විවිධ සේවක කොට්ඨාශවලට අදාළ පරිපාලනමය කරුණු සමඟ කාර්යක්ෂමතාව අඛණ්ඩව වර්ධනය කර පවත්වාගෙනයෑම සඳහා ජය බහළු/ සමගි බහළු පර්යන්ත වල මෙහෙයුම් කාර්යමණ්ඩලය ඉලක්ක කර ගනිමින් විශේෂයෙන් සැලසුම් කරන ලද දැනුවත් කිරීමේ හා අභිප්‍රේරණ වැඩසටහනක් ඉහළ කළමනාකාරීත්වයේ, ජය බහළු පර්යන්තයේ කාර්යභාර කළමනාකරුගේ සහ අදාළ විධායක නිලධාරීන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් හා සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලද අතර

සියළුම මෙහෙයුම් ගණයේ කාර්යමණ්ඩල මෙම වැඩසටහන සඳහා මුළු මනින්ම සහභාගී වී අවසන් වන තෙක් නොකඩවා පැවැත්වීමට සැලසුම් කොට ඇත.

- අභාවිත කාලය අවම කිරීමේ අදහසින් නිලධාරීන්ගේ ඍජු අධීක්ෂණය යටතේ උපකරණ හුවමාරුව පර්යන්තයේදී, ජැටියේදී/අංගණයේදී පමණක් සිදු වන බව හා බහළු මෙහෙයුම් උපකරණ මෙහෙයවන්නන් විසින් සිදු කරන බවට සහතික කිරීම සඳහා ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව අධීක්ෂණය කරන අතර එය ඵලදායීතාවය සහ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා වසර පුරාම ක්‍රියාත්මක වේ.

- අන්තර් පර්යන්ත භාණ්ඩ ප්‍රවාහන ක්‍රියාවලිය (Inter Terminal Trucking) විධිමත් කිරීම සහ ප්‍රතිනැව්ගත කිරීම් සහ දේශීය නැව් බඩු මෙහෙයුම් සඳහා අංගණය උපරිම ලෙස භාවිතා කිරීම සඳහා අංගණය එකම ඒකකයක් ලෙස සලකා කාර්යක්ෂම සහ ඵලදායී අංගණ කළමනාකරණයක් සිදු කිරීම මඟින් 2018 වර්ෂයේ මුල් කාර්තුව තුළ අංගණ සැලසුම් පිළිබඳ විශාල වෙනසක් පර්යන්තය තුළ සිදු කරන ලද අතර අංගණ දොඹකර නිසි වේලාවට යෙදවීම මඟින් පර්යන්ත ප්‍රවේගය (Terminal Velocity) අවශ්‍ය මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

- අන්තර් පර්යන්ත භාණ්ඩ ප්‍රවාහනය (Inter Terminal Trucking) ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම හා මනාව සංවිධිත කිරීම සඳහා සහ සියළුම පරදුභාරකරුවන් සම්බන්ධීකරණය කර අවසානයේදී ආවතික/ අහඹු සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පර්යන්ත තුනෙහිම නියෝජිතයන්ගෙන් සමන්විත විශේෂ කණ්ඩායමක් හඳුන්වා දෙන ලදී. කණ්ඩායම් රැස්වීම් දිනපතා ජය බහළු පර්යන්ත පරිශ්‍රයේදී පැවැත්වේ.

- 2018 වර්ෂයේ ආරම්භයේ සිට පර්යන්ත කාර්යක්ෂමතාව ධනාත්මකව ඉහළ නැංවීමට පාදක වූ ප්‍රයිම් මූවර් සහ රබර් ටයර් සහිත ගැන්ට්‍රි දොඹකර පහසුවෙන් ක්‍රියාකරවීමට හැකිවනු පිණිස අංගණයේ අඩුක්කු කිරීමේ (හිස්/ පූර්ණ බහළු) ප්‍රදේශය ද ඇතුළුව ජැටි පෙදෙසේ මාර්ග සහ මංතීරු තවදුරටත් ප්‍රතිසංස්කරණය කරන ලදී.

- ප්‍රධාන පෙළේ නැව් සේවාවන්ගේ (MSC/EMC/ZIM/HHM/KMTC/COSCO/OOCL) විවිධ අංශයන්හි කාර්යක්ෂම සම්බන්ධතාවය ලබාගැනීම තුළින් අතිරේක ආදායමක් උපයා ගැනීමේ අරමුණින් 2018 වසරේදී නව කාණ්ඩ (T/S, Export, ECR) හඳුන්වාදෙමින් හිස් බහළු තටාක මෙහෙයුම් පුළුල් කරන ලදී.

- 2018 නොවැම්බර් මස 10 වන දින පැමිණි MV.ARBATAX නෞකාවෙන් බහළු 7450ක් මෙහෙයවමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉතිහාසය තුළ එක් නැවකින් මෙහෙයවන ලද ඉහළම ධාරිතාවය 2018 නොවැම්බර් මාසයේදී වාර්තා කරන ලදී.

- ජය බහළු පර්යන්තය විසින් දිනාගන්නා ලද 2015- ISO-9001 සහතිකය තවදුරටත් තබාගැනීම සඳහා වූ නිරීක්ෂණ විගණනය (surveillance audit) පසුගිය වර්ෂයේ නොවැම්බර් මස මැද භාගයේදී පවත්වන ලද අතර ඊළඟ වර්ෂය සඳහා ද නිර්දේශ කරමින් විගණනය සාර්ථකව අවසන් කරන ලදී.

## සේවා සැපයුම් කොට්ඨාශය

වරායට ගොඩබාන පූර්ණ බහළු පැටවුම් (FCL), අර්ධ පූර්ණ බහළු පැටවුම් (LCL), තොගකඩන, තොග ඇසුරුම් සහ මෝටර් රථ හා ව්‍යාපෘති නැව්බඩු සහ සියළු නැව්බඩු කාර්යක්ෂමව බෙදාහැරීමේ සහ සේවාලාභීන් හට නැව්බඩු ආශ්‍රිත සේවා සැපයීමේ කටයුතු මෙහෙයවීම සේවා සැපයුම් කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

පූර්වයෙහි සිදු කල ආකාරයටම 2018 වර්ෂය තුළදී ද දවසේ පැය 24 පුරාම සේවා සැපයීම තුළින් පූර්ණ බහළු විස්සේ සම ඒකක 160,470ක් සෘජුවම බෙදාහරින ලද අතර එමගින් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් රුපියල් මිලියන 1,884.80ක ආදායමක් උපයාගන්නා ලදී. සේවාලාභීන් හට සපයන සේවා පුළුල් කිරීමට සහ ලේඛන කටයුතු සඳහා වැය වන කාලය අවම කිරීමට නැව්බඩු කළමනාකරණ පද්ධතිය ඵලදායී ලෙස භාවිතා කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අර්ධ පූර්ණ බහළු විස්සේ සම ඒකක 31,025ක් සහ ප්‍රතිනැව්ගත පූර්ණ බහළු විස්සේ සම ඒකක 704 ක් (31,729) මෙහෙයවන ලදී. එම මෙහෙයුම් ප්‍රමාණයෙන්, (සාමාන්‍ය/අන්තරාදායක) නැව්බඩු විස්සේ සම ඒකක 8,676ක් හා පෞද්ගලික නැව්බඩු විස්සේ සම ඒකක 1,076ක් බහළුගත නැව්බඩු ගුදම්ගත කිරීමේ මෙහෙයුම් වශයෙන් පැලියගොඩ බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේදී සමස්ත බහළු 8,478 ක් මෙහෙයවන ලද අතර, දේශීය නැව්බඩු, ප්‍රතිඅපනයන නැව්බඩු, විවිධ රාජ්‍ය සඳහා එක්රැස් කරන නැව්බඩු (MCC) සඳහා සහ විශේෂ නැව්බඩු වර්ග මෙහෙයුම් තුළින් රුපියල් මිලියන 257.94ක් උපයා ඇති අතර වරාය තුළ ගුදම් පහසුකම් සපයමින් අර්ධ පූර්ණ බහළුගත නැව්බඩු ගුදම්ගත කිරීමේදී රුපියල් මිලියන 1,883.3ක් උපයා ඇත. විවිධ රාජ්‍ය සඳහා භාණ්ඩ එක්රැස් කිරීම වෙනුවෙන් උපයන ලද ආදායම රුපියල් මිලියන 207.46ක් විය. මීට අමතරව, හිස් බහළු වෙනුවෙන් වූ ප්‍රමාද ගාස්තු වශයෙන් සහ බහළුවල තත්ත්වය වෙනස් කිරීමේ (Change of status of Containers) ගාස්තු වශයෙන් රුපියල් මිලියන 21.61ක ආදායමක් උපයා ඇත.

බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේ V වන ගුදම (CFS-V) අළුත්වැඩියා කිරීම මගින් බැඳුම්කර නැව්බඩු ගුදම් පහසුකම් වැඩි කිරීමත් සමඟ බැඳුම්කර වෙළඳාම සඳහා තිබූ ඉල්ලුම වැඩි වූ අතර, එමගින් රුපියල් මිලියන 82.21 ක මුළු ආදායමක් උපයා ඇත.

අත්හැර දැමූ නැව්බඩු ටෙන්ඩර් කැඳවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මගින් රුපියල් මිලියන 197.72ක ආදායමක් උපයා ඇති අතර, සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශක සේවා සමාගම මගින් අබලි යකඩ, ඉවතලන තෙල් සහ පාවිච්චි කල ටයර් විකිණීමෙන් රුපියල් මිලියන 6.94ක අමතර ආදායමක් උපයා ඇත.

වර්ෂය තුළ දී, නිශ්කාෂන නියෝජිතායතන වෙත සමස්ත බලපත්‍ර 1,268ක් වන සේ එනම් නව බලපත්‍ර 168ක් නිකුත්කිරීම මගින් හා නිකුත් කල බලපත්‍ර 1,100ක් අළුත්කිරීමෙන් රුපියල් මිලියන 26.83ක ආදායමක් උපයා ඇත. "ඒ" සහ "බී" කාණ්ඩයේ වාප්පු ලිපිකරුවන් හට වාප්පු හැඳුනුම්පත් නිකුත් කිරීමෙන් සහ අළුත්කිරීමෙන් රුපියල් මිලියන 8.90ක ආදායමක් උපයා ඇත. වර්ෂය තුළ නිකුත්කරන ලද හා අළුත්කරන ලද "ඒ " කාණ්ඩයේ බලපත්‍ර සංඛ්‍යාව 2,752ක් ලෙස වාර්තා වී ඇති අතර, නිකුත් කරන ලද "බී" කාණ්ඩයේ බලපත්‍ර සංඛ්‍යාව 304ක් ලෙස වාර්තාවී ඇත.

2018 වර්ෂය තුළ දී සේවා සැපයුම් කොට්ඨාශය විසින් සපයන ලද සේවාවන් තුළින් උපයන ලද සමස්ත ආදායම රුපියල් මිලියන 4,831.1කි.

2018 වර්ෂය තුළ දී ප්‍රේෂණලාභීන් විසින් ගාස්තු සහන සඳහා වරාය හා නාවික අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කෙරුණු ඉල්ලුම්පත්‍ර 19න් 08ක් නිර්දේශ කරන ලද අතර, 09ක් ප්‍රතික්ෂේප කරන ලදී. ඉතිරි ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු අමාත්‍යාංශයේ තීරණ වලට යටත්ව සිදු කරනු_ඇත.

අර්ධ පූර්ණ බහළුගත නැව්බඩු හා සෘජුව භාරදෙන නැව්බඩු වලට අදාල ලේඛන විද්‍යුත් මාර්ගයෙන් නිකුත් කිරීමේ පහසුකම් 2018 වර්ෂය තුළදී පුළුල් කිරීමට පියවර ගනු ලබමින් පවතී. 2019 වර්ෂය තුළදී මෙය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනු ඇත.

**2018 වර්ෂය තුළ සිදු කල වැඩි දියුණු කිරීම් හා සංවර්ධන කටයුතු**

- CFS I ගුදම සඳහා අර්ධ පූර්ණ බහළු නැව්බඩු කළමනාකරණ පද්ධතිය (CMS) හඳුන්වා දී ඇති අතර සේවාලාභීන්ගේ පහසුව සඳහා මාර්ග ගත ක්‍රමය හරහා බහළුගත භාණ්ඩ ගුදම්ගත කිරීම (de-stuffing) සහ මුදල් ගෙවීමේ පහසුකම් සලසන ලදී.

- සියළුම අර්ධ පූර්ණ බහළු සඳහා මාර්ගගත ක්‍රමය හරහා නෞභාර ලේඛනය ප්‍රදර්ශය කිරීම ක්‍රියාත්මක කරන ලදී.
- ශ්‍රී ලංකා රේගුවේ නේවීස් සහ ආසිකුඩා පරිගණක පද්ධති සමෝධානය කිරීම මගින් පූර්ණ බහළු බෙදාහැරීමේ ක්‍රියාවලිය සරල කරන ලදී.
- CFS I ගුදම තුළ ආරක්‍ෂක කැමරා පද්ධතියක් (CCTV) ස්ථාපිත කර ඇති අතර නැව්බඩු වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා බණ්ඩාරනායක ජැටි ගුදම තුළද ආරක්‍ෂක කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
- සමගි බහළු පර්යන්තයට යාබදව සියළු පහසුකම් සහිත අංග සම්පූර්ණ සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
- විකුණුම් අංශයේ කාර්යක්ෂමතාවය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස ගුදම්, ඉවත දමන නැව්බඩු වලින් තොරව පවත්වාගෙන යාමට හැකි වී ඇත.
- පුද්ගලික නැව්බඩු මෙහෙයුම් ප්‍රදේශය සහ එහි සේවාවන් වැඩි දියුණු කිරීම (පැලියගොඩ)

## නාවික කොට්ඨාශය

### නියමු සේවා

සමාලෝචිත වර්ෂය තුළදී කොළඹ වරායට පැමිණි සියළුම වර්ගයේ නෞකා සඳහා සතියේ පැය 24 පුරා නියමු සේවා සපයන ලදී.

| නෞකා වර්ගය | නෞකා සංඛ්‍යාව | පැමිණි කාර්යය | නෞකා සංඛ්‍යාව |
|---|---:|---|---:|
| බහළු නෞකා | 3,739 | නැව් තෙල් සැපයීම සඳහා | 33 |
| සාම්ප්‍රදායික භාණ්ඩ | 51 | අළුත්වැඩියා කටයුතු සඳහා | 50 |
| වියළි තොග භාණ්ඩ | 153 | මගී ප්‍රවාහනය සඳහා | 55 |
| ද්‍රව තොග | 210 | වෙනත් සේවා ලබාගැනීම සඳහා | 8 |
| රෝල් ඔන් රෝල් ඕෆ් | 31 | | |
| වෙනත් නැව්බඩු ප්‍රවාහන | 01 | | |
| **එකතුව** | | | **4,331** |

### ප්‍රධාන වග් යාත්‍රාපති අංශය (CMT)

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය නෞකා සඳහා කාර්යක්‍ෂම සහ අඛණ්ඩ ටග් යාත්‍රා සේවාවන් ලබාදෙමින් සතුටුදායක ලෙස ක්‍රියාත්මක වන ලදී. එම අංශයේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- යාත්‍රා කරමින් පවතින අවස්ථාවලදී නෞකා සඳහා මෙහෙයුම් ටග් යාත්‍රා සැපයීම.
- වර්ගීකරණ අවශ්‍යතා පරිදි නෞකා තට්ටු (Deck) අළුත්වැඩියා කිරීමේ සහ ටග් යාත්‍රාවල නඩත්තු කටයුතු සිදු කිරීම.
- ඉවත ලන නැව් බඳින කඹ භාවිතා කර ටග් යාත්‍රා සඳහා ලණු පැදුරු සහ කැන්වස් වියන් (awnings) නිෂ්පාදනය කිරීම.

නෞකා එහා මෙහා ගෙනයෑම සඳහා ප්‍රමාණවත් ටග් යාත්‍රා සංඛ්‍යාවක් දෛනිකව යොදවන ලද අතර හදිසි අවශ්‍යතාවයන් සඳහා එක් ටග් යාත්‍රාවක් පොරොත්තු සේවයේ යොදවන ලදී.

**ටග් යාත්‍රා සේවය යොදවන ලද මුළු නෞකා ගණන**

නැංගුරම් ටග් යාත්‍රා මගින් නෞකා එහා මෙහා ගෙනයන ලද මුළු වාර ගණන 17,194ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| ටග් යාත්‍රාවේ නම | වාර ගණන |
|---|---:|
| MT Raja | 05 |
| MT Nandimithra (55 BP) | 2,553 |
| MT Suranimala (65 BP) | 3,036 |
| MT Gotaimbara (65 BP) | 2,433 |
| MT Vijayabahu | 1,783 |
| MT Barana – II | 43 |
| MT Airawana | 1,315 |
| MT Ravana | 3,013 |
| MT Pandukabhaya | 3,013 |
| **එකතුව** | **17,194** |

**කොළඹ වරායේ කුලී පදනම මත සේවයේ යොදවා ඇති ටග් යාත්‍රා**

- Tug Hercules
- Tug Push Hardy
- Tug Push Husky

**ත්‍රිකුණාමලය**

- M/T. Sinhabahu
- M/T. Neelamaha
- M/T. Mahasen
- M/T. Therapuththabaya

**ගාල්ල වරාය**

- M/T. Kanchadeva

**කන්කසන්තුරය වරාය**

- M/T. Indra

**ටග් යාත්‍රා සේවා සැපයීමෙන් උපයන ලද ආදායම (කොළඹ වරාය)**

| වර්ෂය | රු. මිලියන |
|---|---:|
| 2017 තත්‍ය ආදායම | 872.33 |
| 2018 සංශෝධිත ආදායම | 998.03 |
| 2019 ප්‍රක්ෂේපිත ආදායම | 1092.70 |

**ප්‍රධාන ඉංජිනේරු නිලධාරී අංශය**

**කාර්ය මණ්ඩලය**

සියළුම ටග් යාත්‍රා, නියමු යාත්‍රා සහ මුවරිං දියත් යාත්‍රාවල මෙහෙයුම් හා අළුත්වැඩියා අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා 2018 වර්ෂයේදී ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නිරත විය.

යාත්‍රා ඇදගෙන යාම සහ නියමු මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය කරන යාත්‍රා සඳහා යොදවනු ලබන දෛනික ගමන්වාර වලට අමතරව මෙම අංශයේ කාර්ය මණ්ඩලය විසින් එදිනෙදා ඉටු කලයුතු නඩත්තු කටයුතු සිදුකරන ලදී.

කළමනාකාරීත්වයේ නිර්දේශය මත, වැඩපොළකට අවශ්‍ය ආම්පන්න සපයන අතරම ටග් යාත්‍රාවල එදිනෙදා නඩත්තු කටයුතු තවදුරටත් සිදු කිරීමට ප්‍රධාන ඉංජිනේරු නිලධාරී අංශය සූදානම්ව සිටී.

**වරාය ගිනි නිවීමේ ඒකකය (PFB)**

ස්වකීය ගිනි ආරක්ෂක ප්‍රමිතීන් ක්‍රියාත්මක කරමින් හා පවත්වාගෙන යන අතරම ගින්නෙන් හා වෙනත් හදිසි ආපදාවන්ගෙන් සිදුවන හානි අවම කරමින් 2018 වර්ෂය තුළදී ගිනි නිවීමේ ඒකකය විසින් කාර්යක්ෂම හදිසි සේවා ඉටු කරනු ලැබ ඇත.

සමාලෝචිත වර්ෂය තුළ වරාය ගිනි නිවීම් ඒකකය විසින් පහත සඳහන් සේවාවන් ඉටු කරන ලදී.

| | |
|---|---|
| ප්‍රතිචාර දක්වන ලද ගිනි නිවීම් | 21 |
| නාවික හමුදා පෙරහුරු සඳහා කැඳවීම් | 02 |
| තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 190 |
| ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 38 |
| නැව්වල අධිතාප වැඩ සඳහා පොරොත්තු රාජකාරි | 580 |
| අන්තරාදායක නැව්බඩු මෙහෙයවීමේ පොරොත්තු රාජකාරි | 06 |
| ජැටි/ගුදම් ආදිය සේදීම සඳහා ජලය සැපයීම | 46 |
| ජලය පිටතට පොම්ප කිරීම | 02 |
| තෙල් දූෂණය පාලනය කිරීමේ කාර්යයන් | 18 |
| තෙල් නැව් පරීක්ෂණ චාරිකා | 660 |
| ටග් යාත්‍රා සඳහා ගිනි නිවීමේ ජල බවුසර් සැපයීම | 192 |
| හදිසි අවස්ථාවකදී එම ස්ථානයෙන් පුද්ගලයන් ඉවත් කිරීමේ පෙරහුරු | 13 |
| හදිසි කැඳවීම් | 31 |

**ගිනි නිරාපද ක්‍රියාකාරකම්**

- සියළුම ගොඩනැගිලි/දොඹකර/නෞකා ආදියෙහි ගිනි ආරක්ෂණ උපකරණ පරීක්ෂා කිරීම් සිදු කරන ලදී.
- කොළඹ වරායේ සහ ගාලු වරායේ සවිකර ඇති ගිනි නිවීමේ උපකරණ වසරකට දෙවරක් පරීක්ෂා කරන ලද අතර ප්‍රදීපාගාර සහ සංචාරක බංගලාවන්හි හා ත්‍රිකුණාමල වරායේ සවිකර ඇති ගිනි නිවන උපකරණ වසරකට එක් වරක් පරීක්ෂා කර සේවා කරන ලදී.
- වසර තුළ පරීක්ෂා කර සේවා කරන ලද ගිනි නිවීමේ උපකරණ සංඛ්‍යාව 3,002 ක් විය.

- තෙල් බැංකුවේ ආදර්ශ ගින්නක් ඇති කර කොළඹ ගිනි නිවන හමුදාව සමඟ ඒකාබද්ධ ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.
- එස්ඒජීටී(SAGT) හි ආදර්ශ ගින්නක් ඇති කර එහි කාර්යමණ්ඩලය සමඟ ඒකාබද්ධ ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.
- සීඅයිසීටී (CICT) හි ආදර්ශ ගින්නක් ඇති කර එහි කාර්යමණ්ඩලය සමඟ ඒකාබද්ධ ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.

**ආදායම**

2018 වර්ෂය තුළ වරාය ගිනි නිවීමේ ඒකකය විසින් උපයන ලද ආදායම පහත දැක්වේ.

| **විස්තරය** | **ඇ.එ.ජ.ඩො.** | **රුපියල්** |
|---|---|---|
| ගිනි නිවීම් සඳහා කැඳවීම් | 12,950.00 | 91,500.00 |
| ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 54,840.00 | |
| තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 283,372.00 | |
| අධිතාප වැඩ සඳහා පොරොත්තු රාජකාරි | 32,190.50 | |
| අන්තරාදායක නැව්බඩු සඳහා පොරොත්තු රාජකාරි | 2,540.00 | 30,000.00 |
| පරීක්ෂණ නිල ගමන් සඳහා අයකිරීම් | 8,300.00 | |
| තෙල් දූෂණ මැඩ පැවැත්වීම සඳහා අයකිරීම් | 4,700.00 | 1,010,375.00 |
| හදිසි අවස්ථා | 540.00 | 10,000.00 |
| **මුළු ආදායම** | **399,432.50** | **1,141,875.00** |
| ඇ.එ.ජ.ඩො. **399,433.50 x 183.00** | **73,096,330.00** | **1,141,875.00** |
| **මුළු ආදායම** | **ශ්‍රී ලංකා රුපියල් 74,238,205** | |

**වරාය නිරාපද අංශය**

වරාය නිරාපද අංශය මගින් වරාය තුළ මෙහෙයවන සියළුම වර්ගයේ අනතුරුදායක නැව්බඩු පිළිබඳ වාර්තා තබා ගන්නා අතර සෑම විටම සුරක්ෂිත මෙහෙයුම් ක්‍රම අනුගමනය කරන බවට සහතික වනු ලැබේ.

රසායනික ද්‍රව්‍ය කාන්දු වීම සහ ගිනි ගැනීමේ සිද්ධීන් ගණනාවක් වරාය ගිනි නිවීම් ඒකකයේ සහයෝගයෙන් මැඩ පවත්වන ලදී. එමෙන්ම, අන්තරාදායක නැව්බඩු ගුදම් ඇතුළු සියළුම ගුදම් සහ බහළු පරීක්ෂා කිරීමේ කටයුතු කාලානුරූපව සිදුකරන ලදී.

අධිතාප වැඩ සඳහා අවසර ලබාදීමට ප්‍රථම වැඩබිම් පරීක්ෂණ කිරීම් සිදු කරන අතර අනවසර අධිතාප වැඩ සිදුකරන සිද්ධීන් අනාවරණය කර ඒවා නවත්වන ලදී. තවද, සමුද්‍ර දූෂණ සම්බන්ධයෙන් ද පරීක්ෂණ සිදුකරන ලදී. සේවක හා සමුද්‍රීය පරිසරයට අදාළව සිදුවූ හදිසි අනතුරු සිද්ධීන් පිළිබඳ විමර්ශන හා විශ්ලේෂණයන්ද සිදු කරන ලදී.

- කොළඹ වරායට නෞකා 5,508ක් පැමිණ ඇති අතර ඒවායින් අන්තරාදායක නැව්බඩු සහ දේශීය නැව්බඩු මෙ.ටො. 445,382.145ක් ගොඩබාන ලද අතර ප්‍රතිනැව්ගත නැව්බඩු වශයෙන් මෙ.ටො. 891,186.318ක් ගොඩබාන ලදී.
- ප්‍රතිනැව්ගත අනතුරුදායක ප්‍රතිනැව්ගත නැව්භාණ්ඩ බහළුම් 39,010 ක් මෙහෙයවන ලදී.
- අධි පුපුරණ ද්‍රව්‍ය (GPIE) මෙ.ටො. 8,715ක් සහ පුපුරණ ස්වභාවයේ ද්‍රව්‍ය (GP IAE/IIE) මෙ.ටො. 6,774.742ක් මෙහෙයුම් කරන ලදී.
- අන්තරාදායක නැව්බඩු ගුදම් ඇතුළුව අනිකුත් ගුදම් පරීක්ෂාව සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහය ඇතිව කාලානුරූපව සිදු කරන ලදී.

- අධිතාප වැඩ සඳහා අවසර ලබාදීමට අවශ්‍ය පරීක්ෂා කිරීම් සහ සමුද්‍ර දූෂණය ඇතිවීම පරීක්ෂා කර බැලීම හා සමුද්‍ර දූෂණය ඇතිවීම වැලැක්වීම සඳහා මග පෙන්වීම හා අදාළ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණය කිරීම.
- මෙහෙයුම් කොට්ඨාශයේ සේවකයින් සඳහා වරාය තුළ අන්තරාදායක නැව්බඩු මෙහෙයුම් කිරීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම හා ඒ ආශ්‍රිත නිරාපද අංගය පිළිබඳ දේශන මාලාවක් අනුසාරයෙන් හඳුන්වාදෙන ලදී.
- සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහය ඇතිව, ජය බහළු පර්යන්තයේ සහ සමගි බහළු පර්යන්තයට අනුයුක්ත සේවකයන්ගේ සහ මූරිං කණ්ඩායම්වල (Mooring Gangs) පෞද්ගලික ආරක්ෂාව මෙන්ම විශේෂයෙන්ම පෞද්ගලික ආරක්ෂක උපකරණ භාවිතා කිරීම අධීක්ෂණය කරන ලදී.
- සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහාය ඇතිව ද්‍රව පෙට්‍රෝලියම් වායු සහ පෙට්‍රෝලියම් තෙල් ගොඩබෑමේ කටයුතු නිරතුවරුව අධීක්ෂණය කරන ලදී.
- සමුද්‍රීය දූෂණ අධිකාරියේ (MEPA ) අනුමැතිය ඇතිව කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරනු ලබන කසල සහ අපිරිසිදු තෙල් (Sludge Oil) ඉවත් කිරීමේ කටයුතු නිරතුරුවම අධීක්ෂණය කරන ලදී.
- සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහය ඇතිව ජය බහළු හා සමගි බහළු පර්යන්ත අංගණයේ අන්තරාදායක නැව්බඩු අඩුක් කිරීම(Stacking) අඛණ්ඩ පරීක්ෂාවට ලක් කරන ලදී. අන්තරාදායක නැව්බඩු ප්‍රකාශ නොකිරීම සම්බන්ධයෙන් නැව් නියෝජිතවරුනට විරුද්ධව ක්‍රියාමාර්ග ගනු ලැබීය.
- අන්තර්ජාතික සමුද්‍රීය අන්තරාදායක භාණ්ඩ (IMDG) පිළිබඳ නීති සංග්‍රහයේ 37-2014 සංශෝධනය ප්‍රකාරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අන්තරාදායක නැව්බඩු උපලේඛනය (Schedule of Dangrous Goods) යථාකාලයේදී ප්‍රකාශයට පත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.
- වරාය නිරාපද අංශයේ සහය ඇතිව මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් අන්තර්ජාතික සමුද්‍රීය ආයතනයේ විගණනය (කේතය iii) සඳහා අවශ්‍ය පරිදි වරාය තුළ අන්තරාදායක නැව්බඩු මෙහෙයුම් කිරීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය පිළිබඳව මෙන්ම ඒ ආශ්‍රිත නිරාපද අංගයන් පිළිබඳව පුහුණු පාඨමාලාවන් පවත්වන ලදී.

විවිධ වර්ගයේ තෙල් නැව් 308ක් කොළඹ වරායට පැමිණි අතර එම නැව්වලින් ගොඩබාන ලද නැව්බඩු පහත පරිදි වේ.

| **නැව් භාණ්ඩ වර්ගය** | **ප්‍රමාණය (මෙ.ටො.)** |
|---|---:|
| ද්‍රව පෙට්‍රෝලියම් වායු | 407,763.577 |
| ගෑස් ඔයිල්/ජෙට් *AI*/ගැසොලින්/භූමිතෙල් | 3,111,037.538 |
| බොර තෙල් | 1,529,550.000 |
| ඉන්ධන ඔයිල් | 904,323.053 |
| ලිහිසි තෙල් | 6,170.000 |

**වෙරළ ප්‍රදීපාගාර අංශය**

ප්‍රධාන ජාත්‍යන්තර නෞකා මාර්ග හරහා විහිදෙන දකුණු හා බස්නාහිර වෙරළ තීරය දිගේ පිහිටුවා ඇති ප්‍රදීපාගාර නිසි පරිදි නඩත්තු කිරීම සිදු කරන ලදී.

**ප්‍රවේශ ඇළ මාර්ගයන්හි ස්ථාපිත ආලෝක බෝයා**

ආලෝක බෝයා නිරන්තර පරීක්ෂාවට ලක්කර නිසිලෙස නඩත්තු කරන ලදී. ආලෝක බෝයා නිසිලෙස ක්‍රියාත්මක නොවන අවස්ථාවල නාවිකයන් වෙත ඒ බව ලංකා නැව් නියෝජිතයන්ගේ සංගමය (CASA), නෞකා මෙහෙයුම්කරුවන්ගේ සංගමය (SLAVO), ලංකා නැව්

මෙහෙයුම්කරුවන්ගේ සංගමය (LASO) සහ එක්සත් රාජධානියේ ජල ශාස්ත්‍රීය සමීක්ෂණ කොට්ඨාශය වෙත චක්‍රලේඛ මගින් දැනුම් දෙන ලදී.

**ආදායම – ප්‍රදීපාගාර ගාස්තු - වරායයන් තුනෙහි**

| | 2016<br>තත්‍ය ආදායම<br>රු. මිලියන | 2017<br>තත්‍ය ආදායම<br>රු. මිලියන | 2018<br>අයවැය<br>(ප්‍රතිශෝධිත)<br>රු. මිලියන |
|---|---|---|---|
| ආදායම- ප්‍රදීපාගාර ගාස්තු | 1,073.23 | 1,164.89 | 1,372.10 |

**වරාය යාත්‍රා අංශය**

වරාය යාත්‍රා අංශයේ කාර්යය වන්නේ ප්‍රධාන වශයෙන් කොළඹ වරායට පැමිණෙන නෞකා ආරක්ෂිතව බැඳ තැබීම/මුදා හැරීම සඳහා සහාය වීම පහසු කරවීම සඳහා නියමු දියත් යාත්‍රා සඳහා යාත්‍රා බැඳ තැබීමේ කණ්ඩායම් සැපයීම, දූපත් දියකඩනය, නිරිත දිග දියකඩනය වෙත විවිධ වැඩ කණ්ඩායම් ප්‍රවාහනය කිරීම, වරාය තුළ ජලය පිරිසිදුව තබා ගැනීම සහ පීරාෆ් පාවෙන දොඹකර මගින් විශාල බර එසවීම් මෙහෙයවීමේ කටයුතු සිදු කිරීමය. නියමු දියත් යාත්‍රාවල සහ මුවරින් දියත් යාත්‍රාවල එදිනෙදා නඩත්තු කටයුතු ද සාර්ථක ලෙස සිදු කරනු ලැබේ.

**ජල ශාස්ත්‍රීය සමීක්ෂණ අංශය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයුම් කරනු ලබන සියළුම වරායයන්හි ජල ශාස්ත්‍රීය සමීක්ෂණ කටයුතු මෙන්ම අදාළ කොට්ඨාශ මගින් කරන ලද ඉල්ලීම් අනුව සියළුම ඉඩම් මැනීමේ කටයුතු ද මෙම අංශයේ මිනින්දෝරුවන් විසින් සිදු කරන ලදී.

**කොළඹ වරාය**

- ප්‍රවේශ ඇළ මාර්ගයේ ධ්වනි ගැඹුර මැනීම.
- දකුණු වරායේ ධ්වනි ගැඹුර මැනීම.
- ඇතුල් වරාය ද්‍රෝණියේ හා නැංගුරම් පොළවල ධ්වනි ගැඹුර මැනීම.
- ප්‍රවේශ ඇළ මාර්ගයේ බෝයාවන්හි පිහිටීම පිළිබඳ මිනුම් කටයුතු කිරීම.
- කොළඹ වරාය සිතියම සංශෝධනය කිරීම
- වරාය අභ්‍යාන්තර මාර්ගය පුළුල් කිරීමේ කටයුතු වල මිනුම් කටයුතු අධිවේගී ගුවන් මාර්ගයේ මිනුම් කටයුතු සහ තල මිතික කටයුතු සිදු කිරීම
- කල්බදු ගිවිසුම් සඳහා අවශ්‍ය මිනුම් කටයුතු සහ සැලසුම් කටයුතු කිරීම
- ජය බහළු පර්යන්ත – V(JCT – V) ව්‍යාපෘතිය සඳහා මිනුම් උපදේශක සේවා ලබාදීම.
- මහර ගල් වැඩපොළෙහි සීමා මායිම් මැනීම සහ සීමා සලකුණු කිරීම සිදු කිරීම.
- වරාය නගරයේ සීමා සලකුණු කිරීම.
- කොළඹ උදම් දත්ත මධ්‍යස්ථානයේ නිරීක්ෂණ කටයුතු සහ නඩත්තු කටයුතු සිදු කිරීම.

**ගාල්ල වරාය**

- ගාල්ල වරායේ උදම් රළ සහ කාලගුණික දත්ත මධ්‍යස්ථානයේ නිරීක්ෂණ කටයුතු සහ නඩත්තු කටයුතු සිදු කිරීම.
- ගාල්ලේ ඉඩම් කමිටු රැස්වීම් වලට සහභාගී වීම.
- කල්බදු ගිවිසුම සඳහා මිනුම් සහ සැලසුම් කටයුතු සිදු කිරීම.

- ප්‍රධාන දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා භූ ලක්ෂණ (Topographic) සමීක්ෂණය සිදු කිරීම.
- නේවාසික බංගලා වශයෙන් භාවිතා කල හැකි නිවාස මිලදී ගැනීම පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ කමිටුවේ වැඩ කටයුතු සිදු කිරීම.
- වරාය හැරිමේ කටයුතු නඩත්තු කටයුතු කිරීම සඳහා ඇතුල් වරාය ද්‍රෝණිය සහ ප්‍රවේශ ඇළ මාර්ගයේ ධ්වනි ගැඹුර මැනීම සිදු කිරීම.

**ත්‍රිකුණාමල වරාය**

- කල්බදු සැලසුම් සකස් කිරීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කිරීම.
- උදම් සහ කාලගුණික විද්‍යා දත්ත මධ්‍යස්ථානය නිරීක්ෂණය කිරීම හා නඩත්තු කිරීම.
- අනවසරයෙන් අල්ලාගත් ඉඩම් බිම් කට්ටි 150 කට වඩා වැඩි ප්‍රමාණයක මිනුම් කටයුතු සිදු කිරීම.
- නැගෙනහිර පලාත් ආණ්ඩුකාරවරයා විසින් ක්‍රියාත්මක කරන ලද ත්‍රිකුණාමලයේ ඉඩම් වැඩසටහනට සහභාගී වීම.
- ඩ්‍රෝන කැමරා සමීක්ෂණයේ විමර්ශන සහ දත්ත විශ්ලේෂණ කමිටුවට සහභාගී වීම.

**හම්බන්තොට වරාය**

- ප්‍රවේශ ඇළ මාර්ගයන්හි බෝයාවල පිහිටීම පිළිබඳව සමීක්ෂණ සිදු කිරීම.
- මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරා ඇති නිර්මිත මුහුදු ප්‍රදේශයන්හි මිනුම් කටයුතු සිදු කිරීම.
- ව්‍යාපෘති ඉංජිනේරුවන් විසින් පවරන ලද වෙනත් අදාළ මිනුම් කටයුතු සිදු කිරීම.

**කන්කසන්තුරේ වරාය**

- කන්කසන්තුර වරායේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මිනුම් කටයුතු සිදු කිරීම.
- නව ජැටියේ ජල ශාස්ත්‍රීය සමීක්ෂණය සහ තලමිතික කටයුතු සිදු කිරීම
- වරාය සීමාව සහ නව ගේට්ටු සංකීර්ණය සවිකිරීමේ කටයුතු සිදු කිරීම.
- කන්කසන්තුර වරාය සඳහා පිළියෙල කරන ලද විස්තරාත්මක ලේඛන ගැසට් පත්‍රයේ පල කිරීම.

**ඔලුවිල් වරාය**

- වන්දි ලබාදීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුවේ කටයුතු සිදු කිරීම.
- නැවත පදිංචි කිරීමට සුදුසුයැයි හඳුනාගත් පුද්ගලයන් වෙනුවෙන් නැවත පදිංචි කිරීමේ සමීක්ෂණ පැවැත්වීම.
- වරාය පිවිසුම් මාර්ගයෙහි ජල ශ්‍රාස්ත්‍රීය සමීක්ෂණ සහ තලමිතික කටයුතු සිදු කිරීම.
- අමාත්‍යවරයා විසින් සැලසුම් කරන ලද ඔලුවිල් වරාය විශේෂ කමිටු රැස්වීමට සහභාගී වීම.

**නාවික අංශය**

නැව් සේවා සපයන්නන්, දියත් යාත්‍රා ක්‍රියාකරවන්නන්, සමුද්‍රීය මිනින්දෝරුවන්, සුළු හා මහා පරිමාණ අළුත්වැඩියාවන් සිදු කරන වැඩහල්, තෙල් සහ තෙල් මිශ්‍රිත ජලය සහ අපවිත්‍ර ද්‍රව්‍ය එකතුකිරීමේ පහසුකම් සපයන්නන් සඳහා වාර්ෂික ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

| බලපත්‍ර වර්ගය | නිකුත් කළ ගණන | ආදායම (රු.) |
|---|---|---|
| නැව් අළුත්වැඩියා බලපත්‍ර | 141 | 13,503,332.49 |
| නැව් තටාකාංගන බලපත්‍ර | 65 | 2,818,017.59 |
| සමීක්ෂණ බලපත්‍ර (Survey Licence) | 40 | 3,414,621.78 |
| නැව් සේවා සැපයුම් බලපත්‍ර | 96 | 8,228,619.90 |
| බෝට්ටු බලපත්‍ර | 46 | 5,364,030.47 |
| එස්ජීටී සහ වෙනත් බලපත්‍ර | 12 | 541,053.76 |
| **එකතුව** | **Rs. 33,869,675.92** | |

## සංවර්ධන ව්‍යාපෘති

### සැලසුම් හා සංවර්ධන කොට්ඨාශය

**1. නැගෙනහිර බහළු පර්යන්තය - කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය**

**නැගෙනහිර බහළු පර්යන්තය - අදියර 1**

**ව්‍යාපෘතිය පිළිබඳ විස්තර**

මීටර් 1200ක දිගින් හා මීටර් -18ක ගැඹුරින් යුත් ජැටි බැම්මකින් යුක්ත, වාර්ෂිකව බහළු විස්සේ සම ඒකක මිලියන 2.4ක මෙහෙයුම් ධාරිතාවයක් සහිත නැගෙනහිර බහළු පර්යන්තය (ECT) දකුණු වරායේ දෙවන ගැඹුරු පර්යන්තය වේ. නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කොට මෙහෙයුම් කිරීම සඳහා; ඉදිකර, මෙහෙයුම් කර, පවරාදීමේ (BOT) සහනයක් ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. මේ වන විටත් නැගෙනහිර බහළු පර්යන්තයේ ජැටි බැම්මේ මීටර් 440ක් ද ඊට යාබඳ අංගණ ප්‍රදේශය සහ ඒ හා සම්බන්ධ පහසුකම් ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සංවර්ධනය කර ඇත.

**වර්තමාන ප්‍රගතිය**

2016 ජූනි මස 06 වන දින "අභිප්‍රාය ප්‍රකාශ කිරීම" (Expression Of Interest) පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය ප්‍රකාශයට පත්කිරීමත් සමඟ ව්‍යාපෘතියේ පූර්ව සුදුසුකම් ක්‍රියාවලිය ආරම්භ වූ අතර, 2016 සැප්තැම්බර් 20 දින අවසන් විය. අභිප්‍රාය ප්‍රකාශ කිරීම සඳහා කැඳවීම් 2016.09.20 දින අවසන් වූ අතර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව, ලැබී තිබුණු අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ අයදුම්පත් ඇගයීමට ලක් කරන ලදී.

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් 2016.11.23 සහ 2016.12.07 යන දිනයන්හි පැවැත්වූ රැස්වීම් වලදී ව්‍යාපෘතිය සඳහා ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා නව නිශ්චිත නිර්ණායකයන් අනුගමනය කළ යුතු බවට උපදෙස් දෙන ලදී. සමස්ත ලංසු ක්‍රියාවලියේදී අතිරේක තෝරාගැනීමේ නිර්ණායකයන් අනුගමනය කිරීමේ සෘණාත්මක ප්‍රතිඵල පෙන්වා දෙමින් ගරු වරාය හා නාවික අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් මෙම කරුණ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත යලි ඉදිරිපත් කිරීමට තීරණය කල අතර ලංසු ක්‍රියාවලිය 2016.12.21 දින සිට අක්‍රිය වී ඇත.

ආසියානු සංවර්ධන බැංකුව විසින් සකස් කරන ලද අනුග්‍රාහාත්මක ගිවිසුමේ මුල් කෙටුම්පත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමාලෝචනය කරන ලද අතර, ඒ පිළිබඳව වන මත ප්‍රකාශයන් ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කර ඇත.

කොළඹ වරායේ වැඩි ගැඹුරින් යුතු නව බහළු නෞකා නැංගුරම්පොළවල් සඳහා වන විභව අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, නැගෙනහිර බහළු පර්යන්තය - අදියර 1 හි මෙහෙයුම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට ගරු වරාය හා නාවික අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

## 2. ගාල්ල වරායේ සංවර්ධන ව්‍යාපෘති

### ගාලු වරායේ රුවල් යාත්‍රා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය හරහා ගාලු වරාය පුළුල් කිරීමේ ක්‍රියාවලියක ශ්‍රී ලංකා රජය නිරතව සිටී.

රජයේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ සංචාරක කර්මාන්තය හා වාණිජ කටයුතු සඳහා ප්‍රාදේශීය වරායක් ලෙස ගාලු වරාය සංවර්ධනය කිරීම වේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, දැනටමත් ඉදිකර ඇති රුවල් යාත්‍රා සඳහා පහසුකම් සැපයීමේ ප්‍රදේශය රුවල් යාත්‍රා මෙහෙයුම් කිරීම සඳහා සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.

ඉහත සඳහන් ව්‍යාපෘති පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. මෙම යෝජනා සඳහා ඉල්ලීමේ අරමුණ වනුයේ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් යෝජනා ලබා ගැනීම සහ ගාලු වරායේ රුවල් යාත්‍රා මධ්‍යස්ථානය මෙහෙයුම් කිරීම සඳහා ඒවා සැලසුම් කිරීම, ඉදි කිරීම, ක්‍රියාත්මක කර, මෙහෙයුම් කිරීම සහ පවරා දීමේ කටයුතු වල යෙදිය හැකි බව තහවුරු කරමින් ඒ සඳහා වන වාණිජමය, කළමනාකරණ, තාක්ෂණික සහ මූල්‍ය හැකියාව පෙන්නුම් කල හැකි විශ්වාසනීය ලංසුකරුවන් හඳුනාගැනීම වේ.

ඒ අනුව, ගාලු වරායේ රුවල් යාත්‍රා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා මුදල් යෙදවීම, සැලසුම් කිරීම, ඉදිකිරීම සහ මෙහෙයුම් කිරීම පෞද්ගලික අංශය විසින් සිදු කරනු ඇත. උසස් තත්ත්වයේ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව රුවල් යාත්‍රා පහසුකම් ඉදිකොට, මෙහෙයුම් කොට පවරාදීම ආයෝජකයාගේ වගකීම වේ. මෙයට රුවල් යාත්‍රා සංකීර්ණයක් (Marina Concession Complex) ඇතුලත් වන අතර, ආපනශාලා, වෙළෙඳ සැල් සහ ආශ්‍රිත සේවාවන්, රුවල් යාත්‍රා සංගම් සහ විනෝදාත්මක උත්සව සහ ප්‍රවර්ධන වැඩසටහන්, ආගන්තුක සත්කාරක සේවා සහ සියළුම ආශ්‍රිත සේවාවන් ලබා දීම මගින් යාත්‍රා කිරීම හා අදාළ සියළු විනෝදාත්මක කටයුතු සඳහා ගාල්ල වරාය ආකර්ෂණීය අන්තයක් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ.

යෝජනා ඉදිරිපත් කිරීමේ කාලය 2018 අගෝස්තු මස 21 වන දින අවසන් විය. ඒ අනුව, යෝජනා සඳහා ඉල්ලීම් ඇගයීමට ලක් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

## 3. මගී පර්යන්ත ව්‍යාපෘතිය (බණ්ඩාරනායක පාලම)

මුහුදු සංචාරය, විනෝදාත්මක කර්මාන්ත ක්ෂේත්‍රයේ සීග්‍රයෙන් දියුණු වෙමින් පවතින වෙළඳපොළ අංගයකි. එය නියමු ගාස්තු, නෞකා බැඳ තැබීමේ කටයුතු වැනි වරාය කටයුතු සමඟ ඉතා සමීපව බැඳී ඇති අතර, මගීන් සඳහා පහසුකම් සැලසීම වරාය බලධාරීන්ගේ වගකීම වේ. මෙම කර්මාන්තයේ සංවිධිත වර්ධනය සඳහා මෙම පහසුකම් සැපයීම සිදු කරන නමුත් එහි ස්වභාවික අලංකාරය දියුණු කිරීම සඳහා අනාගත සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීමට මෙම ක්ෂේත්‍රයේ වෙනත් මෙහෙයුම්කරුවන්ගේ දායකත්වය අවශ්‍ය වේ. මෙම පසුබිමේදී, පහසුකම් සංවර්ධනය සඳහා ආකෘතියක් ඇති කිරීමටද අදාළ සංචාරක සේවාවන් මෙහෙයවීම සඳහා ද ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වීමට, මෙම කර්තව්‍යයේදී මෙම කර්මාන්තයේ යෙදී සිටින ක්‍රියාකාරීන් අතුරින් වර්ධන හැකියාවන් හා අනාගත සැලසුම් වලින් යුක්ත අයවලුන් හඳුනාගැනීම අවශ්‍ය වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

## 4. ත්‍රිකුණාමල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

**ව්‍යාපෘති පිළිබඳ විස්තර හා වර්තමාන ප්‍රගතිය**

ත්‍රිකුණාමල වරායේ සෛද්ධාන්තික ප්‍රධාන සැලැස්ම (Conceptual Master Plan) කෙටි කාලීන සහ දිගු කාලීන ව්‍යාපෘති යෝජනා මත පදනම්ව සකස්කරන ලදී. "යෝජනා සඳහා කැඳවීම්" මගින් තෝරාගෙන නිර්දේශ කරන ලද ඕෂන්පික් සහ ඩීමෝ් සමාගම්හි ආයෝජන යෝජනා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව (CCEM) වෙත ඉදිරිපත් කර ඇති අතර, මත්ස්‍ය වගාව සඳහා වූ යෝජනාව ලේකම්වරුන්ගේ කමිටුව (SC) විසින් අනුමත කරන ලදී.

ත්‍රිකුණාමලය වරායේ සිට ගල් අඟුරු සහ ක්ලින්කර් දුම්රිය මගින් ප්‍රවාහනය කිරීම ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන ඇත. දුම්රිය මාර්ගය ඉදිකල යුතු මං තීරුව හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ත්‍රිකුණාමලය දිසාපති සහ දුම්රිය දෙපාර්තමේන්තුව ඒකාබද්ධව කටයුතු කරනු ලබයි. සමීක්ෂණ කටයුතු දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන අතර, මෙය නිමවූ පසු, අනාගත ප්‍රවේශ මාර්ගය සහ නැවත පදිංචි කිරීමේ සැලසුම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සකස් කරනු ඇත.

කොළඹ වරායේ CFS – 2 ගුදමේ වහල ව්‍යුහය සහ කුළුනු භාවිතා කර මීටර් 24 x මීටර් 96ක නව ගුදමක් ඉදි කිරීමේ කටයුතු අවසන් කර ඇත. නව ගුදම, ත්‍රිකුණාමල වරායේ අංක 2 සහ අංක 3 ගුදම් පිහිටා ඇති ස්ථානයේම ඉදිකර ඇති අතර, එය ගල් අඟුරු, ක්ලින්කර් සහ සාමාන්‍ය නැව්බඩු තැන්පත් කිරීමට භාවිතා කරනු ඇත.

පවත්නා අංක 6 ගුදම අබලන් තත්ත්වයේ පවතී. එමනිසා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අංක 06 ගුදම ඉවත් කර එම ස්ථානයේම මීටර 30 x මීටර 96 ක ප්‍රමාණයේ නව ගුදමක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මූලික වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

ත්‍රිකුණාමලය වරායේ ප්‍රවේශ ඇළ මාර්ගයේ වම්පස සහ දකුණුපස සඳහා ජලයේ ගිල්වා ඇති දම්වැල් භාවිතයෙන් බැඳ ඇති බෝයා ස්වයංක්‍රීයව දැල්වෙන සූර්ය බල ශක්තියෙන් ක්‍රියාකරන බල්බ 14 ක් සවිකිරීමට සැලසුම් කර ඇත. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රදීපාගාර ප්‍රතිසක්‍රීය කිරීමට නියමිතය. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ජපාන යෙන් බිලියන 01 කි. ව්‍යාපෘතිය ක්‍රියාත්මකව පවතී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් සඳහා ඩ්‍රෝන සමීක්ෂණය (Drone Survey) අවසන් කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් හඳුනාගැනීමේ ක්‍රියාවලියක ශ්‍රී ලංකා වරාය අධිකාරිය නිරතව සිටී.

## 5. කන්කසන්තුරේ වරාය සංවර්ධනය (KKS)

**ව්‍යාපෘතිය පිළිබඳ විස්තර සහ වර්තමාන ප්‍රගතිය**

කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව කන්කසන්තුරේ වරායේ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත අක්කර 30ක ඉඩමක් පවරා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එයින් අක්කර 15ක් මූලිකව ආරක්ෂක වැටක් ඉදිකර ගේට්ටුවක් සහ ගුදම් පහසුකම් සහිතව වරාය මෙහෙයුම් ආරක්ෂාකාරීව සිදු කිරීමට අනුමත කරනු ලැබේ.

මෙම ප්‍රදේශ සඳහා මිණුම් සිතියම (Survey Map) යාපනයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු අතර සීමා වැට/තාප්පය ඉදිකර ගේට්ටු ව්‍යුහය සහ ගුදම ඉදිකිරීම සඳහා මිණුම් සිතියම ලබාගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අපේක්ෂා කෙරේ.

## 6. ජාතික වරාය ප්‍රධාන සැලැස්ම

**ව්‍යාපෘතිය පිළිබඳ විස්තර සහ වර්තමාන තත්ත්වය**

ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවෙන් තාක්ෂණික සහාය ලබාගෙන ඇත. ඉහත තාක්ෂණික සහාය ඇතිව, ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාගැනීම වෙනුවෙන් ඇ.එ.ජ.ඩොලර් මිලියන 1.5ක ප්‍රදානයක් ලබාදීම මගින් වරාය ක්ෂේත්‍රයට සහාය පලකොට ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා 2016 නොවැම්බර් මස දී නෙදර්ලන්තයේ Maritime & Transport Business සමාගමේ (MTBS) සේවය මාස 18ක කාලසීමාවක් සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදී ඇත. ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ දී මෙම උපදේශකත්වයේ විෂය පථයට පහත සඳහන් කරුණු ඇතුළත් වේ.

(අ) ජාතික වරාය ඉදිරි ගමන්මග (NPD)
(ආ) කොළඹ වරාය සංවර්ධන සැලැස්ම
(ඇ) ත්‍රිකුණාමල වරාය සංවර්ධන සැලැස්ම
(ඈ) සේවා සැපයුම් සහ වරාය ආශ්‍රිත ප්‍රදේශ එකිනෙක හා සම්බන්ධ වීම සඳහා වන ප්‍රමුඛතා ව්‍යාපෘති
(ඉ) වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතියේ (Port Access Elevated Highway Project) අවසන් සැලැස්මේ තාක්ෂණික සමාලෝචනය

කොළඹ වරාය සහ ත්‍රිකුණාමලය වරාය පිළිබඳ පූර්ව ශක්‍යතා අධ්‍යයනය අදියර යටතේ අධ්‍යයනය සඳහා පහත සඳහන් කෙටිකාලීන ප්‍රමුඛතා ව්‍යාපෘති 08ක් මෙම අධ්‍යයනයේ දී හඳුනාගෙන ඇත. පූර්ව ශක්‍යතා අදියරේ දී, විෂය ක්ෂේත්‍රයේ නිර්වචනය, මූල්‍යමය ශක්‍යතාවය, ආර්ථික ශක්‍යතාවය සහ සංවර්ධන ආකෘතිය ඇතුළත් වනු ඇත.

**කොළඹ වරාය**

1. ජය බහළු පර්යන්ත නවීකරණ සැලැස්ම
2. කොළඹ වරායේ ද්‍රවීකරණය කරන ලද ස්වාභාවික වායු (LNG) මෙහෙයුම් කිරීම සහ ගබඩා කිරීම
3. කොළඹ වරායේ මගීන් සඳහා වෙන්වූ පර්යන්තය
4. වරාය ප්‍රජා පද්ධතිය (Port Community System)
5. බණ්ඩාරනායක ජැටියේ ගුදම් ප්‍රතිස්ථානගත කිරීමේ සැලැස්ම
6. විජය කුමාර ජැටිය නවීකරණය කිරීමේ සැලැස්ම

**ත්‍රිකුණාමලය වරාය**

1. අෂ්රොෆ් ජැටිය නවීකරණය කිරීම - අදියර I
2. ගැඹුරු මුහුදේ තෙල් ජැටිය

පූර්ව ශක්‍යතා අධ්‍යයන අන්තර්ගත කරමින් සියළුම අවසන් වාර්තා MTBS සමාගම විසින් ඉදිරිපත් කර ඇත.

## පිටත වරාය ව්‍යාපෘති කොට්ඨාශය

**කන්කසන්තුර වරාය ප්‍රතිසංස්කරණය කිරීම**

උතුරු පළාත සංවර්ධනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාරව, මූලික වරාය පහසුකම් ස්ථාපිත කිරීම සහ පුළුල් කිරීම සඳහා වාණිජ වරායක් ලෙස කන්කසන්තුරය වරාය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය තීරණය කර ඇත.

**ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුතු (ඉන්දියාවේ එක්සිම් බැංකුව විසින් ලබා දෙනු ලබන විදේශ ණය අරමුදල මගින් මුදල් යෙදවීමට නියමිතය)**

- කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය සඳහා ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 45.27ක මූල්‍යමය සහය ලබාදීම සඳහා 2018 ජනවාරි 10 වැනි දින ණය දීමේ ගිවිසුමකට ශ්‍රී ලංකා රජය ඉන්දියාවේ එක්සිම් බැංකුව සමඟ ගිවිසුමකට එළඹ ඇත.
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා රජය අතර ණය දීමේ ගිවිසුම 2018 ඔක්තෝම්බර් 17 දින අත්සන් කරනු ලැබ ඇත.
- ව්‍යාපෘතිය සඳහා සුදුසු ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරයෙකු එක්සිම් බැංකුව විසින් තෝරා ගැනීම සඳහා පූර්ව සුදුසුකම් ලේඛනය ඉපිළුම් කිරීම අවසන් කර ඇති අතර පූර්ව සුදුසුකම් ලත් පුද්ගලයින්ගේ නම් ලැයිස්තුවෙන් ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරයෙකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. 2019 ඔක්තෝම්බර් මසදී තෝරාගත් ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරයාට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නියමිතය.
- අනිශ්චිත කාර්යසටහන (Tentative Schedule) ප්‍රකාරව, ප්‍රධාන ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ ජූලි මස ආරම්භ කිරීමට නියමිතය.

**ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුතු පහසු කිරීම සඳහා වන මූලික සංවර්ධන කටයුතු ( ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුදල් භාවිතයෙනි)**

- ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ පහසුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ස්වකීය අරමුදල් භාවිතයෙන් ප්‍රාරම්භක සංවර්ධන කටයුතු කිහිපයක් සිදු කරමින් සිටී. සීමා වැට/තාප්පය සහ ගේට්ටු ව්‍යුහය ඉදිකිරීම 2018 ඔක්තෝම්බර් 18 දින ආරම්භ කල අතර රුපියල් මිලියන 8.5ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා ඇත. පවත්නා කාර්යාල ගොඩනැගිල්ල වෙනස් කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර සීමා තාප්පය ඉදිකිරීම සඳහා අත්තිවාරම් දැමීමට කැනීම් කටයුතු ආරම්භ කර ඇත.

**ත්‍රිකුණාමල වරාය සංවර්ධන ව්‍යාපෘතිය**

- ත්‍රිකුණාමල වරායේ තොග නැව්බඩු සඳහා පවතින ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා ත්‍රිකුණාමල වරායේ පවත්නා අෂ්රෆ් ජැටිය මීටර් 160කින් දීර්ඝ කිරීමට තීරණය කර ඇත.
- අවශ්‍ය මූලික අනුමැතීන් කළමනාකරණ කමිටුවෙන් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබා ගෙන ඇති අතර ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇත.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික කටයුතු ලෙස අෂ්රෆ් ජැටිය පුළුල් කිරීමේ කටයුතු සඳහා යෝජිත ප්‍රදේශය ආවරණය වන පරිදි "මූලික බිම් විමර්ශනයක්" (Borehole Investigation) සිදු කිරීමට අවශ්‍ය වේ. ඒ අනුව, මූලික බිම් විමර්ශනය සිදු කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා ලංසුකරුවෙකු තෝරා ගෙන ඇති අතර කටයුතු 2019 වර්ෂයේ මුල් භාගයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ඇත.

**හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ - II වන අදියර**

- ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘතිය පවරා දී ඇත. දෝෂ නිවැරදි කිරීම සඳහා වන වසරක කාල සීමාව (Defect Liability Period) ක්‍රියාත්මකව පවතින අතර රඳවුම් ගාස්තු 2019 වර්ෂයේදී මුදා හැරීමට නියමිතය.
- රජය විසින් දෙන ලද උපදෙස් පරිදි, 2017 ජූලි මස දී හම්බන්තොට වරාය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් මත මෙහෙයුම් කිරීම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සීමාසහිත චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග්ස් සමාගම සමඟ අනුග්‍රාහාත්මක ගිවිසුමකට එළඹ ඇත. ඒ අනුව, හම්බන්තොට වරායට අදාළ සියළුම වරාය මෙහෙයුම්/ වරාය වත්කම්/ පරිපාලන කටයුතු

හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම වෙත පවරා ඇත.

## කොන්ත්‍රාත් හා සැලසුම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදුකරනු ලබන සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ වරාය ආශ්‍රිත ව්‍යුහයන් සැලසුම් කිරීම කොන්ත්‍රාත් සහ සැලසුම් කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ජැටි බැම්, පාලම්, ගොඩනැගිලි සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන ව්‍යාපාර කටයුතු පහසු කිරීම සඳහා මාර්ග ආදී වරාය යටිතල පහසුකම් ඇතුළුව ව්‍යුහයන් සැලසුම් කිරීම ද මෙම කොට්ඨාශයට අයත් වේ. තවද, සියළුම ප්‍රාදේශීය වරායයන් ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම කොට්ඨාශයන්හි සියළුම නඩත්තු කටයුතු සහ සංවර්ධන ව්‍යාපෘති වල සැලසුම් කටයුතු කොන්ත්‍රාත් හා සැලසුම් කොට්ඨාශය විසින් ඉටුකරනු ලබයි. එම ව්‍යාපෘති වලට අදාළ ටෙන්ඩර් සම්බන්ධ කටයුතු, උපදේශක සේවා, ඉදිකිරීම් අධීක්ෂණය, තත්ත්ව පාලනය සහ කොන්ත්‍රාත් කළමනාකරණය ද ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

ඉහත සඳහන් කටයුතු වලට අමතරව, කොළඹ වරායේ සුළු ඉදිකිරීම් කටයුතු එහි සෘජු කම්කරු ශ්‍රමය යොදවා සිදු කිරීම ද මෙම කොට්ඨාශය විසින් සිදුකරනු ලැබේ.

2018 වසර තුළ මෙම කොට්ඨාශය මගින් සිදුකරන ලද ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු පහත සඳහන් පරිදි සාරාංශගත කෙරේ.

### 1. කොළඹ වරායේ අභ්‍යන්තර වරාය මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

දකුණු වරාය සංවර්ධන කටයුතු අවසන්වීමත් සමඟ වරාය පරිශ්‍රය තුළ ඇතිවිය හැකි යැයි අපේක්ෂා කරන මාර්ග තදබදයට මුහුණදීම සඳහා ඉඟුරුකඩේ මංසන්ධියේ සිට ගේට්ටු අංක 01 දක්වා දිවෙන මංතීරු 04කින් යුක්තව දැනට පවතින අභ්‍යන්තර වරාය මාර්ගය මංතීරු 06ක් දක්වා පුළුල් කිරීමට අවශ්‍යව ඇත. මාර්ගය පුළුල් කිරීමට සමගාමීව කොළඹ කොටුව ප්‍රදේශයේ ඇති පාලම් දෙක සහ වරාය පිවිසුම් මාර්ගයේ ඇති බ්ලූමැන්ඩල් මාර්ගය හරහා දිවෙන පාලම ද පුළුල් කිරීම අවශ්‍ය වේ.

මංතීරු 06ක් දක්වා මාර්ගය පුළුල් කිරීම සඳහා පවත්නා ගොඩනැගිලි, කාර්යාල, වැඩපොලවල් හා උපකරණ ආදිය කඩා ඉවත් කර වෙනත් ස්ථානයක ඉදිකළ යුතුව ඇත. වරාය අභ්‍යන්තර මාර්ගය පුළුල් කිරීමේ කටයුතු 2011 වසරේ දී ආරම්භ කරන ලද අතර, ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ කාර්යය සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති ප්‍රදේශයන්හි ඉදිකිරීම් කටයුතු, අදියර වශයෙන් සිදු කෙරෙමින් පවතී.

**ව්‍යාපෘති ප්‍රගතිය**

වරායේ අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීමේ කටයුතු අදියර වශයෙන් සිදු කර ඇත. 2018 වසර තුළදී රුපියල් මිලියන 81.79ක වැඩ කටයුතු (මූල්‍ය ප්‍රගතිය) අවසන් කර ඇත. 2018 දෙසැම්බර් මස දක්වා ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 847.89 කි.

CFS 3 සිට වෛද්‍ය මධ්‍යස්ථානය දක්වා මාර්ගය ඉදි කිරීම අවසන් කර ඇති අතර ඩොක්යාඩ් වංගුවේ සිට ද සේරම් ගේට්ටුව දක්වා මාර්ගය ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මකව පවතී.

හර්තාල් පාලමේ, බෝට්ටු අංගණයේ සිට ශ්‍රී ලංකා නාවික සේවා මධ්‍යස්ථානය දක්වා මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවූ අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි සංශෝධිත ටෙන්ඩර් ලේඛනය සමග 2019 වර්ෂයේදී මෙම ටෙන්ඩරය නැවත සොයා බලා යළි කැඳවීම සඳහා පියවර ගෙන ඇත.

## 2. වරාය පිවිසුම් මාර්ගය පුළුල් කිරීම

පාංශු පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර මාර්ගය පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම, දුර්වල පස/පීට් (Peat) තට්ටුවක් පවතින හෙයින් පස වැඩිදියුණු කිරීමට අවශ්‍ය බව හඳුනාගෙන ඇත. පස වැඩි දියුණු කිරීම සැලසුම් කිරීම සහ මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයෙන් (CECB) යෝජනාවක් ලබා ගෙන ඇත. වැඩ කටයුතු මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය වෙත ප්‍රදානය කර ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

පස සංවර්ධනය සඳහා මූලික වාර්තාව මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද අතර සැලසුම්/ නිර්මාණ අවසන් කිරීම සඳහා වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතියේ අවසන් අනුරේඛය (Final Trace) ලබා දෙන ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. කෙසේ නමුත්, 2018 මාර්තු 23 දින මාර්ග සංවර්ධන අධිකාරියෙන් එවා ඇති ලිපිය ප්‍රකාරව මෘදු පස සණ කිරීම සඳහා කරන ලද පාංශු පිළියම් පරීක්ෂණය (Soft Ground Treatment) ඔවුන් විසින් සිදු කරන ලද අතර යෝජිත වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය සමඟ වරාය ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීම සැලසුම් කරනු ඇත.

## 3. කොළඹ වරායේ පර්යන්ත/ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම

**බණ්ඩාරනායක ජැටිය ගල් අතුරා තාර දැමීම**

සමස්ත අංගණ ප්‍රදේශයම ගිලා බැසීමට ලක්ව ඇති හෙයින් බණ්ඩාරනායක ජැටියේ වැඩි දියුණු කිරීම් අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

බණ්ඩාරනායක ජැටියේ ගල් අතුරා තාර දැමීමේ කටයුතු - අදියර (I) 2017 වර්ෂයේ අවසන් කරන ලදී.

**ව්‍යාපෘති ප්‍රගතිය**

බණ්ඩාරනායක ජැටිය - අදියර II හි ගල් අතුරා තාර දැමීමේ කටයුතු රුපියල් මිලියන 28.05ක සමස්ත පිරිවැයකට 2018 වර්ෂයේදී අවසන් කරන ලදී.

## 4. ජය බහළු පර්යන්තයේ 3 වැනි පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීම - (M සහ N මංතීරු)

බහළු අඩුක් කිරීමේ ප්‍රදේශ සහ මාර්ග බොහෝමයක් ගිලා බැස්මට ලක්වී වළවල් සහිත ස්වභාවයකට පත්වී ඇති හෙයින් දැනට පවතින බහළු අඩුක් කිරීමේ අංගණය ද ඇතුළුව ජය බහළු පර්යන්ත - 3 හි ඇති මාර්ග ඇතුළු බහළු අඩුක් කිරීමේ අංගණය ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ. පර්යන්තයේ එදිනෙදා සිදු කෙරෙන බහළු මෙහෙයුම් කාර්යයන්ට බාධා නොවන අයුරින් ප්‍රතිසංස්කරණ කටයුතු අදියර වශයෙන් කරනු ලැබේ.

**ව්‍යාපෘති ප්‍රගතිය**

ජය බහළු පර්යන්තයේ 3 වැනි පර්යන්තයේ M සහ N මංතීරු ප්‍රතිසංස්කරණ කටයුතු රුපියල් මිලියන 49.68ක සමස්ත පිරිවැයකට 2018 වර්ෂයේ දෙවන කාර්තුවේදී අවසන් කරන ලදී.

## 5. විජය කුමාර ජැටිය ගල් අතුරා තාර දැමීම - අදියර II

විජය කුමාර ජැටියේ සමස්ත අංගණ ප්‍රදේශයම හානියට පත්වී ඇති අතර මතුපිට නැවත සකස් කිරීම සහ වැසි ජල ජලාපවහන කාණු පද්ධතිය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. වරාය මෙහෙයුම් සඳහා සිදුවන බලපෑම අවම කිරීම සඳහා අදියර දෙකක් යටතේ සංවර්ධන කටයුතු සැලසුම් කර ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

අදියර – I හි කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි මස රුපියල් මිලියන 37.6ක සමස්ත පිරිවැයකට ප්‍රදානය කල අතර වැඩ කටයුතු අවසන් කරන ලදී.

අදියර - II, සඳහා සැලසුම් හා නිර්මාණ කටයුතු අවසන් කර ඇති අතර ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී අවසන් වීමට නියමිතය.

## 6. බහළුගත නැව්බඩු මෙහෙයුම් මධ්‍යස්ථානයේ (CFS -02) වැඩ පොලවල් වෙනත් ස්ථානයකට රැගෙන යෑම

ඉඟුරුකඩේ මංසන්ධියේ සිට ගේට්ටු අංක 01 දක්වා දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් කාර්යාල, වැඩ පොලවල් සහ ගොඩනැගිලි වෙනත් ස්ථානයකට රැගෙන යාමට අවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව, යන්ත්‍රෝපකරණ වැඩපොලවල් දෙකක් සහ එක් විදුලි වැඩපොලක් CFS – 02 පිහිටි ප්‍රදේශයට ගෙන යනු ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

ටෙන්ඩර් කැඳවීම අවසන් කර ඇති අතර එක් යන්ත්‍රෝපකරණ වැඩපොල ගොඩනැගිල්ලක් සඳහා ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 7. ත්‍රිකුණාමලය වරායේ අෂ්රෆ් ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම

ජැටි බැම්ම ආසන්නයේ අංගණය ගිලා බැසීම හේතුවෙන් පර්යන්තයන්හි මෙහෙයුම් කටයුතු අඩාලව ඇති බැවින් අෂ්රෆ් ජැටිය සංවර්ධනය කිරීම සහ මතුපිට අළුතින් සකස් කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත. ටෙන්ඩර් කැඳවන ලද අතර තෝරාගත් අවම ටෙන්ඩරය කොන්ත්‍රාත්කරුගේ වරද (පිළි නොගැනීම) හේතුවෙන් අවසන් කරන ලද අතර ප්‍රතිශෝධිත විෂය පථයක් සමඟ ටෙන්ඩර් ලේඛනය සකස් කෙරෙමින් පවතී.

**ව්‍යාපෘති ප්‍රගතිය**

වැඩබිමෙහි තත්ත්වය සලකා බලා යළි ටෙන්ඩර් කැඳවීම සඳහා නව ටෙන්ඩර් ලේඛන සකස් කෙරෙමින් පවතී.

## 8. ත්‍රිකුණාමල වරායේ පරිපාලන ගොඩනැගිල්ල සඳහා අතිරේක මහලක් (Floor) ඉදිකිරීම

සියළුම කාර්යාල එක් ස්ථානයක කේන්ද්‍රගත කිරීමට පවත්නා පරිපාලන ගොඩනැගිල්ල සඳහා අතිරේක මහලක් ඉදිකිරීමට තීරණය කරන ලදී.

**ව්‍යාපෘති ප්‍රගතිය**

ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයේදී ආරම්භ කල අතර, වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. සමස්ත කොන්ත්‍රාත්තුවේ වටිනාකම රුපියල් මිලියන 25.3කි.

### 9. ගාලු වරායේ ක්ලෝසන්බර්ග් ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම

ගාලු වරායේ අංගණය අබලන් තත්ත්වයේ පැවතීම හේතුවෙන් පර්යන්තයන්හි මෙහෙයුම් කටයුතු අඩාලව ඇති බැවින් පවත්නා ජැටිය සංවර්ධනය කිරීම සහ එහි මතුපිට අළුතින් සකස් කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

ඉදිකිරීම් කටයුතු අදියර දෙකකින් සිදු කරන ලදී. ව්‍යාපෘතියේ පළමු අදියර රුපියල් මිලියන 60.29ක සමස්ත කොන්ත්‍රාත් අගයකට 2018 වර්ෂයේදී සැලකිය යුතු ප්‍රමාණයකට අවසන් කරන ලද අතර රුපියල් මිලියන 24.39ක සමස්ත කොන්ත්‍රාත් අගයකට ව්‍යාපෘතියේ දෙවන අදියර සිදු කෙරෙමින් පවතී.

### 10. ගාලු වරායේ දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීම

ව්‍යුහයේ අවි ආයුධ ඒකකය වෙනත් ස්ථානයකට ගෙන යෑම හේතුවෙන් ගාලු වරායේ ප්‍රධාන දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කර ඇත. වැඩ කටයුතු පහත සඳහන් පරිදි අදියර දෙකකින් සිදු කිරීමට සැලසුම් කර ඇත.

අදියර 1 :- ප්‍රධාන දියකඩනය - 1(MB -1) ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුරේ සිට මීටර 150 ක් පමණ දිගට සහ (MB- 2) – SIAM City Cement සමාගමට පිටුපසින් බදු ප්‍රදේශය දිගින් මීටර 120 ක දිගින් යුක්තව

අදියර 2 :- MB-3 - දියකඩනය මීටර 300 ක් පමණ දිගින් යුක්තව

දියකඩනයේ ප්‍රතිසංස්කරණ සැලසුම, සැලසුම් හා සංවර්ධන කොට්ඨාශය මගින් සිදු කරන ලද අතර අදියර - I සඳහා ටෙන්ඩර් ලේඛන සකස් කෙරෙමින් පවතී.

### 11. ඔලුවිල් වෙරළ තීරයේ පාංශු විස්ථාපනය පිළිබඳ පුළුල් අධ්‍යයනය

ඔලුවිල් වරායේ උතුරු සීමාවට ඔබ්බෙන් වර්තමානයේ සිදුවන වෙරළ ඛාදනය, දකුණු සීමාවේ දකුණු දියකඩනය දිගට විශාල වශයෙන් වැලි එක්රැස්වීම, පිවිසුම් ඇළ මාර්ගය තුළ හා අවට රොන්මඩ ඉවත් කිරීම ආදී ගැටළු සඳහා පිළියම් ලෙස ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කර ඇත. මෙවැනි කාර්යයන් සඳහා ප්‍රාරම්භයක් ලෙස ඔලුවිල් වෙරළ ආශ්‍රිතව වැලි අංශු ගමන්කරන ආකාරය සහ අනාගතයේ සිදුවිය හැකි වෙනස්කම් තීරණය කිරීම සඳහා සහ පිළියම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග සැකසීම සඳහා පුළුල් ඉංජිනේරු අධ්‍යයනයක් සිදුකිරීමට යෝජනා කර ඇත.

මෙම අධ්‍යයනය සඳහා මූල්‍ය සහාය ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් සැපයීමේ නියෝජිත ආයතනය වන ඩෙන්මාර්ක් විදේශ කටයුතු අමාත්‍යාංශය (DANIDA) විසින්, දීමනා ලබාදීමේ පදනම යටතේ ලබාදීමට එකඟ වී ඇත. අධ්‍යයනය සිදුකිරීම සඳහා උපදේශන සේවාව සාර්ථක උපදේශක වන සීමාසහිත ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය වෙත වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රදානය කරන ලදී.

2017 අප්‍රේල් මස දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ රැස්වීම් ශාලාවේ දී අධ්‍යයනයේ අවසන් කෙටුම්පත් වාර්තාව DANIDA ආයතනයේ නියෝජිතයන් හා අදාළ දේශීය පරදු භාරකරුවන්ගේ (Stakeholders) සහභාගිත්වයෙන් ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඉදිරිපත් කරන ලදී.

ඉන්පසු, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය, DANIDA සහ ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනයේ සහභාගිත්වයෙන් පැවති රැස්වීමක දී, වෙනත් අඩු වියදම් විකල්ප සෙවීම

සඳහා අධ්‍යයනය දීර්ඝ කිරීමට තීරණය කරන ලදී. ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනයෙන් විෂය පථය (Scope) හා පිරිවැය යෝජනාව (Cost Proposal) ලබාගැනීම සඳහා වරාය හා නාවික අමාත්‍යාංශය අවසර ලබා දී ඇත. එමනිසා, ඒ සම්බන්ධයෙන් ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනයට දැනුම් දී ඇති අතර, ඔවුන්ගේ ප්‍රතිචාරය බලාපොරොත්තුව සිටී.

2017 අප්‍රේල් මස පැවැත්වූ රැස්වීමේ දී තීරණය කළ පරිදි අධ්‍යයනය දීර්ඝ කිරීම සඳහා විෂය පථය හා පිරිවැය යෝජනාව ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය විසින් ලබාදෙන ලදී. අධ්‍යයනය පිළිබඳ අවසන් වාර්තාව 2017.06.20 වෙනි දින ඉදිරිපත් කළ අතර, අවසන් ගෙවීම ද සිදුකර ඇත.

මේ පිළිබඳව මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබාදෙන ලෙසට ඩෙන්මාර්ක් තානාපති කාර්යාලය වෙත ලිපියක් යවා ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

2018 වසරේ ජනවාරි මස 4 වැනි සතියේ (22 සහ 23 වැනි දිනයන්හි දී) ඩෙන්මාර්කයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආයෝජන අරමුදලේ (IFU) නියෝජිතයන් අදාළ පරදු භාරකරුවන් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය රැස්වීම් මාලාවක් සාර්ථකව පවත්වන ලදී.

මෙම ක්‍රියාවලිය ඉදිරියට පවත්වාගෙන යෑමට සහ ඔලුවිල් වරාය මෙහෙයුම් තත්ත්වයට ගෙන ඒම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

## ඉංජිනේරු

### නාවික ඉංජිනේරු කොට්ඨාශය

කොළඹ වරායේ නාවික, මෙහෙයුම් සහ සිවිල් ඉංජිනේරු කොට්ඨාශයන්හි මෙන්ම ගාල්ල, ත්‍රිකුණාමල සහ කන්කසන්තුරේ යන වරායයන්හි මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් පාවෙන යාත්‍රා සංඛ්‍යාවක් සේවයෙහි යොදවා තිබෙන බව සහතික වීම නාවික ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම නෞකා සහ යාත්‍රාවල නැව් තට්ටුවේ දිය යට සහ එන්ජින් කාමර යන්ත්‍රවල සියළුම ප්‍රධාන නඩත්තු කටයුතු නාවික ඉංජිනේරු කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. එසේම, සියළුම යාත්‍රා හා නෞකා වල වානේ හා දැව අළුත් කිරීම, මලකඩ ගැටිති කඩා ඉවත් කිරීම හා පින්තාරු වැඩ ඇතුළුව බඳ හා නැව් තට්ටු අළුත්වැඩියා කිරීම මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. අදාළ නෞකා වල පන්ති තත්ත්වය පවත්වාගැනීම සහ තාක්ෂණික සමාලෝචනය හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව් තැනීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමද නාවික ඉංජිනේරු කොට්ඨාශයේ වගකීමකි.

නාවික ඉංජිනේරු කොට්ඨාශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම අදාළ කොට්ඨාශ වලට හා එම සේවා ලබාගැනීමට අපේක්ෂා කරන බාහිර පාර්ශ්වයන්ට අවශ්‍ය සේවාවන් නාවික ඉංජිනේරු කොට්ඨාශය විසින් 2018 වසර තුළදී සාර්ථකව ලබාදෙන ලදී. එසේම මෙම වසර ජයග්‍රහණයේ සාර්ථක වසරක් බව තවදුරටත් අප විශ්වාස කරමු. එමෙන්ම නාවික ඉංජිනේරු කොට්ඨාශයේ කාර්යමණ්ඩලය එළඹෙන වර්ෂයේදී එහි ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර සිටී.

නාවික ඉංජිනේරු කොට්ඨාශය ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර 2018 වර්ෂය තුළදී එක් එක් අංශ විසින් අත්කරගත් ජයග්‍රහණ පහත පරිදි වේ.

**නාවික 1 අංශය**

**නැවත සැකසීමේ ඉංජිනේරු අංශය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැංගුරම් ටග් යාත්‍රා, ''මේස'' ගිනි නිවීමේ පාවෙන යාත්‍රාව සහ භාරන යාත්‍රා වල සියළුම නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම නාවික I අංශය යටතේ ඇති නැවත සැකසීමේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන වගකීම වේ. මෙම පාවෙන යාත්‍රාවල වර්ගීකරණ සමීක්ෂණ අවශ්‍යතාවයන් ඉටු කරමින් ඒවාහි අළුත්වැඩියා කටයුතු සිදු කරන අතරතුර කොළඹ වරාය සඳහා නැංගුරම් ටග් යාත්‍රා පහක මෙහෙයුම් අවශ්‍යතාවය ද, ත්‍රිකුණාමල වරාය සඳහා නැංගුරම් යාත්‍රා දෙකක අවශ්‍යතාවයද, ගාල්ල වරාය සඳහා එක් නැංගුරම් යාත්‍රාවක්ද කන්කසන්තුර වරාය සඳහා එක් නැංගුරම් ටග් යාත්‍රාවක් මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම අංශයට හැකි විය.

එසේම, හැරීමේ යාත්‍රා දෙකක් වන, ''හංසකාවා'' ට්‍රේලිං සක්ෂන් ඩ්‍රෙජරය සහ ''දියකොවුලා'' ග්‍රැබ් හොපර් ඩ්‍රෙජරය මෙම අංශය විසින් 2018 වර්ෂය තුළදී ප්‍රශස්ත මෙහෙයුම් තත්ත්වයක පවත්වා ගන්නා ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නාවික හා සිවිල් ඉංජිනේරු කොට්ඨාශ වල භාවිතා කෙරෙන පිටතින් සවිකරන මෝටර් වල (Outboard Motors) දෛනික අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ද නැවත සැකසීමේ අංශය විසින් සිදු කරන ලදී.

එමෙන්ම තටාකාංගන සමීක්ෂණ වෙනුවට ජල සමීක්ෂණ හා වෙනත් සමීක්ෂණ සිදු කරන ලද අතර මෙම වර්ෂයේදී සියළුම යාත්‍රා අදාළ පංතියේ පවත්වාගන්නා ලදී.

**ඉංජිනේරු වරාය යාත්‍රා අංශය**

නියමු දියත් යාත්‍රා, මුවරින් දියත් යාත්‍රා සහ අනෙකුත් යාත්‍රා වල අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකිම වේ. නාවික කොට්ඨාශයේ මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති අනෙකුත් වරායයන් වල මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම අංශය සමත් විය.

''නියමු 11'' සහ ''නියමු 15'' යන නියමු දියත් යාත්‍රා ඉංජිනේරු වරාය යාත්‍රා අංශය මගින් 2018 වසර තුළදී ප්‍රතිසංස්කරණය කරන ලදී. ත්‍රිකුණාමලය වරායේ සහ ගාලු වරායේ යාත්‍රා වල අළුත්වැඩියා කටයුතු ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම නියමු දියත් යාත්‍රා, මුවරින් දියත් යාත්‍රා සහ යාත්‍රා වල නිරාපද නඩත්තු සේවා සහ අනෙකුත් අළුත්වැඩියා කටයුතු 2018 වර්ෂයේදී සිදු කරන ලදී.

මෙම වර්ෂය තුළදී සියළුම නියමු දියත් යාත්‍රා සහ මුවරින් දියත් යාත්‍රා වල වර්ගීකරණ සමීක්ෂණ සාර්ථකව සිදු කරන ලදී.

**නාවික II අංශය**

**නැව් තැනීමේ අංශය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පාවෙන යාත්‍රා වල සහ නෞකා වල සියළුම දැව අළුත්වැඩියා වැඩ, මලකඩ ගැටිති කඩා ඉවත් කිරීම, පින්තාරු වැඩ හා ෆයිබර්ග්ලාස් අළුත්වැඩියා කටයුතු නැව් තැනීමේ අංශය විසින් සිදු කරන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැංගුරම් ටග් යාත්‍රා, දියත් යාත්‍රා බත්තල් සහ අනෙකුත් යාත්‍රා වල දැව පනේල වැඩ සහ දැව ෆෙන්ඩර් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමද මෙම අංශයේ වගකීම වේ. එමෙන්ම ටොන් 600ක බරක් දැරිය හැකි ජේටනට් දියත් මගට යාත්‍රා ප්‍රවිෂ්ට කිරීම සහ දියත් මගෙහි ඇති යාත්‍රා නැවත මුහුදට ගෙන ඒමේ මෙහෙයුම් සහ ඒවාහි නඩත්තු කටයුතු මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

2018 වර්ෂය තුළදී වේලුසුමන මෝටර් ටග් යාත්‍රාව (MT Velusumana) ජේටන්ට් දියත් මගට ප්‍රවිෂ්ට කරන ලද අතර බඳෙහි ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සහ දිය යට සවිකර ඇති යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු නිම කරන ලදී. අනෙක් දියත් මග මෙහෙයුම මෙම වර්ෂයේදී බාහිර පාර්ශ්වයකට අයත්

යාත්‍රාවක් සඳහා (Barge Matara) සිදු කරන ලදී. නැංගුරම් ටග් යාත්‍රා සහ දියත් යාත්‍රා වල අනෙකුත් ෆයිබර්ග්ලාස් අළුත්වැඩියා වැඩ සහ දැව පනේල අළුත්වැඩියා මෙම වර්ෂයේදී සිදු කරන ලදී.

**නැව්බඩු යාත්‍රා අංශය**

නාවික කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන නියමු දියත් යාත්‍රා සහ මූවරින් දියත් යාත්‍රා මෙන්ම මෙහෙයුම් කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන ඇඳගෙන යාමේ ටග් යාත්‍රා, මෝටර් දියත් යාත්‍රා, වතුර බත්තල් සහ තට්ටු බත්තල් වල වානේ අළුත්වැඩියා කටයුතු සහ දැව අළුත්වැඩියා කටයුතු සිදු කිරීම නැව්බඩු යාත්‍රා අංශයේ වගකීම වේ. එමෙන්ම මෙම වානේ යාත්‍රා වල මලකඩ ගැටිති ඉවත් කිරීම හා පින්තාරු වැඩ සිදු කිරීමේ හැකියාවද මෙම අංශය සතු වේ.

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 10, 11, 12, 13, 14 නියමු යාත්‍රා සහ අනෙකුත් යාත්‍රා සඳහා අවශ්‍ය වානේ අළුත්වැඩියා කටයුතු, ෆෙන්ඩර් අළුත්වැඩියා කටයුතු සහ පින්තාරු වැඩ සඳහා දියත් මගට ප්‍රවිෂ්ඨ කරන ලදී.

විවිධ ප්‍රමාණයේ රැහැන් සිලිංග නිෂ්පාදනය කිරීම හා බෙදාහැරීම මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනෙකුත් අංශ සඳහා සහ බාහිර පාර්ශ්වයන් සඳහා තිර රෙදි, විවිධ ප්‍රමාණයේ කැන්වස් ආවරණ වියන් සහ කුඩාරම් රෙදි නිෂ්පාදනය කිරීමේ හැකියාව මෙම අංශය සතු වේ. 2018 වර්ෂය තුළදී ලද වැඩ ඇණවුම් අනුව ඉහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

**නව බේරේ අංගනය**

නාවික කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන ටග් යාත්‍රා වල සහ දියත් යාත්‍රාවල මෙන්ම මෙහෙයුම් කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන වානේ නැව්බඩු බත්තල් සහ වතුර බත්තල් වල වානේ අළුත්වැඩියා කටයුතු, මලකඩ ගැටිති ඉවත් කිරීමේ වැඩ සහ පින්තාරු වැඩ සිදු කිරීම නව බේරේ අංගන අංශයෙහි ප්‍රධාන වගකීම වේ. වේලුසුමන ටග් යාත්‍රාවේ සහ නැව්බඩු බත්තලෙහි වානේ අළුත්වැඩියා කටයුතු සහ වතුර බත්තල 18 හි පින්තාරු වැඩ 2018 වසර තුළදී සිදු කරන ලදී.

## යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය

යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය විසින් ජය බහළු පර්යන්තයේ සහ සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් උපකරණ විධිමත්ව නඩත්තු කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. 2018 වසර තුළ නෞකාවේ සිට ගොඩබිම භාණ්ඩ මෙහෙයවන දොඹකර සහ හුවමාරු දොඹකර 90% කට වඩා වැඩි ප්‍රමාණයක ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී.

උපකරණ ක්‍රියා විරහිත වන සියළුම සිද්ධීන් වලදී " ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමෝපාය" හා සම්බන්ධවී සැලසුම්ගත නඩත්තු වැඩ පිළිවෙලක් මගින් 2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළුගත හා සම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් කරන අනෙකුත් මෙහෙයුම් උපකරණ මෙම කොට්ඨාශය මගින් සතුටුදායක අන්දමින් නඩත්තු කරන ලදී.

යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වන නැව්බඩු මෙහෙයුම් උපකරණ නඩත්තු කිරීමට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වාහන (බස්, ලොරි, වෑන්, ඩබල් කැබ්, කාර්, ත්‍රී වීලර් හා යතුරු පැදි) නඩත්තු කිරීමද මෙම කොට්ඨාශය විසින් සිදු කරනු ලැබේ.

සමර්හිල් ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති ආහාරයට ගන්නා ආනයනික තොග තෙල් ගබඩාව යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. 2018 වර්ෂය තුළදී මෙම කොට්ඨාශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම වර්ධනය කර ගැනීමට සතුටුදායක අන්දමින් දායක විය.

ආයු කාලය ඉක්මයමින් පවතින උපකරණ වෙනුවට අළුතින් උපකරණ සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ ප්‍රසම්පාදන ගණනාවක් මෙම කොට්ඨාශය යටතේ ක්‍රියාත්මක කර ඇත. ජය බහළු පර්යන්තය සඳහා පර්යන්ත ට්‍රක් රථ 14ක් සැපයීමට ගිවිසුම් අත්සන් කර ඇති අතර ඒවා 2019 වර්ෂය මැද භාගයේදී ලැබීමට නියමිතය.

සේවා සැපයුම් මෙහෙයුම් සඳහා ටොන් 15 අඩු එසවුම් ට්‍රක් රථ 04ක් ද 2019 වර්ෂය තුළදී ලැබීමට නියමිතව ඇත.

## යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය

සියළුම ව්‍යුහයන්, සියළුම වරායයන් වල මෙහෙයුම්/ මෙහෙයුම් නොවන උපකරණ මෙහෙයුම් තත්ත්වයේ පවත්වා ගැනීම/ නිසි ලෙස ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගැනීම යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන කාර්යය වේ. නැංගුරම් ටග් යාත්‍රා, නියමු දියත් යාත්‍රා, භාරන යාත්‍රා, සඳහා බහළු මෙහෙයුම් දොඹකර වල සියළුම ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු, වානේ අළුත්වැඩියා කටයුතු කිරීමේ සේවා, ජය බහළු පර්යන්තයට හා සමගි බහළු පර්යන්තයට අයත් බහළු මෙහෙයුම් දොඹකර, අර්ධ බහළු ට්‍රේලර් වලට අදාළ සියළුම ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු, වානේ ගොඩනැගිලි ගුදම් සහ වෙනත් ව්‍යුහ අළුතින් ඉදිකිරීම හා පැරණි වානේ ගොඩනැගිලි සහ ව්‍යුහයන් ඉවත් කිරීම මීට ඇතුළත් වේ. නැව්බඩු මෙහෙයුම් උපකරණ, නාවික යාත්‍රා සඳහා අවශ්‍ය නව අමතර කොටස් යන්ත්‍රානුසාරයෙන් නිපදවීම, පිරිසැකසුම් කිරීම හා ඇසුරුම් කිරීම සහ සියළුම වරායයන් වල අනෙකුත් සියළුම වැඩ සහ වරාය ආශ්‍රිත කටයුතු වලද මෙම කොට්ඨාශය නිරතව සිටී. තවද මෙම කොට්ඨාශය දම්වැල් හා කොකු පරීක්ෂා කිරීම මෙන්ම මෙහෙයුම් අවශ්‍යතා සඳහා යොදා ගන්නා ග්‍රැබ් උපකරණ නඩත්තු කිරීම පිළිබඳවද වගකීම දරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන සහ සුළු කාර්යයන් මෙම කොට්ඨාශය විසින් වර්ෂය තුළදී නිම කර ඇත..

- ♦ නැගෙනහිර බහළු පර්යන්තයේ ප්‍රවේශ දොරටුව ස්ථාපිත කිරීම අවසන් කර ඇත. පිටවීමේ ගේට්ටුවේ වැඩ 60% ක් නිම කර ඇත.
- ♦ විජය කුමාර පාලමේ ගුදම කඩා ඉවත් කිරීම සහ එම ගුදමේ භාණ්ඩ ගෙනයාම සඳහා පමණක් වෙන්වූ මං තීරුව ( Conveyor Belt Structure) නවීකරණය කිරීම.
- ♦ කොච්චිකඩේ ගුදම කඩා ඉවත් කිරීමෙන් පසු එහි ද්‍රව්‍ය භාවිතා කර ත්‍රිකුණාමලයේ ගුදම ඉදිකිරීම.
- ♦ J-12 ගැන්ට්‍රි දොඹකරවල ට්‍රොලි රේල්ලු අළුත් කිරීම.
- ♦ J-9, J-11, J-12, J-18 ගැන්ට්‍රි දොඹකර වල ට්‍රොලි රේල්ලු අළුත්වැඩියා කිරීම.
- ♦ J-1, J-2, ගැන්ට්‍රි දොඹකරවල අත්වැට අළුත්වැඩියා කිරීම.
- ♦ J-12 කණු සහ සම්බන්ධ කිරීමේ බාල්ක අළුත්වැඩියා කිරීම 75% ක් අවසන් කර ඇත.
- ♦ CFS V සහ පරන්තන් ගුදම නවීකරණය කිරීම.
- ♦ බණ්ඩාරනායක ජැටි ගුදම සඳහා නැව්බඩු රාක්ක ඉදිකිරීම.
- ♦ චෛත්‍යයේ විදුලි සෝපාන ආවරණයේ ඉහළ වහලය සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කිරීම සහ චෛත්‍යය පරිශ්‍රය තුළ නරඹන්නන් හට විවේක ගැනීම සඳහා ගොඩනැලගිල්ලක් ඉදිකිරීම.
- ♦ ත්‍රිකුණාමල වරායේ බෝයා ඉදිකිරීම.
- ♦ සාම්පූර් ප්‍රදීපාගාරය අළුත්වැඩියා කිරීම - වැඩ 40% ක් අවසන් කර ඇත.

ඉහත කාර්යයන්ට අමතරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ නැංගුරම් බැඳ තැබීමේ දම්වැල් පරීක්ෂා කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශයේ වැඩබිම් 07 මගින් ගැල්වනයිස් කටයුතු, ප්‍රයිම්මූවර් රථ වල ගෙවී ගිය අමතර කොටස් යන්ත්‍රානුසාරයෙන් සැකසීම, බ්‍රෂ් වාත්තු කිරීම, ජල පොම්ප සවිකිරීම සහ අළුත්වැඩියා කිරීම සහ ලියවන පට්ටල් වැඩ සිදු කිරීම වැනි මහා පරිමාණයේ වැඩ 100ක් සහ කුඩා පරිමාණයේ වැඩ 3,105 ක් සිදු කරන ලදී.

### සිවිල් ඉංජිනේරු කොට්ඨාශය

වරාය ව්‍යුහ, ගොඩනැගිලි, අභ්‍යන්තර මාර්ග, අංගණ, නිල නිවාස වල නඩත්තු කටයුතු පවත්වාගෙන යන, එමෙන්ම වරාය ද්‍රෝණියෙහි ගැඹුර හා ප්‍රවේශ මාර්ග නඩත්තු කරන හා පරදුභාරකරුවන් හට අවශ්‍ය වෙනත් විවිධ සේවා සපයන සිවිල් ඉංජිනේරු කොට්ඨාශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කොට්ඨාශ වලින් එකකි. දිවයින පුරා පිහිටි අනෙකුත් වරාය වල පහසුකම් හා ප්‍රදීපාගාර නඩත්තු කිරීම දක්වා ද මෙම කොට්ඨාශයේ කාර්යභාරය පුළුල් කර ඇත.

පූර්වයෙන් හඳුනාගත් අවශ්‍යතාවයන්ට අනුව සිවිල් නඩත්තු කටයුතු සැලසුම් කර ඇති අතර සුළු නඩත්තු කටයුතු ඒවාහි කඩිනම් අවශ්‍යතාවය පදනම් කොට ගෙන මෙම කොට්ඨාශයේම කාර්ය මණ්ඩලය විසින්ම සිදු කරන ලදී.

වරාය පරිශ්‍රය තුළ පවිත්‍රතාවය මෙම කොට්ඨාශයේ විෂය පථය යටතට ගැනෙන අතර අදාළ ආයතන සමඟ ඒකාබද්ධව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කරනු ලබයි.

2018 වර්ෂය තුළදී සිවිල් ඉංජිනේරු කොට්ඨාශය මගින් කොළඹ වරායේ සිදු කරන ලද විවිධ සුළු නඩත්තු කටයුතු වලට අමතරව පහත සඳහන් ප්‍රධාන කාර්යයන්ද සාර්ථකව නිම කරන ලදී.

- ත්‍රිකුණාමලය වරායේ නව ගුදම ඉදිකිරීම.
- ජය බහළු පර්යන්තයේ බහළු අංගණයේ අළුත්වැඩියා කටයුතු.
- යාපනය අර්ධද්වීපයේ ප්‍රදීපාගාරය පුනරුත්තාපනය කිරීම.
- ගාලු වරායේ වරාය ද්‍රෝණිය හෑරීම.
- නුවර එළිය සංචාරක බංගලාව නවීකරණය කිරීම.
- නීති කොට්ඨාශය ප්‍රති ස්ථානගත කිරීම.
- ආරක්ෂක කොට්ඨාශය ප්‍රති ස්ථානගත කිරීම.
- මුදල් කොට්ඨාශය අළුත්වැඩියා කිරීම
- වරාය පරිශ්‍රය තුළ ඇති ආපනශාලා අළුත්වැඩියා කිරීම.
- වරාය පරිශ්‍රය තුළ ඇති වැසිකිලි අළුත්වැඩියා කිරීම.

## මානව සම්පත් සංවර්ධන

### මානව සම්පත් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආයතනික අරමුණු ඉටු කිරීම පිණිස අනෙකුත් වරායයන්ද ඇතුළුව එහි සියළුම කොට්ඨාශ සඳහා අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවාගැනීම මඟින් මානව සම්පත් කොට්ඨාශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කළමනාකාරීත්වය සහ කාර්යමණ්ඩලය තෘප්තියට පත්වන ආකාරයෙන් කාලීන බඳවා ගැනීම් සිදු කිරීම තුළින් මෙම අරමුණ ඉටුකිරීම කඩිනම් කරනු ලැබ ඇත.

2018 වසර ආරම්භයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත සේවක සංඛ්‍යාව 9,377 ක්වූ අතර මෙයට ඇතුළත් සියළුම ස්ථිර, කොන්ත්‍රාත් පදනම හා වෙනත් සේවක කාණ්ඩ පහත දැක්වෙන පරිදි වේ.

| | ස්ථිර | කොන්ත්‍රාත් පදනම | වෙනත් | එකතුව |
|---|---|---|---|---|
| විධායක | 579 | 10 | 0 | 589 |
| විධායක නොවන | 5,246 | 26 | 0 | 5,272 |
| තාක්ෂණික | 1,835 | 0 | 0 | 1,835 |
| තාක්ෂණික නොවන | 1,678 | 1 | 2 | 1,681 |
| **එකතුව** | **9,338** | **37** | **2** | **9,377** |

කෙසේ වුවද, 2018 වර්ෂය ආරම්භයේදී 9,651 ක් වූ සේවක සංඛ්‍යාව වසර අවසානයේදී 9,710 ක් වූ අතර වරායයන් අනුව සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| | ස්ථිර | කොන්ත්‍රාත් පදනම | වෙනත් | එකතුව |
|---|---|---|---|---|
| කොළඹ වරාය | 8,929 | 18 | 1 | 8,948 |
| ගාල්ල වරාය | 362 | 0 | 0 | 362 |
| ත්‍රිකුණාමල වරාය | 400 | 0 | 0 | 400 |
| **එකතුව** | **9,691** | **18** | **1** | **9,710** |

**2018 වර්ෂයේ අභ්‍යන්තර උසස්වීම්**

මානව සම්පත් සැලැස්මට අනුව බඳවාගැනීමේ ක්‍රියාපරිපාටිය ප්‍රකාරව යෝග්‍යතාව සහ සුදුසුකම් සහිත අපේක්ෂකයන්ගෙන් අභ්‍යන්තර පුරප්පාඩු පුරවන ලද අතර එම පුරප්පාඩු සඳහා සුදුසු අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති අවස්ථාවන්හිදී බාහිර බඳවා ගැනීම් සිදු කරන ලදී.

**2018 වර්ෂයේ බාහිර බඳවා ගැනීම් හා අභ්‍යන්තර උසස්වීම් පිළිබඳ විස්තර**

2018 වර්ෂය තුළ ස්ථිර සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 695 දෙනෙකු බාහිරව බඳවාගන්නා ලදී. එම බඳවාගැනීම් පිළිබඳ සවිස්තරාත්මක විස්තර පහත දැක්වේ.

| සේවක කාණ්ඩය | ස්ථිර | කොන්ත්‍රාත් | එකතුව |
|---|---|---|---|
| **විධායක** | 17 | 1 | 18 |
| **විධායක නොවන** | 192 | 0 | 192 |
| **තාක්ෂණික** | 263 | 0 | 263 |
| **තාක්ෂණික නොවන** | 222 | 0 | 222 |
| එකතුව | **694** | **1** | **695** |

**2018 වර්ෂය තුළ නැවත සේවයේ පිහිටුවන ලද සේවකයින්ගේ සංඛ්‍යාව පහත පරිදි වේ.**

- විධායක නොවන : 01
- තාක්ෂණික නොවන : 03
- **එකතුව : 04**

**සේවයෙන් ඉවත්වූ සේවකයින් පිළිබඳ විස්තර**

2018 වර්ෂය තුළ සේවකයින් 366 දෙනෙකු සේවයෙන් ඉවත්වූ අතර, අදාළ විස්තර පහත දක්වා ඇත.

| සේවයෙන් ඉවත්වීමට හේතුව | ඉවත්වූ සේවක සංඛ්‍යාව |
|---|---|
| විශ්‍රාම ගැනීම් | 294 |
| මරණයට පත්වීම | 28 |
| සේවයෙන් ඉල්ලා අස්වීම් | 11 |
| සේවය අත්හැර යෑම් | 10 |
| වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම | 01 |
| සේවය අවසන් කිරීම් | 22 |
| **එකතුව** | **366** |

**අනතුරු සඳහා වන්දි ගෙවීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් 48 දෙනෙකු හා බාහිර පුද්ගලයන් 05 දෙනෙකු ඇතුළුව 2018 වර්ෂය තුළ සිදුවූ මුළු හදිසි අනතුරු සංඛ්‍යාව 53කි. හදිසි අනතුරු හේතුවෙන් බාහිර පුද්ගලයින් එක් අයෙකු මිය ගොස් ඇති අතර රු. 440,000/-ක මුදලක් වන්දි වශයෙන් ගෙවා ඇත.

**කරුණාසහගත මරණාධාර දීමනාව**

කොළඹ වරායේ ස්වභාවික හේතූන් මත මිය ගිය සේවකයින්ගේ යැපෙන්නන් වෙනුවෙන් රු. 443,000/-ක මුදලක් කරුණාසහගත වශයෙන් ගෙවා ඇති අතර 2018 වර්ෂ සඳහා තවත් රු. 50,000/-ක මුදලක් ගෙවීමට නියමිතව ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ අනෙකුත් වරායයන්හි සේවකයන්හට කරුණාසහගත මරණාධාර ගෙවීම සිදු කර නොමැත.

**දැනුවත් කිරීමේ වැඩසටහන්**

අළුතින් බඳවාගත් සේවකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 15ක් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේදී පවත්වන ලදී.

**රන් කාසි ප්‍රදානය**

| බර | රන් කාසි ගනන |
|---|---|
| පවුම් 01 | 51 |
| පවුම් 01 ¼ | 178 |
| පවුම් 01 ½ | 44 |

**විනය කටයුතු**

මානව සම්පත් කොට්ඨාශය විසින් විනය පරීක්ෂණ 241 ක් හා වෙනත් පරීක්ෂණ 88 ක් 2017 වර්ෂයේ සිට ඉදිරියට සිදු කරගෙනආ අතර ඉන් පරීක්ෂණ 166 ක් අවසන් කරන ලද අතර වසර අවසානයේදී පරීක්ෂණ 163 ක් අවසන් නොවී පැවතිණ.

## සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය අරමුණු/ පරමාර්ථ ළඟා කර ගැනීමේදී මානව සම්පත කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරයි. මූල්‍ය හා ද්‍රව්‍ය කළමනාකරණය සිදු කරන ආකාරයට මානව සම්පත කළමනාකරණය කිරීම කළ හැකි කාර්යයක් නොවේ. ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරමින් සිය සේවකයින්ට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දීමට ඉවහල් වන්නා වූ පහසුකම් හා ප්‍රස්ථාවන් ලබාදීම අරමුණු කරගෙන සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය අංශ දෙකකින් ක්‍රියාත්මක වේ.

- ප්‍රධාන කාර්යාලය
- මධ්‍යම මුළුතැන්ගෙවල් අංශය

සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශයේ ප්‍රධාන කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන සුභසාධක වැඩසටහන් පහත පරිදි වේ.

## 1. ප්‍රධාන කාර්යාලය

**සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය**

අගෝස්තු ජාතික රක්ෂණ භාර අරමුදල හරහා ක්‍රියාත්මක වූ සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය 2018 අගෝස්තු 31 දිනෙන් අවසන් විය. සභාපතිතුමාගේ අත්සනින් නිකුත් කරන ලද අංක - 28/2018 හා 2018.11.01 දිනැති වරාය අධිකාරියේ චක්‍රලේඛය මගින් මේ දක්වා ක්‍රියාත්මක වූ සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ව්‍යුහාත්මක වෙනසකට ලක් කර ඇත.

සේවක රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ බාහිර ප්‍රතිකාර සඳහා ලබා දෙන රු. 7,500/- මුදල හා ඇස් කණ්ණාඩි සඳහා ලබා දෙන රු. 5,000/- මුදල වෙනුවට නව රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ බාහිර ප්‍රතිකාර සඳහා රු. 10,000/- ක්ද ඇස් කණ්ණාඩි සඳහා රු. 10,000/- ක්ද වශයෙන් වැඩි කර ඇත. එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම වෛද්‍ය කොට්ඨාශයේ නිර්දේශය ලබා ගැනීමෙන් පසු සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය හරහා සේවක මහත්ම/ මහත්මීන්ට ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත. ඊට අදාළ ප්‍රතිලාභ වෙන්කර ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් කළමනාකාර අධ්‍යක්ෂතුමන් වෙත ඉදිරිපත් කර අනුමැතිය කරවා ගෙන ඇත.

ඉහත චක්‍රලේඛය අනුව 2018.09.01 දින සිට ලබා ගත් ඇස් කණ්ණාඩි සහ බාහිර ප්‍රතිකාර වලට අදාළ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට අවස්ථාව ලබාදී ඇත. ඒ අනුව එම ගෙවීම් වලට අදාළ මූලික කටයුතු මේ වන විටත් සුභසාධක කොට්ඨාශය යටතේ ක්‍රියාත්මක කරමින් පවතී.

**ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

වරාය අධිකාරියේ සේවකයින්ගේ දූ දරුවන් හට අ.පො.ස (උ.පෙළ.) හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව 02ක් පිරිනැමේ. අ.පො.ස. (උ.පෙළ.) සඳහා රු. 750/- බැගින් මාස 24 ක් සඳහා ලබාදේ.

විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන සේවක මහත්ම/ මහත්මීන්ගේ දූ දරුවන් සඳහා මහපොළ ශිෂ්‍යාධාරය හෝ ඒ වෙනුවට විශ්ව විද්‍යාලය මගින් ලබා දෙන ශිෂ්‍යාධාරය ලබා නොගැනීමේ පදනම මත ශිෂ්‍යත්වය ලබා දීම සිදු කරයි.

වසරකට මාස 10 ක් වන සේ වසර 03 සිට 05 දක්වා වූ කාලයක් සඳහා ශිෂ්‍යත්වය ලබා දෙන අතර එය අධ්‍යයන පාඨමාලාවේ කාලසීමාව මත රඳා පවතී. වසර 03 හි උපාධි පාඨමාලාව සඳහා වසරකට රු. 25,000/- බැගින් වසර 03 ක දීද ඒ ආකාරයට වසර 04 සහ 05 පූර්ණකාලීන වෛද්‍ය උපාධි පාඨමාලා සඳහා වසරකදී රු. 25,000/- බැගින් වසර 05 ක දී ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව වසර 03 ක සාමාන්‍ය උපාධිය හදාරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා රු. 75,000/- ක් ද වසර 4 ක උපාධි පාඨමාලාව හදාරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා රු. 100,000/- ක්ද, වසර 05 වෛද්‍ය උපාධිය හදාරන/ශිෂ්‍යාවන් සඳහා රු. 125,000/- ක්ද වන සේ වාර්ෂිකව රු. 25,000/- බැගින් ලබා දීම සිදු කරනු ලබයි.

දැනට ගෙවනු ලබන ශිෂ්‍යත්ව මුදල මහපොළ ශිෂ්‍යාධාර මුදලට හා සමාන ලෙස වැඩි කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත්වී ඇති අතර ඒ පිළිබඳව ඉහළ කළමනාකාරීත්වය දැනුවත් කර ඇත.

ඒ අනුව 2011/2012 සඳහා රු. 100,000/- ක්ද, 2012/2013 සඳහා රු. 200,000/- ක්ද, 2013/2014 සඳහා රු.975,000/- ක්ද, 2014/2015 සඳහා රු.1,775,000/- ක්ද, 2015/2016 සඳහා රු.3,650,000/- ක්ද, 2016/2017 සඳහා රු. 1,925,000/- ද, වශයෙන් ගෙවීම් මේ වන විට සිදු කර ඇත.

අ.පො.ස (සා.පෙළ.) සමත් A සාමාර්ථ හෝ B සාමාර්ථ 06ට වැඩි සහ සියළු විෂයයන් සමත් සිසු දරුවන් සඳහා වසර 02 කට රු. 9,000/- බැගින් ලබාදීම සිදු කරයි. 2018 වර්ෂයේදී අ.පො.ස. (සා.පෙළ.) සිසුන් සඳහා රු. 5,190,600.00 ක මුදලක් ලබාදී ඇත.

**ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය**

වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ ප්‍රයෝජනය සඳහා 2016 ජනවාරි මස ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සාර්ථකව ක්‍රියාත්මක වේ. මේ වන විට ලියාපදිංචි වී ඇති රෝගීන් සංඛ්‍යාව 2528 කි. 2018 වර්ෂයේ ප්‍රතිකාර කරන ලද රෝගීන් සංඛ්‍යාව 3905 ක් වේ. ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර වලට අමතරව වීන කටු ප්‍රතිකාර හා ආයුර්වේද සම්බාහනය ද කරනු ලැබේ. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා 2018 වසරේ පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන දෙකක මුදලක් වෙන් කර ඇති අතර 2019 වසර සඳහා ද ඒ හා සමාන මුදලක් වෙන් කර ඇත. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගම හරහා බඳවා ගෙන ඇති අතර ඒ සඳහා ස්ථිර කාර්යය මණ්ඩලයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් සැළැස්මට ඇතුළත් කර බඳවා ගැනීමට මානව සම්පත් කොට්ඨාශය වෙත නිර්දේශ කර ඇත.

**නිවාස ණය යෝජනා ක්‍රමය**

වරාය අධිකාරියේ සේවකයින්ට නව නිවසක් තනා ගැනීම, නිවසක් සඳහා කොටසක් එකතු කිරීම, නිවසක් තනා ගැනීම සඳහා ඉඩමක් මිලදී ගැනීම යනාදී කාර්යයන් සඳහා වරාය අධිකාරියේ ස්ථිර සේවකයින්ට රු. ලක්ෂ 05ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලබා දීමේ වැඩසටහනක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂිකව රු. මිලියන 50ක මුදලක් වෙන් කරන අතර එම මුදල් අවශ්‍යතාවය අනුව බැංකුව වෙත මුදා හැරීමට කටයුතු කරනු ලැබේ. එම ණය මුදල ලබාදීමේ දී 6%ක සහනදායී පොළී අනුපාතයක් අය කරනු ලැබේ. 2018 වර්ෂය තුළදී රු. 2,500,000/- ක මුදලක් ණය සඳහා මේ වන විට යොදවා ඇත.

2018 වර්ෂය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයට වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 50කි. එනමුත් නිවාස ණය මුදල් ලබා ගැනීම සඳහා සේවක මහත්ම/ මහත්මීන්ගේඉල්ලීම අඩුවීම හේතුවෙන් 2018 වසරේදී බැංකුව වෙත මුදා හරින ලද මුදල රුපියල් 250,000 කි. එය මේ සඳහා වෙන් කරන ලද මුදලින් 5% කි. රු. 350,000/- ක් ලෙස පැවති නිවාස ණය මුදල 2006 වසරේදී රු. 500,000/- ක් දක්වා වැඩි කර ඇත.

2006 වසරේ සිට 2018 වර්ෂය දක්වා වසර (12) ක් තුළ නිවාස ණය මුදල වැඩි කර නොමැත. පසුගිය වර්ෂයන් වල නිවාස ඉදිකිරීමේ අමුද්‍රව්‍ය වල සහ ඉඩකඩම් වල මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ ගියද ඊට සාපේක්ෂව නිවාස ණය මුදල වැඩි කර නොමැත. නිවාස ණය මුදල වැඩි කරන ලෙස වෘත්තීය සමිති විසින් අධිකාරියේ ඉහළ කළමනාකාරීත්වය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර, සේවක මහත්ම/මහත්මීන් විසින් ද ඒ සඳහා මෙම කොට්ඨාශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

සුභසාධක කොට්ඨාශය විසින් ලබා දෙන සුභසාධක පහසුකම් අතර නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා සේවක මහත්ම/ මහත්මීන්ගේ උනන්දුව ඉතාමත් අඩු වී ඇත. නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වලට යටත්ව හෝ මෙම ණය මුදල ඉහළ දැමීම සිදු කිරීම මගින් නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කල හැකි වේ.

**සුභසාධක බස් රථ ලබාදීම**

අධිකාරියේ සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයගේ අවමංගල්‍ය කටයුතු සඳහා වන්දනා ගමන් හා විනෝද චාරිකා සඳහා බස් රථ 06ක් යොමු කර ඇත. අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා වෙන් කර ඇති බස් රථ 03ක් වේ.

සේවක මරණයකදී අවමංගල්‍ය උත්සවයේ කටයුතු සඳහා කොට්ඨාශයේ / අංශයේ සේවක මහත්ම/ මහත්මීන් හට සහභාගී වීම සඳහා නොමිලේ බස් රථයක් ලබාදීම සිදු කරයි. ඊට අමතරව වන්දනා ගමන්, විනෝද චාරිකා සහ විවාහ මංගල උත්සව වලට සහභාගී වීම සඳහා අධිකාරියේ සේවකයින්ට

කිලෝ මීටර් 1 සඳහා රු. 12.00 ක සහනදායී ගාස්තුවකටද, යැපෙන්නන් සමඟ අදාළ චාරිකා සඳහා කිලෝ මීටර් 1 ට රු. 15.00 ක සහනදායී ගාස්තුවකට ලබා දීම සිදු කරයි.

2018 වර්ෂය තුළ බස් රථ යොදවන ලද ගමන් වාරයක් සංඛ්‍යාව 871 කි.

**දිවා සුරැකුම් මධ්‍යස්ථානය**

වයස අවු. 2 ½ සිට අවුරුදු 05 දක්වා සේවක මහත්ම/ මහත්මීන්ගේ දූ දරුවන්ට මේ තුළින් රැකවරණය ලබා දේ. දූ දරුවන් ඇතුළු කර ගැනීම ජනවාරි සිට අගෝස්තු 31 දක්වා සිදු කෙරේ. ඒ සඳහා එක් දරුවකු වෙනුවෙන් රු. 1,300/- ක සහනදායී මාසික ගාස්තුවක් අය කෙරේ. 2018 දූ දරුවන් 30 දෙනෙකු රැකවරණය ලැබූ අතර ඉන් දරුවන් 19 දෙනෙකු වයස අවුරුදු 05 සම්පූර්ණවීම නිසා පාසල් අධ්‍යාපනය ලැබීම සඳහා 2018 දෙසැම්බර් මස ඉවත්ව යන ලදී.

දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දරුවන් සඳහා කෙටි ආහාරයක් ලබාදීම සහ දිවා ආහාරය ලබාදීම ද වරාය අධිකාරිය මගින් සිදු කරයි. සුභසාධක දාරකාගාරයේ කටයුතු යථා පරිදි පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයේ සිට දාරකාගාරයේ සේවාව වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගම හරහා ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 569,400/- ක මුදලක් මාසික ගාස්තු ලෙස ලැබී ඇත.

**පුස්තකාල පහසුකම් සැපයීම**

වරාය අධිකාරියේ සේවකයින්ගේ කියවීමේ රුචිය වැඩි කිරීම සහ ඒ තුළින් නව දැනුම එකතු කර ගැනීම හා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සේවකයින් විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දේ. 2018 වර්ෂයේදී පුස්තකාල 20 ක් සඳහා රු. 200,000/- පොත් ලබා ගැනීමට මුදල් ලබාදී ඇත.

**විශේෂ නිවාඩු හිමිකම් දීමනා ගෙවීම**

රෝගී තත්ත්වයකදී හෝ හදිසි අනතුරු තත්ත්වයකදී තමන්ට හිමි සියළුම නිවාඩු අවසන් වී ඇති අවස්ථාවක වෛද්‍ය නිර්දේශය මත සේවයට යෝග්‍ය වන තෙක් උපරිම දින 180 ක් දක්වා සුභසාධක ගෙවීම් සිදු කරනු ලැබේ. ප්‍රධාන වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය අනුව වැටුප් සහිත හෝ රහිත සුභසාධක නිවාඩු ලබා දේ. 2018 ජනවාරි මස සිට දෙසැම්බර් 31 දින දක්වා අයදුම්පත් 102 ක් ලැබී ඇති අතර ඉන් අනුමත වැටුප් රහිත නිවාඩු දින 254 ක් සඳහා හා අනුමත වැටුප් සහිත නිවාඩු දින 3487 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

**සමුද්‍රීය කෞතුකාගාරය**

වරාය හා නාවික ක්ෂේත්‍රයේ ඓතිහාසික විකාශනය දැක්වෙන අනුරූ සහ ප්‍රදර්ශන පුවරු මෙන්ම පැරණි වරාය පරිශ්‍රය තුළ භාවිත කල භාණ්ඩ මෙහි ප්‍රදර්ශනයට තබා ඇත. පාසැල් සිසුන් හට ඉහළ අධ්‍යාපනික වටිනාකමක් ඇති මෙය නැරඹීමට පාසැල් ශිෂ්‍යයන් වැඩි වශයෙන් පැමිණෙති. කොළඹින් බැහැරව අධ්‍යාපන චාරිකා පැමිණෙන පාසැල් සිසුන්ගෙන් බහුතරයක් මෙම සමුද්‍රීය කෞතුකාගාරය නැරඹීමට පැමිණේ. ඊට අමතරව වැඩිහිටි නිවාස හා පෙර පාසැල් වලින් ද පැමිණේ. පෙ.ව. 08.00 සිට ප.ව. 05.00 දක්වා විවෘතව පවතින අතර ඉරිදා දිනයන් හා පෝය දිනයන්හිද විවෘතව පවතී. 2018 වර්ෂය තුළදී කෞතුකාගාරය නැරඹීම සඳහා 42,776 ක පිරිසක් පැමිණ ඇත.

සමුද්‍රීය කෞතුකාගාරය ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව සමුද්‍රීය කෞතුකාගාරය වායුසමීකරණය කිරීම සහ ආලෝක කරණය කිරීම සඳහා මූලික කටයුතු සිදු කර ඇත. මේ සඳහා 2018 සහ 2019 වර්ෂයන් වලට අදාළව වෙන් කරන ලද මුදල මිලියන 25 කි.

**සේවකයින්ට තිළිණ ප්‍රදානය**

සේවා කාලය වසර 30 ක් සම්පූර්ණ කල පසු තිළිණයක් ප්‍රදානය කරනු ලැබේ. මේ අනුව වසර 30 ක් සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා තිළිණ දීම මානව සම්පත් කොට්ඨාශයේ දැනුම් දීම මත සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. ඒ අනුව 2018 වසරේ සුදුසුකම් ලැබූ සංඛ්‍යාව 405 කි.

**සුභසාධක ආපනශාලා**

වරාය අධිකාරිය පරිශ්‍රය තුළ සේවකයින් හා විවිධ සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන අයගේ පහසුව පිණිස සුභසාධක ආපනශාලා 13 ක් පවත්වාගෙන යන අතර වාර්ෂික මිල ගණන් කැඳවා සුදුසු අය තෝරාගෙන එම අය මගින් ආපනශාලා පවත්වාගෙන යනු ලැබේ. 2018 වර්ෂය තුළ දී ආපනශාලා මගින් බදු කුලිය ලෙස ලැබුණු මුළු ආදායම රු. 5,263,399 ක් වේ. කොළඹ ඉවත් කරන ලද නව මුළුතැන්ගෙවල් පරිශ්‍රයේ අළුතින් ආපනශාලාවක් ඉදිකිරීම සඳහා මේ වන විට කටයුතු සූදානම් කරමින් පවතී.

ඊට අමතරව සියළුම ආපනශාලාවල පවතින අළුත්වැඩියා කටයුතු අවසන් කිරීමට මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එම අළුත්වැඩියාවන් 2019 වසරේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**කතරගම අංක II නිවාඩු නිකේතනය**

2017.10.06 දිනැති අංක 29/2017 දරණ සභාපතිතුමාගේ චක්‍රලේඛය මගින් කතරගම අංක II නිවාඩු නිකේතනය සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය වෙත පවරන ලදී. මෙම කොට්ඨාශය මගින් 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා සේවක මහත්ම/ මහත්මීන් 385 දෙනෙකු සඳහා කාමර පහසුකම් ලබා දී ඇත.

| | | | |
|---|---|---|---|
| විධායක | - 161 | විධායක නොවන | - 224 |

නිවාඩු නිකේතනයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එම කටයුතු 2019 වසරේදී අවසන් කිරීමට අපේක්ෂා කරයි.

**2. මධ්‍යම මුළුතැන්ගෙවල් අංශය**

**කාර්ය මණ්ඩලය වෙත නොමිලේ ආහාර සැපයීම**

වරාය අධිකාරියේ මුර පදනම යටතේ යොදවා ඇති සේවකයින් හට දිවා / රාත්‍රී ආහාර මෙන්ම තේ, රසකැවිලි සහ කැඳ සැපයීම සිදු කරනු ලබන අතර කාර්යාල ගණයේ සේවක මහත්ම මහත්මීන් හට දිවා ආහාරය පමණක් සැපයීම සිදු කරන අතර අතිකාල සේවයේ යෙදෙන කාර්යාල ගණයේ සේවකයින් රාත්‍රී 10.00 හෝ ඉන් පසු සේවයේ නිරතවන්නේනම් රාත්‍රී ආහාරයද ලබා දීම සිදු කරයි. 2018 වර්ෂය තුළ දිවා/ රාත්‍රී ආහාර, තේ/රසකැවිලි හා කැඳ සඳහා වියදම් කර ඇති මුදල රු. 873,003,968 කි. දිවා/රාත්‍රී ආහාර සඳහා රු. 649,767,694. සහ තේ/රසකැවිලි හා කැඳ සඳහා රු. 223,236,274.62 ක්ද වියදම් කර ඇත.

**විශේෂ උත්සව අවස්ථා සඳහා සංග්‍රහ කටයුතු**

කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, වර්ෂ ආරම්භ උත්සවය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සංවත්සර උත්සවය, දාරකාගාරයේ වර්ෂ අවසාන උත්සවය ආදී විශේෂ උත්සව සඳහා සංග්‍රහ කටයුතු සිදු කරනු ලබයි.

ඊට අමතරව ජාතික වශයෙන් සිදුවන ස්වභාවික හදිසි විපත් අවස්ථාවන් හිදී ද ඉහළ කළමනාකාරීත්වයේ අනුමැතියට යටත්ව පිසූ ආහාර පාර්සල් සැපයීමද සිදු කරනු ලබයි.

## වෛද්‍ය කොට්ඨාශය

වෛද්‍ය කොට්ඨාශය සතියේ දින 7 තුළ දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මකව පවතී.

බාහිර රෝගී අංශයේ කටයුතු සඳහා වෛද්‍යවරු 06 දෙනෙකු, එක් දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු සහ පරිපූරක වෛද්‍ය කාර්යමණ්ඩලයක් සේවයේ යෙදී සිටී. Xray සේයාරූ ලබා ගැනීමේ පහසුකම් හා ඊ සී ජී පහසුකම්, රසායනාගාර සේවා සහ පැය 24 පුරා ක්‍රියාත්මක වන බෙහෙත් ශාලා, ඖෂධ නිකුත් කිරීමේ අංශ සහ ගිලන් රථ සේවාවක් ද වෛද්‍ය කොට්ඨාශය විසින් පවත්වා ගෙන යනු ලැබේ.

හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර සේවා කඩිනමින් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඒ ඒ කොට්ඨාශ සඳහා පත්කර ඇති ඩෙංගු කමිටු විසින් අදාළ කොට්ඨාශ ප්‍රධානියාගේ සහ කොට්ඨාශීය ඩෙංගු මර්ධන කමිටුවේ කමිටු සාමාජිකයාගේ අධීක්ෂණය යටතේ වරාය පරිශ්‍රය තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සති පතා පරීක්ෂාවට ලක් කරනු ලැබීය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා මගින් වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත එක් එක් කොට්ඨාශය විසින් මේ පිළිබඳව මාසික වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

පැන නැගුණු ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට සහ ඒවාට ප්‍රතිකර්ම සෙවීමේ ක්‍රියාමාර්ග ගැනීමට උපකාරීවනු පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඩෙංගු නිවාරණ කමිටු රැස්වීම් මාසිකව පවත්වන ලදී.

විශේෂයෙන්ම දියවැඩියාව වැනි වැරදි ජීවන රටාව හේතුවෙන් හට ගන්නා රෝග වළක්වා ගැනීම සඳහා වෛද්‍යවරු විසින් අධ්‍යාපනික වැඩසටහන් පවත්වන ලදී.

වෛද්‍ය කොට්ඨාශයේ සම්පත් භාවිතය ප්‍රශස්ත මට්ටමකින් කළමනාකරණය කරන ලදී.

අළුතින් සේවයට බඳවා ගැනීමේදී සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ රැසක් 2018 වර්ෂයේදී සිදු කරන ලදී.

## මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය (MPMA)

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය (MPMA) වරාය සේවකයින්, වරාය භාවිතා කරන්නන් සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයින් පුහුණු කිරීමේ ප්‍රධාන අරමුණ පෙරදැරිව කටයුතු කරන ආයතනයකි. තවද, වාර්ෂික පුහුණු කිරීමේ දින දර්ශනයට අනුව ඉලක්කගත කණ්ඩායම්වල දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම අරභයා සකසන ලද දේශන, සම්මන්ත්‍රණ, වැඩ මුළු මාලාවන් සහ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. වරාය සේවකයින්ගේ ඵලදායිතා වර්ධනය, කණ්ඩායම් හැඟීමෙන් යුතුව වැඩ කිරීමේ ආකල්ප වර්ධනය, තාක්ෂණික නිපුණතා සංවර්ධනය, පාරිභෝගික සේවා වර්ධනය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කරගත් වැඩ මුළු ගණනාවක් 2018 වර්ෂයේ දී පවත්වන ලදී. වරාය සේවකයින්ගේ හැකියා මට්ටම වැඩි දියුණු කරගැනීමට හා සහතික පත් මගින් වටිනාකම සනාථ කෙරෙන පාරිභෝගික සේවා දිශානතියට අනුව සකස් කරන ලද පාඨමාලා තුළින් වරාය මෙහෙයුම් විශේෂඥතාවය ලබාගැනීමට ඉවහල් වන මං මාවත් විවර කිරීමට මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය පහසුකම් සලසන ලදී.

2018 වර්ෂයේදී මිනිස් පැය 401,273ක් ආවරණය කරමින් (සේවාස්ථ පුහුණුව රහිතව) අපේක්ෂකයන් 8,325 පමණ මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් පුහුණු කර ඇත. මීට අමතරව කාර්මික විද්‍යාල සහ වෙනත් වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සහ විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන් 346 දෙනෙකු සඳහා ද මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් සේවාස්ථ පුහුණුව ලබා දී ඇත.

**2018 වර්ෂයේ සමස්ත පුහුණු කිරීම් පිළිබඳ කාර්යසාධනය**

| විෂය ධාරාව | පුහුණු කරන ලද අපේක්ෂකයින් සංඛ්‍යාව | මුළු මිනිස් පැය ගණන |
|---|---|---|
| උපකරණ ක්‍රියාකරවීම | 994 | 17,382 |
| නැව්බඩු මෙහෙයවීම | 11 | 264 |
| කළමනාකරණය | 3458 | 233,885 |
| තොරතුරු පද්ධති | 790 | 65,102 |
| තාක්ෂණික ( විදුලි/යාන්ත්‍රික වැඩපල) | 490 | 30,134 |
| ගිනි, නිරාපද සහ වෘත්තීය සෞඛ්‍යය | 1040 | 11,275 |
| සමුද්‍රීය සහ නාවිකත්ව | 1542 | 43,222 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ ආධුනිකයන් වෘත්තීය පුහුණු අධිකාරියේ සහ කාර්මික විද්‍යාල සිසුන් | 178 | 180,600 |
| විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් | 168 | 141,120 |
| **එකතුව (සේවාස්ථ පුහුණුව රහිතව)** | **8325** | **401,273** |
| **එකතුව (සේවාස්ථ පුහුණුව සහිතව)** | **8671** | **722,993** |

**නව උසස්වීම් පටිපාටිය ප්‍රකාරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්හට උසස්වීම් ලබාගැනීම සඳහා යෝග්‍යතා සුදුසුකම් ලබාදීම**

අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නොමැති වීම හේතුවෙන් වරාය සේවකයන් බොහෝ දෙනෙකු එකම තනතුරේ දීර්ඝ කාලයක් රැඳී සිටින බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මගහැරවීමට සහ මෙම සුදුසුකම් ශ්‍රී ලංකා වරාය අධිකාරියට යෝග්‍ය පරිදි සපුරාලීම සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) හා ඒකාබද්ධව ව්‍යුහාත්මක පුහුණු වැඩසටහනක් සහ ජාතික වෘත්තීය සුදුසුකම් සපුරාලීමේ සහතිකය (NVQ) ලබා දීමට මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය සැලසුම් කරන ලදී.

තවද, විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා 2018 වර්ෂය තුළදී වරාය මෙහෙයුම් කළමනාකරණය, වරාය ආරක්ෂක කළමනාකරණය, ගිණුම්කරණය, විගණනය සහ මානව සම්පත් කළමනාකරණය යන විෂයයන් පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන් පවත්වන ලදී. මීට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාන්තා ගැන්ට්‍රි දොඹකර ක්‍රියාකරුවන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා නව වැඩසටහනක් පවත්වන ලදී.

**සමස්ත වරාය ඵලදායීතාවය වැඩි දියුණු කිරීම**

වරායේ සමස්ත ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා වරාය කටයුතු පිළිබඳ විවිධ විෂයයන් යටතේ මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විවිධ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

1. වරාය මූල්‍ය / ගිණුම්
2. විගණනය

3. ප්‍රසම්පාදනය හා ගබඩා කළමනාකරණය
4. ලිපිකරු කුසලතා සංවර්ධනය හා පරිපාලනය
5. මානව සම්පත් කළමනාකරණය
6. ධනාත්මක චින්තනය
7. සෞඛ්‍ය සහ නිරාපද අංශය
8. වරාය කළමනාකරණය
9. කාර්මික ශිල්පීන් සහ අධීක්ෂකවරුන් සඳහා ඉංජිනේරු සැලසුම් ඇඳීම
10. මෝටර් පාලක පරිපථ (Motor Control Circuit)
11. විදුලි කාර්මිකයන් සඳහා ඉලෙක්ට්‍රොනික විද්‍යාව
12. වැද්දුම් පාඨමාලාව
13. පරිගණක පුහුණුව
14. උපකරණ පුහුණුව ආදිය

2018 වර්ෂයේදී පාඨමාලා සඳහා සහභාගීවන්නන් 994 දෙනෙකු සඳහා එවැනි උපකරණ මෙහෙයුම් වැඩසටහන් 39ක් පවත්වන ලදී. තවද, බහළු පර්යන්තයන්හිදී මිනිස් ජීවිත සහ උපකරණවල ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික ලොරි රථ රියදුරන් 761 ක් සඳහා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් වල ප්‍රතිඵලයක් වශයෙන් ලොරි රථ කාර්යයන් සඳහා වරාය තුළ ගත කරන කාලයේ අඩුවීමක් සහ පර්යන්ත කටයුතුවල ආරක්ෂාවේ වර්ධනයක් ඇති විය.

**දේශීය හා විදේශීය සමුද්‍රීය කර්මාන්තයට දැක්වූ සහයෝගීතාවයන්**

සමුද්‍රීය කර්මාන්තයට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීමෙන් මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ලබා දෙනු ලැබේ. මෙම පුහුණු වැඩසටහන් හරහා රැකියා විරහිත හා වරප්‍රසාද නොලත් දහස් ගණන් ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්හට ජාත්‍යන්තර නෞකා සේවාවන්හි රැකියා අවස්ථා හිමි විය. 2018 වසරේදී අපේක්ෂකයින් 1542 දෙනෙකු සඳහා වැඩසටහන් 76ක් පවත්වන ලදී.

**2015 ISO 9001 තත්ත්ව සහතිකය**

මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය නැවියන් සඳහා නාවික ක්ෂේත්‍රයේ රැකියා ලබාගැනීමට අනිවාර්යය අවශ්‍යතාවයක් වන IMO/ STCW පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා තිබිය යුතු තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා ISO 9001 : 2015 තත්ත්ව සහතිකය ලබා ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධ්‍යාපනික ආයතනය වේ. නාවිකයන් සඳහා International Maritime Organization/ Standards of Training, Certification and Watch keeping පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා තිබිය යුතු අනිවාර්යය අවශ්‍යතාවයක් වන 2015 ISO 9001තත්ත්ව සහතිකය දිනා ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධ්‍යාපනික ආයතනය මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය වේ.

2018 වර්ෂයේදී මෙම ආයතනය විසින් කළමනාකරණ සමාලෝචන 03ක්, අභ්‍යන්තර තත්ත්ව විගණන 04 ක්, වෙළඳ නාවික ලේකම් කාර්යාල විගණන 01 ක් සහ ඉන්දියාවේ ලියාපදිංචි තත්ත්ව ප්‍රමිති (IRQS) විගණන 01 ක් පවත්වා ඇත.

**නවීන තාක්ෂණය භාවිතා කිරීම**

ආයතනයේ කටයුතු වලට නවීන තාක්ෂණය හඳුන්වාදීම තුළින් වරාය මහපොළ හා සමුද්‍රීය විද්‍යායතනය එහි පුහුණු වැඩසටහන් වල තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමට කටයුතු කර ඇත.

මෙහි ස්ථාපිත මෙකාට්‍රොනික පර්යේෂණාගාර බහළු අනුකාරකය (Mechatronic Laboratory Container Simulator) මගින් අභ්‍යාසිලාභීන් 23 දෙනෙකු පුහුණු කල අතර ගැන්ට්‍රි දොඹකර සහ හුවමාරු දොඹකර (Transfer Cranes) මෙහෙයුම්කරුවන් 24දෙනෙකු පුහුණු කර ඇත.

**විභව්‍ය ශ්‍රම බලකාය**

අනාගත අවශ්‍යතා සපුරාලීම සහ අළුතින් සංවර්ධනය කරන ලද වරායයන්හි කාර්යයන් සඳහා පුහුණු සේවක සංචිතයක් පවත්වා ගෙන යෑමේ කටයුතු මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් ක්‍රියාත්මක කරමින් සිටී. මෙම කාර්යය සඳහා 2018 වසරේදී වරාය උපකරණ ක්‍රියාකරුවන් 233 දෙනෙකු පුහුණු කරන ලදී.

**භාෂා සහ තොරතුරු තාක්ෂණ කුසලතා වැඩිදියුණු කිරීම**

ගෝලීය මට්ටමින් ක්‍රියාත්මක වන ව්‍යාපාරයකදී පාරිභෝගික තෘප්තිය ප්‍රධානතම සාධකයක් වන බැවින්, පාරිභෝගිකයන් වඩාත් තෘප්තියට පත්කිරීම සඳහා සේවකයන්ගේ භාෂා කුසලතා වර්ධනය කිරීම සහ ඔවුනට තොරතුරු තාක්ෂණ කුසලතා හා දැනුම ලබාදීම පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවධානය යොමු වී ඇත. මෙය යථාර්තයක් බවට පත් කිරීමේ වගකීම මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය භාර ගෙන ඇති අතර 2018 වර්ෂයේදී විවිධ තොරතුරු තාක්ෂණ පාඨමාලා පවත්වා සේවකයන් 790 දෙනෙකු පුහුණු කර ඇත. තවද, තෝරා ගත් අයදුම්කරුවන් 331 ක් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ඇතුළු විවිධ භාෂා පාඨමාලා පවත්වා ඇත. මෙයට අමතරව, බ්‍රිටිෂ් කවුන්සිල් අධ්‍යාපන ආයතනය (British Council) හා එක්ව විධායක ශ්‍රේණියේ ඉහළ නිලධාරීන් 23 දෙනෙකු සඳහා දේශන ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම පිළිබඳව පුහුණු වැඩසටහනක් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් පවත්වන ලදී.

**වෘත්තීය පුහුණුව සඳහා සහායවීම**

රජයේ විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ වෙනත් වෘත්තීය පුහුණු ආයතනයන්හි සිසුන්හට ඔවුන්ගේ අධ්‍යාපන පාඨමාලා සම්පූර්ණ කර ගැනීම පිණිස වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සහයෝගය දැක්වීමේ ක්‍රියාවලියක ශ්‍රී ලංකා වරාය අධිකාරිය නිරතව සිටී. 2018 වසරේ දී විවිධ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයන් 168 දෙනෙකු හා වෙනත් අධ්‍යාපනික ආයතන වල සිසුන් 178 දෙනෙකු සඳහා ඔවුන්ගේ පාඨමාලාවල පුහුණුවීමේ කොටස නිම කරගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් අවස්ථාව සලසා දෙනු ලැබීය.

**මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් සේවා සපයනු ලබන සමුද්‍රීය ආයතන**

මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් පහත සඳහන් ආයතන වෙත සේවාවන් සපයනු ලැබේ.

1. ශ්‍රී ලංකා නාවික හමුදාව.
2. Lanka Academy of Technical Studies (Private) Ltd.
3. CINEC ආයතනය.
4. Mercantile Seamen Training Institute Ltd.
5. UNK Global Maritime Institute.
6. වෙළෙඳ නැව් ලේකම් කාර්යාලය (Merchant Shipping Secretarait)
7. සාගර විශ්වවිද්‍යාලය (Ocean University)

**උපයන ලද ආදායම**

2018 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළදී බාහිර පාර්ශ්වයන් ගෙන් ගාස්තු අයකරන පාඨමාලා වලින් රුපියල් 21,304,422/- ක මුළු මුදලක් මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත උපයා දී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා එහි සේවකයන්හට ලබා දුන් පුහුණු වැඩසටහන් මගින් ඉපැයූ ආදායම රුපියල් 22,525,668/- ක් විය. ඒ අනුව, 2018 වසරේදී මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් උපයන ලද මුළු ආදායම රුපියල් 43,830,050 /-ක් විය.

2018 වර්ෂයේ දී මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් පවත්වන ලද පාඨමාලා සඳහා මුළු වියදම රුපියල් 8,902,870/- විය.

# උපකාරක සේවා

## ලේකම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අතිශය වැදගත් කොට්ඨාශ අතර ප්‍රධාන තැනක් හිමිවන ලේකම් කොට්ඨාශයට සභාපතිතුමාගේ කාර්යාලය, උප සභාපතිතුමාගේ කාර්යාලය, කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ කාර්යාලය සහ අතිරේක කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ කාර්යාලය අන්තර්ගත වන අතර අධිකාරියේ සමස්ත පරිපාලනමය කටයුතු මෙහෙයවනු ලබන්නේ මෙම කොට්ඨාශය මගිනි.

එය නිසි පරිදි බාධාවකින් තොරව පවත්වාගෙන යනු පිණිස ඉහළ කළමනාකාරීත්වයේ උපදෙස් අනුව චක්‍රලේඛ නිකුත් කිරීම, නීති සම්පාදනය කිරීම හා වරාය හා නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයෙන් සහ වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සඳහා කඩිනමින් පිළිතුරු සැපයීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් කිහිපයකි. මෙම පරිපාලනමය කාර්යයන් හැරුණුවිට වෙනත් අදාළ කොට්ඨාශ සමඟ මනා අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, පාර්ලිමේන්තුවේදී අමාත්‍යතුමා වෙත යොමු කරනු ලබන ප්‍රශ්ණ වලට පිළිතුරු සකස් කිරීම හා පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ වරාය අධිකාරියට අදාළ වාර්තා සකස් කිරීමද මෙම කොට්ඨාශයෙන් ඉටුවන අනෙකුත් ප්‍රධාන කාර්යයන් වේ.

විගණන අධිකාරීවරයා විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් නිකුත් කරන විගණන වාර්තාවට පිළිතුරු සැපයීම හා විගණන කාර්යයන් සඳහා රජයේ විගණන අධිකාරීවරයා හට අවශ්‍ය විස්තර සපයාදීම මෙම කොට්ඨාශයෙන් ඉටුවන තවත් විශේෂ කාර්යයකි. විගණන විමසුම්, මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රගති වාර්තා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව වරාය හා නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන්නේ ද මෙම කොට්ඨාශය මගිනි.

ශ්‍රී ලංකා රජය විසින් රටෙහි සියළුම අර්ධ රාජ්‍ය සේවකයින් ආවරණය වන පරිදි හඳුන්වා දී ඇති අග්‍රහාර (රන්) සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා ද ක්‍රියාත්මක වන අතර එහි කටයුතු මෙහෙයවනු ලබන්නේ ලේකම් කොට්ඨාශය විසිනි. මෙම නව රක්ෂණ යෝජනා ක්‍රමය මගින් පෙර පැවති රක්ෂණ යෝජනා ක්‍රමයට වඩා හොඳ හා වැඩි ප්‍රතිලාභ හිමිවන අතර, පහත සඳහන් වන පරිදි ප්‍රතිලාභ වැඩි කර ඇත.

01. පුද්ගලික රෝහලක නේවාසික ප්‍රතිකාර ගැනීමේදී ගෙවන ලද උපරිම රක්ෂණ ආවරණය වූ රු. 200,000/- ක මුදල රු. 350,000/- දක්වා ඉහළ නංවා ඇත.
02. සේවකයෙකුගේ ස්වභාවික මරණයකදී ගෙවන ලද රු. 100,000/- කරුණා සහගත දීමනාව රු. 700,000/- දක්වා ඉහළ නංවා ඇත.
03. හදිසි අනතුරකින් සිදුවන සේවක මරණයකදී ගෙවන ලද රු. 1,000,000/-ක වන්දි මුදල රු. 2,000,000/- දක්වා ඉහළ නංවා ඇත.
04. බරපතල රෝග සඳහා කරන ලද ගෙවීම්ද පහත දැක්වෙන ආකාරයට ඉහළ නංවා ඇත.

    හදවත් සැත්කම් සඳහා රු. 1,000,000/- දක්වා
    මොලයේ සැත්කම් සහ වකුගඩු සැත්කම් සඳහා රු. 1,200,000/- දක්වා
    පිළිකා සැත්කම් සඳහා රු. 600,000/- දක්වා

මීට අමතරව, වර්ෂය තුළදී විවිධ වැඩසටහන් හා උත්සව ගණනාවක් සංවිධානය කරන ලදී. 2018 වර්ෂය තුළදී ආයතනික සමාජ වගකීම යටතේ මහරගම අපේක්ෂා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන් සඳහා වියලි ආහාර බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 39 වන සාංවත්සරික උත්සවයට සමගාමීව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පොල් පර්යේෂණ ආයතනය හා ඒකාබද්ධව වරාය පරිශ්‍රය තුළ රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාවට නැංවීය. සමාජ සත්කාරක පුණ්‍ය ක්‍රියාවක් ලෙස ලේ දන් දීමේ ව්‍යාපාරයක්ද පවත්වන ලදී.

කළමනාකාර මට්ටමේ නිලධාරීන්ගේ රාජකාරීන්ට අදාළ වන පරිදි විදේශ පුහුණුවීම් වැඩසටහන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමට සුදුසු අපේක්ෂකයින් තෝරාගැනීම හා විදේශීය සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන සඳහා සහභාගී වන නිලධාරීන් හා සේවකයින් පිළිබඳ සියළු කටයුතු කිරීම මෙන්ම ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලට සහභාගීවීමට විදේශ ගතවන මලල ක්‍රිඩකයින්ගේ විදේශ ගමන් පිළිබඳ කටයුතු ඉටුකිරීම ලේකම් කොට්ඨාශය මගින් සිදු කෙරේ.

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත රටෙහි තරුණ පරම්පරාව විනාශකාරී මත් උවදුරින් ගලවා ගැනීමේ අරමුණ ඇතිව ප්‍රකාශයට පත් කරන ලද "මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ සතිය" ට සහයෝගය දැක්වීමක් වශයෙන් ලේකම් කොට්ඨාශය අසලින් වරාය මහපොළ හා සමුද්‍රීය විද්‍යායතනය දක්වා " මත් විරෝධී" පා ගමන සංවිධානය කරන ලද්දේ ලේකම් කොට්ඨාශය විසිනි.

නුවරඑළිය, ගාල්ල, ඔලුවිල් සහ කතරගම (විශේෂ) සුභසාධක නිවාඩු නිකේතන වරාය අධිකාරියේ නිලධාරීන්/සේවකයින් සඳහා රාජකාරීමය කටයුතු හෝ පුද්ගලික අවශ්‍යතාවය මත අනුමත සහනදායී ගාස්තු යටතේ වෙන් කිරීමේ කටයුතු සිදු කරනු ලබන්නේ ලේකම් කොට්ඨාශය මගිනි. ඒවාහි අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඉංජිනේරු කොට්ඨාශය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව සිදු කරනු ලැබේ.

ස්වකීය කාලය, වාහන ඉන්ධන හා කාර්ය මණ්ඩලය යොදාගනිමින් සියළුම කොට්ඨාශ හා අංශ වලින් ඒ ඒ කොට්ඨාශ හා අංශ වෙත බෙදා හැරෙන ලිපි ලේකම් කොට්ඨාශයට එක්රැස් කොට "ලිපි බෙදාහැරීමේ මධ්‍යස්ථානය" ලෙස ක්‍රියාත්මක වෙමින් ලිපි බෙදා හැරීම නිසි කලට ප්‍රමාදයකින් තොරව සිදු කරනු ලබන්නේ ලේකම් කොට්ඨාශය විසිනි.

අධිකාරියේ නිලධාරීන් /සේවකයින් විසින් සිදු කරන විෂමාචාර සම්බන්ධයෙන් ගන්නා ලද විනයානුකූල ක්‍රියාමාර්ග වලින් නිදොස් කරන ලෙස ඉල්ලා ඔවුන් විසින් සභාපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා විමර්ශනය කිරීම සඳහා විනය නීති මාලාව අනුව පත් කර ඇති අභියාචනා කමිටු වෙත ඉදිරිපත් කිරීම ලේකම් කොට්ඨාශය විසින් සිදු කරනු ලැබේ.

## තොරතුරු පද්ධති කොට්ඨාශය

### පර්යන්ත කළමනාකරණ පද්ධතිය (TMS)

නව තාක්ෂණය භාවිතා කරමින් පර්යන්ත කළමනාකරණ පද්ධතියේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම, බහළු මෙහෙයුම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, ගේට්ටු ස්වයංක්‍රීයකරණය සහ අංගණ ස්වයංක්‍රීයකරණය කිරීම පර්යන්ත කළමනාකරණ පද්ධතිය මගින් සිදු කෙරේ. අධිකාරියේ ව්‍යාපාරික ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා යෝජිත වැඩි දියුණු කිරීමේ පද්ධතිය සමඟ විශ්ලේෂක මෙවලම් මත පදනම්වූ කෘත්‍රිම බුද්ධිය, (Artificial Intelligence based Analytical Tools) ගුවන් විදුලි සංඛ්‍යාත හඳුනාගැනීම (Radio Frequency Identification), ගෝලීය පිහිටුම් පද්ධතිය (Global Positioning System) සහ දෘෂ්ටික සංකේත හඳුනාගැනීම (Optic Character Recognition) භාවිතා කරනු ඇත.

**ගුවන් විදුලි සංඛ්‍යාත හඳුනාගැනීමේ පද්ධතිය (RFID) මත පදනම් වූ ආරක්‍ෂක පද්ධතිය**

ගුවන් විදුලි සංඛ්‍යාත හඳුනාගැනීමේ පද්ධතිය මත පදනම් වූ හැඳුනුම්පත් නිකුත්කිරීමේ පලමු අදියර වරාය භාවිතා කරන්නන් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත දැනටමත් හඳුන්වා දී ඇත. පද්ධතියේ දෙවන අදියර මගින් විද්‍යුත් මාර්ගයෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීම, ගෙවීම් කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවාවන් උපරිම අයුරින් ලබාදීම සඳහා ජංගම යෙදවුම් (Mobile Apps.) හා වෙබ් අඩවි භාවිතා කිරීමේ හැකියාව ඇති කර ඇත.

**ඉලෙක්ට්‍රොනික ලේඛන (e-Docs) කළමනාකරණ පද්ධතිය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉලෙක්ට්‍රොනික ලේඛන පද්ධතියක් නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කරනු ඇත. මෙම පද්ධතිය මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළු ලේඛන අංකනය (Digitize) කෙරෙන අතර ලේඛන පහසුවෙන් ලබා ගැනීමට හා අන්‍යෝන්‍ය පරිශීලනය සඳහා යොදා ගැනීමට හැකිවේ. මෙම පද්ධතිය මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භෞතික ලේඛන කළමනාකරණය කිරීමේදී සිදු වන නාස්තිය, ගබඩා කිරීම, කාලය සහ වියදම් අවම කර ගත හැකි වනු ඇත.

**මූල්‍ය සහ ප්‍රසම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීම (ඔරකල් ඉලෙක්ට්‍රොනික ව්‍යාපාර පද්ධතිය) (Oracle e-Business Suite)**

පවත්නා මොඩියුල (Modules) මගින් නව පද්ධතිය වැඩි දියුණු කිරීම් සහිතව උත්ශ්‍රේණිගත කෙරෙනු ඇත. නව මූල්‍ය හා ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය මගින් වරාය භාවිතා කරන්නන්හට ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ගෙවීම් සිදු කිරීමට හැකි වන අතර නව පහසුකම් රැසක්ද හිමි වනු ඇත.

## නීති කොට්ඨාශය

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ ප්‍රකාශිත විශේෂිත වරායයන් එනම් කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට සහ කන්කසන්තුරේ/පේදුරුතුඩුව යන වරායයන්ට නීති නිලධාරීන් නීති උපදේශකයන් වන අතර ඔවුන් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්‍ෂ මණ්ඩලයට, අධ්‍යක්‍ෂවරුන්හට, කොට්ඨාශ ප්‍රධානීන්හට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙනත් කොට්ඨාශ වලට උපදෙස් ලබා දෙනු ලැබේ.

**නීති උපදෙස්**

2018 වර්ෂය තුළ වරාය අධිකාරියේ කළමනාකාරීත්වයට සහ කොට්ඨාශ ප්‍රධානීන්හට නීති උපදෙස් 500කට අධික ප්‍රමාණයක් ලබා දී ඇත.

මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන සහ නීති කොට්ඨාශයේ විෂය පථය යටතට ගැනෙන කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු (පැවරුම්, බදුකර, ප්‍රකාශන, උකස්කර ආදිය) කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඒ හා සම්බන්ධ වෙනත් කටයුතු වල නිරතවීමද නීති කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ.

**කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර සහ ඔප්පු**

2018 වර්ෂය තුළ ගිවිසුම් 18 ක්, ගිවිසුම්/කොන්ත්‍රාත්තු 23ක් සහ අවබෝධතා ගිවිසුම් නීති කොට්ඨාශය විසින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එම ලේඛනවලට අමතරව, පහත සඳහන් ගිවිසුම් සහ බැඳුම්කරද ක්‍රියාත්මක කර ඇත.

- විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු පිළිබඳ ගිවිසුම් සහ බැඳුම්කර 09ක්
- ශ්‍රී ලංකාව තුළ සහ විදේශගත පුහුණුවීම් හා අධ්‍යාපනික කටයුතු සම්බන්ධයෙන් ගිවිසුම් හා බැඳුම්කර 29ක්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන අධිකරණ නඩු සම්බන්ධ සියළුම කටයුතු නීතිපතිගේ සහ බාහිර නීතිඥවරුන්ගේ සහාය ඇතිව නීති කොට්ඨාශය විසින් මෙහෙයවනු ලැබේ.

**නඩු කටයුතු**

2017 දෙසැම්බර් මස අවසන් භාගය වන විට ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණ, දිසා අධිකරණ, කම්කරු විනිශ්චය සභා, මහේස්ත්‍රාත් අධිකරණ, කම්කරු දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිසම, මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්,(Ombudsman) කම්කරු උසාවි, කම්කරු වන්දි සහ බේරුම්කාර මධ්‍යස්ථාන හමුවේ නඩු/පැමිණිලි/ අයැදුම් 398ක් විමසුම් කෙරෙමින් පැවතින.

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව/ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අළුත් නඩු පැමිණිලි සහ අයදුම් 109ක් ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය, කම්කරු විනිශ්චය සභා, මහේස්ත්‍රාත් අධිකරණය, මානව හිමිකම් කොමිසම, කම්කරු කොමසාරිස්, කම්කරු දෙපාර්තමේන්තුව, බේරුම්කාර හා කම්කරු වන්දි විනිශ්චය සභාව සහ රේගු විමර්ශන අංශය හමුවේ ගොනුකර තිබේ. සමස්ත නඩු 507න් 82ක් 2018 වර්ෂයේදී අවසන් කර ඇත.

2018.12.31 දිනට නඩු /පැමිණිලි/අයැදුම් 424ක් එකී විනිශ්චයායතනයන්හි නිම නොවී පැවතින.

**ශ්‍රේෂ්ඨාධිකරණ නඩු**

2017 වසර අවසන් වන විට නඩු 32ක් විභාග වෙමින් පැවතින. 2018 වසර තුළ අළුතින් නඩු 08ක් ගොනු කර ඇත. සමස්ත නඩු 40න් නඩු 02ක් නිෂ්ප්‍රභ කර, 01ක් අවසන් කර, 02ක් ඉල්ලා අස් කර ගන්නා ලදී. 2018.12.31 දිනට නඩු 35ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පැවැතින.

**අභියාචනාධිකරණ නඩු**

2017.12.31 දිනට නඩු 24ක් විභාග වෙමින් පැවතින. 2018 වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අළුතින් නඩු 02ක් ගොනු කර ඇත. මුළු නඩු 26න් නඩු 04ක් නිෂ්ප්‍රභ කරන ලදී. 2018.12.31 දිනට නඩු 22ක් අභියාචනාධිකරණයේ විභාග වෙමින් පැවතිනි.

**මහාධිකරණ නඩු**

2017 දෙසැම්බර් 31 දිනට මහාධිකරණයේ නඩු 15ක් විභාග වෙමින් පැවතින. 2018 වර්ෂය තුළ එක් අළුත් නඩුවක් ගොනු කර ඇත. මුළු නඩු 16න් එක් නඩුවක් නිෂ්ප්‍රභ කල අතර එක් නඩුවක් ඉල්ලා අස් කර ගන්නා ලදී. 2018.12.31 දිනට මහාධිකරණය ඉදිරියේ නඩු 14ක් විභාග වෙමින් පැවතින.

**දිසා අධිකරණ නඩු**

2017.12.31 දිනට නඩු 09ක් විභාග වෙමින් පැවතින. 2018 වර්ෂය තුළ අළුත් නඩු 03ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ගොනු කර ඇත. සමස්ත නඩු 12න් එක් නඩුවක් අවසන් කර, 02ක් නිෂ්ප්‍රභ කරන ලද අතර එක් නඩුවක් ඉල්ලා අස්කර ගන්නා ලදී. 2018.12.31 දිනට දිසා අධිකරණයෙහි නඩු 08ක් විභාග වෙමින් පැවතින.

**මහේස්ත්‍රාත් අධිකරණ නඩු**

2017.12.31 දිනට නඩු 22ක් මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පැවතින. 2018 වර්ෂය තුළ අළුත් නඩු 72 ක් මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරන ලදී. නඩු 94 කින්, එක් නඩුවක් ඉල්ලා අස්කර ගත් අතර, නඩු 02ක් නිෂ්ප්‍රභ කර, නඩු 49ක් අවසන් කරන ලදී. 2018.12.31 දිනට නඩු 42ක් මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පැවතින.

**කම්කරු විනිශ්චය සභා නඩු**

2017.12.31 දිනට කම්කරු විනිශ්චය සභා වල නඩු 05ක් විභාග වෙමින් පැවතින. 2018 වර්ෂයේ දී අළුත් නඩු 03 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ගොනු කරන ලද අතර කම්කරු විනිශ්චය සභා නඩු 08න් 05 ක් නිෂ්ප්‍රභ කරන ලදී. 2018.12.31 දිනට නඩු 03 ක් කම්කරු විනිශ්චය සභාවේ විභාග වෙමින් පැවතින.

**මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අයැදුම්, කම්කරු ආරවුල් (සමතයට පත්කිරීමේ නඩු) සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද පැමිණිලි, මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සහ කම්කරු වන්දි කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද අයැදුම්**

2017.12.31 දිනට මානව හිමිකම් කොමිසම (HRC) ඉදිරියේ අයැදුම් 163 ක්, කම්කරු කොමසාරිස් ඉදිරියේ සමතයකට පත්කිරීම සඳහා පැමිණිලි 100ක්, මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) ඉදිරියේ පැමිණිලි 18 ක් සහ කම්කරු වන්දි විනිශ්චය සභාව ඉදිරියේ පැමිණිලි 01ක් විභාග වෙමින් පැවතින.

2018 වර්ෂය තුළදී මානව හිමිකම් කොමිසම වෙත නව අයැදුම් 05ක්, මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත එක් අළුත් පැමිණිල්ලක්, කම්කරු කොමසාරිස්වරයා වෙත සමතයකට පත් කිරීම සඳහා නව පැමිණිලි 14ක් ඉදිරිපත් වූ අතර කම්කරු වන්දි විනිශ්චය සභාව වෙත කිසිදු අයැදුමක් ඉදිරිපත් නොවීය.

මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කරන ලද අයැදුම් 04ක්, සහ සමතයකට පත්කිරීම සඳහා වූ පැමිණිලි 04ක් 2018 වර්ෂයේ දී අවසන් කරන ලද අතර කම්කරු විනිශ්චය සභාව වෙත කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත් නොවීය.

ඒ අනුව, 2018.12.31 දිනට, මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අයැදුම් 164 ක්, සමතයකට පත්කිරීම සඳහා පැමිණිලි 110 ක්, මහජන පැමිණිලි පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) ඉදිරියේ වූ පැමිණිලි 19 ක් සහ කම්කරු වන්දි විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කල එක් පැමිණිල්ලක් විභාග වෙමින් පැවතිනි.

**බේරුම්කාර නඩු**

2017.12.31 දිනට වාණිජ බේරුම්කාර නඩු 03ක් සහ කාර්මික බේරුම්කාර නඩු 06ක් විභාග වෙමින් පැවතිනි. 2018 වර්ෂය තුළදී කිසිදු කාර්මික බේරුම්කාර නඩුවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ගොනු කර නොමැත. එක් කාර්මික බේරුම්කාර නඩුවක් සමතයට පත් කරන ලද අතර එක් වාණිජ බේරුම්කාර නඩුවක් අවසන් කරන ලදී. ඒ අනුව, 2018.12.31 දිනට කාර්මික බේරුම්කාර නඩු 02ක් සහ වාණිජ බේරුම්කාර නඩු 05ක් විභාග වෙමින් පැවතින. (බේරුම්කාර විනිශ්චය සභාව විසින් තීන්දු කර ඇති ප්‍රදානයට එරෙහිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති බැවින් අවසන් කර ඇති වාණිජ බේරුම්කාර නඩු 02ක් අවසන් නොවූ නඩු ලෙස සලකනු ලැබේ.)

**රේගු විමර්ශන**

2017.12.31 දිනට, රේගු විමර්ශන 02ක් විමර්ෂනයට ලක්වෙමින් පවතින අතර, 2018.12.31 දිනට එක් විමර්ශනයක විමසුම් කටයුතු අවසන් නොවී පැවතුනි.

## සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාශය

ශ්‍රී ලංකාවේ සියළුම වාණිජ වරායයන්හි මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය කරනු ලබන ඉන්ධන ගබඩා කිරීම සහ නිකුත් කිරීම, යන්ත්‍ර සහ උපකරණ අමතර කොටස් සහ වෙනත් අයිතම මිලදී ගැනීම (දේශීය සහ විදේශීය) මෙම කොට්ඨාශයේ කාර්යභාරයට ඇතුළත් වේ.

**2018 වර්ෂයේ ප්‍රගතිය**

**සමාලෝචිත වර්ෂය තුළ අනුමත කල ටෙන්ඩර් සංඛ්‍යාව**

| විස්තරය | ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව | ටෙන්ඩර් මණ්ඩල අනුමැතීන් සංඛ්‍යාව |
|---|---|---|
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (රු. 2,000,000/- ට වඩා වැඩි) | 13 | 130 |
| අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව-A (රු.500,000/-සිට 2,000,000/- දක්වා) | 51 | 1,474 |
| අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව-B (රු.500,000/- ට අඩු) | 91 | 5,412 |

**විදේශීය මිලදී ගැනීම් වල 2018 වර්ෂයේ සමස්ත වියදම**

- භාණ්ඩ වල වටිනාකම (C & F Value)
  - **i.** ප්‍රාග්ධන නොවන අයිතම - Rs. 249.51 million
  - **ii.** ප්‍රාග්ධන අයිතම - Rs. 46.058 million
- විවෘත කල ණයවර ලිපි (භාණ්ඩ භාරගැනීම(D/A) සහ භාණ්ඩ සඳහා ගෙවීම(D/P) ඇතුළත්ව) - 53
- විවෘත කල ටෙලිග්‍රැෆික් භාරදීමේ නියෝග - 45

**2018 වර්ෂය තුළ වාප්පු අංශය මගින් නිෂ්කාශනය කරන ලද නැව් භාණ්ඩවල විස්තර**

| | |
|---|---|
| මුහුදු මගින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ | 59 |
| ගුවන් මගින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ | 37 |
| තැපැල් මගින් ගෙන්වන ලද භාණ්ඩ | 03 |

**2018.12.31 දිනට තොග වල වටිනාකම රු. 762,389,366.53**

**ප්‍රධාන ගබඩාව සහ තොග පාලනය**

- 2018 වර්ෂය තුළ ගබඩා වෙත ලැබුණු භාණ්ඩ වල වටිනාකම (ප්‍රාග්ධන නොවන) Rs.2,104,745,177.24
- 2018 වර්ෂය තුළ ගබඩා වලට ලැබුණු භාණ්ඩ වල වටිනාකම (ප්‍රාග්ධන) Rs. 241,461,466.44
- භාවිත අංශ වෙත නිකුත් කල භාණ්ඩ වල වටිනාකම (ප්‍රාග්ධන නොවන) Rs.2,087,065,197.54

## ආරක්ෂක කොට්ඨාශය

ආරක්ෂක කොට්ඨාශය වරාය අධිකාරිය තුළ ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සියළුම වරාය සේවාවන් සඳහා ආරක්ෂාව සැපයීම, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලනයට අයත් සියළුම වරායයන් සතු දේපල හා මානව සම්පත ආරක්ෂා කිරීම, වරාය භාවිතා කරන්නන්, වරාය භූමිය හා මුහුදු සීමාවන් ආරක්ෂා කිරීම මෙන්ම මෙහෙයුම් කරනු ලබන භාණ්ඩ හා සේවාලාභී යාත්‍රා වෙත ආරක්ෂාව සැපයීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන වගකීම් වේ. මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභිලාශයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ආරක්ෂක කටයුතු ඉතා ප්‍රශස්ථ මට්ටමින් සැපයීමට මෙම කොට්ඨාශය බැඳී සිටින අතර එම කාර්යය ඉටු කිරීම සඳහා ගතයුතු සෑම පියවරක්ම ගනු ලබන අතර සපයනු ලබන වෙනත් විවිධ සේවාවන් මගින් ආදායම් ඉපයීමට ද මෙම කොට්ඨාශය සමත් වී ඇත.

ඒ අනුව, පෙර වර්ෂ වලදී මෙන්ම 2018 වසර තුළදී ද විවිධ වරාය බලපත්‍ර නිකුත් කිරීම මගින් රු. 560,054,657.51 ක ආදායමක් උපයා ඇති අතර එසේ නිකුත්කරන ලද බලපත්‍ර වර්ග පහත පරිදි වේ.

- වාර්ෂික වාහන බලපත්‍ර
- වාර්ෂික පුද්ගල බලපත්‍ර
- මාසික පුද්ගල බලපත්‍ර
- මාසික වාහන බලපත්‍ර
- Angling බලපත්‍ර
- තාවකාලික පුද්ගල හා වාහන බලපත්‍ර
- නව ප්‍රවාහන වාහන ආදේශනය කිරීමේ දී නිකුත් කරන බලපත්‍ර විශේෂ වාහන බලපත්‍ර (විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව)
- අනුමැතිය ලත් වාහන සඳහා බලපත්‍ර
- අධිකාරියේ නිලධාරීන් වෙත නිකුත් කරන බලපත්‍ර
- අධිකාරියේ සේවකයින් සඳහා නිකුත් කරන බලපත්‍ර (හැඳුනුම්පත්)
- සංචිත වාහන සඳහා බලපත්‍ර
- සේවකයින්ගේ පෞද්ගලික වාහන සඳහා බලපත්‍ර

මීට අමතරව, නිදහස් පුද්ගල හා වාහන බලපත්‍ර නිකුත් කරන ලද අතර වරාය තුල ප්‍රවාහන කටයුතු සඳහා නව වාහන සපයන ආයතන වෙත බාධාවකින් තොරව වාහන බලපත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි විනිවිධභාවයකින් යුතුව කටයුතු කරන ලදී.

**ක්‍රියාත්මක කළ නව වැඩසටහන්**

- වසර පහකට බලපැවැත්වෙන පරිදි වාර්ෂිකව මුදල් ගෙවා අළුත් කිරීමේ පදනම මත මෙතෙක් නිකුත් කල වාර්ෂික පුද්ගල බලපත්‍රය (RPU) වෙනුවට වසරක් පාසා මුදල් ගෙවා අළුත් කලයුතු වාර්ෂික පුද්ගල බලපත්‍රයක් (RPU) නිකුත් කිරීමට කටයුතු කරන ලදී. එමගින් වාර්ෂික බලපත්‍ර අළුත් නොකර වරායට පිවිසෙන බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් පැන නගින ගැටළුකාරී තත්ත්වයන් මගහරවා ගැනීමට හැකිවිය.
- වරාය භාවිතා කරන්නන් වරායට පිවිසීමේදී මුහුණදෙන අපහසුතා මගහරවමින් බලපත්‍ර නිකුත්කිරීමේ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව කිරීම සඳහා මාසික හා වාර්ෂික වරාය පිවිසුම් බලපත්‍ර මාර්ගගත ක්‍රමයට (Online) ලබා ගැනීමට පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය සැලසුම් සකස්කර ඇති අතර එම වැඩසටහන ඉදිරි වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.
- ජාත්‍යන්තර නෞකා හා වරාය ආරක්ෂක නියමයන් (ISPS CODE) අනුගමනය කරමින් සියළු වරායයන්වල අදාල සියළු ස්ථාන ආවරණය වන පරිදි දැන්වීම් පුවරු ස්ථාපිත කිරීමට 2018 වසරේ දී කටයුතු කරන ලදී.
- වරාය පාර්ශ්වීය ආයතන වෙත ජාත්‍යන්තර නෞකා හා වරාය ආරක්ෂක නියමයන් පිළිබඳව පුහුණු සැසිවාර 2018 වසරේදී පැවැත්වූ අතර ඉදිරි වර්ෂයේදී ද පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

- සියළුම ගේට්ටු, අංගන හා පර්යන්ත වල ආරක්ෂක කටයුතු විධිමත් කිරීම සඳහා අධි තාක්ෂණික CCTV කැමරා පද්ධතියක් සවිකිරීමේ ව්‍යාපෘතියක් 2017 වර්ෂයේදී සැලසුම් කරන ලද අතර 2018 වර්ෂයේදී එම ව්‍යාපෘතියේ ඇගයුම් කටයුතු අවසන් කර, මේ වන විට එය අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.
- වරාය ගේට්ටුවලදී සියළුම පුද්ගලයින් හා භාණ්ඩ ස්කෑන් යන්ත්‍ර මගින් පරීක්ෂා කිරීම සඳහා අදාළ අධි තාක්ෂණික ස්කෑනර් යන්ත්‍ර මිළදී ගැනීම සඳහා මූලික කටයුතු 2018 වසරේදී සිදු කර ඇති අතර, මෙම යන්ත්‍ර මිලදී ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.
- ආරක්ෂක නාවික අංශය ප්‍රතිසංවිධානය කර වරාය තුල හා ඉන් පිටත මුහුදු සීමාවේ ආරක්ෂක කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා පොලිස් නාවික කොට්ඨාශය ශ්‍රී ලංකා නාවික හමුදාව හා එක්ව නව ආරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව, වරාය මුහුදු ප්‍රදේශය තුළ ධීවරයින් විසින් සිදු කරන ලද මාදැල් එලීම වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සීමා කිරීමට ආරක්ෂක කොට්ඨාශයේ නාවික අංශයට හැකි වී ඇත.

ඉහත සඳහන් කළ සෑම කාර්යයක් ම සාර්ථකව ඉටු කිරීම උදෙසා පුහුණු මානව සම්පත් අවශ්‍යතාවය 2018 වර්ෂයේදී හඳුනාගත් අතර පුරප්පාඩු පැවති තනතුරු සඳහා නව බඳවාගැනීම් සිදු කොට මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය හා එක්ව ඔවුනට අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කරන ලද අතර කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා දැනුම කුසලතා සහ ආකල්ප සංවර්ධනය කරමින් ගුණාත්මක භාවයෙන් යුත් ආරක්ෂක සේවාවක් පවත්වාගෙන යාම සඳහා සෑම නිලයක්ම නියෝජනය වන පරිදි පහත සඳහන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එමගින් කොළඹ වරායේ පමණක් නොව ප්‍රාදේශීය වරායන් හි ආරක්ෂක නිලධාරීන් ද පුහුණු කරන ලදී.

**ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්**

- අන්තරාදායක නැව් බඩු සහ විනාශකාරී අවිආයුධ වරාය පරිශ්‍රයන් තුලින් සංසරණයවීම වැලැක්වීම.
- ආරක්ෂක සැරයන් තනතුර වෙත උසස්වීම් ලබා දීම සඳහා වූ පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම
- කාර්යාල කටයුතු පිළිබඳ මූලික අවබෝධය ලබාදීම
- ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නියාමක සංස්කරණ පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම

මෙලෙස ගුණාත්මකභාවයෙන් යුතු ආරක්ෂක සේවාවක් ලබා දෙමින් 2018 වර්ෂය තුළදී අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වීමට මෙම කොට්ඨාශය සමත් වී ඇත.

## සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය එහි ආරම්භයේ සිටම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් සහ බාහිර ආයතන අතර සතුටුදායක හා ධනාත්මක සම්බන්ධතාවයන් ශක්තිමත් ලෙස ගොඩ නගමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ඉහළ නැංවීමෙහිලා පෘථුල ලෙස කටයුතු කර ඇත.

මාධ්‍ය ආයතන, පොදු මහජනතාව, රජයේ දෙපාර්තමේන්තු, නියෝජිත ආයතන හා ආයතනික පරදුභාරකරුවන් සමඟ සන්නිවේදන හා මහජන සම්බන්ධතා ශක්තිමත් කිරීම සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම් වලින් එකකි. මාධ්‍යවේදීන්, විශ්ලේෂකයින්, රජයේ නිලධාරීන් සහ අනෙකුත් ප්‍රධාන බලපෑම්කරුවන් සමඟ සම්බන්ධතාවය හා සන්නිවේදනය කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීමෙහිලා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් සිදු කරන අතිශය වැදගත් කාර්යයකි.

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය, දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය ආයතන, පරදුභාරකරුවන් සහ ක්ෂේත්‍රයේ නියුතු අනෙකුත් අභිප්‍රායික පාර්ශ්වයන් සමඟ සහයෝගීතාවයෙන්

යුතුව කටයුතු කිරීමට පුළුල් පියවර ගෙන ඇත. තව තවත් නාලිකා ආකර්ශනය කර පසුගිය වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පවත්වන ලද ක්‍රියාකාරකම් හා වැඩසටහන් තුළින් මහජන සම්බන්ධතා ශක්තිමත් කරමින් ධනාත්මක ප්‍රචාරණයක් ලබාදීමට මෙම කොට්ඨාශය විසින් නිර්මාණාත්මක පියවර ගෙන ඇත.

ප්‍රවෘත්ති නිර්මාණය හා සන්නිවේදනය, විශේෂාංග ලිපි හා බහු මාධ්‍යය, ඉලක්කගත කණ්ඩායම් වෙත තොරතුරු බෙදාහැරීම මෙන්ම සාම්ප්‍රදායික සහ සමාජ මාධ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, වර්ධනය කිරීම, කළමනාකරණය සහ අධීක්ෂණය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිළිබඳ ප්‍රචාරය සහ එහි කීර්තිනාමය ධනාත්මකව වර්ධනය කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි අපගේ ප්‍රධාන වැඩසටහන් හා ක්‍රියාකාරකම් මගින් අවධානය යොමු කරන ලදී. එසේ කරන ලද්දේ මාධ්‍ය හමු, පිළිගැනීමේ උත්සව සහ සම්මුඛ සාකච්ඡා, මාධ්‍ය නිවේදන සැකසීම, සංස්කරණය සහ නිකුත් කිරීම, රූපවාහිනී වාර්තාමය චිත්‍රපට, ඡායාරූප ඇල්බම සහ අනෙකුත් දේශන ඉදිරිපත් කිරීම මගින් සහ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා එක්රැස් කිරීම ආදිය මගිනි.

2018 වර්ෂය තුළ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් නිතිපතා පවත්වාගෙන එන ප්‍රකාශන අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාකාරකම් හා අත්කරගත් ජයග්‍රහණ පිළිබඳ පුළුල් ලෙස දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් ග්‍රාහක පිරිස සහ ජාල සම්බන්ධතාවය පුළුල් කිරීම සඳහා නව මාර්ගගත ප්‍රකාශන හඳුන්වාදෙන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උත්සව සහ ක්‍රියාකාරකම් කේන්ද්‍ර කර ගනිමින් මුළු වර්ෂය තුළම විවිධ නිල මාධ්‍ය නිවේදන ගණනාවක් නිකුත් කර ඇත.

මේ වන විට 12 වන ප්‍රකාශන වසරෙහි පසුවන "තීර්ථ" පුවත්පත 2018 වර්ෂය තුළදී කලාප හතරක් නිකුත් කර ඇති අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් අතර හා පරදුභාරකරුවන් අතර නොමිලේ බෙදා දී ඇත. මෙම සෑම කලාපයක් මගින්ම වරාය හා නාවික ක්ෂේත්‍රයේ වත්මන් කටයුතු, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකරණ උපායමාර්ග, ආකර්ශනීය සේවා පරිසරය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ පවුල්වල සාමාජිකයන් අත්කරගත් ජයග්‍රහණ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ මගින් සංවිධානය කරන ලද උත්සව ආදී විවිධ වැදගත් විෂයයන් සහ අධිකාරියේ විවිධ කොට්ඨාශ මගින් සංවිධානය කරන ලද උත්සව ආදිය ආවරණය කර ඇත. තවද, වරාය අධිකාරියේ දීර්ඝ කාලයක් සේවය කොට විශ්‍රාම ගන්නා සේවකයින් වෙනුවෙන් පුවත්පතේ ප්‍රමුඛස්ථානයක් ලබාදී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් විසින් රචිත තෝරාගත් කාව්‍යය එකතුවක් වන "කාව්‍යාංජලී" ග්‍රන්ථය ප්‍රකාශයට පත් කොට ඇත. පිටු 80කින් යුත් මෙම ග්‍රන්ථයේ කවි 60ක් අන්තර්ගත වේ.

අපගේ ඉලක්කගත ග්‍රාහක පිරිස සමඟ ඇති ආකර්ෂණය පුළුල් කිරීමටත් හා ශක්තිමත් කිරීමත් 2018 වර්ෂය අගදී මෙහෙයුම් ආරම්භ කරන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් වූ නව අන්තර්ජාල වෙබ් අඩවි ඇතුළත් නාමාවලිය සහ නිල ට්විටර් ගිණුමක් සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් සැලසුම් කොට විකාශය කිරීම ආරම්භ කර ඇත. අන්තර්ජාල වෙබ් අඩවි ඇතුලත් නාමාවලි දෙකක් නිල වශයෙන් එළිදැක්වීම 2019 වර්ෂය ආරම්භයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

සන්නිවේදන හා මහජන සම්බන්ධතාවලට අදාළ ලිපිලේඛන වලින් වැඩි ප්‍රමාණයක් සංඛ්‍යාංකනය කිරීම සඳහා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් new.slpa.lk පිවිසුමෙන් පවතින එහි නව වෙබ් අඩවි නාමාවලිය ආරම්භ කරන ලදී. මෙම වෙබ් අඩවිය මගින් වර්ෂය මුළුල්ලේම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන්වූ මුද්‍රිත පුවත්පත් වාර්තා පරිලෝකනය කර එකතුවක් පවත්වාගෙන යනු ලැබේ.

සීඝ්‍රයෙන් දියුණු වන සමාජ මාධ්‍ය ජාලා ආකර්ශනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිය නිල ට්විටර් ගිණුම ආරම්භ කිරීමට සැලසුම් කරන ලද අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ

අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිතා කරන මුහුණු පොත (Facebook) සහ යූ ටියුබ් (You Tube) පිටු වලට එකතු කරන ලදී. ගතානුගතික ප්‍රකාශන මාධ්‍ය පවත්වාගනිමින් අන්තර්ජාලය, දුරකථන සහ සමාජ මාධ්‍ය ආදී බහුවිධ සන්නිවේදන මාධ්‍ය හරහා සන්නිවේදනය ප්‍රශස්ත අයුරින් සිදු කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන බව සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විශ්වාස කරනු ලැබේ.

මහජන සම්බන්ධතාවයේ වැදගත්කම හුවා දැක්වීමට සහ එය රූප රාමු මගින් පෙන්වීම සඳහා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් පසුගිය වර්ෂයේදී වීඩියෝ නිර්මාණ ගණනාවක් පටිගත කොට සංස්කරණය කර ප්‍රචාරය කරන ලදී. සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ විශ්‍රාමගැනීමේ උත්සව වැනි අවස්ථා 88ක වීඩියෝ පට නිෂ්පාදනය කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියට අදාළ ප්‍රවෘත්ති පිළිබඳ වීඩියෝ 72ක් නිෂ්පාදනය කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිෂ්පාදනය කරන ලද ප්‍රවෘත්ති වීඩියෝ රටේ රූපවාහිනී නාලිකා සමඟ හුවමාරු කර ගන්නා ලද අතර ඒවා ඔවුන්ගේ ප්‍රවෘත්ති පැයේදී විකාශනය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හස්තය ලෙස සැලකෙන සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින්/ පසුගිය වර්ෂයේ පැවරී තිබූ ඉලක්ක ගණනාවක් සාර්ථකව සපුරා ගැනීම සඳහා වීඩියෝ කැමරා, ඡායාරූපකරණය, වීඩියෝ සංස්කරණය, මාධ්‍ය රූප නිර්මාණකරණය (Graphic Designing) සහ මාධ්‍ය ඒකක හරහා කාර්යක්ෂමව කටයුතු කර ඇත. වාර්තා තබාගැනීම් හා බෙදාහැරීම් සඳහා ආයතනය තුළ රූපවාහිනි වාර්තාමය කෙටි චිත්‍රපටි (Tele-documentaries) වල වීඩියෝපට නිර්මාණය සුවිශේෂී අවස්ථාවන් වල දෘෂ්‍යපට හා මුද්‍රිත ලියවිලි සුරක්ෂිතව තබාගැනීම, වාර්තා තබාගැනීම හා ප්‍රචාරය කිරීම සඳහා වැදගත් අවස්ථා වලදී ගනු ලබන ලද, ඡායාරූප එකතුවක් තබාගැනීම මෙන්ම මහජන සම්බන්ධතා පුළුල් කිරීම සඳහා විවිධ උත්සව සංවිධානය කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරදුභාරකරුවන් සහ කොළඹ වරාය සමඟ අන්තර් සම්බන්ධතා වැඩි දියුණු කිරීම මීට ඇතුළත් වේ.

ජය බහළු පර්යන්ත (JCT ), සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමඟ එක්ව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සංවිධානය කරන ලද "Port of Colombo Awards Night" පළමු වරට මේ වර්ෂයේ කොළඹදී පැවැත්විණ. මෙම උත්සවය සම්පූර්ණයෙන්ම සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. Port of Colombo Awards Night – 2018 හිදී ශ්‍රී ලංකාව කලාපයේ ප්‍රධාන කේන්ද්‍රීය වරායක් බවට පත් කිරීමට යන ගමනේදී වරායේ වර්ධනය වෙමින් පවතින මෙහෙයුම් ධාරිතාවය කෙරෙහි ඔවුන් විසින් දායකත්වය ලබාදෙන සේවාවේ වටිනාකම හඳුනාගන්නා ලදී. කොළඹ වරාය සඳහා දක්වන ලද දායකත්වය හඳුනාගනිමින් ප්‍රධාන නැව් සේවා මෙහෙයුම්කරුවන් සහ පෝෂිත නැව් සේවා මෙහෙයුම්කරුවන් Port of Colombo Awards Night – 2018 හිදී අභිනන්දනයට පාත්‍ර කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය විදහා දැක්වීම පිණිස සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය රජය විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන දෙකක් සඳහා එනම් සංවර්ධන උපාය මාර්ග, ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය සහ වරාය හා නාවික අමාත්‍යාංශය සමඟ සම්බන්ධව බෝට්ටු තැනීමේ තාක්ෂණය වැඩිදියුණු කිරීමේ ආයතනය (BTI) සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් සංවිධානය කරන ලද ගාලු වරායේ රුවල් යාත්‍රා අංගණයේ පැවති ප්‍රදර්ශනය සහ "Boat Show & Boat Festival Sri Lanka 2018" මුදල් සහ ජන මාධ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ව්‍යවසාය සංවර්ධනය අරමුණු කර ගනිමින් මොනරාගලදී පැවති "Enterprise Sri Lanka" ප්‍රථම ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

2018 වර්ෂයේ හොඳම වරාය අධිකාරිය සඳහා වූ සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දිනාගනු ලැබූ වසරේ ආරම්භයේදී ඩුබායිහි පැවති ගෝලීය වරාය සංසදයේදී සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය නියෝජනය කරන ලදී.

වාර්ෂික දින දර්ශන සහ දිනපොත් සැලසුම් කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදාහැරීමේ කටයුතු සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

ආයතන සහ මහජනතාව අතර සම්බන්ධතාව ගොඩනංවා පවත්වාගෙන යන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉතාම වැදගත් කොට්ඨාශය ලෙස සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ කාර්යභාරය ඉතා සුවිශේෂ වේ.

## අභ්‍යන්තර විගණන කොට්ඨාශය

**වගකීම**

අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ කාර්යයන් වාර්ෂිකව විගණනය වැඩසටහන මගින් මෙහෙයවන ලද අතර ඒවා විගණන කමිටු රැස්වීමේදී නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය විශ්වසනීයතා වගකීම් ඉටුකිරීම සඳහා සහාය ලබාදේ. විගණන කමිටුව හරහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ ඵලදායී සහ සවිස්තරාත්මක කරුණු අඩංගු වූ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වී ඇත. වැදගත් මූලික අභ්‍යන්තර පාලන පියවරක් වශයෙන් අභ්‍යන්තර සැලැස්ම සහ සමාලෝචනයට යටත්ව පවතින විගණන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. කමිටුව විසින් තවත් වැදගත් කටයුතු කිහිපයක්, අධිකාරියේ පාලනය ඉහළ තත්ත්වයකට නගා සිටුවා පවත්වාගෙන යෑමේ අරමුණින් වැදගත් කාර්යයන් ගණනාවක් ක්‍රියාත්මක කොට ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම්/වියදම් පිළිබඳව අභ්‍යන්තර පිරික්සුම් සහ සාමාන්‍ය අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදු කරන ලදී.

**අභ්‍යන්තර පරීක්ෂණ**

**සේවක පැමිණීම**

කම්කරු හා කම්කරු නොවන සේවකයින් සිය සේවා ස්ථානයේ රැඳී සිටී දැයි පරීක්ෂා කිරීම සඳහා හදිසි පරීක්ෂණ කටයුතු, හදිසි වැටලීම් කණ්ඩායම විසින් දිවා රාත්‍රී මුර සේවා තුළදී නිතිපතා සිදු කරනු ලැබී ය. අනවසරයෙන් සේවා ස්ථානයෙන් බැහැරව සිටි සේවකයින් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම පිණිස වාර්තා කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයින් සිය සේවා ස්ථාන වල රැඳී සිටීම යහපත් අතට පත් විය.

**මුදල්**

මුදල් හා සුළු මුදල් අග්‍රිමය වරින් වර හදිසි පරීක්ෂා කිරීම් වලට භාජනය කරනු ලැබූ අතර ඌණතාවයන් පිළිබඳව වාර්තා කරන ලදී.

**ආදායම් විගණනය**

විශේෂ කාර්යයක් ලෙස වරායෙහි ආදායම් ලැබීම් පිළිබඳව විගණන කටයුතු, විගණන වැඩසටහන අනුව සිදුකරන ලද අතර, එමගින් වරාය ගාස්තු අඩුවෙන් අයකිරීම පිළිබඳ සිද්ධීන් අනාවරණය විය.

ණයගැති ගිණුම්, විවාදිත බිල්පත් සහ අගරු චෙක්පත් පරීක්ෂණයට භාජනය කළ අතර ඒවායේ අඩුලුහුඩුකම් වාර්තා විය. ගොඩබෑමේ සහ භාරදීමේ ඒකක සම්බන්ධයෙන් අඛණ්ඩ පරීක්ෂණ සිදුකරන ලදී.

**වියදම් විගණනය**

ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සහ ගබඩා ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කරන ලදී. අතිරික්ත ගෙවීම් සහ වෙනත් අක්‍රමිකතා අනාවරණය කරගන්නා ලදී. වාහන ධාවන සටහන් පත් සහ වාහන අවසර පත් පරීක්ෂාවට ලක් කළ අතර ඌණතාවයන් අනාවරණය කරගන්නා ලදී.

වැටුප් හා වේතන සකස් කිරීම් සම්බන්ධයෙන් නිතිපතා පරීක්ෂා කරගෙන යනු ලැබූ අතර අනාවරණය කර ගනු ලැබූ අක්‍රමිකතා පිළිබඳ වාර්තා කෙරිණ.

**ගබඩා භාණ්ඩ පිළිබඳ භෞතික සමීක්ෂණය**

කොළඹ වරායේ ගබඩා භාණ්ඩ පිළිබඳ භෞතික සමීක්ෂණ කටයුතු අඛණ්ඩව කර ගෙන යනු ලැබූ අතර සෙසු වරායයන්හි වාර්ෂික තොග පරීක්ෂා කිරීම සඳහා ද සහාය දක්වන ලදී.

ප්‍රධාන ගබඩාවේ අඛණ්ඩ සමීක්ෂණ කටයුතු වලදී භාවිතා නොවන තොග අයිතම හඳුනාගත් අතර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සැපයුම් කොට්ඨාශය වෙත වාර්තා කරන ලදී.

**විමර්ශන කටයුතු**

සභාපතිතුමාගේ ඉල්ලීම පරිදි වර්ෂය තුළ  දී විශේෂ විමර්ශන සිදු කරන ලදී.

**අවසාන ගිණුම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කරන්නේදැයි සහතික කරනු පිණිස අධිකාරියේ අවසාන ගිණුම් පරීක්ෂා කිරීම ද මෙම කොට්ඨාශයේ  වගකීම වේ.

**පූර්ව විගණන**

සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු ආපසු ගෙවීම් සහ වරාය ගාස්තු අයකිරීම්  අතහැර දැමීම පිළිබඳව පූර්ව විගණනයන් සිදු කරනු ලැබී ය.

**හම්බන්තොට  වරාය, ගාල්ල වරාය සහ ත්‍රිකුණාමලය වරාය**

හම්බන්තොට, ගාල්ල සහ  ත්‍රිකුණාමලය වරායයන්හි ගබඩා සමීක්ෂණ සහ විශේෂ විගණන පවත්වන ලදී.

**විගණන කමිටුව**

අධ්‍යක්ෂ මණ්ඩලයේ  අධ්‍යක්ෂවරයෙකු වන මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරයාගෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ.  විගණන කමිටු නිතිපතා පැවැත්වීම තහවුරු කරනු වස්, විගණන කමිටුවේ සභාපති ලෙස මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරයා පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් සමාලෝචනය කිරීම, එම ප්‍රතිපත්ති සහ ක්‍රියාපිළිවෙත්හි කාර්යක්ෂමතාවය සොයා බැලීම, අභ්‍යන්තර විගණන අංශයේ වාර්තා හා රජයේ විගණන අංශයේ ලිපි සමාලෝචනය කර ඒවාහි නිර්දේශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාමාර්ග ලබාගන්නේද යන්න සහ ඒවාට කොට්ඨාශ ප්‍රධානීන්ගේ එකඟතාවය ලැබෙන්නේද යන්න පිළිබඳව විගණන කමිටුවේ විමර්ශනයට ලක්වේ.

මෙමඟින්, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම මත මූල්‍ය හා මෙහෙයුම් අවදානම හඳුනා ගැනීමට අවශ්‍ය සැලසුම් හා යාන්ත්‍රණ අධිකාරිය සතු වන බව හා මෙවැනි අවදානම් මනාව සැලසුම් කල ක්‍රියාකාරී සැලස්මක් හරහා කළමනාකරණය කර විසඳිය හැකි බවට තහවුරු කරනු ලැබේ.

අධිකාරියේ සේවකයින්ගේ හා වෙනත් පරදු භාරකරුවන්ගේ යහපත උදෙසා සම්පත් වල ඵලදායීතාවය ඉහළ නැංවීමට හා කාර්යක්‍ෂමතාවය වර්ධනය කිරීම සඳහා මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු හා අදාළ වර්තමාන පද්ධතීන් හා ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත නිතිපතා වාර්තා කිරීම විගණන කමිටුව වගකීම වේ.

## වෙනත් වරායයන්

### ත්‍රිකුණාමලය වරාය

**නෞකාවෙන් නෞකාවට මෙහෙයුම්**

2015 අප්‍රේල් මස සිට ත්‍රිකුණාමලය වරායේ නෞකාවෙන් නෞකාවට මෙහෙයුම් සිදු කරන ලදී.

**යාත්‍රා**

ත්‍රිකුණාමලය වරායේ භාවිතය සඳහා දැනට පවතින යාත්‍රා ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

- ටග් යාත්‍රා – 02 - මෙහෙයුම්හි නිරතව TTA ජැටියේ නැංගුරම් ලා ඇත.
- දියත් යාත්‍රා – 04 - 02ක් මෙහෙයුම්හි නිරතව සහ 02ක් මෙහෙයුම්හි නිරත නොවේ.
- ටැනක් යාත්‍රා - 01- මෙහෙයුම්හි නිරතව TTA ජැටියේ නැංගුරම් ලා ඇත.

### ගාලු වරාය

**ගාලු වරායට පැමිණි නෞකා**

| නෞකා වර්ගය | ගණන |
|---|---|
| ක්ලින්කර් නෞකා | 71 |
| ක්ලින්කර් බත්තල් | 02 (නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් වාර 23) |
| ජිප්සම් | 04 |
| සිමෙන්ති තොග | නැත |
| සිමෙන්ති බෑග් | නැත |
| යබොර නෞකා | 01 |
| මගී නෞකා (වරාය තුළ නැංගුරම් ලා ඇති) | 05 |
| මගී නෞකා (නැංගුරම්ලා ඇති) | 02 |
| වෙනත් නෞකා (මෝටර් රුවල් යාත්‍රා, මගී නෞකා, ධීවර යාත්‍රා සහ අළුත්වැඩියා කටයුතු, ඉන්ධන ලබා ගැනීම හා වෙනත් අවශ්‍යතාවයන් සඳහා පැමිණෙන වෙනත් නෞකා ඇතුළුව) | 56 |
| පිටත වරාය සීමාව | 8,690 |
| නැංගුරම් ලාඇති | 119 |
| රුවල් යාත්‍රා | 36 |



# මූල්‍ය සමාලෝචනය

## වාර්ෂික වාර්තාව 2018

**ආදායම (සියළු වරායයන්)**

ආදායම
(වරාය කටයුතු සාරාංශය) (රු. මිලියන)

| විස්තරය | 2018 | ★ 2017 | විස්තරය | 2018 | ★ 2017 |
|---|---|---|---|---|---|
| වරාය කටයුතු වලින් ආදායම | 38,546 | 35,389 | නාවික | 10,583 | 8,145 |
| වෙනත් ආදායම් | 13,737 | 8,574 | ස්ටෙවඩෝරු (Stevedoring) | 18,257 | 16,873 |
| | | | වාප්පු මෙහෙයුම් | 5,607 | 5,325 |
| | | | වරාය පහසුකම් | 3,226 | 3,773 |
| | | | වෙනත් සේවා මෙහෙයුම් | 873 | 1,274 |
| **මුළු ආදායම** | **52,283** | **43,963** | **උප එකතුව** | **38,546** | **35,389** |

★ සසඳා බැලීමේ අවශ්‍යතාවයන් සඳහා 2017 තත්‍ය අගයන්ගෙන් හම්බන්තොට වරාය ඉවත් කර ඇත.

**මෙහෙයුම් සහ වෙනත් වියදම් (සියළු වරායයන්)**

රු. මිලියන

| විස්තරය | 2018 | ★ 2017 | (වැඩිවීම)/ අඩුවීම | % |
|---|---|---|---|---|
| වත්කම් නඩත්තුව | 1,323 | 1,324 | 0 | 0 |
| ඉන්ධන, විදුලිය, සහ ජලය | 2,328 | 2,148 | (180) | (8) |
| විදේශ ණය මත පොලිය | 2,257 | 1,808 | (448) | (25) |
| අතිකාල | 4,688 | 3,795 | (893) | (24) |
| ක්ෂය | 4,047 | 5,571 | 1,522 | 27 |
| වේතන, වැටුප් සහ දීමනා | 15,087 | 12,523 | (2,564) | (20) |
| වෙනත් | 2,540 | 2,608 | 67 | 3 |
| **වියදම** | **32,270** | **29,776** | **(2,494)** | **8** |
| විදේශ විනිමය (පාඩු)/ලැබීම් | 11,317 | 2,194 | (9,122) | (416) |
| **විදේශ විනිමය පාඩු ඇතුළුව මුළු වියදම** | **43,587** | **31,970** | **(11,617)** | **(36)** |

## වරායයන් අනුව කාර්යසාධනය
### කොළඹ වරාය

2018 වර්ෂයේ කොළඹ වරාය රුපියල් මිලියන 19,484ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. 2017 වර්ෂයේ දළ ආදායම වූ රුපියල් මිලියන 41,455 හා සැසඳීමේදී 2018 වර්ෂයේ දළ ආදායම රුපියල් මිලියන 49,606ක් වූ අතර එය රුපියල් මිලියන 8,151ක වැඩි වීමකි. 2018 වර්ෂයේ බදු වලට පෙර මුළු වියදම (රුපියල් මිලියන 11,195ක විදේශ විනිමය පාඩුද ඇතුළුව) රුපියල් මිලියන 41,841ක් වූ අතර 2017 වර්ෂයේ වියදම රුපියල් මිලියන 30,445ක් විය. (රුපියල් මිලියන 2,161ක විදේශ විනිමය පාඩුද ඇතුළුව) මෙය 37%ක වැඩි වීමකි.




**<u>සටහන:</u>**

හම්බන්තොට වරාය මෙහෙයුම් කිරීම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රජය, චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග්ස් සමාගම, හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් (HIPG), හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් (HIPS) අතර 2017 ජූලි 29වන දින එළඹෙන ලද අනුග්‍රාහාත්මක ගිවිසුම හේතුවෙන් 2018 වර්ෂයේ ආදායම් සහ වියදම් ගිණුම කොළඹ වරාය වෙත මාරු කරන ලදී.

එබැවින්, 2017 වර්ෂයේ සැසඳීමේ අවශ්‍යතාවය සඳහා පහත සඳහන් අයිතමය හැර ආදායම් සහ වියදම් කොළඹ වරායේ ගිණුමට එක් කරන ලදී.

2017 වර්ෂයේ ආදායම සඳහා හම්බන්තොට වරායේ වෙනත් ආදායම වූ රුපියල් මිලියන 131 ඇතුලත් වූ අතර 2017 වර්ෂයේ වියදම් සඳහා හම්බන්තොට වරායේ රුපියල් මිලියන 2,641ක ක්ෂය සහ මාගම්පුර වරාය කළමනාකරණ සමාගමට ගෙවන ලද රුපියල් මිලියන 616ක කළමනාකරණ ගාස්තුද ඇතුලත් වේ.

## ගාල්ල වරාය

ගාල්ල වරාය 2018 වර්ෂයේදී රුපියල් මිලියන 499ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. 2017 වර්ෂයේ දළ ආදායම වූ රුපියල් මිලියන 1,388 හා සැසඳීමේදී 2018 වර්ෂයේ දළ ආදායම රුපියල් මිලියන 1,623ක් වූ අතර එය රුපියල් මිලියන 235ක වැඩි වීමකි.

2018 වර්ෂයේ බදු අය කිරීමට පෙර මුළු වියදම රුපියල් මිලියන 925ක් වූ අතර (රුපියල් මිලියන 122ක විදේශ විනිමය පාඩුව ඇතුළුව) 2017 වර්ෂයේ වියදම රුපියල් මිලියන 760ක් විය. ( රුපියල් මිලියන 32ක විදේශ විනිමය පාඩුව ඇතුළුව) මෙය 22%ක වැඩි වීමකි.




## ත්‍රිකුණාමල වරාය

2018 වර්ෂයේදී ත්‍රිකුණාමල වරාය රුපියල් මිලියන 160ක මෙහෙයුම් ආදායමක් වාර්තා කරන ලදී. 2017 වර්ෂයේ දළ ආදායම වූ රුපියල් මිලියන 1,120ට සාපේක්ෂව 2018 වර්ෂයේ දළ ආදායම රුපියල් මිලියන 1,054ක් විය. මෙය රුපියල් මිලියන 67ක වැඩි වීමකි. 2017 වර්ෂයේ වියදම රුපියල් මිලියන 764ක් වූ අතර 2018 වර්ෂයේ බදු ගෙවීමට පෙර මුළු වියදම රුපියල් මිලියන 820ක්ව පැවතුනි. මෙය 7%ක වැඩි වීමකි.



ආයතනයේ ප්‍රධාන ගාමක බලවේගය මානව ප්‍රාග්ධනය බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුනාගනු ලැබ ඇති අතර ආයතනයේ තරඟකාරීත්වයේ වාසිදායක තත්ත්වය වශයෙන් මානව සම්පත සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් ලෙස මානව සම්පත් ප්‍රතිපත්තියක් හඳුන්වාදීම මගින් මෙම අමිල සම්පතෙන් ලබා ගත හැකි විශිෂ්ටතම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

ප්‍රධාන පුහුණු කිරීමේ ආයතනයේ මානව සම්පත පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කේන්ද්‍රීය ආයතනය මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයයි. මෙහිදී ඩිප්ලෝමා පාඨමාලා, වෙනත් වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රායෝගික සැසි ඇතුළු විවිධ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. තවද, පුහුණු සේවක ගණයේ සේවකයන් උදෙසා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය හරහා ජාතික වෘත්තීය සුදුසුකම ලැබීම සඳහා ප්‍රායෝගික විභාග පැවැත්වීමටද පියවර ගෙන ඇත.

බඳවා ගැනීමේ පටිපාටිය සහ අනුමත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය පැන නගින බැවින් එය නැවත අධ්‍යයනය කර බලා සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද නිර්ණායකයනට සහ කාර්යය රාමුවකට අනුව යෝජිත බඳවා ගැනීමේ පටිපාටිය සැලසුම් කෙරෙනු ඇත. මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ඉල්ලුම මෑත වර්ෂයන් තුළ කැපී පෙනෙන ඉහළයාමක් පෙන්නුම් කර ඇත. 2018 වර්ෂය තුළ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් සේවකයින් 8,325ක් පුහුණු කර ඇත.

ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා කාර්යමණ්ඩලයට සිය කාර්යසාධනය නිදහස්ව ඉටුකිරීමට හැකිවන යෝග්‍යතම පරිසරය බිහි කිරීම පිණිස අභිප්‍රායික මානව සම්පත් ප්‍රතිපත්තිය මගින් පරිපාලන කාර්ය සංග්‍රහය, විනය නීති සංග්‍රහය, බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය හා විවිධ කොට්ඨාශවල පවතින මානව සම්පත් අවශ්‍යතා ප්‍රති අධ්‍යයනය කරනු ඇත. තවද, මෙම මානව සම්පත් ප්‍රතිපත්තිය මගින් සියළුම සේවක කාණ්ඩ සඳහා සමාන අවස්ථා ලබාදීම සහතික කරන අතර, විශේෂයෙන්ම සේවා උසස්වීම් ලබාදීමේදී ස්ත්‍රී පුරුෂ භේදය නොසලකා සමානාත්මතාවය පවත්වාගනිමින් සියළුම ආකාරයේ මානව සම්පත් හා සම්බන්ධ කටයුතු වලදී අසාධාරණයට ලක් නොවීම සහතිකවනු ඇත.

සමාලෝචිත වර්ෂය තුළදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය ආයතනික සමාජ වගකීම් අඛණ්ඩව සිදු කරන ලදී.

- වරාය සේවකයින්ගේ අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විභාග විශිෂ්ට ලෙස සමත්වූ දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරි නැමීම.

- වරාය සේවකයින්ගේ කුඩා දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් අංග සම්පූර්ණ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පවත්වාගෙන යාම.

- වරාය ගිනි නිවීමේ ඒකකය ගිනි නිවීම් කටයුතු වලදී කොළඹ මහ නගර සභාවට සහායවී ඇති අතර හදිසි අවස්ථාවලදී කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි ගිනි නිවීමේ කටයුතු සිදු කර ඇත.

- මුල්ලේරියාව මානසික රෝහලේ වාට්ටුවක් නඩත්තු කිරීම.

ආයතනික පාලනය යනුවෙන් අදහස් කෙරෙනුයේ ආයතනයට සම්බන්ධ සියළුම පාර්ශ්වයන්ගේ උපරිම යහපත උදෙසා එහි සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින් අදාළ ආයතනය සම්බන්ධ නිසි මාර්ගෝපදේශකත්වයකින් යුතුව පාලනය පවත්වා ගෙන යාම සඳහා එම ආයතනය විසින් පිහිටුවනු ලබන සමස්ත යාන්ත්‍රණය වේ. යහපාලනයක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් මූලික වගකීම පැවරී ඇත්තේ වරාය අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතය. ආයතනයේ මූලික අරමුණු ළඟා කරගනු පිණිස, එහි කාර්යය පද්ධති හා හැසිරවීම් නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වන බවට ඔවුනට සහතික වීමට සිදු වන අතර ඒ සඳහා වෘත්තීමය නිළධාරීන් ඔවුන්ට අදාළ ක්‍රියාකාරී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වගකීම දැරීම තුළින් පහසුකම් සැලසිය යුතුය. මෙම කර්තව්‍යය තුළ අභ්‍යන්තර විගණක නිලධාරීන් හට ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂා කිරීමට හා අනුමත ක්‍රියා පිළිවෙත්හි විචල්‍යතාවයන් තිබේදැයි යන්න වාර්තා කිරීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටුකල යුතුව ඇත. එහි විචල්‍යතාවයන් විශේෂයෙන් මෙහෙයුම් හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් අපේක්ෂිත කාර්ය සාධනය ළඟාකර ගන්නේ කෙසේද යන්න පිළිබඳව නිර්දේශ කරනු ලබන්නේ නම් එමගින් යහපාලනය කෙරෙහි දායකත්වයක් සැපයෙනු ඇත.

මූල්‍යමය හා වෙනත් මෙහෙයුම් වාර්තා කිරීම් උසස් මට්ටම හා සංඛ්‍යාතය, අධ්‍යක්ෂ මණ්ඩලය සිය භාරකාරීත්ව යුතුකම් ඉටුකරන වපසරිය, අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ කළමනාකාරීත්වය විසින් හුවමාරු කරගන්නා තොරතුරු වල තත්ත්වය සහ වටිනාකම ඉහළ කරවන ආකාරයේ විනිවිදභාවයෙන් යුතු ආයතනයක් පවත්වාගෙන යාමට දක්වන ඔවුන්ගේ කැපවීම ඉතා වැදගත් කොට සලකනු ලැබේ. එනයින් බලන කල ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආයතනික යහපාලනයේ උසස් ගුණාංග පවත්වාගෙන යාමට කැපවී ඇත.

අධිකාරියේ පාලනය පවත්වාගෙන යාමේ වගකීම දරන්නේද අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. මනා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා නීතිරීති හා රෙගුලාසි, ව්‍යුහයන් හා ක්‍රියාමාර්ග වර්ධනය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු අවධානයක් යොමු කිරීම අධිකාරිය විසින් අඛණ්ඩව සිදු කර ගෙන යනු ලැබේ. අධිකාරිය විසින් එහි ආයතනික පාලන ව්‍යුහයන් උසස් මට්ටමින් ප්‍රසාදනය කර ඇත.

මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් අනුගමනය කර ඇති ආයතනික යහපාලන ප්‍රතිපත්තිමය අංග පහත සඳහන් ශීර්ෂ යටතේ දක්වා ඇත:

- අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු
- අභ්‍යන්තර පාලන
- අභ්‍යන්තර විගණන
- විනය නීති
- මහා භාණ්ඩාගාරය, වරාය හා නාවික අමාත්‍යාංශය සමඟ පවතින සම්බන්ධතාවය
- ව්‍යවස්ථාපිත හා නෛතික අවශ්‍යතාව සමඟ පවතින අනුකූලතාවය.
- යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ මාලාවේ නිශ්චිතව හඳුනාගත් වගන්ති වලින් බැහැරව කටයුතු කිරීම සඳහා වරාය සහ නාවික අමාත්‍යවරයා හා මුදල් හා සැලසුම් අමාත්‍යවරයා විසින් ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීමට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය අනුගමනය කරමින් ක්ෂේත්‍රය තුළ උසස් මට්ටමකින් තරඟකාරී සහ ප්‍රායෝගික රාජ්‍ය ආයතනයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කරන නම්‍යශීලීත්වය සහ ස්වාධීනත්වය තහවුරු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ''පාලන විධි සංග්‍රහය'' කෙටුම්පත් කර ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු**

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, උපසභාපති හා අධ්‍යක්ෂවරුන් 07දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, ඉහළම වෘත්තීය සහ පෞද්ගලික සාරධර්ම සහ වටිනාකම් හා අධිකාරිය ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයවලුන් විය යුතුවේ.

වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ පහත සඳහන් ආකාරයටය;

- ♦ වරාය සංවර්ධනයෙහි හෝ වරාය මෙහෙයුම් කාර්යයන්හි හෝ නෛතික හෝ මූල්‍ය කටයුතු හෝ නාවික කටයුතු,වාණිජ හෝ ඉංජිනේරු කටයුතුවල හෝ පරිපාලනයෙහි හෝ කම්කරු සබඳතා පිළිබඳ පළපුරුද්දක් සහිත සහ එම කටයුතුවල හැකියාව ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන්නේ නම් ඔවුන් අතරින් සභාපතිවරයා සහ තවත් අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

- ♦ පනතේ 13:1 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කළමනාකාර අධ්‍යක්‍ෂ පත්කරනු ලැබේ.

- ♦ මූල්‍ය විෂය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු නම් කරනු ලැබේ.

- ♦ රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ ධීවර කටයුතු විෂය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා භාරයේ පවතින අමාත්‍යාංශයේ නියෝජිතයෙකු එම ඇමතිවරයා විසින් නම් කරනු ලැබේ.

සභාපතිවරයා හැර, (1)(අ) උපවගන්තිය හෝ (1)(ඇ) උප වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු වරාය අධිකාරියේ උප සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැක.

සභාපතිවරයා, උප සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්‍ෂවරයා සතු කාර්යභාරය පැහැදිලි ලෙස වෙන් කොට, අර්ථ නිරූපනය කර ඇත. විධායක නොවන සියළු අධ්‍යක්ෂවරු ඔවුන් සතු ගැඹුරු හසල දැනුම හා පළපුරුද්ද මත අධිකාරියට සේවය සලසයි.මෙම වාර්තාවේ සඳහන් දිනය වන විට ධූරයන් දරමින් සිටි අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ඔවුන් පිළිබඳ විස්තර අංක 13 සිට 17 දක්වා පිටුවල සඳහන් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූලික කටයුතු සහ වගකීම් පහත දැක්වේ;**

- ♦ ක්‍රමෝපායික අරමුණු, ප්‍රතිපත්ති, අභිලාෂ හා ඉලක්ක තුළින් කාර්යයන් මෙහෙයවීම.
- ♦ ඉලක්ක හා අරමුණු ඉටුකර ගැනීම උදෙසා වූ කාර්යසාධනය අධීක්ෂණය කිරීම.
- ♦ ප්‍රමාණවත් අභ්‍යන්තරික පාලනයක් සහ ඉහළම ආචාරධර්ම ප්‍රමිතීන් පවත්වා ගන්නා බවට සහතික වීම.
- ♦ නිර්ණායකයන් සම්පාදනය කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඒවායේ සාර්ථකත්වය පිළිබඳව සහතික වීම.
- ♦ සියළු ව්‍යාපාරික අවදානම් සහගත තත්ත්වයක් හඳුනාගෙන යෝග්‍ය හා ප්‍රමාණවත් පාලනයක් ඇති කිරීම හා අවදානම් තත්ත්වයන් සම්බන්ධයෙන් කාලීනව අවශ්‍ය පියවර ගැනීම සඳහා එම තත්ත්වය වාර්තා කිරීමේ අධීක්ෂණ යාන්ත්‍රණය යථා පරිදි ක්‍රියාත්මක වන බවට සහතික වීම.

අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වන අතර සමාලෝචිත වර්ෂය තුළ 14 වතාවක් රැස්වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කටයුතු සිදුකර ගෙන යාමට අවශ්‍ය තොරතුරු අවස්ථානුකූලව ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සභාපතිගේ උපදෙස් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය සකස් කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර

තොරතුරු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සියළුම අධ්‍යක්ෂවරුන් වෙත සපයනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලබන කරුණු අතර මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධන දර්ශකයන් සමාලෝචනය කිරීම, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති හා යෝජනා සිය සීමාවන් තුළ අනුමත කිරීමද ඇතුළත් වේ.

සියළුම නිර්දේශයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් අනුමැතියට යටත්ව, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ඇතැම් වගකීම් ප්‍රධාන වශයෙන් කළමනාකරණ කමිටුව, විගණන කමිටුව ඇතුළු අනුකමිටු කිහිපයක් වෙත අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පවරනු ලැබ ඇත.

**කළමනාකරණ කමිටුව**

සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ විධායක අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් හතර දෙනෙකු (04) සහ අනෙකුත් පූර්ණ කාලීන අධ්‍යක්ෂවරු හත් දෙනෙකු (07) සහ හාබර් මාස්ටර්වරයා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ලෙස කටයුතු කරන ලදී.

සාර්ථක වාණිජමය ආයතනයක් වශයෙන් මෙන්ම සමාජ වගකීමක් සහිත සංස්ථාපිත රාජ්‍ය ආයතනයක් ලෙස වරාය භාවිතා කරන්නන්හට වඩාත් දියුණු සේවයක් සලසමින් මානව සම්පත් ඵලදායිතාව වැඩි දියුණු කිරීම මෙන්ම අනෙකුත් හවුල්කරුවන්ගේ යහපත සඳහා සම්පත් උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගෙන එදිනෙදා පරිපාලන, කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ තීරණවලට එළඹීමේදී කළමනාකරණ කමිටුව ඉහත විස්තර කරන ලද විවිධ පැතිකඩ සම්බන්ධව කටයුතු ඉටුකරන ලදී.

කළමනාකරණ කමිටුව එහි රැස්වීම් වලදී සියළුම ප්‍රතිපත්තිමය කරුණු මෙන්ම තීරණ ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ එකඟත්වය සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව ද මනා පරිශීලනයට භාජනය කරන ලදී. මෙම ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට සහ ප්‍රමාදයන් වළකාලීමට හැකිවනු පිණිස සඳහා කළමනාකරණ කමිටුව මසකට දෙවරක් රැස්වී තීරණ ගන්නා ලදී. මෙම වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් එකොළහක් (11ක්) පවත්වා ඇත.

**විගණන කමිටුව**

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් සාමාජිකයින් හතරදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුව 2018 දෙසැම්බර් මස නැවත පත් කරන ලදී.

විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම, එම ප්‍රතිපත්ති හා පටිපාටිවල කාර්යක්ෂමතාව සොයා බැලීම සහ අභ්‍යන්තර විගණක වාර්තාව හා රජයේ විගණන සමාලෝචනය කිරීම සහ ඒවා සම්බන්ධ නිර්දේශ කොට්ඨාශ ප්‍රධානීන් විසින් පිළිපදිනු ලබන්නේදැයි අධ්‍යක්ෂ මණ්ඩලය හරහා පසු විපරම් කිරීම සිදු කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ, මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ අවදානම් හඳුනා ගැනීමටත් මනා ලෙස නිර්වචනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් තුළින් එවැනි අවදානම් කළමනාකරණය කර ගැනීමට හැකිවනු පිණිස ක්‍රියාමාර්ග සහ යාන්ත්‍රණයන් අධිකාරිය සතුව පවතින බවට විගණන කමිටුව විසින් තහවුරු කරනු ලැබේ .

සේවකයින්ගේ සහ වරාය කටයුතු හා සම්බන්ධ අයගේ යහපත වෙනුවෙන් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට සහ සම්පත්වල ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ පවත්නා ක්‍රමවේදයන් සහ පිළිවෙත් සවිමත් කිරීම උදෙසා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම කමිටුවේ වගකීම වේ.

**අභ්‍යන්තර පාලනය**

ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් තිබීම ආයතනයක කාර්යක්ෂම කළමනාකරණය සඳහා අත්‍යාවශ්‍ය අංගයකි. අධිකාරියේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙම පාලන ක්‍රියාදාමයේ ක්‍රියාශීලිත්වය සමාලෝචනය කිරීම සම්බන්ධව සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සහ පිළිවෙත් සම්බන්ධයෙන් විස්තරාත්මක රීති මාලාවක් අධිකාරිය විසින් සකස් කර ඇති අතර ඒවා නිරන්තරයෙන් සමාලෝචනය කර යාවත්කාලීන කරයි. ව්‍යාපාරික අරමුණු ළඟා කර ගැනීමේදී බාධා පමුණුවන අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා මෙම ක්‍රමවේදය සැලසුම් කර ඇත. වත්කම් අනවසරයෙන් භාවිතා කිරීම හෝ ඒවා ආරක්ෂා කිරීම සඳහා මෙන්ම විධිමත් වාර්තා පවත්වා ගෙන යාම, උත්පාදනය වන්නා වූ තොරතුරු වල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහතිකවීමක් මෙම කමිටුව මගින් සැලසේ.

අධිකාරියේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ නිර්ණායක තුළින් එහි ප්‍රවීණතාවය, අවංකභාවය, සදාචාරාත්මක වටිනාකම සහ මනා පාරිසරික සන්නිවේදන වටපිටාවක් පවත්වා ගෙන යාම කෙරෙහි අධිකාරියේ ඇපකැපවීම තුළින් අභ්‍යන්තර පාලන පද්ධතියට සහාය දැක්වේ.

**අභ්‍යන්තර විගණකවරු**

සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධානත්වය දරනු ලැබේ. මෙය ස්වාධීනව කටයුතු කරන කොට්ඨාශයක් වන අතර ඍජුවම වගකියනු ලබන්නේ සභාපතිට හා විගණන කමිටුවට පමණි.

විගණන කමිටුවේ විෂය පථය සකස් කරනු ලබන්නේ සභාපති සහ විගණන කමිටුවේ උපදෙස් ප්‍රකාරව වන අතර විෂය පථය අවශ්‍ය වන්නේ නම් අදාළ සංශෝධන සඳහා එය අඛණ්ඩව සමාලෝචනය කෙරේ. විගණන කමිටුවේ සහාය ඇතිව මූලික වශයෙන් සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කරනුයේ අභ්‍යන්තර විගණන කොට්ඨාශය මගිනි. අභ්‍යන්තර විගණනය අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙත්හි කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය පිළිබඳ විෂය නිශ්‍රිත මතයක් සපයන අතර අභ්‍යන්තර පාලන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම.

**විනය නීති**

සතුටුදායක හැසිරීම් රටාවක් පවත්වාගෙන යාම සඳහා මග පෙන්වනු පිණිස විනය නීති පනවා ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්,කොට්ඨාස ප්‍රධානීන් හා සේවකයින් විසින් සිය දෛනික රාජකාරි කටයුතු ඉටු කිරීමේදීත්, ස්වකීය ක්‍රියාකාරකම් අධිකාරියේ කීර්තිනාමයට හා ප්‍රතිරූපයට හානි විය හැකි අවස්ථාවලදීත්, ඉහළම මට්ටමේ සදාචාරාත්මක හා අවංකභාවයෙන් යුතුව කටයුතු කරනු ලැබීම අධිකාරියේ අපේක්ෂාව වේ.

**විනය නීතිවල මූලිකාංග**

- සියළුම කටයුතු වලදී සාධාරණත්වය, අවංකභාවය හා අපක්ෂපාතීත්වය දැක්වීම.
- නීතිය දැන සිටීම හා එයට අවනත වීම.
- ඉටු කරනු ලබන සියළු කටයුතු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම.
- අධිකාරියට අගතියක් සිදුවිය හැකි ආකාරයේ හැසිරීමෙන් වැළකීම.

**අනුකූලතා කාර්යය රාමුව හා ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අවනත වීම**

සියළුම නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමේ වැදගත්කම අධිකාරිය පිළිගෙන ඇත. මෙම අවශ්‍යතාවයේදී අධිකාරියේ සියළුම ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සඳහා මුදල් කොට්ඨාශය හා අභ්‍යන්තර විගණන කොට්ඨාශය සමගාමීව සෑම පරිශ්‍රමයක්ම දරමින් කටයුතු කරමින් සිටී. ඊට

අමතරව අධිකාරියේ ව්‍යාපාරික කටයුතු සහ වෙනත් කාර්යයන් නීති සහ රීති වලට අනුකූලව සිදුවන බවට නීති කොට්ඨාශය සහතික වේ.

**වරාය හා නාවික අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය සමඟ පවතින සම්බන්ධතාවය**

පැහැදිලි විධානයන් මගින් ක්‍රමෝපායික අරමුණු ඉටු කර ගනු පිණිස සැලසුම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වන ගරු වරාය හා නාවික අමාත්‍යවරයා සහ එහි ලේකම්වරයා සහ උපාය මාර්ගික ව්‍යවසායකත්ව කළමනාකරණ ආයතනය (SEMA) සමඟ අධිකාරිය අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගෙන යනු ලැබේ. ඊට අමතරව මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයට අවශ්‍ය වන පරිදි වසර 03ක් සඳහා ව්‍යාපාරික සැලසුමක් සහ මූල්‍යමය වාර්තා සහ අනෙකුත් මෙහෙයුම් කාර්යසාධන වාර්තා ඇතුළු පරිපූර්ණ වාර්තා අධිකාරිය විසින් ත්‍රෛමාසික පදනමක් මත ඉදිරිපත් කරන ලදී.

**අදාළ පාර්ශ්ව සම්බන්ධ අනාවරණය කිරීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ගණුදෙනු පවත්වා ගෙන යනු ලබන කිසිදු පාර්ශ්වයක් සමඟ පෞද්ගලික හිතවත්කමක් හෝ සම්බන්ධතාවයක් නොපවත්වන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර සනාථ කර සිටී.

**වගකීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මගින් වරාය අධිකාරියේ කාර්යයන්හි ගති ස්වභාවය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වන බවත්, එම වාර්තා පිළිගත් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

**අනාගතය**

ආයතනික පාලනයක සැබෑ වටිනාකම රැඳී පවතින්නේ වඩා යහපත් ක්‍රම පද්ධති, ප්‍රතිපත්ති සහ මූලධර්ම මාලාවක් අන්ධානුකරණයෙන් අනුගමනය කිරීම තුළ නොවන බවත්, සියළුම පරදුභාරකරුවන්ගේ විශ්වාසය දිනා ගනිමින් බවත් අධිකාරිය විශ්වාස කරන අතර එමගින් සිය ව්‍යාපාරික කටයුතු විනිවිදභාවයෙන් යුක්තව ඉහළම විශ්වාසය හා සාධාරණත්වයෙන් ඉටු කිරීමෙන් ඔවුන් ද අපගේ ක්‍රමෝපායන්ට සහාය වනු ඇත.



# වරාය සංඛ්‍යාලේඛන

## වාර්ෂික වාර්තාව 2018

## කොළඹ වරාය

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 184.6 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 810 |
| ඊසාන දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 330 |
| බටහිර පිවිසුම | මීටර් 230 X මීටර් 16 |
| උතුරු පිවිසුම | මීටර් 190 X මීටර් 13 |

වැඩ කරන වේලාවන්

කොළඹ වරාය වසරේ සෑම දිනකම දවසේ පැය 24 පුරා සේවා සැපයීමේ පදනම මත ක්‍රියාත්මකව පවතී.

**2018**

| | |
|---|---|
| A - බහළුගත | 89.9% |
| B - තොගකඩන | 0.7% |
| C - වියළි තොග | 2.8% |
| D - දියර තොග | 6.6% |

## කොළඹ නව වරාය

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 192.0 |
| නිරිත දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 5,140 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 1,550 |
| ප්‍රධාන පිවිසුම | 570 මීටර් X මීටර් 18 |

## ගාල්ල වරාය

**වරාය පරිමාණය**

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර්15.3718 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර්140 |
| ගොඩබිම ප්‍රදේශය | හෙක්ටයාර්16.4015 |
| සමස්ත සීමිත දිග ප්‍රමාණය | මීටර්130 |
| සීමිත ගැඹුර | මීටර්7.3 |

වැඩ කරන වේලාවන්

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව වසරේ සෑම දිනකම දවසේ පැය 24 සේවා සැපයීමේ පදනම මත ක්‍රියාත්මකව පවතී.

**අපගමන වේලාව**

නැගෙනහිර - බටහිර ප්‍රධාන මාර්ගයෙන් නැත.

**නැංගුරම් පහසුකම්**

**සමස්ත අද්දර නැංගුරම්පළ සංඛ්‍යාව** 05

| නැංගුරම්පළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ක්ලෝසන්බර්ග් ජැටිය | 420 | 8.9 |
| නව පාලම | 162 | 8.9 |
| නව පාලම/ හරස් | 84 | 8.9 |

**ගුදම් පහසුකම්**

| ගුදමේ නම හෝ පිහිටා ඇති ස්ථානය | ඒකක ප්‍රමාණය | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (වර්ග අඩි) | ධාරිතාවය (ඝන අඩි) | බහළු තැන්පත් කිරීමේ උස (අඩි) |
|---|---|---|---|---|---|
| **අංක** 01 | 06 | 23 | 20,000 | 460,000 | 10 උස |
| **අංක** 02 | 12 | 23 | 40,000 | 920,000 | 10 උස |
| ගාල්ල වරායේ සබ්මැරීන කේබල් මධ්‍යස්ථානය (GSCD) | 07 | 23 | 23333.3 | 536666.7 | 10 උස |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 05 | 23 | 16666.7 | 383333.3 | 10 උස |

2018.01.15 දින සිට 2023.01.14 දින දක්වා ගාලු වරායේ සබ්මැරීන කේබල් මධ්‍යස්ථානය වෙත අංක 02 දරණ ගුදමේ ඒකක 07ක් ලබා දෙන ලදී.

## ත්‍රිකුණාමලය වරාය

වරාය පරිමාණය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර්1,536 |
| ප්‍රවේශ ඇළ මාර්ගය (අවම පළල) | මීටර් 500 |
| ගොඩබිම් ප්‍රදේශය | හෙක්ටයාර් 2,254 |

වැඩ කරන වේලාවන්

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව ත්‍රිකුණාමලය වරාය වසරේ සෑම දිනකම පැය 24 සේවා සැපයීම් පදනම මත ක්‍රියාත්මකව පවතී.

**නැංගුරම්ලෑමේ පහසුකම්**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැංගුරම්පළවල්**

| නැංගුරම්පළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| අෂ්රෆ් ජැටිය | 250 | 12.5 |
| පැති නැංගුරම්පළ- අෂ්රෆ් ජැටිය | 90 X 2 | 8.5 |
| මඩකොව් ප්‍රදේශයේ පිහිටි ජැටිය | 45 | 3.5 |
| ටීටීඒ හි පිහිටි ජැටිය ( TTA) | 190 | 2.0-4.0 |
| සිලෝන් ජැටිය | 50 | 2.5 |
| නගර ජැටිය | 50 | 2.5 |
| මුතූර් ජැටිය | 60 | 3.0 |
| වීඑස්ඕ ජැටිය (VSO) | 25 | 1.5 |
| පරණ නගර ජැටිය | 60 | 2.0 |
| තෙල් ජැටිය | 130 | 9.75 |

**වෙනත් නැංගුරම්පළවල්**

| නැංගුරම්පළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ප්‍රීමා ජැටිය (ඇතුළ්) | 122 | 5.9 |
| ප්‍රීමා ජැටිය (පිටත) | 227 | 14.3 |
| ප්‍රීමා ජැටිය (බහුකාර්ය) | 170 | 10.3 |
| ටෝකියෝ සිමෙන්ති ජැටිය | 160 | 9.5 |

**ගුදම් පිළිබඳ විස්තර – ටීටීඒ (TTA)**

| ගුදම | පරිමාණය (අඩි) | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය වර්ග අඩි (අඩි) | බහළු තැන්පත් කිරීමේ (උස) | ධාරිතාවය (ඝණ අඩි) |
|---|---|---|---|---|---|
| අංක 01 | 75 X 34 | - | 2,550 | 12 | 30,600 |
| අංක 02 සහ 03 | 90 X 70 | 15 | 6,300 | 12 | 75,600 |
| අංක 04 | 190 X 95 | 19 | 18,050 | 14 | 252,700 |
| අංක 05 ඒ | 150 X 110 | 25 | 16,500 | 15 | 247,500 |
| අංක 05 බී | 150 X 80 | 15 | 12,000 | 12 | 144,000 |
| අංක 06 | 300 X 110 | 20 | 33,000 | 15 | 495,000 |
| අංක 07 | 96 X 36 | - | 3,456 | 12 | 41,472 |

## මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය – දැනට

**වරාය පරිමාණය**

වරාය ප්‍රදේශය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 75 |
| බටහිර දියකඩනයේ දිග | මීටර් 988 |
| නැගෙනහිර දියකඩනයේ දිග | මීටර් 311 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 * මීටර් 16 |
| හැරවුම් පෙදෙස | මීටර් 600 |

පාලම්වල දිග

| | |
|---|---|
| සාමාන්‍ය නැව්බඩු පාලම | මීටර් 600 |
| සේවා පාලම | මීටර් 105 |
| තෙල් පාලම 1 | මීටර් 310 |
| තෙල් පාලම 2 | මීටර් 300 |
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 17 |
| නෞකා නිර්මාණය | ද.බ. ටො. 100,000 |

## මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය - දෙවන අදියර අවසන් කිරීමෙන් පසු

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| සම්පූර්ණ කිරීමෙන් පසු මුළු ජල ප්‍රදේශය | හෙක්ටයාර් 152 (අදියර -I හි ජල ප්‍රදේශය ඇතුළුව) |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 * මීටර් 17 |
| හැරවුම් පෙදෙස | මීටර් 600 |

**පාලම් වල දිග**

| | |
|---|---|
| ප්‍රධාන නැංගුරම්පළ | මීටර් 835.5 |
| පෝෂක බහළු පර්යන්තය | මීටර් 460 |
| බහුකාර්ය නැංගුරම්පළ | මීටර් 838.5 |
| හුවමාරු නැංගුරම්පළ | මීටර් 208 |
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 17 |
| නෞකා නිර්මාණය | ද.බො.ටො. 100,000 |



# මූලාශ්‍ර ප්‍රකාශනයන්

## වාර්ෂික වාර්තාව 2018

2018.12.31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා**
**සභාපති**

**පී ජී දසනායක මහතා**
**උප සභාපති**

**කපිතාන් අතුල හේවාවිතාරණ මහතා**
**කළමනාකාර අධ්‍යක්‍ෂ**

**නිලාන් වික්‍රමසිංහ මහතා**
**විධායක අධ්‍යක්‍ෂ**

**පී එස් එම් චාර්ල්ස් මහත්මිය**
**අධ්‍යක්‍ෂ**

**එච් ජී සුමනසිංහ මහතා**
**අධ්‍යක්‍ෂ**

**නිශාන්ත වික්‍රමසිංහ මහතා**
**අධ්‍යක්‍ෂ**

**සුරංග පී හිදැල්ලාරච්චි**
**අධ්‍යක්‍ෂ**

**රාජ් ඔබේසේකර**
**අධ්‍යක්‍ෂ**

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩලය රැස්වීම් 14ක් පවත්වා තිබුණි.

2018 වර්ෂය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාකරන කළමනාකරණ කමිටුව රැස්වීම් එකොළහක් (11) පවත්වා තිබුණි. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනෙක් අනු කමිටුව වන විගණන කමිටුව 2018 වර්ෂය තුළදී රැස්වීම් හතරක් (04) පවත්වා තිබුණි. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පහත සඳහන් අධ්‍යක්‍ෂවරුන් විගණන කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

**එච් ජී සුමනසිංහ මහතා**
**සභාපති**

**පී එස් එම් චාර්ල්ස් මහත්මිය**
**සාමාජික**

කොළඹ වරාය ලොව ප්‍රධාන පෙළේ වරායයන් 30 අතුරින් වඩාත්ම වේගයෙන් වර්ධනය වෙමින් පවතින වරාය ලෙස 2018 වර්ෂය තුළදී ශ්‍රේණිගත වී ඇත. පෙර වාර්තා බිඳහෙලමින් බහළු විස්සේ සම ඒකක මිලියන 7 ක් මෙහෙයවීමට කොළඹ වරාය 2018 වර්ෂයේදී සමත්වී ඇත. 2017 වර්ෂය හා සැසඳීමේදී සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගමෙහි 14.2% ක මෙහෙයුම් අනුපාතය හා කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගමෙහි 12.0% ක මෙහෙයුම් අනුපාතය හා සමීපව 14.6% ක ඉහළම වර්ධන අනුපාතයක් වාර්තා කිරීමට ජය බහළු පර්යන්තය සමත් විය. ප්‍රතිනැව්ගත මෙහෙයුම් 22.2% ලෙස වාර්තාකරමින් ජය බහළු පර්යන්තය විශිෂ්ට ලෙස වර්ධනයක් පෙන්නුම් කර ඇත. ජාත්‍යන්තර ඇල්ෆාලයිනර් සමීක්ෂණට අනුව කොළඹ වරාය මෙවැනි ඉහළම ස්ථානයකට පැමිණ ඇත්තේ වරාය ඉතිහාසයේ ප්‍රථමවතාවටය.

ප්‍රමාණයෙන් විශාල නෞකා වල පැමිණීම වැඩිවීම, නව සංධානගතවීම්/ ඒකාබද්ධවීම්/ පවරාගැනීම් සහ පෞද්ගලික අංශයේ පර්යන්ත මෙහෙයුම්කරුවන්ගේ තරඟකාරී ගාස්තු සහන ආදී අභියෝග මධ්‍යයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත 14.6%ක වර්ධනයක් වාර්තා කරමින් 2017 වර්ෂය හා සංසන්දනය කිරීමේදී බහළු විස්සේ සම ඒකක 2,304,534ක් මෙහෙයවන ලදී. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් සහ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් සමාගම් දෙක පිළිවෙලින් 14.2% සහ 12.0% ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී.

- කොළඹ වරායේ මෙහෙයුම් ධාරිතාවය 2017 වර්ෂයේදී බහළු විස්සේ සම ඒකක 6,209,608 සිට 2018 වර්ෂයේදී බහළු විස්සේ සම ඒකක 7,047,486 ක් දක්වා ඉහළ යන ලදී. (මෙය විස්සේ සම ඒකක 838,418 හෙවත් 13.5% ක වැඩිවීමකි)
- 2017 වර්ෂය හා සැසඳීමේදී කොළඹ වරායේ ප්‍රතිනැව්ගත බහළු මෙහෙයුම් ධාරිතාවය 18.2%කින් ඉහළ යන ලදී. (විස්සේ සම ඒකක 860,776)
- 2017 වර්ෂය හා සැසඳිමේදී කොළඹ වරායේ මෙහෙයවන ලද සමස්ත නැව්බඩු ටොන් ප්‍රමාණය 12.5%කින් ඉහළ යන ලදී.

2018 වර්ෂයේ කොළඹ වරායට පැමිණි නෞකා සංඛ්‍යාව පසුගිය වසර හා සසඳා බැලීමේදී 2017 වර්ෂයේ පැමිණි නෞකා සංඛ්‍යාව වන 4,329 සහ 2018 වර්ෂයේ පැමිණි 4,331 හි කිසිදු වෙනසක් නොවී එලෙසම පැවති බව පෙනේ. බහළු රැගත් නෞකා වල පැමිණීම 2017 වර්ෂයේ සටහන් වූ 3,683 සාපේක්‍ෂව 2018 වර්ෂයේදී 3,739 දක්වා එනම් 1.5% කින් වැඩිවී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත සහ කොළඹ වරාය වෙත වැඩි බහළු ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය විසින් අලෙවි හා ව්‍යාපාර සංවර්ධන ක්‍රමෝපායයන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට සහ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීම සඳහා ප්‍රධාන නැව් සේවා සමඟ පර්යන්ත සේවා ගිවිසුම් පහක් (05) අත්සන් කරන ලදී. 2018 වර්ෂය තුළ ප්‍රධාන නැව් සේවා හතරක් සහ පෝෂක නැව් සේවා එකක් (01) ආකර්ෂණය කරගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත්වී ඇත. ඊට අමතරව, අහඹු ලෙස පැමිණෙන නෞකා අපගේ පර්යන්ත වල මෙහෙයවා එමගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත අන්තර් මෙහෙයුම් ලබා ගැනීමට සමත් විය.

අතිවිශාල බහළු නෞකා (ULCS) මෙහෙයවීමට හැකි වන අයුරින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රමාණවත් ගැඹුරින් යුත් පහසුකම් කොළඹ දකුණු වරායේ ඉදිකරන ලදී. කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් පර්යන්ත සමාගම විසින් 2018 වර්ෂයේදී බහළු විස්සේ සම ඒකක මිලියන 2.6 ක් මෙහෙයුම් කරන ලද අතර (12% ක වර්ධනයක්) මීටර් 14.25 කට වඩා වැඩි ගැඹුරු ධාරිතාවයකින් යුත් බහළු නෞකා 308 ක් කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් පර්යන්තය වෙත පැමිණෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස කලාපයේ ප්‍රතිනැව්ගත කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කොළඹ වරායේ පිළිගැනීම තවදුරටත් තහවුරු වන ලදී. ඩ්‍රැවරි සමුද්‍රීය පර්යේෂණය (Drewry Maritime Reseach) මගින් 2018 වසරේ තුන්වැනි කාර්තුව සඳහා ගෝලීය බහළු වරාය සම්බන්ධතා දර්ශකයේ (Global Container Port Connectivity Index Score) 11 වැනි ස්ථානයට කොළඹ වරාය ශ්‍රේණිගත කරන ලද අතර, 2017 වසර හා සැසඳීමේදී මෙම ශ්‍රේණිගත කිරීම ස්ථාන දෙකකින් ඉදිරියට පැමිණ ඇත.

පසුගිය වසර හා සාපේක්‍ෂව, ප්‍රතිශතයක් වශයෙන් 18.9% ක වැඩිවීමක් වන රුපියල් මිලියන 52,283 ක ආදායමක් 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් උපයන ලදී. 2017 වර්ෂයේ රුපියල් මිලියන 22,270 ක මෙහෙයුම් ලාභය (විදේශ ණය පොලිය සහ විදේශ විනිමය පාඩු/ලැබීම් වලට පෙර) 2017 වර්ෂයේ දී රුපියල් මිලියන 15,995 දක්වා 39.2% කින් ඉහළ යන ලදී.

# මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සියළු ගණුදෙනු පිළිබඳ ගිණුම් පොත් නිසියාකාරව පවත්වාගෙන යනු ලබන බවටත්, පවතින තත්ත්වය හා වර්ෂයේ ලාභය/පාඩුව පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දෙන අයුරින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන බවටත්, සහතික කිරීමේ වගකීම 1971 අංක 38 දරණ මුදල් පනතේ (12) හා (13.6) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, ගිණුම් පොත් නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා අධිකාරියට අධ්‍යක්ෂ මණ්ඩලය මගපෙන්වා ඇති අතර, නිතිපතා පවත්වන ලද රැස්වීම් වල දී විගණන කමිටුව හරහා මූල්‍යමය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලදී.

මෙම වාර්තාවෙහි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු මගින් ගිණුම්කරන ප්‍රතිපත්ති අඛණ්ඩ පදනමක් මත පිළිගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ල යොමු වී ඇත.

අධිකාරියේ වත්කම් ආරක්ෂා කරගැනීම, වංචා හා වෙනත් අක්‍රමිකතා වලක්වා ගැනීම හා අනාවරණය කර ගැනීමත්, උදෙසා තමන්ට ගත හැකි සෑම පියවරක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාර කටයුතු විධිමත් ක්‍රමවේදයකට ගෙනයාමට සහ අපගේ ලේඛනයන්හී නිරවද්‍යතාවය හා විශ්වාසවන්තභාවය හැකිතාක් දුරට ප්‍රායෝගික වන පරිදි ආරක්ෂා කිරීම සඳහා, අභ්‍යන්තර පරීක්ෂා කිරීම්, අභ්‍යන්තර විගණනයන් සහ මූල්‍ය හා අනෙකුත් පාලනයන් ඇතුළත් සඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



**එස් ඒ එස් කේ ජයසේකර**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

ආයතනයේ මූල්‍ය කළමනාකරණය අනුව වගකීම් ඉටුකිරීමේදී අධ්‍යක්‍ෂ මණ්ඩලයට සහාය වීම විගණන කමිටුවේ වගකීම වේ. මෙය ඉටුකිරීමේදී කමිටුවේ ප්‍රධාන වගකීම් පහත දැක්වෙන පරිදි වේ.

- ♦ ඵලදායී අභ්‍යන්තර පාලන සහ අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්‍ෂමව සිදුවන බවට සහතික වීම.

- ♦ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලීන්හි නිරවද්‍යතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.

- ♦ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වන බවට සහතිකවීම.

- ♦ මෙහෙයුම් කාර්යක්ෂමතා සහ පාලන පද්ධති සමාලෝචනය කිරීම.

මහා භාණ්ඩාගාර නියෝජිත/ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ විසින් විගණන කමිටුවේ ප්‍රධානත්වය දරණු ලබන අතර අධිකාරියට සිය පාලනය උසස් මට්ටමකින් ගෙනයාම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැදගත් ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරනු ලැබීය.

වැදගත් මූලික අභ්‍යන්තර පාලන ක්‍රමයක් ලෙස සමාලෝචනයට යටත් අභ්‍යන්තර සැලැස්ම කමිටුව විසින් සකසන ලද අතර අධිකාරියට එහි පාලනය වඩා සාර්ථකව සිදු කිරීමට සහාය වීමේ අරමුණින් යුතුව වැදගත් කාර්යයන් කිහිපයක් සිදු කරන ලදී.

වැදගත් මූලික අභ්‍යන්තර ක්‍රමවේදයක් ලෙස, 2018 වසර සඳහා අභ්‍යන්තර සැලැස්ම සහ විගණන වැඩසටහන ක්‍රියාත්මක කළ අතර මාසික වාර්තා ලබා ගැනීම තුළින් එය ක්‍රියාත්මක කිරීමේ සඵලතාව පිළිබඳ නිතිපතා සමාලෝචන කරන ලදී. විගණකාධිපතිවරයා විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වරාය අධිකාරියේ ගිණුම් පිළිබඳ කෙටුම්පත් වාර්තාව කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමඟ සමාලෝචනය කරන ලදී. කමිටු රැස්වීම්වලදී මතු කරන ලද ඇතැම් විශේෂ කරුණු විගණන කමිටුවේ නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. අධිකාරියේ ත්‍රෛමාසික මූල්‍ය වාර්තා සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණන සමාලෝචනය සමඟ අඛණ්ඩව සමාලෝචනය කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුදැනුම මත ඉදිරියට කළයුතු පියවර ගන්නා ලදී. කමිටු රැස්වීම්හී දී පෙන්වූ වැදගත් කරුණු විගණන කමිටුවේ නිර්දේශ සමඟ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අවධානය සඳහා යොමුකරන ලදී.

අධිකාරියේ වත්කම් ආරක්ෂාකාරීව පවතින බවට සහ විගණනය කරන ලද ගිණුම් වල ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය වැරදි ලෙස සඳහන් වීම් වලින් තොර බවට සහතික වීම සඳහා අවශ්‍ය "පිරික්සුම් සහ තුල්‍යතාවයන්" පවතින බව විගණන කමිටුවේ අදහස වේ. වසර තුළ දී, අධිකාරියේ පාලනය වැඩි දියුණු කිරීම සහ විනිවිදභාවයකින් යුතුව කටයුතු සිදු කිරීම සඳහා විගණන කමිටුව සුවිශේෂී දායකත්වයක් සපයන ලදී.

**එච් ජී සුමණසිංහ**
**සභාපති - විගණන කමිටුව**

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අනුකූලතාවය දැක්වීමේ තත්ත්වය සවිස්තරාත්මකව පහත දැක්වේ.

**සේවක අර්ථ සාධක අරමුදල - අධිකාරියේ සහ සේවක දායකත්වය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ස්ථිර සේවකයින් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දායකත්වය වශයෙන් 15% ක් සේවක දායකත්වය වෙනුවෙන් 10% ක් වශයෙන් එළඹෙන මාසයෙහි අවසාන දිනට ප්‍රථම කම්කරු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වේ.

සේවකයින්ගෙන් අඩු කරනු ලබන සියළුම දායක මුදල් සහ අධිකාරියේ අදාළ දායක මුදල නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල**

අධිකාරියේ 3% ක දායක මුදල සෑම මසකම නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**උපයන විට ගෙවීම**

උපයන විට ගෙවීමේ බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**ආදායම් බදු**

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 113 වගන්තිය ප්‍රකාරව උපයනු ලබන ආදායමට අදාළ ආදායම් බදු ගෙවීම, බදු ගෙවිය යුතු ආදායමක් උපයා ඇති සෑම අවස්ථාවකදීම නියමිත දිනවලදී ත්‍රෛමාසිකව ගෙවනු ලැබ ඇත.

**වාර්ෂික ආදායම**

අධිකාරියේ ආදායම් බදු සම්බන්ධ වාර්ෂික වාර්තාව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙත වාර්ෂිකව ගොනුකර ඇත. මෙම වාර්තා සෑම වර්ෂයකම නියමිත දිනය වන නොවැම්බර් 30 දිනට ප්‍රථම සම්පූර්ණ කොට භාරදෙනු ලැබ ඇත.

**වාර්ෂික වාර්තාකරණය**

වාර්ෂික අයවැය, ගිණුම් සහ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | කොළඹ | ත්‍රිකුණාමලය | ගාල්ල | ශ්‍රීලවඅ 2018 | 2017 (හම්බන්තොට වරාය රහිතව ) |
|---|---|---|---|---|---|
| **පැමිණි නෞකා සංඛ්‍යාව** | | | | | |
| නැව්බඩු නෞකා | 4,244 | 180 | 75 | 4,499 | 4,545 |
| වෙනත් නෞකා | 146 | 9 | 9 | 164 | 167 |
| වෙනත් යාත්‍රා | 689 | 46 | 59 | 794 | 818 |
| | **5,079** | **235** | **143** | **5,457** | **5,530** |
| **මෙහෙයුම්** | | | | | |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (ශ්‍රී.ල.ව.අ.)** | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,965,987 | - | - | 1,965,987 | 1,609,114 |
| දේශීය | 328,813 | - | - | 328,813 | 388,282 |
| තැන්මාරු මෙහෙයුම් | 9,734 | - | - | 9,734 | 13,306 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **2,304,534** | **-** | **-** | **2,304,534** | **2,010,702** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,644,336 | - | - | 1,644,336 | 1,406,265 |
| දේශීය | 379,939 | - | - | 379,939 | 375,944 |
| තැන්මාරු මෙහෙයුම් | 42,483 | - | - | 42,483 | 27,626 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **2,066,758** | **-** | **-** | **2,066,758** | **1,809,835** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (සී.අයි.සී.ටී)** | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,992,035 | - | - | 1,992,035 | 1,726,203 |
| දේශීය | 634,497 | - | - | 634,497 | 619,325 |
| තැන්මාරු මෙහෙයුම් | 49,662 | - | - | 49,662 | 43,003 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **2,676,194** | **-** | **-** | **2,676,194** | **2,388,531** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම | 5,602,358 | - | - | 5,602,358 | 4,741,582 |
| දේශීය | 1,343,249 | - | - | 1,343,249 | 1,383,551 |
| තැන්මාරු මෙහෙයුම් | 101,879 | - | - | 101,879 | 83,935 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **7,047,486** | **-** | **-** | **7,047,486** | **6,209,068** |
| සාම්ප්‍රදායික මෙ.ටො. | 3,517,522 | 3,173,077 | 729,457 | 7,420,056 | 7,522,340 |
| ද්‍රව මෙ.ටො. | 6,618,378 | 386,711 | - | 7,005,089 | 6,318,954 |
| | **10,135,900** | **3,559,788** | **729,457** | **14,425,145** | **13,841,294** |
| **සම ඒකක ( මෙ.ටො.) - ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | | | | | |
| බහළුගත නැව්බඩු | 29,080,139 | - | - | 29,080,139 | 25,791,290 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 3,535,276 | 3,173,077 | 729,457 | 7,437,810 | 7,522,340 |
| ද්‍රව | 6,618,378 | 386,711 | - | 7,005,089 | 6,318,954 |
| **මුළු සම ඒකක (මෙ.ටො.)** | **39,233,793** | **3,559,788** | **729,457** | **43,523,038** | **39,632,584** |
| **සම ඒකක ( මෙ.ටො.) - (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| බහළුගත නැව්බඩු | 27,042,195 | - | - | 27,042,195 | 23,622,195 |
| සාම්ප්‍රදායික නැව්බඩු | - | - | - | - | |
| ද්‍රව | - | - | - | - | |
| **මුළු සම ඒකක (මෙ.ටො.)** | **27,042,195** | **-** | **-** | **27,042,195** | **23,622,195** |
| **සම ඒකක ( මෙ.ටො.) - (සී.අයි.සී.ටී.)** | | | | | |
| බහළුගත නැව්බඩු | 33,893,481 | - | - | 33,893,481 | 30,411,243 |
| සාම්ප්‍රදායික නැව්බඩු | - | - | - | - | |
| ද්‍රව | - | - | - | - | |
| | **33,893,481** | **-** | **-** | **33,893,481** | **30,411,243** |
| **සම ඒකක ( මෙ.ටො.) - (කොළඹ වරාය)** | | | | | |
| බහළුගත නැව්බඩු | 90,015,815 | - | - | 90,015,815 | 79,824,728 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 3,535,276 | 3,173,077 | 729,457 | 7,437,810 | 7,522,340 |
| ද්‍රව | 6,618,378 | 386,711 | - | 7,005,089 | 6,318,954 |
| **මුළු සම ඒකක (මෙ.ටො.)** | **100,169,469** | **3,559,788** | **729,457** | **104,458,714** | **93,666,022** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (ශ්‍රී.ල.ව.අ.)** | | | | | |
| බහළුගත නැව්බඩු | 54,053,066 | - | - | 54,053,066 | 54,109,284 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 8,144,775 | 3,341,207 | 510,612 | 11,996,594 | 14,472,781 |
| වෙනත් | 4,849,320 | 239,667 | 61,493 | 5,150,480 | 4,760,974 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **67,047,161** | **3,580,874** | **572,105** | **71,200,140** | **73,343,039** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| බහළුගත නැව්බඩු | 49,409,665 | - | - | 49,409,665 | 42,569,709 |
| සාම්ප්‍රදායික නැව්බඩු | - | - | - | - | |
| වෙනත් | - | - | - | - | |
| **මුළු ටොන් ප්‍රමාණය** | **49,409,665** | **-** | **-** | **49,409,665** | **42,569,709** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (සී.අයි.සී.ටී)** | | | | | |
| බහළුගත නැව්බඩු | 102,203,816 | - | - | 102,203,816 | 93,110,002 |
| සාම්ප්‍රදායික නැව්බඩු | - | - | - | - | |
| වෙනත් | - | - | - | - | |
| **මුළු ටොන් ප්‍රමාණය** | **102,203,816** | **-** | **-** | **102,203,816** | **93,110,002** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| බහළුගත නැව්බඩු | 205,666,547 | - | - | 205,666,547 | 189,788,995 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 8,144,775 | 3,341,207 | 510,612 | 11,996,594 | 14,472,781 |
| වෙනත් | 4,849,320 | 239,667 | 61,493 | 5,150,480 | 4,760,974 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **218,660,642** | **3,580,874** | **572,105** | **222,813,621** | **209,022,750** |
| **සේවක සංඛ්‍යාව** | | | | | |
| සේවක සංඛ්‍යාව | **8,948** | **400** | **362** | **9,710** | **9,377** |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | සටහන | සමූහය 2018 | සමූහය 2017 | ශ්‍රීලවඅ 2018 | ශ්‍රීලවඅ 2017 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 3 | 147,060,913,673 | 149,445,346,188 | 147,011,659,779 | 149,426,989,444 |
| අස්පෘෂ්‍ය වත්කම් | 4 | 230,312,403 | 57,039,427 | 230,312,403 | 57,039,427 |
| ආයෝජනය කරන ලද දේපළ | 5 | 172,382,765,733 | 173,647,489,750 | 172,382,765,733 | 173,647,489,750 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 6 | 100 | - | 76,000,100 | 76,000,000 |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන | 7 | 39,221,857,964 | 39,221,857,964 | 39,196,120,030 | 39,196,120,030 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් (AFS) | 8 | 20,786,547,809 | 21,974,163,908 | 20,786,547,809 | 21,974,163,908 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් අයවිය යුතු මුදල | 9 | 102,995,559 | 123,179,740 | 102,995,559 | 123,179,740 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් - මහජන බැංකු ණය | 10 | 3,950,858,870 | 3,950,858,870 | 3,950,858,870 | 3,950,858,870 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **383,736,252,111** | **388,419,935,847** | **383,737,260,283** | **388,451,841,169** |
| | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| වට්ටෝරුගත | 11 | 2,550,631,838 | 2,497,221,609 | 2,535,006,071 | 2,484,790,666 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 12 | 12,962,975,602 | 115,568,661,254 | 11,958,215,682 | 114,562,457,908 |
| තැන්පතු සහ අත්තිකාරම් | 13 | 231,415,959 | 295,557,929 | 231,415,959 | 295,557,929 |
| පෙර ගෙවූ වියදම් | | 65,041,109 | 105,069,819 | 65,041,109 | 105,069,819 |
| සේවක ණය | 14 | 5,012,492,331 | 4,297,024,012 | 4,979,815,402 | 4,270,311,802 |
| වෙනත් මූල්‍ය වත්කම් | 15 | 36,132,390,042 | 22,491,559,843 | 35,935,170,096 | 22,345,520,484 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 2,754,881,161 | 1,736,048,989 | 1,934,879,597 | 914,764,144 |
| දේපළ පිරියත සහ උපකරණ - MPMC සමාගම | 17 | 998,823 | 998,823 | - | - |
| **මුළු ජංගම වත්කම්** | | **59,710,826,866** | **146,992,142,278** | **57,639,543,917** | **144,978,472,752** |
| **මුළු වත්කම්** | | **443,447,078,977** | **535,412,078,125** | **441,376,804,200** | **533,430,313,920** |
| | | | | | |
| **ස්කන්ධ සහ වගකීම්** | | | | | |
| | | | | | |
| **ස්කන්ධ** | | | | | |
| යෙදූ වූ ප්‍රාග්ධනය | 18 | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 |
| ප්‍රාග්ධන සංචිත | 19 | 14,543,219,896 | 14,533,969,106 | 14,543,219,896 | 14,533,969,106 |
| වෙනත් සංචිත | 20 | 1,125,903 | 1,125,903 | 1,125,903 | 1,125,903 |
| විලම්භිත ආදායම | 21 | 171,277,865,767 | 173,117,689,453 | 171,277,865,767 | 173,117,689,453 |
| ණය නිදහස් කිරීමේ සංචිතය | 22 | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 |
| ප්‍රතිප්‍රමාණන සංචිත | 23 | 75,228,436,897 | 75,893,542,157 | 75,228,436,897 | 75,893,542,157 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සංචිත | | (1,013,023,345) | 174,592,753 | (1,013,023,345) | 174,592,753 |
| රඳවාගත් ඉපයීම් | | 36,524,981,185 | 32,780,151,598 | 37,978,458,423 | 34,320,307,691 |
| **මුළු ස්කන්ධ එකතුව** | | **308,767,535,975** | **308,706,000,643** | **310,221,013,213** | **310,246,156,734** |
| | | | | | |
| | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජය | 24.1 | 59,690,100,248 | 54,924,342,666 | 59,690,100,248 | 54,924,342,666 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන | 25.1 | 10,926,466,537 | 11,363,752,700 | 10,924,411,551 | 11,360,327,710 |
| රජයේ ප්‍රදානයන් | 26 | 28,451,742,423 | 28,764,321,596 | 28,451,742,423 | 28,764,321,596 |
| විලම්භිත බදු වගකීම් | 27 | 9,198,644,245 | 4,191,116,180 | 9,198,644,245 | 4,191,116,180 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 28 | 5,381,709,018 | 4,737,678,804 | 5,371,717,412 | 4,731,949,905 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **113,648,662,471** | **103,981,211,946** | **113,636,615,879** | **103,972,058,057** |
| | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| භාණ්ඩ හා සේවා සැපයීම හා වෙනත් ණය හිමියන් | 29 | 1,783,098,873 | 106,228,718,883 | 1,478,725,009 | 105,914,892,043 |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජය | 24.2 | 6,645,377,816 | 5,198,526,722 | 6,645,377,816 | 5,198,526,722 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන | 25.2 | 5,112,837,302 | 4,708,319,092 | 1,960,389,294 | 1,555,871,084 |
| තැන්පතු සහ ලැබූ අත්තිකාරම් | 30 | 2,207,268,553 | 2,215,795,483 | 2,207,268,553 | 2,215,795,483 |
| ගෙවිය යුතු ප්‍රවර්තන බදු | 31 | 319,257,513 | 298,733,479 | 289,230,831 | 276,768,597 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | 32 | 4,962,924,635 | 4,074,771,871 | 4,938,183,606 | 4,050,245,199 |
| විලම්භිත බදු වගකීම් | | 115,834 | - | - | - |
| **මුළු ජංගම වගකීම්** | | **21,030,880,525** | **122,724,865,529** | **17,519,175,108** | **119,212,099,128** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **443,447,078,977** | **535,412,078,125** | **441,376,804,200** | **533,430,313,920** |

පිටු අංක 103 සහ 115 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 116 සිට 137 දක්වා පිටුවල සඳහන් ගිණුම් ප්‍රකාශ සඳහා සටහන් මගින් මෙම මූල්‍ය ගිණුම් පිළිබඳ අනුකලනයක් නිර්මාණය වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ මගින් 2018.12.31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දෙනු ලැබේ.

ශිරානි වන්නිආරච්චි
අධ්‍යක්ෂ (මුදල්)

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදුව ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

කාවන් රත්නායක
සභාපති

කපිතාන් අතුල හේවාවිතාරණ
කළමනාකාර අධ්‍යක්ෂ

දිනය : 2019 පෙබරවාරි 28

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය | සටහන | සමූහය 2018 | සමූහය 2017 | ශ්‍රීලවඅ 2018 | ශ්‍රීලවඅ 2017 |
|---|---|---|---|---|---|
| ආදායම | **33** | 38,546,124,626 | 35,887,576,749 | 38,546,124,626 | 35,389,455,404 |
| | | - | | | |
| සෘජු වියදම් | **34** | (21,255,413,995) | (20,577,453,769) | (21,112,085,564) | (20,011,306,204) |
| | | - | | | |
| **දළ ලාභය** | | **17,290,710,631** | **15,310,122,980** | **17,434,039,062** | **15,378,149,199** |
| වෙනත් මෙහෙයුම් මගින් ආදායම් | **35** | 11,577,690,595 | 6,936,504,408 | 11,577,478,847 | 6,924,202,305 |
| පරිපාලන වියදම් | **36** | (8,661,394,247) | (7,701,478,049) | (8,868,026,841) | (7,907,367,241) |
| **මෙහෙයුම් ලාභය** | | **20,207,006,980** | **14,545,149,339** | **20,143,491,069** | **14,394,984,263** |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | **37** | (81,453,526) | (269,436,216) | (130,554,275) | (207,764,536) |
| විදේශ විනිමය ලැබීම් / (පාඩු) | **38** | (11,316,830,420) | (2,266,439,579) | (11,316,830,420) | (2,193,749,789) |
| ආශ්‍රිත සමාගම් වලින් ලැබූ ලාභයේ කොටස් | **7.2** | - | (39,164,092) | - | |
| **බදු වලට පෙර ලාභය** | | **8,808,723,034** | **11,970,109,452** | **8,696,106,374** | **11,993,469,938** |
| ආදායම් බදු වියදම් | **39** | (21,322,032) | (20,354,391) | - | - |
| විලම්භිත බදු වියදම් | **27** | (4,448,860,301) | 102,008,604 | (4,448,860,301) | 102,008,604 |
| **වසරේ ලාභය** | | **4,338,540,701** | **12,051,763,665** | **4,247,246,073** | **12,095,478,542** |
| **මව් සමාගමේ ස්කන්ධ කොටස්හිමියන් වෙත බෙදිය හැකි** | | **4,338,540,701** | **12,051,763,665** | **4,247,246,073** | **12,095,478,542** |
| **වෙනත් සවිස්තරාත්මක ආදායම්** | | | | | |
| **වසරේ ලාභය** | | 4,338,540,701 | 12,051,763,665 | 4,247,246,073 | 12,095,478,542 |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් ප්‍රතිණනය කිරීම | | (351,550,704) | (176,382,793) | (347,934,931) | (177,735,321) |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වටිනාකම වෙනස් කිරීම | **8.1** | (71,925,684) | 21,643,291 | (71,925,684) | 21,643,291 |
| ලැයිස්තුගත නොකල කොටස් මත හානිවීම් සඳහා ප්‍රතිපාදන | **8.2** | (1,115,690,415) | - | (1,115,690,415) | - |
| වසර සඳහා වෙනත් සවිස්තරාත්මක මුළු ආදායම | | (1,539,166,802) | (154,739,502) | (1,535,551,029) | (156,092,030) |
| **වසර සඳහා වෙනත් සවිස්තරාත්මක ආදායම්හි මුළු එකතුව** | | **2,799,373,898** | **11,897,024,163** | **2,711,695,043** | **11,939,386,512** |
| **මව් සමාගමේ ස්කන්ධ කොටස්හිමියන් වෙත බෙදිය හැකි** | | **2,799,373,898** | **11,897,024,163** | **2,711,695,043** | **11,939,386,512** |

පිටු අංක 103 සිට 115 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 116 සිට 137 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීම් ප්‍රකාශනය**

| | යෙදවූ ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | වෙනත් සංචිත | විලම්බිත ආදායම | ණය මුදාහැරීම් සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | විකිණීම සඳහා ඇති සංචිත | රඳවාගත් ඉපැයුම් (හර) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **සමූහය** | | | | | | | | | |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | **7,591,379,785** | **712,038,233** | **1,125,903** | **3,071,461,909** | **4,613,549,887** | **74,048,089,533** | **152,949,462** | **(13,661,974,306)** | **76,528,620,407** |
| වසරේ ලාභය | - | - | - | | - | - | - | 12,051,763,665 | **12,051,763,665** |
| වෙනත් විස්තිරණ ආදායම | - | - | - | | - | - | 21,643,291 | | **21,643,291** |
| මුළු විස්තිරණ ආදායම | | | | | | | | | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත මත ගැලපුම | - | - | - | | - | 2,157,158,929 | - | | **2,157,158,929** |
| ගෙවූ ලාභාංශ | | | | | | | | (6,802,000) | **(6,802,000)** |
| ඉවත් කිරීම් මත ගැලපුම | - | - | - | | - | (311,706,305) | - | 311,706,305 | - |
| පෙර වර්ෂය හා ගැලපුම (41සටහන) | - | - | - | | - | - | - | 33,033,174,743 | **33,033,174,743** |
| HIPS හි ආයෝජන මත ප්‍රාග්ධන ලැබීම් / පාඩු | | 13,821,930,873 | | | - | | | - | **13,821,930,873** |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම | | | | (103,534,286) | | | | (176,382,793) | **(279,917,079)** |
| CICTසමාගමේ පෙර ගෙවූම් ගාස්තු | | | | (658,207) | | | | | **(658,207)** |
| ලාල් ටර්මිනල් සමාගම මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (6,829,041) | | | | | **(6,829,041)** |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (596,774) | | | | | **(596,774)** |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | 309,000,000 | | | | | **309,000,000** |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම මගින් එකවර ලැබූ මුදල | | | | 370,000,000 | | | | | **370,000,000** |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ලැබුන මුදල | | | | 72,388,674,280 | | | | | **72,388,674,280** |
| HIPS අත්කර ගැනීම මගින් කල්බදු අයිතිය | | | | 97,198,113,903 | | | | | **97,198,113,903** |
| HIPG අත්කර ගැනීම මගින් කල්බදු අයිතිය | | | | (46,075,536) | | | | | **(46,075,536)** |
| හම්බන්තොට වරායේ ආදායම් හා වියදම් ගැලපුම් | | | | | | | | 1,228,665,984 | **1,228,665,984** |
| කල්බදු අයිති ක්‍රමක්ෂය කිරීම-HIPS | | | | (61,866,795) | | | | | **(61,866,795)** |
| **2017දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **14,533,969,106** | **1,125,903** | **173,117,689,453** | **4,613,549,887** | **75,893,542,157** | **174,592,753** | **32,780,151,598** | **308,706,000,643** |
| වසරේ ලාභය | - | - | - | | - | - | - | 4,338,540,701 | 4,338,540,701 |
| වෙනත් විස්තිරණ ආදායම | - | - | - | | - | - | (71,925,684.00) | | (71,925,684) |
| ගෙවන ලද ලාභාංශ | | | | | | | | (1,000,000) | (1,000,000) |
| ඉවත් කිරීම් මත ගැලපුම | - | - | - | | - | (106,437,496) | - | 106,437,496 | (0) |
| පෙර වර්ෂය හා ගැලපුම (සටහන 41) | - | - | - | | - | - | - | (347,597,906) | (347,597,906) |
| හම්බන්තොට ස්ථාවර වත්කම් FD/AR/JE/09 මත ගැලපුම | - | *9,250,790* | | | - | - | - | | 9,250,790 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | | | | | | | | (351,550,704) | (351,550,704) |
| CICTසමාගමේ පෙර ගෙවූම් ගාස්තු | | | | (103,534,286) | | | | | (103,534,286) |
| ලාල් ටර්මිනල් සමාගම මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (658,207) | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (10,300,000) | | | | | (10,300,000) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (12,333,333) | | | | | (12,333,333) |
| කල්බදු අයිතිය ක්‍රමක්ෂය කිරීම - HIPS | | | | (731,198,730) | | | | | (731,198,730) |
| කල්බදු අයිතිය ක්‍රමක්ෂය කිරීම - HIPG | | | | (981,799,130) | | | | | (981,799,130) |
| ප්‍රතිප්‍රමාණන සංචිත මත විලම්බිත බදු ගැලපුම | | | | | | (558,667,764) | | | (558,667,764) |
| ලැයිස්තුගත නොකල ආයෝජන මත ගැලපුම | | | | | | | (1,115,690,414) | | (1,115,690,414) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **14,543,219,896** | **1,125,903** | **171,277,865,767** | **4,613,549,887** | **75,228,436,897** | **(1,013,023,345)** | **36,524,981,185** | **308,767,535,975** |
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | | | | | | | | | |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | **7,591,379,785** | **712,038,233** | **1,125,903** | **3,071,461,909** | **4,613,549,887** | **74,048,089,533** | **152,949,462** | **(12,170,982,560)** | **78,019,612,153** |
| වසරේ ලාභය | - | - | | - | - | - | - | 12,095,478,542 | **12,095,478,542** |
| වෙනත් විස්තිරණ ආදායම | - | - | | - | - | - | 21,643,291 | - | **21,643,291** |
| **මුළු විස්තිරණ ආදායම** | | | | | | | | | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත මත ගැලපුම | - | - | | - | - | 2,157,158,929 | - | - | **2,157,158,929** |
| ඉවත් කිරීම් මත ගැලපුම | - | - | | - | - | (311,706,305) | - | 311,706,305 | - |
| HIPS,HIPG ආයෝජන මත ප්‍රාග්ධන ලැබීම්/ පාඩු | - | 13,821,930,873 | | - | - | - | - | - | **13,821,930,873** |
| පෙර වර්ෂය හා ගැලපුම (සටහන 41) | - | - | | - | - | - | - | 33,033,174,743 | **33,033,174,743** |
| CICTසමාගමේ පෙර ගෙවූම් ගාස්තු | | | | (103,534,286) | | | | | **(103,534,286)** |
| ලාල් ටර්මිනල් සමාගම මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (658,207) | | | | | **(658,207)** |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (6,829,041) | | | | | **(6,829,041)** |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | (596,774) | | | | | **(596,774)** |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම මගින් එකවර ලැබූ මුදල | | | | 309,000,000 | | | | | **309,000,000** |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ලැබුන මුදල | | | | 370,000,000 | | | | | **370,000,000** |
| HIPS සමාගම අත්පත් කර ගැනීම මගින් හිමි වූ කල්බදු අයිතීන් | | | | 72,388,674,280 | | | | | **72,388,674,280** |
| HIPG සමාගම අත්පත් කර ගැනීම මගින් හිමි වූ කල්බදු අයිතීන් | | | | 97,198,113,903 | | | | | **97,198,113,903** |
| HIPS අත්කර ගැනීම මගින් කල්බදු අයිතිය | | | | (46,075,536) | | | | | **(46,075,536)** |
| HIPG අත්කර ගැනීම මගින් කල්බදු අයිතිය | | | | (61,866,795) | | | | | **(61,866,795)** |
| හම්බන්තොට වරායේ ආදායම් හා වියදම් ගැලපුම් | | | | | | | | 1,228,665,984 | **1,228,665,984** |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම | | | | - | | - | | (177,735,321) | **(177,735,321)** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **14,533,969,106** | **1,125,903** | **173,117,689,453** | **4,613,549,887** | **75,893,542,157** | **174,592,753** | **34,320,307,691** | **310,246,156,736** |
| වසරේ ලාභය | - | - | - | | - | - | - | 4,247,246,073 | 4,247,246,073 |
| වෙනත් විස්තිරණ ආදායම | - | - | - | | - | - | (71,925,684.00) | - | (71,925,684) |
| ඉවත් කිරීම් මත ගැලපුම | - | - | | - | - | (106,437,496) | | 106,437,496 | - |
| හම්බන්තොට ස්ථාවර වත්කම් FD/AR/JE/09 මත ගැලපුම | | *9,250,790* | | | | | | | 9,250,790 |
| පෙර වර්ෂය හා ගැලපුම (සටහන 41) | | | | | | | | (347,597,906) | (347,597,906) |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම | | | | | | | | (347,934,931) | (347,934,931) |
| CICTසමාගමේ පෙර ගෙවූම් ගාස්තු | | | | *(103,534,286)* | | | | | (103,534,286) |
| ලාල් ටර්මිනල් සමාගම මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | *(658,207)* | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | *(10,300,000)* | | | | | (10,300,000) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ගෙවන මුදල මත ක්‍රමක්ෂය | | | | *(12,333,333)* | | | | | (12,333,333) |
| HIPS සමාගම අත්පත් කර ගැනීම මගින් හිමි වූ කල්බදු අයිතීන් | | | | *(731,198,730)* | | | | | (731,198,730) |
| HIPG සමාගම අත්පත් කර ගැනීම මගින් හිමි වූ කල්බදු අයිතීන් | | | | *(981,799,130)* | | | | | (981,799,130) |
| ප්‍රතිප්‍රමාණන සංචිත මත විලම්බිත බදු ගැලපුම | | | | | | (558,667,764) | | | (558,667,764) |
| ලැයිස්තුගත නොවූ ආයෝජන මත ගැලපුම | | | | | | | *(1,115,690,414)* | | (1,115,690,414) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **14,543,219,896** | **1,125,903** | **171,277,865,767** | **4,613,549,887** | **75,228,436,897** | **(1,013,023,345)** | **37,978,458,423** | **310,221,013,213** |

පිටු අංක 103 සිට 115 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 116 සිට 137 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | සමූහය 2018 | 2017 | ශ්‍රීලවඅ 2018 | 2017 |
|---|---|---|---|---|
| **බදු වලට පෙර ලාභය** | **8,808,723,034** | **11,970,109,452** | **8,696,106,374** | **11,993,469,938** |
| ***ගැලපුම් කරන ලද*** | | | | |
| ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (ශුද්ධ ලාභාංශ ) | - | 39,164,092 | - | - |
| ක්‍ෂය | 4,022,189,767 | 5,560,486,512 | 4,016,616,489 | 5,547,819,038 |
| හම්බන්තොට වරායේ ආදායම් හා වියදම් ගැලපීම් | - | 1,228,665,984 | - | 1,228,665,984 |
| අස්පෘශ්‍යා වත්කම් ක්‍රමක්‍ෂය කිරීම | 30,655,643 | 23,924,336 | 30,655,643 | 23,695,026 |
| වසරේ පාරිතෝෂික ගාස්තු හා අදාළ පිරිවැය | 702,582,527 | 628,563,266 | 700,899,467 | 632,614,189 |
| ලාභාංශ ආදායම | (2,240,351,509) | (839,681,509) | (2,240,351,509) | (839,681,509) |
| පොලී ආදායම | (2,208,920,317) | (1,735,779,887) | (2,159,268,568) | (1,650,080,928) |
| පොලී වියදම් | 2,257,106,666 | 2,229,389,034 | 2,256,555,666 | 2,082,018,395 |
| රජයේ දීමනා වල ක්‍රමක්‍ෂය | (309,174,484) | (61,171,076) | (309,174,484) | (61,171,076) |
| ශුද්ධ විනිමය පාඩු | 11,316,830,420 | 2,278,909,051 | 11,316,830,420 | 2,205,937,060 |
| CICT සමාගමේ පෙර ගෙවුම් ගාස්තු | (103,534,286) | (103,534,286) | (103,534,286) | (103,534,286) |
| ලාෆ් ටර්මිනල් පුද්ගලික සමාගමේ වර්ෂය තුළ ක්‍රමක්ෂය | (658,207) | (658,207) | (658,207) | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරිස් පුද්ගලික සමාගම වර්ෂය තුළ ක්‍රමක්ෂය | (10,300,000) | (6,829,041) | (10,300,000) | (6,829,041) |
| HIPG/HPS සමාගම්හි කල්බදු අයිතීන් ක්‍රමක්‍ෂය | (1,712,997,860) | (107,942,330) | (1,712,997,860) | (107,942,330) |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් -මහජන බැංකුව | - | 3,950,858,870 | - | 3,950,858,870 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් -මහජන බැංකුව | - | (3,950,858,870) | - | (3,950,858,870) |
| වසරේ ක්‍රමක්‍ෂය ටෝකියෝ සිමෙන්ති සමාගම | (12,333,333) | (596,774) | (12,333,333) | (596,774) |
| ආයතනික සමාජ වගකීම් වියදම් | - | (17,467,352) | - | (17,467,352) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය | (16,024,922) | (18,139,866) | (16,024,922) | (18,139,866.00) |
| **කාර්ය ප්‍රාග්ධන විචල්‍යතාවයට පෙර මෙහෙයුම් ලාභය** | **20,523,793,139** | **21,067,411,396** | **20,453,020,890** | **20,908,118,258** |
| | | | | |
| **කාර්ය ප්‍රාග්ධන විචල්‍යතා** | | | | |
| වට්ටෝරු | (53,410,229) | 450,476,599 | (50,215,405) | (23,504,214) |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 104,348,692,534 | (104,687,905,948) | 104,362,666,803 | (103,740,921,708) |
| තැන්පතු හා අත්තිකාරම් | 64,141,970 | (88,758,338) | 64,141,970 | (88,758,338) |
| පෙර ගෙවූ වියදම් | 40,028,709 | (53,070,210) | 40,028,709 | (53,070,210) |
| සේවක ණය හා වෙනත් | (709,503,599) | 8,611,631 | (709,503,599) | 8,611,631 |
| වෙළඳ සහ වෙනත් ණයහිමියන් | (104,434,693,187) | 106,896,579,377 | (104,436,167,034) | 106,897,012,310 |
| ලැබූ තැන්පතු හා අත්තිකාරම් | (8,526,930) | (2,041,110,620) | (8,526,930) | (2,041,110,620) |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් | - | 4,369,842 | - | 4,369,842 |
| ප්‍රතිපාදන හා උපචිත වියදම් | 887,938,307 | (5,401,104,932) | 887,938,307 | (5,862,884,744) |
| **මෙහෙයුම් මගින් උත්පාදිත මුදල්** | **20,658,460,714** | **16,155,498,797** | **20,603,383,711** | **16,007,862,204** |
| | | | | |
| ගෙවන ලද පොලී | (1,996,843,394) | (3,147,988,754) | (1,996,292,394) | (3,191,434,497) |
| ගෙවන ලද පාරිතෝෂික | (410,103,017) | (428,803,093) | (409,066,891) | (428,588,159) |
| ගෙවූ බදු | (312,810,824) | (313,871,591) | (298,406,936) | (299,155,517) |
| **මෙහෙයුම් කාර්ය මගින් ලද ශුද්ධ මුදල්** | **17,938,703,480** | **12,264,835,358** | **17,899,617,491** | **12,088,684,032** |
| **ආයෝජන වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | |
| දේපළ , පිරියත උපකරණ පවරා ගැනීම | (163,222,860) | (234,744,363) | (126,752,432) | (226,747,761) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම මගින් උත්පාදන | 16,166,413 | 41,889,593 | 16,166,413 | 24,107,030 |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවන මුදල | - | 309,000,000 | - | 309,000,000 |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා ) මගින් එකවර ගෙවන මුදල | - | 370,000,000 | - | 370,000,000 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | (225,551,518) | (13,448,381,643) | (225,551,518) | (13,448,381,643) |
| අස්පෘෂ්‍ය වත්කම් පවරා ගැනීම | (205,681,089) | (11,187,222) | (205,681,089) | (11,187,222) |
| ලැබූ ලාභාංශ | 2,239,351,509 | 832,879,509 | 2,240,351,509 | 839,681,509 |
| ලැබූ පොලිය | 1,760,133,597 | 1,140,142,394 | 1,710,481,848 | 1,098,540,547 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවනේ ලැබිය යුතු පොලිය | 20,184,181 | 24,232,164 | 20,184,181 | 24,232,164 |
| වෙනත් මූල්‍ය වත්කම් මගින් ශුද්ධ උත්පාදන | (13,640,830,199) | (4,125,404,192) | (13,589,649,612) | (4,050,571,836) |
| | - | - | | |
| **ආයෝජන වලින් (භාවිතා කල) ශුද්ධ මුදල්** | **(10,199,449,965)** | **(15,101,573,763)** | **(10,160,450,700)** | **(15,071,327,214)** |
| **මුදල් යෙදවුම් මගින් මුදල් ප්‍රවාහයන්** | | | | |
| ශ්‍රී ලංකා රජයෙන් ණය ලබා ගැනීම් | - | 12,016,727,822 | - | 12,016,727,822 |
| මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම් | - | - | - | - |
| ලබාගත් ණය ශ්‍රී ලංකා රජය වෙත නැවත ගෙවීම | (5,179,100,598) | (6,959,384,915) | (5,179,100,598) | (6,959,384,915) |
| ලබාගත් ණය මූල්‍ය ආයතන වෙත නැවත ගෙවීම | (1,541,320,743) | (1,743,449,323) | (1,539,950,739) | (1,742,079,319) |
| **ආයෝජන වලින් (භාවිතා කල) ශුද්ධ මුදල්** | **(6,720,421,341)** | **3,313,893,584** | **(6,719,051,337)** | **3,315,263,589** |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වෙනස් වීම්** | **1,018,832,172** | **477,155,179** | **1,020,115,453** | **332,620,407** |
| වසර ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | **1,736,048,989** | **1,258,893,810** | **914,764,144** | **582,143,737** |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන 16)** | **2,754,881,161** | **1,736,048,989** | **1,934,879,597** | **914,764,144** |

පිටු අංක 103 සිට 115 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 116 සිට 137 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

**1 සංස්ථාපිත තොරතුරු**

1.1 **පොදු කරුණු**

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් 1979 අගෝස්තු 01 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබූ අතර, ඉන්පසුව එය 1984 අංක 07 හා අංක 35 දරණ පනත් වලින් සංශෝධනය කොට ඇත.

1.2 **ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම් කටයුතු වල ස්වභාවය**

නැව් භාණ්ඩ වාහක කටයුතු (ස්ටෙවඩෝරු), නැව් ගත කිරීම හා ප්‍රතිනැව්ගත කිරීම,ගොඩබෑම් හා ගුදම්ගත කිරීම, වාප්පු කටයුතු, වතුර සැපයීම, ඉන්ධන සැපයීම, පෙට්‍රෝලියම්, පෙට්‍රෝලියම් නිෂ්පාදන සහ ලිහිසි තෙල් යාත්‍රා වලට හා යාත්‍රාවන්ගෙන් රැගෙන ඒම, යාත්‍රා වලින් යාත්‍රා වලට ද නියමු ගාස්තු සඳහා බංකර සහ ගබඩා අතරද කිමිදුම් කටයුතු සඳහා යාත්‍රා බැඳ තැබීමට සහ මුහුද යට නැව් අළුත් වැඩියා කටයුතු, ඊට අනුශාංගික සේවාවන් සපයන යාත්‍රා සඳහා ජලය, ඉන්ධන, විදුලි බලය කාර්යක්‍ෂමව සහ අඛණ්ඩව සැපයීම.

1.3 **මුදල් වර්ෂය**

අධිකාරියේ මුදල් වර්ෂය දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වේ.

1.4 **ලියාපදිංචි කාර්යාලය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය තැ.පෙ.595, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01 දරණ ස්ථානයෙහි පිහිටා ඇත.

1.5 **සේවක සංඛ්‍යාව**

2018 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යාව 9, 710 (2017-9,377) කි.

1.6 **නිකුත් කිරීමේ බලය ලත් දිනය**

2018 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තීරණයට අනුකූලව 2019 පෙබරවාරි 22 දින නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

**2 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය**

**2.1 පිළියෙල කිරීමේ පදනම**

වරාය අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව පිළියෙල කරන ලදී. වෙනස් කරන ලද, විකිණීම සඳහා ඇති මූල්‍යමය වත්කම් වල සාධාරණ වටිනාකම අනුව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූල වෙමින් මූල්‍යමය ප්‍රකාශන සකස් කිරීමේදී ඇතැම් විමර්ශනාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍යය. මෙම ක්‍රියාවලියේ දී කළමනාකාරීත්වයට සිය විනිශ්චයන් වෙත එළඹීමේදී සියළු පාර්ශ්වයන්ගේම ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කිරීම අවශ්‍ය වේ.

## 2.2 ඒකාබද්ධ කිරීම

### 2.2.1 පරිපාලිත

පරිපාලිත යනු අයිතියෙන් භාගයකට වඩා කොටස්කාරීත්වය සමඟ මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීම සඳහා සමූහයකට බලය ඇති ඒකකයකි. පරිපාලිතයක පාලනය සමූහයකට මාරු කිරීමේ දින සිට පරිපාලිතය සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ ලෙස සැලකේ. මෙම පාලනය අවසාන වන දින සිට එය ඒකාබද්ධ තත්ත්වයෙන් ඉවත් කෙරේ.

ව්‍යාපාර සංයෝජනය සඳහා සැළකීම පිණිස අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය, සමූහය විසින් භාවිතා කරනු ලැබේ. පරිපාලිතය සමන්විත වන්නේ මාරුකරන ලද වත්කම් වල සාධාරණ වටිනාකම සහ පරිපාලිතය විසින් දරනු ලබන වගකීම් වලිනි. පරිපාලිතය සම්පූර්ණයෙන්ම අධිකාරියට අයිති බැවින් පරිපාලිතයේ පාලනයට යටත් නොවන කටයුතු, සමූහය විසින් පිළිගනු නොලැබේ.

අන්තර් ඒකක ගණුදෙනු, ශේෂයන්, අන්තර් සමාගම් ගණුදෙනුවලදී සිදුවන ආදායම සහ වියදම ඉවත්කරනු ලැබේ. තවද වත්කම් වලදී පිළිගනු ලබන අන්තර් සමාගම් ගණුදෙනු වලදී ඇතිවන ලාභ සහ පාඩු ද ඉවත් කෙරේ. සමූහය විසින් භාවිතා කරනු ලබන ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිතා කිරීමේ අවශ්‍යතාවය අනුව පරිපාලිතයේ ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කර ඇත.

### 2.2.2 ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගමක් යනු සමූහයේ සැළකිය යුතු බලපෑමක් ඇති සාමාන්‍යයෙන් ඡන්ද අයිතියෙන් 20%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක සෘජු හෝ සෘජු නොවන කොටස් හිමිකම සහිත එහෙත්, පාලනයක් රහිත ඒකකයකි. ආශ්‍රිත සමාගමක ආයෝජනයක් ගිණුම්ගත කරනුයේ ගිණුම්කරණයේ ස්කන්ධ ක්‍රමය භාවිතා කිරීමෙනි. ස්කන්ධ ක්‍රමය යටතේ, ආයෝජනය ආරම්භයේදී පිරිවැයක් ලෙස සලකන අතර පවරා ගැනීමේ දිනයෙන් පසු ආයෝජිතයාගේ ලාභය හෝ පාඩුව ආයෝජකයාගේ කොටසෙහි ධාරණ අගයේ වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස පිළිගනු ලබයි.

සමූහයේ පශ්චාත් පවරා ගැනීමේ ලාභ හෝ පාඩු සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ සඳහන් කර ඇති අතර ආයෝජිතයාගේ අනෙකුත් සවිස්තරාත්මක ආදායම්, පශ්චාත් පවරා ගැනීමේ කොටස්, වෙනත් සවිස්තරාත්මක ආදායම් සමඟ ආයෝජනයේ ධාරණ අගයට ගැළපුම් කර සඳහන් කර ඇත.

ආශ්‍රිත සමාගමේ කරන ලද ආයෝජනයෙන් හානි සිදු වී තිබේද යන්න, විෂයානුබද්ධ සාක්ෂි තිබේ ද යන්න, සමූහය විසින් සෑම වාර්තා කරන දිනයකදීම තීරණය කරනු ලබයි. එය එසේ නම්, හානි සිදු වූ අගය, ආශ්‍රිත සමාගමේ නැවත ලබා ගැනීමට හැකි අගය සහ එහි ධාරණ අගයේ වෙනස ලෙස සමූහය ගණනය කරන අතර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ ආශ්‍රිත සමාගම් වල ලාභ / පාඩු කොටස් හා ආසන්නයේ සඳහන් කර ඇත.

## 2.3 විදේශ මුදල් පරිවර්තනය

### 2.3.1 ක්‍රියාත්මක කරනු ලබන සහ ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

සමූහයේ එක් එක් ඒකකයන්ගේ මූල්‍යමය ප්‍රකාශ වල ඇතුළත් කර ඇති ගණුදෙනු සහ ශේෂයන් ගණනය කරනුයේ එම ඒකකය මෙහෙයුම් කරනු ලබන මූලික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය භාවිතා කරමිනි. ඒකාබද්ධ මුදල් ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහයේ ඉදිරිපත් කරන මුදල් වර්ගය වේ.

### 2.3.2 ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් වලින් සිදුකරන ගණුදෙනු, භාවිතා කරන මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලබන්නේ ගණුදෙනු සිදු කරන දිනයන්හි පවත්නා විනිමය අනුපාතය භාවිතා කරමිනි. මෙවැනි ගණුදෙනු පියවීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වන විදේශ විනිමය ලාභ සහ පාඩු, විදේශ මුදල් ඒකක මගින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් හි වසර අවසානයේ විනිමය අනුපාත පරිවර්තනය සවිස්තරාත්මකව ආදායම් ප්‍රකාශනයේ සඳහන් කර ඇත.

ක්‍රමක්ෂ පිරිවැයෙහි වෙනස්වීම් වලට අදාළව පරිවර්තන වෙනස්කම් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

## 2.4 දේපල, පිරියත සහ උපකරණ

**2.4.1** අදාළ දෙපාර්තමේන්තු විසින් වැඩ අවසන් කල බවට සහතිකය නිකුත් කල පසු ක්‍රියාකාරී වැඩසටහන් ගිණුම් වල පවතින පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

2.4.2 දේපල, පිරියත හා උපකරණ මුල්වරට හඳුනාගෙන ඇත්තේ පිරිවැය දැරීමේදී වන අතර එහි පිරිවැය ලෙස වත්කම් වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට දැරූ පිරිවැය හා සමූහයේ කළමනාකරණය අදහස් කරන පරිදි වත්කම් මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට දැරිය යුතු අනෙකුත් පිරිවැය ඇතුළත් විය යුතුය.

දේපල,පිරියත සහ උපකරණ වල ප්‍රතිප්‍රමාණනය කරනු ලබන මුදලේ ප්‍රමාණය, දේපල, පිරියත සහ උපකරණ වල වටිනාකම සාධාරණ වටිනාකමට සමාන වන අවස්ථාවලදී ප්‍රතිප්‍රමාණනය කරන දිනට වූ සැලකි පිරිවැය ලෙස සලකන ලදී. අනෙකුත් දේපල, පිරියත සහ උපකරණ පසුව ගණනය කරන ලද්දේ එකතු වූ ක්ෂයවීම් සහ එකතු වූ හානි අඩුකළ පිරිවැයක් ලෙසිනි.

පසුකාලීන පිරිවැය වත්කමේ ඉදිරියට ගෙන ආ අගයේ ඇතුළත් කිරීම හෝ වත්කමක් ලෙස පිළිගනු ලැබීම කරනු ලබන්නේ මෙම වත්කම හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබෙන බවට හා වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කිරීමට හැකියාව ඇත්නම් පමණි. අනෙකුත් සියළු අළුත්වැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු සිදු වන මූල්‍ය වර්ෂය තුළ දී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ සඳහන් කර ඇත.

ඉඩම්වල වටිනාකම ක්ෂය නොකෙරේ. අනෙකුත් වත්කම් වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ සරල රේඛීය ක්‍රමය භාවිතා කරමිනි. මෙසේ කරනු ලබන්නේ ඒවායේ පිරිවැය හෝ පිරිවැය ලෙස සැළකිය හැකි වටිනාකම් පහත දැක්වෙන පරිදි ඒවායේ ඇස්තමේන්තුගත ජීවන කාලය අනුව වේ.

| වත්කම් කාණ්ඩය | | අනුපාතය |
|---|---|---|
| මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහයන් | වසර 5 – 100 | 1% - 20% |
| පාවෙන උපකරණ | වසර 2 – 22 | 4.5% - 50% |
| මෙහෙයුම් උපකරණ | වසර 2 - 20 | 5% - 50% |
| යන්ත්‍ර සහ උපකරණ | වසර 2 – 20 | 5% - 50% |
| කාර්යාල සහ සුහසාධක ගොඩනැඟිලි | වසර 2 – 100 | 1% - 50% |
| පරිගණක දෘඩාංග | වසර 1 – 5 | 20% - 100% |
| මෝටර් රථ | වසර 5 - 15 | 6.6% - 20% |
| විදුලි හා විද්‍යුත් උපකරණ | වසර 1 - 20 | 5% - 100% |
| ගෘහ භාණ්ඩ | වසර 1 - 20 | 5% - 100% |
| වෙනත් වත්කම් | වසර 1 - 20 | 5% - 100% |

වත්කම් වල ධාරණ අගය, ඒවායේ ඇස්තමේන්තුගත යළි අයකර ගත හැකි අගයට වඩා වැඩි නම් එම වත්කමේ ධාරණ අගය යළි අයකර ගත හැකි අගය දක්වා කපාහැරිය යුතුයි.

ක්‍රියාවට නැංවෙමින් පවතින කාර්යයන්හි (Work In Progress) ප්‍රතිපත්තිය වන්නේ “අදාළ දෙපාර්තමේන්තු විසින් වැඩ අවසන් කල බවට සහතිකය නිකුත් කල පසු ක්‍රියාකාරී වැඩසටහන් ගිණුම් වල පවතින පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ”.

### 2.4.3 අස්පෘශ්‍ය වත්කම්

ලබාගන්නා ලද පරිගණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධතීන්හි වර්තමාන අගය ගණනය කරනු ලබන්නේ, එකී මෘදුකාංග හා පද්ධතීන් ලබාගැනීමට වැය කළ පිරිවැය මත පදනම්වයි. පිරිවැයෙන් අඩු කර ගත් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකිරීමේ පාඩු අත්පත් කරගත් වත්කම් ලෙස ප්‍රකාශ කර ඇත. පහත සඳහන් පරිදි ඒවායේ ඇස්තමේන්තුගත ජීවන කාලය අඩුකොට ණය හිලව් කිරීමෙන් පසු පිරිවැය සඳහන් කර ඇත.

| | | |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | වසර 1 – 6 | 16.6% - 100% |

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම ආශ්‍රිත පිරිවැය, වැයකළ මුදල් ලෙස පිළිගෙන ඇත.

### 2.4.4 ආයෝජන දේපල

කුලී මුදල් අයකර ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ආයෝජන දේපල, මූලික වශයෙන් එහි පිරිවැය අනුව ගණනය කෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රථම සකස්කරන ලද මුදල් ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රත්‍යාගණනය කරන ලද මිළ ගණන් වලට අනුකූලව ආයෝජන දේපල පවත්වාගෙන ගොස් ඇත. ආයෝජන දේපලවල විකුණුම් වටිනාකම පුළුල් වශයෙන් සාධාරණ වටිනාකමට සමාන වන බැවින් ආයෝජන දේපල වල අඩංගු මුදල් එසේ නැවත වටිනාකම් කළ දින සිට පැවති සැලකි පිරිවැයක් ලෙස අධිකාරිය විසින් සළකන ලදී. ඒ අනුව ආයෝජන දේපල සඳහන් කර ඇත්තේ එකතු වූ ක්ෂයවීම් සහ එකතු වූ හානි අඩුකිරීමට සලකන ලද පිරිවැයක් ලෙසිනි. අනෙකුත් ආයෝජන දේපල පසුව ගණනය කරන ලද්දේ සමුච්චිත ක්ෂයවීම් සහ එකතු වූ හානි අඩුකළ පිරිවැයක් ලෙසිනි.

ඉඩම්වල වටිනාකම ක්ෂය නොකෙරේ. ගොඩනැගිලිවල වටිනාකම් ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ සරල රේඛීය ක්‍රමය භාවිතා කරමිනි. මෙසේ කරනු ලබන්නේ ඒවායේ පිරිවැය හෝ පිරිවැය ලෙස සැළකිය හැකි වටිනාකම් පහත දැක්වෙන පරිදි ඒවායේ ඇස්තමේන්තුගත ජීවන කාලය අනුව වේ.

| | | |
|---|---|---|
| ආයෝජන දේපල | වසර 10 - 100 | 1% - 10% |

### 2.4.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වාර්තා කිරීමට භාජනය වන එක් එක් කාල පරිච්ඡේදය අවසානයේදී, සමූහය විසින් එහි දේපල,පිරියත සහ උපකරණ, ආයෝජන දේපල සහ අස්පෘශ්‍ය වත්කම් වල පවත්නා වටිනාකම සමාලෝචනය කරනු ලබන අතර එම වත්කම් හානිකරණය වී ඇති බවට යම් පෙන්නුම් කිරීමක් ඇත්දැයි තීරණය කරනු ලැබේ. එසේ පෙන්නුම් කරන්නේ නම් එවැනි හානිකරණ වලින් සිදු වූ ප්‍රමාණය තීරණය කරගැනීම සඳහා වත්කම්වල යළි අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. යම් වත්කමක යළි අයකරගත හැකි මුදල ඇස්තමේන්තුගත කළ නොහැකි අවස්ථා වල, සමූහය විසින් මුදල් උපයන ඒකකය තීරණය කරනු ලබන අතර එම වත්කම අයත්වන්නා වූ මුදල් උපයන ඒකකයේ අයකරගත හැකි මුදල ඇස්තමේන්තුගත කරනු ලැබේ.

අයකරගත හැකි මුදල යනු යමක් විකිණීම සඳහා වැයවන පිරිවැය සහ භාවිතයේ ඇති යමක් විකිණීම සඳහා වැයවන පිරිවැය සහ භාවිතයේ ඇති වටිනාකම අඩු කල විට ලැබෙන සාධාරණ වටිනාකමේ ඉහළ මට්ටම වේ. භාවිතයේ වටිනාකම තක්සේරු කිරීමේදී අනාගත මුදල් ලැබීම් වර්තමාන වටිනාකමට අඩුකළ මුදල අනුව බදු ගෙවීමට පෙර වට්ටම් ගාස්තු ක්‍රමය අනුගමනය කරමින් ඇස්තමේන්තු කරනු ලැබේ. මෙසේ කරනු ලබන්නේ දැනට පවත්නා මුදලේ කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් තත්ත්වයන් සහිත වෙළඳපල තක්සේරු පිළිඹිබු වන අන්දමින්, වට්ටම් අඩුකිරීමට පෙර පූර්වයෙන් පැවති බදු තත්ත්වය භාවිතා කරමිනි. මේ සඳහා අනාගතයේදී ඇතිවන මුදල් ප්‍රවාහය සමඟ ගැලපීම් කරනු නොලැබේ.

යම් වත්කමක අයකරගත හැකි මුදල (මුදල් උපයන ඒකකය) එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇස්තමේන්තුගත කර ඇත්නම් වත්කමේ ධාරණ අගය (මුදල් උපයන ඒකකය) අයකර ගත හැකි මුදල දක්වා අඩු කෙරේ. හානි වලින් ඇති වන්නා වූ පාඩුව සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් ඉතා ඉක්මනින් හඳුනාගත හැක.

## 2.5 මූල්‍ය වත්කම්

**2.5.1** මූලික හඳුනාගැනීමේ දී සමූහය විසින් මූල්‍යමය වත්කම් වල වර්ගීකරණය තීරණය කරනු ලබන අතර සමූහය විසින් එහි මූල්‍යමය වත්කම් පහත සඳහන් පරිදි වර්ගීකරණය කර ඇත:

(අ) කල් පිරෙන තෙක් තබාගන්නා ආයෝජන (HTM)
(ආ) ණය සහ ලැබිය යුතු දේ
(ඇ) විකිණීම සඳහා ඇති දේ (AFS)

### (අ) කල් පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජනයක් යනු ණය සහ ලැබිය යුතු දේවල් හැර ස්ථිර හෝ නිශ්චිත ගෙවීම් සහිත සහ ස්ථිර කල් පිරීමක් සහිත ලබා නොගත් මූල්‍ය වත්කම් වේ. කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන යනුවෙන් වර්ගීකරණය කර ඇත්තේ එම ආයෝජන කල්පිරෙන තෙක් තබාගැනීමට සමූහයට අදහසක් හෝ හැකියාවක් ඇත් නම් පමණි. ආයෝජනය කල්පිරෙන තෙක් නොපවතින්නේ නම් කල් පිරෙන තෙක් තබාගන්නා ආයෝජන ජංගම නොවන වත්කම් වල ඇතුළත් කර ඇත. සමූහය විසින් මෙම කාණ්ඩය යටතේ සඳහන් කර ඇත්තේ දැනට දරණු ලබන ණයකරයන් ය.

### (ආ) ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ යනු ස්ථිර සහ තීරණය කළ යුතු එමෙන් ම දැනට ක්‍රියාකාරී වෙළඳපලේ දක්වා නොමැති ලබා නොගත් මූල්‍යමය වත්කම් වේ. වාර්තාකරණයට භාජනය වන කාලපරිච්ඡේදය අවසාන වී මාස 12ට වැඩි කාලයක් ගතවන්නා වූ කල් පිරෙන වත්කම් හැර ජංගම වත්කම් වල ඇතුළත් කර ඇති ණය සහ ලැබිය යුතු දෑ ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සමූහයේ ණය සහ ලැබිය යුතු දේවල් සමන්විත වන්නේ වෙළඳ සහ වෙනත් ලැබීම්, යළි මිළට ගත් රජයේ සුරැකුම්පත්, ස්ථිර තැන්පතු පූර්ව ගෙවීම්, අත්තිකාරම්, තැන්පතු සේවක ණය සහ වාර්තාකරණයට භාජනය වන කාලපරිච්ඡේදය අවසානයේ පැවති මුදල් සහ මුදල් සමක වලිනි.

### (ඇ) විකිණීම සඳහා ඇති දෑ

විකිණීම සඳහා ඇති මූල්‍යමය වත්කම් යනු මෙම කාණ්ඩය යටතේ නම්කර ඇති හෝ වෙනත් කාණ්ඩයක් යටතේ වර්ගීකරණය කර නොමැති ලබා නොගත් මූල්‍යමය වත්කම් වේ. ආයෝජනය කල් පිරෙන එකක් නොවන්නේ නම් හෝ එය වාර්තාකරණයට භාජනය වන කාලපරිච්ඡේදය අවසානයේ සිට මාස 12ක් තුළ විකිණීමට කළමනාකරණයට අදහසක් නොමැති නම් මේ වත්කම්

ජංගම නොවන වත්කම් වල අන්තර්ගත කරයි. විකිණීමට ඇති මූල්‍යමය වත්කම් සමන්විත වන්නේ දීර්ඝ කාලීන නම් කරන ලද ස්කන්ධ ආයෝජන සහ නම් නොකරන ලද ස්කන්ධ ආයෝජනයන් ගෙනි.

### 2.5.2 හඳුනාගැනීම සහ මුල් වරට ගණනය කිරීම

ණය සහ ලැබීම් මූල්‍යමය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ සමූහය විසින් මෙම ගණුදෙනු ආරම්භ කරන ලද දින සිටය. අනෙකුත් මූල්‍යමය වත්කම් පිළිගනු ලබන්නේ සමූහය මුදල් ලේඛනයේ කොන්ත්‍රාත්තු ප්‍රතිපාදන සඳහා සමූහය පාර්ශ්වකරු වූ වෙළඳ දිනයේ සිට ය. මූල්‍යමය වත්කම් ප්‍රථමයෙන් ම ගණනය කරනු ලබන්නේ සාධාරණ වටිනාකම අනුව ය. ඊට අමතරව සාධාරණ වටිනාකම දක්වා නොමැති වත්කම් ඒවායේ ලාභ සහ පාඩු තුළින් ගණුදෙනු පිරිවැය සඳහා ඇති සෘජු සම්බන්ධතාවය අනුව ගණනය කෙරේ.

මූල්‍යමය වත්කම් වලින් මුදල් ප්‍රවාහයක් ලැබීමට අයිතියක් නොමැතිවිට හෝ මුදල් පැවරීමට ඇති අයිතිය මාරු වීමේ දී සහ මූල්‍යමය වත්කම් වල අයිතියේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ සමූහය විසින් මාරු කර ඇති අවස්ථාවන්හි  මූල්‍යමය වත්කම් පිළි නොගැනේ.

### 2.5.3 පසුව සිදුකෙරෙන ගණනය කිරීම්

#### (අ) කල් පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

කල් ඉකුත්වන තෙක් දරණු ලබන ආයෝජන වන්නේ හානි වලින් පාඩු වී තිබෙනම් ඒවා අඩුකොට ඵලදායි පොලී ක්‍රමයක් අනුගමනය කරමින් පසු කාලයේ සිදුකෙරෙන ක්‍රමක්ෂ පිරිවැය වේ. පවරාගැනීමේදී සහ ගණුදෙනු පිරිවැය වලදී සිදුවන වට්ටම් අඩුකිරීම හෝ වාරික සැළකිල්ලට ගෙන ක්‍රමක්ෂ පිරිවැය ගණනය කරනු ලැබේ.

#### (ආ) ණය සහ ලැබිය යුතු දේ

ආරම්භක පිළිගැනීමෙන් අනතුරුව ණය සහ ලැබීම් ගණනය කරනු ලබන්නේ ක්‍රමක්ෂ පිරිවැය අනුව වන අතර එසේ කිරීමේදී හානි සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට ඵලදායි පොලී ක්‍රමයක් අනුගමනය කිරීමෙනි.

#### (ඇ) විකිණීම සඳහා ඇති දේ

ආරම්භක පිළිගැනීමෙන් අනතුරුව විකිණීම සඳහා ඇති මූල්‍යමය වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති සමාන කොටස් ආයෝජනයන් සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස්කම් වෙනත් සවිස්තරාත්මක ආදායමේ පිළිගෙන ඇති අතර, සමාන කොටස්වල වෙනස්වීම් ප්‍රකාශයේ විකුණුම් සංචිතය ලෙස ඉදිරිපත් කර ඇත. සමූහයේ ක්‍රමෝපායික ආයෝජන වන නම් නොකරන ලද සම කොටස් එහි සාධාරණ අගය විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කිරීමට නොහැකි හෙයින් හානි කිරීම් සඳහා පාඩු ලෙස ගණනය කරනු ලබයි.

### 2.5.4 මූල්‍ය වත්කම් හානිවීම

#### (අ) ක්‍රමක්ෂ පිරිවැය මත පවත්වා ගෙන යනු ලබන වත්කම්

වාර්තා කරන කාලසීමාව අවසානයේදී මූල්‍ය වත්කමට හානි සිදු වූ බවට විෂය මූල සාක්ෂි තිබේදැයි සමූහය තීරණ කරනු ලබයි. වත්කම ආරම්භයේදී පිළිගැනීම, අවසානයේ සිදු වූ සිදුවීම (පාඩු) සහ පාඩු සිදුවීමත් (හෝ සිදුවීම්) යන ක්‍රියාවල ප්‍රතිඵලයක් ලෙස විශ්වාසනීය අයුරින් ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහ මත බලපෑමක් ඇති වූ බවට හා හානිවීම්

පිළිබඳව විෂය මූලික සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හානි වූ බව සහ හානිවීම් පාඩු සිදු වූ බවට සැලකේ.

ණය සහ ලැබීම් මෙන් ම කල් පිරෙන තෙක් දරණු ලබන ආයෝජන පවත්වා ගන යනු ලබන්නේ ක්‍රමක්ෂ පිරිවැය අනුව වන අතර පාඩුවේ ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස අනුව ය. (මීට අනාගතයේදී සිදුවීමට නියමිත වූ ණය හානි අන්තර්ගත නොවේ). එසේම ඉහත සඳහන් කරන ලද මූල්‍යමය වත්කම් එලදායි පොලී ක්‍රමයක් මත වට්ටම්ගත කළයුතු වේ. මූල්‍ය වත්කමේ ධාරණ අගය අඩු කෙරෙන අතර සවිස්තරාත්මක ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙන් පාඩුව පිළිගනු ලබයි.

පසුකාලයකදී හානියෙන් ඇති වූ පාඩු අඩුවන්නේ නම් සහ එම පාඩු විෂය මූල තත්ත්වය අනුව හානිය සිදුවීමෙන් පසු ඇති වූ සිද්ධියකට සම්බන්ධ බවට පිළිගන්නේ නම් එවැනි අවස්ථාවක පෙරදී හඳුනාගත් හානියෙන් වූ පාඩුව සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේදී ප්‍රතිවර්තනයක් ලෙස හඳුනා ගනියි.

### (ආ) විකිණීම සඳහා ඇති දෑ

මූල්‍යමය වත්කම් වලට හානියක් සිදු වී ඇති බවට විෂය මූලික සාධක තිබේදැයි වාර්තාකරණයට භාජනය වන එක් එක් කාලසීමාව අවසානයේ දී, සමූහය විසින් තක්සේරු කරනු ලබයි. මිළ සඳහන් කළ සම කොටස් ආයෝජන සඳහා සාධාරණ වටිනාකමේ වැදගත් හෝ දිගු කලක් තිස්සේ එහි පිරිවැයට වඩා අඩු වත්කම් ප්‍රමාණයක් තිබීම ද වත්කමකට හානියක් සිදුවීමක් ලෙස සැළකීමේ සාධකයක් වේ. සඳහන් කල ආයෝජන සඳහා සාධකයක් පවතී නම් සමුච්චිත පාඩු ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැය සහ පවත්නා සාධාරණ අගය අතර ඇති වෙනසින් කලින් පිළිගත් ලාභ හෝ පාඩු වලින් සිදු වූ පාඩු අඩු කර ප්‍රතිවර්ගීකරණ ගැළපුමක් ලෙස සම කොටස් වලින් ලාභ හෝ පාඩු ලෙස ප්‍රතිවර්ගීකරණය කිරීමෙනි.

මිළ සඳහන් නොකළ සමාන කොටස් ආයෝජනයන් සඳහා පිරිවැයට අඩු ආයෝජනයේ වටිනාකමේ ඇති වැදගත් හෝ දිගු කාලීන අඩු වීමක් ද වත්කම් හානි වීම් සිදු වූ බවට සාධක වේ. මිල සඳහන් නොකළ ආයෝජනයන් සඳහා සාධක පවතී නම්, හානි වීම් සඳහා පාඩු වල අගය ගණනය කරනු ලබන්නේ මූල්‍ය වත්කමේ ධාරණ අගයේ සහ සමාන මූල්‍ය වත්කමක් සඳහා පවත්නා වෙළඳ පොළ ඉපැයුම් අනුපාතිකයේ වට්ටම් ගත ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයේ පවත්නා අගය අතර වෙනස මගිනි. මෙම හානිවීම සඳහා පාඩු ප්‍රතිවර්තනය නොකෙරේ.

## 2.6 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ දක්වා ඇත්තේ පිරිවැය අනුවය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය පදනම් කරගෙනය. වට්ටෝරු භාණ්ඩ සමන්විත වන්නේ යාත්‍රා සහ නැව් බඩු මෙහෙයවීමේ උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් සහ පරිභෝජන භාණ්ඩ වලින් මෙන් ම ඉන්ධන සහ ලිහිසි තෙල් වලිනි. වට්ටෝරු භාණ්ඩ පරිභෝජනය සඳහා මිස නැවත විකිණීම සඳහා අදාළ නොවේ.

## 2.7 වෙළඳ ලැබීම්

ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී ගණුදෙනුකරුවන්ට සළසන ලද සේවය වෙනුවෙන් ඔවුන්ගෙන් අයවිය යුතු මුදල්ය. සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයවීමේ සාමාන්‍ය චක්‍රය අනුව එකතුවීම් අපේක්ෂා කරන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මුලදී ලැබිය යුතු දෑ වෙළඳ ද්‍රව්‍ය ලෙස සළකා බැලීමේදී එහි සාධාරණ වටිනාකම පිළිගනු ලැබේ. එනම් ඉන්වොයිස් ගත මුදල සහ හානි සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට මුල් ඉන්වොයිස් මුදල ගණනය කරනු ලැබේ. මෙසේ කරනු ලබන්නේ එම මුදල් කෙටි කලකදී ලැබේ යැයි බලාපොරොත්තුවෙන් වන අතර එම මුදලේ කාලීන අගය මෙහිදි වැදගත් නොවේ.

වෙළඳ ලැබීම් සඳහා හානි සිදු වී තිබේද යන්න සඳහා විෂය මූලික සාක්ෂි තිබේදැයි, වාර්තා කරන කාලසීමාව අවසානයේදී සමූහය තක්සේරු කරයි. වෙළඳ ලැබීම් සඳහා හානි වීම් පිළිබඳ විෂය මූලික සාක්ෂි සඳහා සමූහයේ ගෙවීම් ලබා ගැනීම වෙනුවෙන් පසුගිය පළපුරුද්ද, උපරිම ණය කාලසීමාව වන දින 28ට පසුව ප්‍රමාද වී ලැබුණු ගෙවීම් වල ඉහළ යෑමක් ඇතුලත් විය හැක. වෙළඳ ලැබීම් වලින් හානි සිදු වී, හානි වීම් වලින් පාඩු විඳීමට සිදු වන්නේ හානි වීම් පිළිබඳ විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණි. වැදගත් වෙළඳ ලැබීම් තනි වශයෙන් හානි වීම් සඳහා තක්සේරු කරන අතර වැදගත් නොවන වෙළඳ ලැබීම් හානි වීම් සඳහා සාමූහිකව තක්සේරු කෙරේ.

වෙළඳ ලැබීම් සඳහා හානි වීම් තක්සේරු කිරීම වෙනුවෙන් පහත සඳහන් ආකෘති සහ පදනම භාවිතා කෙරේ.

(අ) **තනි තනි වශයෙන් ඇගයීම් කිරීමේ ආකෘතිය:** හානියෙන් සිදු වූ පාඩුව ගණනය කිරීම සඳහා පහත සඳහන් ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය වර්ග තනි තනිව සමාලෝචනය කරනු ලැබේ.

| | | පදනම | |
|---|---|---|---|
| i | ශ්‍රී ලංකා හමුදාවන් | මාස 12 දක්වා<br>මාස 12න් පසු | ප්‍රතිපාදන නොමැත<br>50% |
| ii | රජයේ ආයතන | මාස 12 දක්වා<br>මාස 12න් පසු | ප්‍රතිපාදන නොමැත<br>100% |
| iii | නඩු පවරා ඇති නැව් නියෝජිතයන් | | 100% |
| iv | නැව් නියෝජිතයින් - තහනම් කර ඇති සහ ක්‍රියාත්මක නොවන | | 100% |
| v | නැව් නියෝජිතයින් - සැලකිය යුතු මුදලක් සහිත (මිලියන 1කට වඩා වැඩි) | මාස 12 දක්වා<br>මාස 12න් පසු | ප්‍රතිපාදන නොමැත<br>100% |

(ආ) **සාමූහික ඇගයීමේ ආකෘතිය :** හානියෙන් සිදුවූ පාඩුව ගණනය කිරීම සඳහා පහත සඳහන් වෙළඳ ලැබීම් වර්ග සාමූහිකව සමාලෝචනය කෙරේ.

| | | |
|---|---|---|
| නැව් නියෝජිතයින් - සැලකිය යුතු මුදලක් රහිත(මිලියන 1කට වඩා අඩු) | මාස 12 දක්වා<br>මාස 12න් පසු | ප්‍රතිපාදන නොමැත<br>1% |

### 2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයේ, මුදල් සහ මුදල් සමක වලට අයත් වන්නේ අතේ ඇති මුදල්, බැංකු වල ඇති තැන්පතු, මූලික කල් පිරීමේ කාල සීමාව තෙමසක් හෝ ඊට අඩු කාලයක් සහිත කෙටි කාලීන ඉහළ මට්ටමේ ද්‍රවශීලතා ආයෝජනයන් ය.

### 2.9 ආයෝජිත ප්‍රාග්ධනය

ප්‍රාග්ධනය යනු කොළඹ වරාය කොමිසම, වරාය නැව් බඩු සංස්ථාව, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව සතුව තිබී ශ්‍රී ලංකා වරාය අධිකාරියට මාරුකර පවරන ලද සියළු දේපළ වලට අදාළ අරමුදල් වල ඇති මුදල්, සියළුම ණය, වගකීම් සහ බැදීම් ඇතුළුව වංචල සහ නිශ්චල දේපළ වේ.

## 2.10 මූල්‍යමය වගකීම්

සමූහය විසින් මූල්‍යමය වගකීම් යටතේ වෙනත් මූල්‍යමය වගකීම් වර්ග කර ඇත. සමූහයේ වෙනත් මූල්‍ය වගකීම් වලට අයත් වන්නේ ණය ගැණුම්, වෙළඳ හා වෙනත් ගෙවීමය. වෙනත් මූල්‍ය වගකීම් මූලිකව පිළිගනු ලබන්නේ වෙළඳ පිරිවැය සඳහා සෘජුවම අදාල මුදල සහ සාධාරණ අගයේ එකතුවෙනි. මූලික පිළිගැනීමෙන් අනතුරුව මෙම මූල්‍යමය වගකීම්, සඵල පොළී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂ පිරිවැය ලෙස ගණනය කරනු ලැබේ. ගිවිසුම්ගත වගකීම් ඉටු කර ඇති, අවලංගු කර හෝ අවසන් කර ඇති අවස්ථාවක සමූහය විසින් මූල්‍ය වගකීම පිළිගනු නොලැබේ.

## 2.11 වෙළඳ සහ ගෙවිය යුතු අනෙකුත් දේවල්

වෙළඳ සහ ගෙවිය යුතු අනෙකුත් දේවල් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ සහ සේවා සම්බන්ධ ගෙවීම් සඳහා ඇති වගකීමයි. ව්‍යාපාරයක සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක මෙන් වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේවල් ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේවල් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ මිළටය. මෙය ගණුදෙනු කරන මිල වන අතර පසුව ගණනය කිරීමේදී මුල් ඉන්වොයිසියේ මුදලට ගණනය කරන අතර, කෙටි කාලසීමාවක් තුළදී ගෙවීම් අපේක්ෂා කරන බැවින් මුදලේ කාලීන වටිනාකම වැදගත් නොවේ.

## 2.12 ණය ලබාගැනීම්

ශ්‍රී ලංකා රජයෙන් සහ මූල්‍ය ආයතන වලින් වරාය සංවර්ධනය සඳහා ලබාගත් ණය, සමූහයේ ණය ගිණුම් සඳහා ඇතුළත් වේ. ණය ගැණුම් මූලිකව පිළිගනුයේ සාධාරණ අගය ලෙස වන අතර ගණුදෙනු පිරිවැයේ ශුද්ධ එකතුව වේ. ණය ගැණුම් පසුව ඵලදායි පොලි අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය ලෙස ගණනය කෙරේ. වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී පවතින වල පොළී අනුපාතිකය (ඵලදායි පොළී අනුපාතිකය) භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය ලෙස වල අනුපාත ණය ගැනුම් ගණනය කරනු ලැබේ.

ණය මුදල් ගැනීමේ පහසුකම් ආරම්භ කිරීමේදී පැවති ණය මුදල පිළියෙළ කිරීමේ ගාස්තුව, ව්‍යුහාත්මක ගාස්තුව, සැකසීමේ ගාස්තුව සහ කළමනාකරණ ගාස්තුව පිළිගනු ලබන්නේ ණය ගැණුම් සඳහා වන ගණුදෙනු පිරිවැය ලෙසය.

ක්‍රමක්ෂ පිරිවැයට ණය මුදලේ ධාරණ අගය ගණනය කිරීමේදී ඇති වන විදේශ විනිමය ලාභ සහ පාඩු එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

## 2.13 ණය ලබාගැනීමේ පිරිවැය

ණය ලබාගැනීමේ පිරිවැය සෘජුවම සම්බන්ධ වන්නේ පවරාගැනීම සහ වටිනා වත්කම් වල ඉදිකිරීම් වෙනුවෙනි. මෙම වත්කම් ඒවා බලාපොරොත්තු වූ කාර්යය සඳහා සූදානම් කිරීමට සැහෙන කාලයක් ගතවේ. එම වත්කම් ඒවා භාවිතා කිරීමට අදහස් කරන කටයුතු සූදානම් වන තෙක් එකී වත්කම් වල පිරිවැයට එකතු කරයි.

අනෙකුත් සියළුම ණය ගැනුම් පිරිවැය සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් ඒවා සිදු වන කාල සීමාව තුළ පිළිගනු ලැබේ.

## 2.14 රජයේ ප්‍රදාන

මුදල්මය නොවන ප්‍රදානයන් ඇතුළුව රජයේ ප්‍රදානයන් එහි සාධාරණ අගය අනුව පිළිගනු ලබන අතර එසේ කරනු ලබන්නේ එම ආධාර ලබාගැනීමෙන් පසු සමූහය විසින් අදාළ කොන්දේසි අනුගමනය කරනු ලබන බවට සාධාරණ සහතිකයක් තිබෙන අවස්ථාවක ය.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් පිළිගනු ලැබේ. මෙය වන්දි ගෙවීම් සඳහා අදහස් කරන පිරිවැයට සරිලන පරිදි අවශ්‍ය කාලයේදී සළකා බලනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා අදාළ රජයේ ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම් වල ඇතුළත් කර ඇති අතර, අදාළ වත්කම් වල බලාපොරොත්තු වන ආයු කාලය මත සරල රේඛීය පදනම මත සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

මූල්‍යමය නොවන ප්‍රදාන, මූල්‍යමය නොවන වත්කම් වල සාධාරණ මිළ අනුව ගණනය කරනු ලබන අතර දීමනා සහ වත්කම් වල සාධාරණ වටිනාකම ගිණුම්ගත කෙරේ.

## 2.15 ජංගම සහ විලම්භිත බදු

අදාළ කාලපරිච්ඡේදය සඳහා බදු වියදම් සංයුක්ත වන්නේ ජංගම සහ විලම්භිත බදු වලිනි. වෙනත් සවිස්තරාත්මක ආදායම් වල පිළිගනු ලබන කරුණු වලට අදාළ ප්‍රමාණයට හැරෙන්නට සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ බදු පිළිගනු ලැබේ. මෙම අවස්ථාවේ දී, වෙනත් සවිස්තරාත්මක ආදායම සඳහා ද බදු පිළිගනු ලැබීම සිදුකෙරේ.

දැනට බලපැවැත්වෙන ආදායම් බදු ගාස්තු වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානය සඳහා වූ බදු නීතිය පදනම් කොට ගෙන ගණන් බලනු ලැබේ. එහිදී ක්‍රියාත්මක වන්නා වූ අධිකාරියේ ආශ්‍රිත ආයතන සහ උපදවන්නා වූ බදු අය කළ යුතු ආදායම සළකා බලනු ලැබේ. බදු අධිකාරීන්ට ගෙවීමට අපේක්ෂිත මුදල් උචිත පරිදි ගෙවීමට කළමනාකරණය විසින් ප්‍රතිපාදන සකස් කරනු ලැබේ.

වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ මූල්‍ය ප්‍රකාශයන් වල ඒවායේ ධාරණ අගය අතර පැන නගින තාවකාලික වෙනස්වීම් මත විලම්භිත බදු පිළිගනු ලැබේ. ගණුදෙනුවක දී වත්කමක් හෝ වගකීමක් මූලික පිළිගැනීමේදී පැන නගින්නේ නම් විලම්භිත බදු ගණනය නොකෙරේ. ගිණුම්කරණ හෝ බදු අය කළ හැකි ලාභ හෝ පාඩු ගණුදෙනුව සිදු කරන අවස්ථාවේදී බලපෑමක් සිදු කරන ව්‍යාපාර සංයෝජන හැර ගණුදෙනු සිදු වීමේදී වත්කම් හෝ වගකීම් මූලික පිළිගැනීමේදී පැන නගියි නම් විලම්භිත බදු පිළිගනු නොලැබේ. විලම්භිත බදු තීරණය කරනු ලබන්නේ වාර්තාකරන කාල සීමාව අවසානයේදී පනවා තිබූ බදු අය කිරීමේ අනුපාතිකය භාවිතා කරමින් වන අතර, අදාළ විලම්භිත බදු වත්කම් උපලබ්ධි වූ අවස්ථාවක හෝ විලම්භිත ආදායම් බදු වගකීම ගෙවා අවසන් වූ අවස්ථාවක මේවා අදාළ වේ.

අනාගත බදු වලින් ලැබෙන ලාභය තාවකාලික වෙනස්වීම් වලට බලපාන ලෙස පවත්නා විට විලම්භිත බදු වත්කම් පිළිගැනීම සිදුවනු ලැබේ.

දැනට පවතින බදු වගකීම් වලට බදු වත්කම් හිලව් කිරීම සඳහා නීතිමය වශයෙන් බලාත්මක කළහැකි අයිතියක් ඇති අවස්ථාවක සහ එකම බදු අධිකාරියක් මගින් පනවා ඇති විලම්භිත බදු වත්කම් සහ වගකීම් සඳහා ආදායම් බදු පනවා ඇති අවස්ථාවන්හි දි විලම්භිත බදු වත්කම් සහ වගකීම් හිලව් කළ හැක.

## 2.16 සේවක ප්‍රතිලාභ

සමූහය සතුව නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සහ නිශ්චිත දායකත්ව සැළසුම් ඇත.

### (අ) නිශ්චිත දායකත්ව සැළසුම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් වන අතර මේ යටතේ සමූහය විසින් වෙනත් ආයතනයකට නිශ්චිත ගෙවීම් කරනු ලැබේ. තවදුරටත් ගෙවීම් කිරීමට නීතිමය හෝ සම්මුතික බැඳියාවක් සමූහයට නොමැත. මෙම මුදල් ගෙවිය යුතු කාලය වනවිට සේවක ප්‍රතිලාභ ලෙස මෙම ගෙවීම් පිළිගනු ලැබේ.

සේවකයාගේ දළ වැටුපෙන් 15%ක් සේවක අර්ථ සාධක අරමුදලට ද 3%ක් සේවක භාරකාර අරමුදලට ද සමූහය විසින් ගෙවනු ලැබේ.

### (ආ) නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම සම්බන්ධව සමූහයේ වගකීම වන්නේ වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ පවත්නා නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වත්මන් වටිනාකමය. නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වාර්ෂිකව ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ආයු ගණක මගිනි. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම නිර්ණය කරනු ලබන්නේ සේවකයා විසින් වර්තමාන සහ පෙර කාල පරිච්ඡේදය සඳහා සේවාවන් වෙනුවෙන් උපයාගත් ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභ සඳහා වට්ටම් ලබා දීමෙනි.

පළපුරුදු ගැළපුම් සහ ආයු ගණක උපකල්පනයන් වල වෙනසින් මතුවන ආයු ගණක ලැබීම් සහ පාඩු ඒවා සිදු වූ කාල සීමාව තුලදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිරින් සපයන මුදල් භාවිතා නොකෙරේ.

### (ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයා විසින් අදාළ සේවාවන් සඳහා සපයන මුදල් අඩුකිරීමෙන් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් ගණනය කරනු ලැබේ.

## 2.17 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වත්මන් නීතිමය බැඳීමක් හෝ සම්මුතික බැඳීමක් ඇති අවස්ථාවක පරිමා ප්‍රතිදාන, නීති හිමිකම් සහ වෙනත් වියදම් සඳහා ප්‍රතිපාදන පිළිගනු ලබන අතර සමූහය විසින් ආර්ථික වත්කම් ලබා දීම අවශ්‍ය විය හැකි අතර විශ්වසනීය ලෙස මුදල් ඇස්තමේන්තුගත කළ හැක.

වර්තමාන වගකීම හා බැඳුනු අවදානම් සහ අවිනිශ්චිතතාවයක් ඇතුළුව වාර්තාකරණ දිනයේ දී ලබා ගත හැකි වඩාත් විශ්වසනීය සාක්ෂි මත පදනම් ව වත්මන් වගකීම් පියවීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් මත ප්‍රතිපාදන ගණනය කෙරේ.

වත්කම් පිටතට යෑමේ හැකියාව දුරස්ථ නැතහොත් සියළු  අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශ වල සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

## 2.18 ආදායම් හඳුනාගැනීම

ලැබී ඇති හෝ ලැබීමට ඇති ගෙවීම් / වලට  අදාළ සාධාරණ වටිනාකම ආදායම ගණනය කිරීමේදී සළකා බැලෙන අතර මෙවැනි ඉටුකරන ලද සේවා සඳහා ලැබිය යුතු මුදල්, ප්‍රකාශිත ශුද්ධ ප්‍රතිදාන වටිනාකමට සහ එකතු කළ බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද යන මුදල් නියෝජනය කරයි. සමූහය විසින් ආදායම පිළිගනු ලබන්නේ ආදායමට අදාළ මුදල විශ්වසනීය ලෙස ගණනය කිරීමෙන් සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා එන තත්ත්වයන් යටතේය.

පහත දැක්වෙන හඳුනාගනු ලැබූ එක් එක් ප්‍රධාන සේවා සඳහා ආදායම පිළිගැනීමේ නිර්ණායක, සමූහය විසින් භාවිතා කරනු ලැබේ.

**(අ) ගොඩබෑමේ සහ බෙදාහැරීමේ සේවා**

ආනයන සහ අපනයන නැව් භාණ්ඩ මෙහෙයවීම සම්බන්ධව මෙම සමූහය විසින් පැටවීම, බහළු ගොඩබෑම සහ ගබඩා කුලියට දීම වැනි සේවා සපයනු ලැබේ. මෙම සේවා විකිණීමේ දී ආදායම සේවා සැපයූ කාල පරිච්ඡේදය තුළ ගණන් බැලෙන අතර නිමකරන ලද කාර්යය හෝ ගණුදෙනුව මත පදනම්ව ඉටුකරන ලද සේවා මත තක්සේරු කරනු ලැබේ.

**(ආ) නාවික සහ ආශ්‍රිත සේවා**

ප්‍රදීපාගාර සේවා, ඇතුල්වීමේ ගාස්තු, කාලය ඉකුත්වීමේ ගාස්තු සහ නියමු ගාස්තු වලින් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ ඒවා ලැබිය යුතු ස්ථානය අනුව ය. එනම් යාත්‍රාව පැමිණීමේ ස්ථානයයි. නාවික සහ ආශ්‍රිත සේවා වලින් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ එම සේවාවන් සපයන ලද කාල සීමාව අනුව සහ එම කාර්යය හෝ ගණුදෙනුව සම්පූර්ණ වීම මත පදනම්ව ඉටුකරන නියමිත සේවා මත පදනම් වූ තක්සේරු කිරීමක් මගිනි.

**(ඇ) බඩු පැටවීම / ගොඩබෑම (ස්ටෙවඩෝරු සේවා)**

බහළු මෙහෙයුම් සහ සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් සම්බන්ධ ස්ටෙවඩෝරු ආදායම එම සේවා සපයන ලද කාල පරිච්ඡේදය අනුව පිළිගනු ලබන අතර මෙය එම කාර්යය හෝ ගණුදෙනුව සම්පූර්ණ වීම මත සහ ඉටුකරන නියමිත සේවා මත පදනම් ව තක්සේරු කරනු ලැබේ.

**(ඇ) රාජ්‍ය භාග ආදායම**

රාජ්‍ය භාග ආදායම පිළිගනු ලබන්නේ අදාළ ගිවිසුමේ අඩංගු දෑ හා අනුකූලව උපචිත පදනම අනුව ය. එස්ජේසීටී පර්යන්ත ආයතනයෙන් ලැබෙන රාජ්‍ය භාගය නිර්ණය කරනු ලබන්නේ සමස්ත වාර්ෂික ධාරිතාව සඳහා ගිවිසුමේ සඳහන් කාල පරිච්ඡේදය වෙනුවෙන් එකඟ වූ විස්සේ සම ඒකක ගාස්තුව අනුව ය. ඉදිකර, මෙහෙයුම්කර, පවරා දීමේ (BOT) ගිවිසුමේ දක්වා ඇති පරිදි අවම සහතික කරන ලද ධාරිතාවය මත පදනම්ව සීඅයිසීටී හි රාජ්‍ය භාගය තීරණය කරනු ලැබේ.

**(ඉ) පොලී ආදායම**

පොලී ආදායම පිළිගනු ලබන්නේ ඵලදායී පොලී ක්‍රමවේදය භාවිතා කරමිනි.

**(ඊ) ලාභාංශ ආදායම**

ලාභාංශ අදායම පිළිගනු ලබන්නේ ගෙවීමක් ලැබීම පිළිබඳ අයිතිය ස්ථාපනය වන විට ය.

**(උ) බදු සහ කුලී ආදායම**

ආයෝජන දේපළ වලින් ලැබෙන බදු සහ කුලී ආදායම පිළිගනු ලබන්නේ බදු කාලසීමාව තුළ උපචිත පදනම මත ය.

**(ඌ) දේපළ, පිරියත සහ උපකරණ විකුණා දැමීමේදී සිදුවන ලාභ සහ පාඩු**

මෙවැනි විකුණා දැමීම් වලින් ලැබෙන ලාභ හෝ පාඩු නිර්ණය කරනු ලබන්නේ ධාරණ අගය සමඟ ලැබෙන මුදල සැසඳීමෙන් වන අතර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙන් පිළිගනු ලැබේ.

## 2.19 වියදම්

මෙහෙයුම් පවත්වා ගෙන යාමේ දී සිදුවන සියළුම වියදම් වාර්තාකරණ කාල පරිච්ඡේදයේ ලාභයට එකතු කරනු ලැබේ.

## 2.20 වාර්තාකරණ කාල සීමාවෙන් පසුව දී සිදුවන සිදුවීම්.

වාර්තාකරණ කාල සීමාවෙන් පසුව දී සිදු වූ වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශ සඳහා වන අදාළ සටහන් වලට සුදුසු ලෙස ගැළපුම් කර හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

## 2.21 වගකීම්

සියළුම ප්‍රමාණාත්මක වගකීම් වාර්තාකරණ කාල පරිච්ඡේදය වන විට හඳුනාගෙන ඇති අතර එය මූල්‍ය ප්‍රකාශනයේ සටහන් වල දක්වා ඇත.

## 2.22 වැදගත් ගිණුම් ඇස්තමේන්තු සහ තීරණ

මූල්‍යමය ප්‍රකාශන සකස් කිරීමේ දී කළමනාකරණය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් පිළිගැනීම සහ ගණනය කිරීම පිළිබඳව තීරණ ඇස්තමේන්තු සහ උපකල්පනයන් සලකා බලනු ලබයි.

### 2.22.1 මූල්‍යමය ප්‍රකාශන මත වඩා වැදගත් බලපෑමක් එල්ල කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතා කිරීමේදී ගනු ලබන වැදගත් තීරණ පහත දැක්වේ.

**(අ) විලම්භනය කරනු ලැබූ බදු වත්කම් හඳුනාගැනීම**

විලම්භනය කරන ලද බදු වත්කම් පිළිගැනීම් කරනු ලැබීමේ පදනම වන්නේ අනාගත බදු වලට භාජනය විය හැකි ආදායමේ සම්භාවිතාව තක්සේරු කිරීම සහ විලම්භනය කරන බදු වත්කම් භාවිතා කිරීම ය.

### 2.22.2 වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් පිළිගැනීම සහ ගණනය කිරීම මත වඩාත් වැදගත් බලපෑමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත:

**(අ) ක්‍ෂය කළ හැකි වත්කම් වල ඵලදායී ජීවකාලය**

එක් එක් වාර්තාකරණ දිනයේදී වත්කම් වල බලාපොරොත්තු වූ ආර්ථික උපයෝගීතාවය මත පදනම්ව ක්ෂය විය හැකි වත්කම් වල ප්‍රයෝජනවත් ජීවන කාලය පිළිබඳ ඇස්තමේන්තුව කළමනාකරණය විසින් සමාලෝචනය කරයි. මෙම ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව, යම් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණික උපකරණයන්හි උපයෝගීතාව වෙනස් කළ හැකි තාක්ෂණික යල් පැනීම් වලට අදාලව සිදු වේ.

**(ආ) නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්ම**

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්මේ වගකීම් වල වර්තමාන වටිනාකම සාධක කිහිපයක් මත රඳා පවතී. මෙය නිර්ණය කරනු ලබන්නේ උපකල්පනයන් කිහිපයක් භාවිතා කරමින් කරනු ලබන ආයුගණක පදනම මත ය. වට්ටම් ඇතුළුව නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මෙහි ශුද්ධ පිරිවැය සහ වගකීම නිර්ණය කිරීමේදී මෙම උපකල්පනයන් භාවිතා කෙරේ. මෙම උපකල්පනයන්ගේ යම් වෙනස් වීමක් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ ධාරණ අගයට බලපෑමක් ඇති කරයි.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| 3 | දේපළ , පිරියත සහ උපකරණ | 2018 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම් ) | ප්‍රතිවර්ගීකරණය /ගැලපුම් කිරීම | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|---|
| | සමූහය | | | | | |
| | **3.1 පිරිවැය මත** | | | | | |
| | ඉඩම් | 51,868,120,202 | 596,000 | - | (61,980,000) | 51,806,736,202 |
| | මෙහෙයුම් ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 113,247,673,784 | 531,675,875 | - | (33,175,000) | 113,746,174,659 |
| | පාවෙන උපකරණ | 7,027,897,794 | 570,215 | - | - | 7,028,468,009 |
| | මෙහෙයුම් උපකරණ | 22,212,009,530 | 65,197,487 | (103,928,703) | - | 22,173,278,314 |
| | පිරියත සහ යන්ත්‍රෝපකරණ | 607,352,301 | 136,848,673 | (8,644,829) | - | 735,556,145 |
| | කාර්යාල සහ සුහසාධන ගොඩනැගිලි | 825,662,329 | 174,960 | - | (10,000,000) | 815,837,289 |
| | කාර්යමණ්ඩල නිල නිවාස සහ වෙනත් ගොඩ | 454,839,491 | - | - | - | 454,839,491 |
| | පරිගණක අඩාංග | 371,729,114 | 84,981,826 | (1,235,890) | - | 455,475,050 |
| | විදුලි හා විද්‍යුත් උපකරණ | 2,205,950,119 | 45,111,686 | (3,383,707) | - | 2,247,678,098 |
| | කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ | 162,563,930 | 14,427,186 | (3,956,457) | - | 173,034,659 |
| | රථ වාහන | 881,906,050 | 40,799,360 | (30,104,504) | - | 892,600,906 |
| | වෙනත් වත්කම් | 371,714,427 | 46,397,059 | (2,122,939) | - | 415,988,547 |
| | | **200,237,419,071** | **966,780,327** | **(153,377,029)** | **(105,155,000)** | **200,945,667,369** |

| | 3.1.1 ක්ෂය | 2018 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම් ) | ප්‍රතිවර්ගීකරණය /ගැලපුම් කිරීම | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|---|
| | මෙහෙයුම් ගොඩනැගිලි සහ ව්‍යුහ | 26,986,573,612 | 1,631,930,334 | - | (20,931,266) | 28,597,572,680 |
| | පාවෙන උපකරණ | 6,653,446,868 | 118,454,922 | - | - | 6,771,901,790 |
| | මෙහෙයුම් උපකරණ | 13,872,790,190 | 730,632,265 | (103,813,236) | 1,326,384 | 14,500,935,603 |
| | පිරියත සහ යන්ත්‍රෝපකරණ | 532,002,372 | 32,531,430 | (6,548,067) | 7,167,454 | 565,153,189 |
| | කාර්යාල සහ සුහසාධන ගොඩනැගිලි | 301,747,958 | 25,164,208 | - | (5,161,500) | 321,750,666 |
| | කාර්ය මණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩ | 215,455,630 | 16,881,721 | - | - | 232,337,351 |
| | පරිගණක අඩාංග | 334,551,178 | 21,392,136 | (1,234,654) | 2,729,684 | 357,438,344 |
| | විදුලි හා විද්‍යුත් උපකරණ | 2,066,622,712 | 43,621,667 | (3,172,340) | 333,987 | 2,107,406,026 |
| | කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ | 127,349,699 | 12,552,436 | (3,900,376) | 244,112 | 136,245,871 |
| | රථවාහන | 787,945,717 | 21,425,632 | (30,074,400) | - | 779,296,949 |
| | වෙනත් වත්කම් | 329,636,833 | 24,422,274 | (1,989,864) | 689,920 | 352,759,163 |
| | | **52,208,122,769** | **2,679,009,025** | **(150,732,937)** | **(13,601,225)** | **54,722,797,632** |

| 3.1.2 ඉදිරියට ගෙන ගිය ශුද්ධ වටිනාකම | | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| **දේපල , පිරියත සහ උපකරණ** | | | |
| ඉඩම් | | 51,806,736,202 | 51,868,120,202 |
| මෙහෙයුම් ගොඩනැගිලි සහ ව්‍යුහ | | 85,148,601,979 | 86,261,100,172 |
| පාවෙන උපකරණ | | 256,566,219 | 374,450,926 |
| මෙහෙයුම් උපකරණ | | 7,672,342,711 | 8,339,219,340 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | | 170,402,956 | 75,349,929 |
| කාර්යාල සහ සුහසාධන ගොඩනැගිලි | | 494,086,623 | 523,914,371 |
| කාර්යමණ්ඩල නිල නිවාස සහ වෙනත් ගොඩනැගිලි | | 222,502,140 | 239,383,861 |
| පරිගණක අඩාංග | | 98,036,706 | 37,177,936 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | | 140,272,072 | 139,327,407 |
| කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ | | 36,788,788 | 35,214,231 |
| රථවාහන | | 113,303,957 | 93,960,333 |
| වෙනත් වත්කම් | | 63,229,384 | 42,077,594 |
| | | **146,222,869,737** | **148,029,296,304** |
| **නොනිමි ප්‍රාග්ධන වැඩ** | **( 3.2 සටහන )** | 720,136,439 | 1,067,510,159 |
| | | **146,943,006,176** | **149,096,806,463** |

| **සමූහය** | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| **දේපළ , පිරියත සහ උපකරණ නිරවුල් කිරීම** | **117,907,497** | **348,539,725** |
| | **147,060,913,673** | **149,445,346,188** |

නිරවුල් කිරීමේ ගිණුමට භූමිය 113,185,199.33, පරිගණක අඩාංග හා මෘදුකාංග 629,850.20, විදුලි හා විද්‍යුත් උපකරණ 2,221,411.32, පාවෙන උපකරණ 38,350.00, ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ 1,439,930.63, රථවාහන 1,271.38, පිරියත හා යන්ත්‍රෝපකරණ 330,844.54 සහ වෙනත් වත්කම් 60,640.00 ඇතුළත් වේ.

රු 44,997,418.24ක් වටිනා වත්කම් ආගමික ස්ථාන ලෙස භාවිතා කෙරේ.

වත්කම් ලේඛනයට අනුව 2018.12.31 දිනට පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් වල මුළු වටිනාකම රු. 30404646533.28

වත්කම් කාණ්ඩ, පාවෙන උපකරණ, මෙහෙයුම් උපකරණ, කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි , පරිගණක අඩාංග හා මෘදුකාංග සහ රථ වාහන වල ඉතිරිව ඇති භාවිතා කල හැකි ජීව කාලය සමාලෝචනයට ලක් කරන ලද අතර ශුද්ධ පොත් අගය ඒ අනුව ගැලපුම් කරන ලදී. වෙනත් වත්කම් කාණ්ඩද අඛණ්ඩ ක්‍රියාවලියක් යටතේ සමාලෝචනය කරනු ඇත.

**ප්‍රතවර්ගීකරණ ගැලපුම්**

**ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද හඳුනාගත් වත්කම් - දේපළ සහ පිරියත කාණ්ඩයෙන් ඉඩම් සහ ගොඩනැගිලි - ඉඩම් සහ ගොඩනැගිලි**

| | |
|---|---|
| ආයෝජන දේපළ ලෙස ප්‍රතිවර්ගීකරණය කරන ලද ඉඩම | Rs.61,980,000 |
| මෙහෙයුම් ගොඩනැගිලි සහ ව්‍යුහ | Rs.33,175,000 |
| කාර්යාල සහ සුහසාධන ගොඩනැගිලි | Rs.10,000,000 |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 3 දේපළ , පිරියත සහ උපකරණ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

| 3.1 පිරිවැය මත | 2018 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම් ) | ප්‍රතිවර්ගීකරණය /ගැලපුම් | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| ඉඩම් | 51,868,120,202 | 596,000 | - | (61,980,000) | 51,806,736,202 |
| මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහ | 113,247,673,784 | 531,675,875 | - | (33,175,000) | 113,746,174,659 |
| පාවෙන උපකරණ | 7,027,897,794 | 570,215 | - | - | 7,028,468,009 |
| මෙහෙයුම් උපකරණ | 22,212,009,530 | 65,197,487 | (103,928,703) | - | 22,173,278,314 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 592,618,157 | 113,010,249 | (8,644,829) | - | 696,983,577 |
| කාර්යාල සහ සුහසාධක ගොඩනැඟිලි | 825,662,329 | 174,960 | - | (10,000,000) | 815,837,289 |
| කාර්යමණ්ඩල නිල නිවාස සහ වෙනත් ගොඩනැ | 454,839,491 | - | - | - | 454,839,491 |
| පරිගණක අඩාංග | 369,153,315 | 84,227,526 | (1,235,890) | - | 452,144,951 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,205,950,119 | 45,111,686 | (3,383,707) | | 2,247,678,098 |
| කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ | 155,098,388 | 11,599,482 | (3,956,457) | - | 162,741,413 |
| රථ වාහන | 863,949,930 | 31,749,360 | (30,104,504) | - | 865,594,786 |
| වෙනත් වත්කම් | 371,714,427 | 46,397,059 | (2,122,939) | - | 415,988,547 |
| | **200,194,687,466** | **930,309,899** | **(153,377,029)** | **(105,155,000)** | **200,866,465,336** |

| 3.1.1 ක්ෂය | 2018 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම් ) | නැවත වර්ග කිරීම් /ගැලපුම් | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහයන් | 26,986,573,612 | 1,631,930,334 | - | (20,931,266) | 28,597,572,680 |
| පාවෙන උපකරණ | 6,653,446,868 | 118,454,922 | - | - | 6,771,901,790 |
| මෙහෙයුම් උපකරණ | 13,872,790,190 | 730,632,265 | (103,813,236) | 1,326,384 | 14,500,935,603 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 523,599,348 | 30,228,384 | (6,548,067) | 7,167,454 | 554,447,119 |
| කාර්යාල සහ සුහසාධන ගොඩනැඟිලි | 301,747,958 | 25,164,208 | - | (5,161,500) | 321,750,666 |
| සේවක නිල නිවාස සහ වෙනත් ගොඩනැඟිලි | 215,455,630 | 16,881,721 | - | - | 232,337,351 |
| පරිගණක අඩාංග | 332,492,652 | 21,081,129 | (1,234,654) | 2,729,684 | 355,068,811 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,066,622,712 | 43,621,667 | (3,172,340) | 333,987 | 2,107,406,026 |
| කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ | 124,805,096 | 11,277,976 | (3,900,376) | 244,112 | 132,426,808 |
| රථවාහන | 776,577,007 | 19,740,867 | (30,074,400) | - | 766,243,474 |
| වෙනත් වත්කම් | 329,636,833 | 24,422,274 | (1,989,864) | 689,920 | 352,759,163 |
| | **52,183,747,906** | **2,673,435,747** | **(150,732,937)** | **(13,601,225)** | **54,692,849,491** |

| 3.1.2 ඉදිරියට ගෙන යන ශුද්ධ වටිනාකම | | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණ | | | |
| ඉඩම් | | 51,806,736,202 | 51,868,120,202 |
| මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහ | | 85,148,601,979 | 86,261,100,172 |
| පාවෙන උපකරණ | | 256,566,219 | 374,450,926 |
| මෙහෙයුම් උපකරණ | | 7,672,342,711 | 8,339,219,340 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | | 142,536,458 | 69,018,809 |
| කාර්යාල සහ සුහසාධන ගොඩනැඟිලි | | 494,086,623 | 523,914,371 |
| කාර්යමණ්ඩල නිල නිවාස සහ වෙනත් ගොඩනැඟිලි | | 222,502,140 | 239,383,861 |
| පරිගණක අඩාංග | | 97,076,140 | 36,660,663 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | | 140,272,072 | 139,327,407 |
| කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ | | 30,314,605 | 30,293,292 |
| රථවාහන | | 99,351,312 | 87,372,923 |
| වෙනත් වත්කම් | | 63,229,384 | 42,077,594 |
| | | **146,173,615,845** | **148,010,939,560** |
| **නොනිමි ප්‍රාග්ධන වැඩ** | **(සටහන 3.2)** | 720,136,439 | 1,067,510,159 |
| | | **146,893,752,284** | **149,078,449,720** |

| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| දේපළ , පිරියත උපකරණ නිරවුල් කිරීම | 117,907,497 | 348,539,725 |
| | **117,907,497** | **348,539,725** |
| | **147,011,659,779** | **149,426,989,444** |

නිරවුල් කිරීමේ ගිණුමෙහි ඉඩම් 113,185,199.33, පරිගණක අඩාංග සහ මෘදූකාංග 629,850.20, විදුලි සහ විද්‍යුත් උපකරණ 2,221,411.32,පාවෙන උපකරණ 38,350.00, ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ 1,439,930.63,රථ වාහන 1,271.38,පිරියත හා යන්ත්‍රෝපකරණ 330,844.54 සහ වෙනත් වත්කම් 60,640.00 ඇතුළත්ව පවතී.

-

රු 44,997,418.24ක් වටිනා වත්කම් ආගමික ස්ථාන ලෙස භාවිතා කෙරේ.

වත්කම් ලේඛනයට අනුව 2018.12.31 දිනට පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් වල මුළු වටිනාකම රු. 30404646533.28

වත්කම් කාණ්ඩ, පාවෙන උපකරණ, මෙහෙයුම් උපකරණ, කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි , පරිගණක අඩාංග හා මෘදූකාංග සහ රථ වාහන වල ඉතිරිව ඇති භාවිතා කල හැකි ජීව කාලය සමාලෝචනට ලක් කරන ලද අතර ශුද්ධ පොත් අගය ඒ අනුව ගැලපුම් කරන ලදී. වෙනත් වත්කම් කාණ්ඩද අඛණ්ඩ ක්‍රියාවලියක් යටතේ සමාලෝචනය කරනු ඇත..

**ප්‍රතිවර්ගීකරණ ගැලපුම්**

<u>ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද හඳුනාගත් වත්කම් - දේපළ සහ පිරියත කාණ්ඩයෙන් ඉඩම් සහ ගොඩනැගිලි - ඉඩම් සහ ගොඩනැගිලි</u>

| | |
|---|---|
| ආයෝජන දේපළ ලෙස ප්‍රතිවර්ගීකරණය | Rs.61,980,000 |
| මෙහෙයුම් ගොඩනැගිලි සහ ව්‍යුහ | Rs.33,175,000 |
| කාර්යාල සහ සුහසාධන ගොඩනැගිලි | Rs.10,000,000 |

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**3.2 සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ**

| සමූහය /ශ්‍රී.ල.ව.අ | 2018 ජනවාරි 01 දිනට | ගැලපුම් කිරීම | වසර තුළ සිදු කල | මාරු කරන ලද | ගැලපුම් කිරීම | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|---|
| කොළඹ වරාය සංවර්ධනය | 493,161,382 | | 125,482,129 | 477,569,792 | (63,050) | 141,010,670 |
| ගාලු වරාය | 33,965,798 | | 40,380,985 | 7,434,036 | | 66,912,747 |
| ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 418,028,350 | | | | | 418,028,350 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 9,714,934 | | | | | 9,714,934 |
| ත්‍රිකුණාමල වරාය | 12,584,690 | | 40,191,345 | - | | 52,776,035 |
| පර්යන්ත කළමනාකරණ පද්ධතිය | 9,418,819 | | | 617,500 | | 8,801,319 |
| වරාය නගර සංවර්ධනය | 2,339,286 | | | | 584,821 | 2,924,107 |
| ප්‍රාග්ධන වත්කම් මිළට ගැනීම (දේශිය) | 33,872,403 | | 3,495,784 | 33,307,081 | | 4,061,106 |
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | 3,436,385 | | | | | 3,436,385 |
| නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය | 50,988,112 | | 16,001,276 | 53,996,830 | (521,771) | 12,470,786 |
| | **1,067,510,160** | **-** | **225,551,518** | **572,925,239** | **-** | **720,136,439** |

නොනිමි වැඩ පිළිබඳ ප්‍රතිපත්තිය "වැඩ නිම කිරීමේ සහතිකය අදාළ දෙපාර්තමේන්තුව වෙත නිකුත් කල පසු නොනිමි වැඩ ගිණුම් වල පිරිවැය යෙදවීම" මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වල 2.4.1 යටතේ අනාවරණය කරනු ලැබේ.

**4 අස්පෘශ්‍ය වත්කම්**

| සමූහය | 2018 ජනවාරි 01 දිනට | එකතු කිරීම | ගැලපුම් කිරීම | (බැහැර කිරීම) | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **4.1 පිරිවැය මත** | | | | | |
| පරිගණක මෘදුකාංග | 976,074,435 | 214,429,006 | - | | 1,190,503,441 |
| **එකතුව** | **976,074,435** | **214,429,006** | | **-** | **1,190,503,441** |

| | 2018 ජනවාරි 01 දිනට | වසර සඳහා වියදම | | | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **4.2 ක්‍රමක්ෂය** | | | | | |
| පරිගණක මෘදුකාංග | 927,782,925 | 30,655,643 | 1,752,470 | - | 960,191,038 |
| **එකතුව** | **927,782,925** | **30,655,643** | **1,752,470** | **-** | **960,191,038** |

| **4.3 ඉදිරියට ගෙන ගිය ශුද්ධ වටිනාකම** | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| | | - |
| පරිගණක මෘදුකාංග | **230,312,403** | **48,291,510** |
| අස්පෘශ්‍ය වත්කම් නිරවුල් කිරීමේ ගිණුම | | 8,747,917.00 |
| | **230,312,403** | **57,039,427** |

| සමූහය | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 230,312,403 | **48,291,510** |
| | **230,312,403** | **48,291,510** |
| | **230,312,403** | **57,039,427** |

**4 අස්පෘශ්‍ය වත්කම්**

| ශ්‍රී.ල.ව.අ | 2018 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | ගැලපුම් කිරීම | (බැහැර කිරීම්) | 2018 දෙසැම්බර් දිනට |
|---|---|---|---|---|---|
| **4.1 පිරිවැය මත** | | | | | |
| පරිගණක මෘදුකාංග | 976,074,435 | 214,429,006 | - | - | 1,190,503,441 |
| **එකතුව** | **976,074,435** | **214,429,006** | **-** | **-** | **1,190,503,441** |

| | 2018 ජනවාරි 01 දිනට | වසර සඳහා වියදම | ගැලපුම් කිරීම | | 2018 දෙසැම්බර් දිනට |
|---|---|---|---|---|---|
| **4.2 ක්‍රමක්ෂය** | | | | | |
| පරිගණක මෘදුකාංග | 927,782,925 | 30,655,643 | 1,752,470 | | 960,191,038 |
| **එකතුව** | **927,782,925** | **30,655,643** | **1,752,470** | **-** | **960,191,038** |

| **4.3 ඉදිරියට ගෙනගිය ලද ශුද්ධ වටිනාකම** | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| | | - |
| පරිගණක මෘදුකාංග | **230,312,403** | **48,291,510** |
| අස්පෘශ්‍ය වත්කම් නිරවුල් කිරීමේ ගිණුම | - | 8,747,917.00 |
| | **230,312,403** | **57,039,427** |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| 5 ආයෝජන වත්කම් සමූහය /අධිකාරිය | 2018 ජනවාරි 01 දිනට | මාරු කරන ලද/ ගැලපුම් කරන ලද | එකතු කිරීම | (බැහැර කිරීම ) | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **5.1 පිරිවැය මත** | | | | | |
| ඉඩම් | 42,256,121,009 | 61,980,000 | | - | 42,318,101,009 |
| ගොඩනැගිලි | 143,333,443,837 | 43,175,000 | | - | 143,376,618,837 |
| එකතුව | **185,589,564,846** | **105,155,000** | **-** | **-** | **185,694,719,846** |

| | 2018 ජනවාරි 01 දිනට | මාරු කරන ලද/ ගැලපුම් කරන ලද | වසර සඳහා වියදම | (බැහැර කිරීම ) | 2018 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **5.1.1 ක්ෂය** | | | | | |
| ගොඩනැගිලි | 11,942,075,097 | 26,698,275 | 1,343,180,742 | - | 13,311,954,114 |
| එකතුව | **11,942,075,097** | **26,698,275** | **1,343,180,742** | **-** | **13,311,954,114** |

| | 2018 දෙසැම්බර් 31 දිනට | 2017 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| **5.1.2 ඉදිරියට ගෙන යන ලද ශුද්ධ වටිනාකම** | | |
| ඉඩම් | 42,318,101,009 | 42,256,121,009 |
| ගොඩනැගිලි | 130,064,664,723 | 131,391,368,740 |
| | **172,382,765,733** | **173,647,489,750** |
| | **172,382,765,733** | **173,647,489,750** |

| 6 පාලිත සමාගම්හි ආයෝජන | | | ශ්‍රීලවඅ | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|---|
| | | | **2018** | **2017** | **2018** | **2017** |
| ලැයිස්තුගත නොකල | කොටස් ගණන | සමාගම් කොටස් % | | | | |
| ජයබහළු පර්යන්ත පුද්ගලික සමාගම | 100,000 | 100% | | - | 1,000,000 | 1,000,000 |
| හම්බන්තොට වරාය කළමනාකරණ සමාගම | 7,500,000 | 100% | | - | 75,000,000 | 75,000,000 |
| ලංකා ගෑස් ටර්මිනල් පුද්ගලික සමාගම | 1 | 100% | 100 | - | 100 | - |
| | | | 100 | - | **76,000,100** | **76,000,000** |

| 7 ආශ්‍රිත සමාගම්හි ආයෝජනයන් | | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|
| | | **2018** | **2017** | **2018** | **2017** |
| ලැයිස්තු ගත නොවන | | | | | |
| ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම | (සටහන 7.1) | **70,879,884** | **70,879,884** | **40,030** | **40,030** |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම | (සටහන 7.2) | **39,150,978,080** | **39,150,978,080** | **39,196,080,000** | **39,196,080,000** |
| | | **39,221,857,964** | **39,221,857,964** | **39,196,120,030** | **39,196,120,030** |

**7.1 ආශ්‍රිත සමාගම්හි ආයෝජන යෙදවීම්**

| | සමූහය 2018 | සමූහය 2017 | ශ්‍රීලවඅ 2018 | ශ්‍රීලවඅ 2017 |
|---|---|---|---|---|
| **7.1 ශ්‍රී ලංකා වරාය කළමනාරකණ හා උපදේශන සේවා සමාගම** | | | | |
| **ජනවාරි 01 දිනට ශේෂය** | **70,879,884** | **64,942,056** | **40,030** | **40,030** |
| ආශ්‍රිත සමාගම්හි කොටස් වල ශුද්ධ ප්‍රතිඵලය | - | 5,937,828 | - | - |
| ලැබූ ලාභාංශ | | | - | - |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **70,879,884** | **70,879,884** | **40,030** | **40,030** |
| **7.2 හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම** | | | | |
| **ජනවාරි 01 දිනට ශේෂය** | **39,150,978,080** | **39,196,080,000** | **39,196,080,000** | **-** |
| ආශ්‍රිත සමාගම්හි කොටස් වල ශුද්ධ ප්‍රතිඵලය | **-** | **(45,101,920)** | **-** | **39,196,080,000** |
| ලැබූ ලාභාංශ | **-** | **-** | **-** | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **39,150,978,080** | **39,150,978,080** | **39,196,080,000** | **39,196,080,000** |
| **ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගමෙහි එකතුව** | | | | |
| **ජනවාරි 01 දිනට ශේෂය** | **39,221,857,964** | **39,261,022,056** | **39,236,110** | **40,030** |
| ආශ්‍රිත සමාගම්හි කොටස් වල ශුද්ධ ප්‍රතිඵලය | **-** | **(39,164,092)** | **-** | |
| ලැබූ ලාභාංශ | **-** | | **-** | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **39,221,857,964** | **39,221,857,964** | **39,196,120,030** | **39,196,120,030** |

**7.2 ආශ්‍රිත සමාගම්හි මූල්‍ය ප්‍රතිඵල වල සාරාංශය සහ එහි මුළු වත්කම් හා වගකීම් වල එකතුව**

**ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම**

| | කොටස් ප්‍රමාණය | ප්‍රතිශතය | වත්කම් | වගකීම් | ආදායම | ශුද්ධ ලාභය |
|---|---|---|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට | 4,003 | 39.97% | | | | |
| 2017 දෙසැම්බර් 31 | 4,003 | 39.97% | 215,394,599 | 56,655,861 | 81,467,514 | 14,855,712 |

**හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම**

| | කොටස් ප්‍රමාණය | ප්‍රතිශතය | වත්කම් | වගකීම් | ආදායම | ශුද්ධ ලාභය |
|---|---|---|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට | 3,919,608,000 | 42.00% | | | | |
| 2017 දෙසැම්බර් 31 දිනට | 3,919,608,000 | 42.00% | 93,958,082,294 | 44,588,586 | 8,257,689 | (107,385,524) |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය වත්කම් සහ මූල්‍යමය කාණ්ඩ වගකීම්**

එක් එක් කාණ්ඩයට අයත් මූල්‍ය වත්කම් හා වගකීම් ඉදිරියට ගෙන ගිය අගය පහත පරිදි වේ.

**සමූහය**

| **මූල්‍යමය වත්කම්** | **විකිණීම සඳහා ඇති** | | **ණය සහ අයවිය යුතු මුදල්** | |
|---|---|---|---|---|
| | **2018** | **2017** | **2018** | **2017** |
| ලැයිස්තුගත කල ආයෝජන | 121,552,220 | 193,477,904 | | |
| ලැයිස්තුගත නොවූ ආයෝජන | 20,664,995,589 | 21,780,686,004 | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | | | 13,065,971,161 | 115,691,840,994 |
| තැන්පතු සහ අත්තිකාරම් | | | 231,415,959 | 295,557,929 |
| සේවක ණය | | | 5,012,492,331 | 4,297,024,012 |
| රජයේ සුරැකුම්පත් වල සහ ස්ථාවර තැන්පතු වල ආයෝජන | | | 36,132,390,042 | 22,491,559,843 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | | | 2,754,881,161 | 1,736,048,989 |
| **එකතුව** | **20,786,547,809** | **21,974,163,908** | **57,197,150,656** | **144,512,031,767** |

**අධිකාරිය**

| | | | | |
|---|---|---|---|---|
| ලැයිස්තුගත ආයෝජන | 121,552,220 | 193,477,904 | | |
| ලැයිස්තුගත නොකල ආයෝජන | 20,664,995,589 | 21,780,686,004 | | |
| මිල ගණන් නියමකල ණයකරයන්හි ආයෝජන | | | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | | | 12,061,211,241 | 114,685,637,648 |
| තැන්පතු සහ අත්තිකාරම් | | | 231,415,959 | 295,557,929 |
| සේවක ණය | | | 4,979,815,402 | 4,270,311,802 |
| රජයේ සුරැකුම්පත් වල සහ ස්ථාවර තැන්පතු වල ආයෝජන | | | 35,935,170,096 | 22,345,520,484 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 1,934,879,597 | 914,764,144 |
| **එකතුව** | **20,786,547,809** | **21,974,163,908** | **55,142,492,297** | **142,511,792,008** |

| **වෙනත් මූල්‍ය වගකීම්** | **සමූහය** | | **ශ්‍රීලවඅ** | |
|---|---|---|---|---|
| | **2018** | **2017** | **2018** | **2017** |
| **අනෙකුත් මූල්‍යමය වගකීම්** | | | | |
| ජංගම නොවන ණයගැනීම් | | | | |
| ශ්‍රී ලංකා රජය | 59,690,100,248 | 54,924,342,666 | 59,690,100,248 | 54,924,342,666 |
| මූල්‍ය ආයතන | 10,926,466,537 | 11,363,752,700 | 10,924,411,551 | 11,360,327,710 |
| ජංගම ණයගැනීම් | | | | |
| ශ්‍රී ලංකා රජය | 6,645,377,816 | 5,198,526,722 | 6,645,377,816 | 5,198,526,722 |
| මූල්‍ය ආයතන | 5,112,837,302 | 4,708,319,092 | 1,960,389,294 | 1,555,871,084 |
| වෙළඳ සහ වෙනත් ණයහිමියන් | 1,783,098,873 | 106,228,718,883 | 1,475,157,023 | 105,914,892,043 |
| තැන්පතු සහ ලැබී ඇති අත්තිකාරම් | 2,207,268,553 | 2,215,795,483 | 2,207,268,553 | 2,215,795,483 |
| **එකතුව** | **86,365,149,329** | **184,639,455,546** | **82,902,704,484** | **181,169,755,708** |

*රු.5,149,981,343.93 හි ඇතුලත් වන වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුය.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | සමූහය /ශ්‍රීලවඅ 2018 | 2017 |
|---|---|---|---|
| **8 විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් (AFS)** | | | |
| | | - | |
| ලැයිස්තුගත කල ආයෝජන | (සටහන 8.1) | 121,552,220 | 193,477,904 |
| ලැයිස්තුගත නොකල ආයෝජන | (සටහන 8.2) | 20,664,995,589 | 21,780,686,004 |
| | | **20,786,547,809** | **21,974,163,908** |

**8.1 ලැයිස්තුගත කල ආයෝජන (සී/ස කලම්බු ඩොක්යාඩ් පුද්ගලික සමාගම )**

| | සමූහය /ශ්‍රීලවඅ 2018 | 2017 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | **193,477,904** | **171,834,613** |
| විකිණීමේ සංචිත වෙත මාරු කිරීමේදී සිදු වූ ශුද්ධ ලාභ/ (පාඩු) | (71,925,684) | 21,643,291 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **121,552,220** | **193,477,904** |

**8.2 ලැයිස්තුගත නොකල ආයෝජන**

සීඅයිසීටී (CICT) සහ එස්ජීටී (SAGT) හි මූල්‍ය වත්කම්හි මූල්‍ය තත්ත්වය පිළිබඳ මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තාගත සාධාරණ අගය සක්‍රිය ව්‍යාපාරයන්ගෙන් ලබාගත නොහැකි හෙයින්, ඒවා, ගණිතමය ආකෘති භාවිතය ඇතුළුව විවිධ ඇගයීම් ක්‍රමවේදයන් භාවිතයෙන් සිදු කරනු ලැබේ. තොරතුරු ලබා ගැනීමට අපොහොසත්වීම හේතුවෙන් ලංකා කෝල් සමාගම සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම්හි සාධාරණ අගය ගැලපුම් කිරීම සිදු නොකරන ලදී.

| | කොටස් ප්‍රමාණය | සමූහය / ශ්‍රීලවඅ 2018 | 2017 |
|---|---|---|---|
| ලංකා කෝල් සමාගම | 200,000 | 2,000,000 | 2,000,000 |
| කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම | 28,456,515 | 1,313,979,580 | 2,859,913,891 |
| සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගම | 56,827,288 | 1,007,616,009 | 577,372,113 |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම | 1,834,140,000 | 18,341,400,000 | 18,341,400,000 |
| | | | - |
| | | **20,664,995,589** | **21,780,686,004** |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය (CICT )** | | 2,859,913,891 | - |
| විකිණීමේ සංචිත වෙත මාරු කිරීමේදී සිදු වූ ශුද්ධ ලාභ / (පාඩු ) | | (1,545,934,311) | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **1,313,979,580** | |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය (SAGT)** | | 577,372,113 | |
| විකිණීමේ සංචිත වෙත මාරු කිරීමේදී සිදු වූ ශුද්ධ ලාභ / (පාඩු ) | | 430,243,896 | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **1,007,616,009** | |

**9 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් අයවිය යුතු මුදල**

බැංකුව විසින් ලැබී ඇති ප්‍රධාන ප්‍රතිගෙවීම් අයකර ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්හට නිවාස ණය ලබාදීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත මාරු කරන ලද මුදල ශේෂය මගින් පෙන්නුම් කෙරේ.

| | සමූහය / ශ්‍රීලවඅ 2018 | 2017 |
|---|---|---|
| ආරම්භක ශේෂය | 123,179,740 | 147,411,904 |
| වසර තුළ මාරු කිරීම් | (20,184,181) | (24,232,164) |
| **අවසාන ශේෂය** | **102,995,559** | **123,179,740** |

**10 මහාභාණ්ඩාගාරය වෙත ලැබිය යුතු මුදල - මහජන බැංකු ණය**

2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව , හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය (අදියර 1) හි අංක 6 දරණ විචල්‍යතා නියෝගය යටතේ හම්බන්තොට සූරිය වැව අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා චයිනා හාබර් එන්ජිනියරිං සමාගම , ඩිනෝහයිඩ්‍රෝ සංස්ථාව , ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ICC (අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිල බේරුම්කාර නඩුව (අංක 21959/CVK/PTA) විසඳීම සඳහා ලබාගත් ණය ප්‍රතිගෙවීම සහ ප්‍රාග්ධන වාරික පොළී ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන ලබාදිය යුතු වේ. අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ලබා දෙන බවට මහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පොරොන්දුවක් ලබාදුන් බැවින් මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයට කිසිදු බලපෑමක් ඇති නොකරනු ඇත. පිටු අංක 32 හි සටහන් අංක 37ට වැඩිමනත් වශයෙනි .

**11 වට්ටෝරුගත භාණ්ඩ**

| | සමූහය 2018 | 2017 | ශ්‍රීලවඅ 2018 | 2017 |
|---|---|---|---|---|
| භාණ්ඩ තොග | 2,519,078,304 | 2,460,657,496 | 2,519,078,304 | 2,460,657,496 |
| අතැති තොගය (අද්මිරාල් මුළුතැන්ගෙය ) | 12,359,440 | 7,891,908 | 12,359,440 | 7,891,908 |
| ලී මෝල - නව බේරේ | 2,018,765 | 5,550,232 | 2,018,765 | 5,550,232 |
| වෛද්‍ය ගබඩාවේ ඇති තොග | 1,391,854 | 1,189,725 | 1,391,854 | 1,189,725 |
| යල්පැනු සහ අඩුවෙන් භාවිතා වන තොගය | - | 109,221 | - | 109,221 |
| වට්ටෝරුගත භාණ්ඩ සඳහා වන පොදු කාර්ය අගය | 192,607 | (162,553) | 192,607 | (162,553) |
| වට්ටෝරුගත භාණ්ඩ ලැබීම් නිරවුල් කිරීමේ ගිණුම | (34,900) | 9,554,637 | (34,900) | 9,554,637 |
| අන්තර් සම්බන්ධිත කැට ගල් | 3,025,969 | 3,025,969 | - | - |
| ක්‍රෂර් - චිප් ගල් | 3,989,926 | 3,989,926 | - | - |
| ගිනි නිවීම් සඳහා යොදාගන්නා පෙන | 1,770,000 | 1,770,000 | - | - |
| ඉන්ධන තොග | 3,589,334 | 3,589,334 | - | - |
| වෙනත් | 3,250,538 | 55,714 | - | - |
| | **2,550,631,838** | **2,497,221,609** | **2,535,006,071** | **2,484,790,666** |

වට්ටෝරුගත භාණ්ඩ භාවිත කල හැකි තත්ත්වයේ පවතින බැවින් අඩුවෙන් භාවිතා කරන තොග ලියා ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රතිපාදන සලසා නොමැත .

**12 වෙළඳ සහ වෙනත් ලැබීම්**

| | | සමූහය 2018 | 2017 | ශ්‍රීලවඅ 2018 | 2017 |
|---|---|---|---|---|---|
| වෙළඳ අයවිය යුතු මුදල් | | 3,360,031,330 | 2,294,383,455 | 2,862,918,268 | 1,797,270,393 |
| නැව් නියෝජිත ආරවුල් | | 19,920,615 | 61,532,367 | 19,920,615 | 61,532,367 |
| නියෝජිත ආදායම | | 1,018,725,281 | 929,288,606 | 1,018,725,281 | 929,288,606 |
| ප්‍රේෂණලාභීන්ගෙන් ලැබිය යුතු ආදායම | | 1,052,504 | 6,101,088 | 1,052,504 | 6,101,088 |
| වෙනත් ලැබිය යුතු ආදායම | (සටහන 12.1) | 7,584,791,146 | 111,802,063,812 | 7,074,748,210 | 111,290,577,450 |
| ලැබිය යුතු ආදායම් බදු | (සටහන 12.3) | 1,482,250,100 | 900,823,810 | 1,482,250,100 | 900,823,809 |
| | | **13,466,770,976** | **115,994,193,138** | **12,459,614,978** | **114,985,593,712** |
| හානිවීම් සඳහා ප්‍රතිපාදන | | (503,795,374) | (425,531,883) | (501,399,295) | (423,135,804) |
| | | **12,962,975,602** | **115,568,661,254** | **11,958,215,682** | **114,562,457,908** |

නඩු අංක 58/2012 හා අදාළ රු. 1,695,536.00ක මුදලට ප්‍රේෂණලාභීන්ගේ ලැබීම්ද ඇතුලත් වේ. නොපියවූ බිල්පත් සඳහා මිඩ්ලන්ඩ් එන්ටර්ප්‍රයිසස් සමාගමට එරෙහිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නඩු පැවරූ අතර ලැබිය යුතු මුදලට අදාළව රු. 5,183,000.00ක බැංකු ඇපයක් තබා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2018 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවා සැපයීම් වලින් ලැබිය යුතු ආදායම වූ රු. 1,195,259,717 (2016:රු. 1,195,259,717 ) දිගුකාලීනව හිඟව පැවතියද එහි අගය හීන වීමක් සිදුවී නොමැත . මෙම හිඟ මුදල් නැව් නියෝජිතයින් ඇතුළු සුවිශේෂී පාරිභෝගිකයින්ගෙන් අයවිය යුතුව ඇති අතර ඒවාහි ක්‍ෂය වීම් පිළිබඳ තනි ගිණුම් වශයෙන් සමාලෝචනයට ලක් කෙරෙන අතර හිඟ මුදල් ඊළඟ වර්ෂයේදී අය කර ගැනීමට විශ්වාසයැයි සාක්ෂි නොමැති නැව් නියෝජිතයින් සිටිද යන්න විමර්ශනය කරනු ලැබේ . ලැබිය යුතු මුදල් පිළිබඳ කල විශ්ලේෂණය පහත දැක්වේ .

| වෙළඳ ලැබිය යුතු දෑ වල කාල සීමාව | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|
| | 2018 | 2017 | 2018 | 2017 |
| මාස 6 දක්වා | 2,276,253,593 | 1,114,298,165 | 2,276,253,593 | 1,114,298,165 |
| මාස 6 සිට මාස 12 දක්වා | 43,753,714 | 50,906,715 | 43,753,714 | 50,906,715 |
| | **2,320,007,308** | **1,165,204,880** | **2,320,007,308** | **1,165,204,880** |

වෙළඳ ලැබිය යුතු දෑ වල අගය හීන වීම සමාලෝචනය කර ඇත. ඇතැම් වෙළඳ ලැබීම්හි අගය හීනවී ඇති බව හඳුනාගෙන ඇති අතර එම හීනවීම් සඳහා ප්‍රතිපාදන 2.7 සටහනේ දක්වා ඇති පදනම මත ලබා දී ඇත. අගය හීනවූ වෙළඳ ලැබීම් බොහෝමයක් ලැබිය යුතුව ඇත්තේ රාජ්‍ය ආයතන වලින් හා අධිකරණ කටයුතු වලට යොමුව ඇති නැව් නියෝජිත ආයතනයන්ගෙනි .

| වෙළඳ ලැබීම් වල අගය හීනවීම් | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|
| | 2018 | 2017 | 2018 | 2017 |
| අධිකරණ කටයුතු වලට සම්බන්ධ නැව් නියෝජිතයන් | 368,836,490 | 386,702,803 | 368,836,490 | 386,702,803 |
| ශ්‍රී ලංකා යුධ හමුදා | 149,442 | - | 149,442 | - |
| රජයේ ආයතන | 810,077 | 36,433,002 | 810,077 | 36,433,002 |
| වෙනත් | - | - | - | - |
| | **501,399,295** | **423,135,805** | **501,399,295** | **423,135,805** |

| **12.1 ලැබිය යුතු වෙනත් දෑ** | | | | |
|---|---|---|---|---|
| රාජ්‍ය භාගය - එස් ඒ ජී ටී | 107,398,457 | 89,648,157 | 107,398,457 | 89,648,157 |
| රාජ්‍ය භාගය - සී අයි සී ටී | 108,722,250 | 86,544,609 | 108,722,250 | 86,544,609 |
| බදු කුලිය-එස් ඒ ජී ටී | 41,094,440 | 33,725,732 | 41,094,440 | 33,725,732 |
| ලැබිය යුතු ආදායම -එච් අයි පී ජී | 5,028,366 | | 5,028,366 | - |
| අමාත්‍යාංශයෙන් ලැබිය යුතු | 305,158 | 577,827 | 305,158 | 577,827 |
| අමාත්‍යාංශයට ඉන්ධන සැපයීම | 3,604,980 | 3,610,421 | 3,604,980 | 3,610,421 |
| බාහිර පාර්ශ්වයන්ට සපයන ලද ආහාර හා තේ | 9,869,377 | 5,510,362 | 9,869,377 | 5,510,362 |
| ජය බහළු පර්යන්ත සමාගම | 247,662 | 319,888 | 247,662 | 319,888 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් හා වෙනත් පාර්ශ්වයන්ට විදුලිය සැපයීම | 25,015 | 476,993 | 25,015 | 476,993 |
| ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සමාගමට ඉන්ධන සැපයීම | 10,647,472 | | 10,647,472 | - |
| *මාගම්පුර වරාය කළමනාකරණ උපදේශන සමාගමට ඉන්ධන සැපයීම* | *5,800,921* | *1,804,652* | 5,800,921 | 1,804,652 |
| විදේශ මිලදී ගැනීම සඳහා අත්තිකාරම් - අයවැය ගත නොවූ | 519,219,841 | - | 519,219,841 | |
| මහා භාණ්ඩාගාර ගනුදෙන් වලින් ලැබිය යුතු | 5,149,981,344 | 5,056,086,436 | 5,149,981,344 | 5,056,086,436 |
| මහා භාණ්ඩාගාර ගනුදෙනු වලින් ලැබිය යුතු - මහජන බැංකු ණය | | 4,369,842 | | 4,369,842 |
| චයිනා මර්චන්ට් සමාගමෙන් ලැබිය යුතු | - | 104,960,332,400 | - | 104,960,332,400 |
| එච් අයි පී එස් සමාගමෙන් ලැබිය යුතු | 4,306,510 | 568,354 | 4,306,510 | 568,354 |
| | - | - | - | - |
| කොටස් ලැබීම් - එස් ඒ ජී ටී (සටහන 12.2) | 141,632,944 | 141,632,944 | 141,632,944 | 141,632,944 |
| අන්තර් සමාගම් ලැබීම් | 826,873,407 | 825,937,832 | 826,873,407 | 825,937,832 |
| වෙනත් ලැබීම් | 509,806,191 | 514,039,803 | (236,745) | 2,553,440 |
| නිදහස් සේවක සංගමය සඳහා අත්තිකාරම් ගෙවීම් | - | 499,964 | - | 499,964 |
| | **7,444,564,336** | **111,725,686,216** | **6,934,521,400** | **111,214,199,854** |
| **12.1.1** | | | | |
| බදු ණයකරුවන් | 111,578,285 | 72,099,947 | 111,578,285 | 72,099,947 |
| විදුලි ණයකරුවන් | 92,579,265 | 67,955,790 | 92,579,265 | 67,955,790 |
| | **204,157,549** | **140,055,737** | **204,157,549** | **140,055,737** |
| අගය හීනවීම මත ප්‍රතිපාදන | (63,930,740) | (63,678,141) | (63,930,740) | (63,678,141) |
| | **140,226,809** | **76,377,596** | **140,226,809** | **76,377,596** |
| | **7,584,791,146** | **111,802,063,812** | **7,074,748,210** | **111,290,577,450** |

**12.2 එස් ඒ ජී ටී සමාගමේ කොටස් මත ලැබිය යුතු**

එස් ඒ ජී ටී ආයතනය මගින් ලැබිය යුතු කොටස් වලින් පෙන්නුම් කරනුයේ එස් ඒ ජී ටී ආයතනය වෙත ලබා දුන් දොඹකර වල මූලික අගය සහ ද්‍රව්‍යමය ආධාර සඳහා නිකුත් කල කොටස් වල වෙනසින් පැන නගින , එස් ඒ ජී ටී ආයතනයෙන් ලැබිය යුතු ශේෂය වේ. කෙසේ නමුත් , අදියර 1 පහසුකම් සඳහා තවත් ප්‍රාග්ධනය ලබාගතහොත් පමණක් රු. 141,632,943.84කට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 2,424,285ක මුදලකට එස් ඒ ජී ටී ආයතනයෙහි අතිරේක "ද්‍රව්‍යමය කොටස්" නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සුදුසුකම් ලබන බවට 2010 මැයි 14 දින එස් ඒ ජී ටී ආයතනය තීරණය කරන ලදී. එස් ඒ ජී ටී ආයතනයෙන් ලැබිය යුතු කොටස් ආදායම ලෙස රු. 141,632,943.84ට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 2,424,285ක ශේෂය මූල්‍ය ප්‍රකාශනයන්හි පෙන්නුම් කල යුතු බවට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත උපදෙස් දී ඇති බැවින් ලැබීම් අගය හීනවීම මත ප්‍රතිපාදන සලසා නොමැත .

| **12.3ලැබිය යුතු ආදායම් බදු** | | | | |
|---|---|---|---|---|
| **ආර්ථික සේවා ගාස්තු** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 798,157,817 | 574,168,289 | 798,157,817 | 574,168,289 |
| වසර තුළ වියදම් | 106,750,663 | 105,200,230 | 106,750,663 | 105,200,230 |
| ඉදිරියට ගෙන ආ ලියා ඉවත් කල ශේෂය - 2013 වර්ෂය | | | (140,812,908) | |
| 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන | 150,296,517 | 118,789,298 | 150,296,517 | 118,789,298 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **914,392,089** | **798,157,817** | **914,392,089** | **798,157,817** |
| **රැඳවුම් බදු** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 102,665,993 | 41,454,280 | 102,665,993 | 41,454,280 |
| වසර තුළ වියදම් | 465,192,018 | 61,211,713 | 465,192,018 | 61,211,713 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **567,858,011** | **102,665,993** | **567,858,011** | **102,665,993** |
| ලැබිය යුතු ආදායම් බදු | | | | |
| **12.3 ලැබිය යුතු ආදායම් බදු** | **1,482,250,100** | **900,823,810** | **1,482,250,100** | **900,823,809** |

| 13 තැන්පතු සහ අත්තිකාරම් | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|
ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයට එරෙහිව අභියාචනා බදු අභියාචනා කොමිසම වෙත යොමු කරන ලදී. 2010/2011 තක්සේරු වර්ෂය සඳහා බදු අභියාචනා කොමිසම ඉදිරියේ අභියාචනාවක් විභාග වෙමින් පවතින අතර 2007/2008 සහ 2008/2009 වර්ෂයන් සඳහා බදු අභියාචනා කොමිසම විසින් තක්සේරුව තහවුරු කරමින් ඔවුන්ගේ තීරණය ලබාදෙන ලදී. බදු අභියාචනා කොමිසම විසින් ලබාදුන් තීරණයට ශ්‍රී ලංකා වරාය අධිකාරිය එකඟනොවූ බැවින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම නඩුව නෛතික ගැටළු විසඳීම සඳහා අභියාචනාධිකරණය වෙත ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවේදී , බදු අභියාචනා කොමිසම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසිදායක ලෙස තීරණයක් ගනු ලැබිණි. (අත්සන් නොකල තක්සේරුව වලංගු නොවේ )

නඩු කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ

| තක්සේරු වර්ෂය | බැංකු ඇපයේ වටිනාකම (රු.) | ඇප වශයෙන් තබාගත් ස්ථාවර තැන්පතු අගය |
|---|---|---|
| 2010/2011 | 749,708,930 | රු. මිලියන 812.10 |

**45 අසම්භාව්‍ය වගකීම්**

ව්‍යාපාර සිදු කර ගෙන යෑමේදී පැන නගින නෛතික හිමිකම් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආපතික වගකීමක් ඇත. ප්‍රතිපාදනයක් ලෙස හඳුනානොගත හොත් (සටහන 29) කළමනාකාරීත්වය විසින් මෙම හිමිකම් ඉල්ලීම් අසාධාරණ ලෙස සලකනු ලබන අතර ඒවා සමතයකට පත් කිරීම සඳහා සම්පත් භාවිතා කිරීමේ සම්භාවිතාවය අවම වේ. මෙම ඇගයීම අධිකාරියේ නීති කොට්ඨාශයේ නීති උපදෙස් හා අනුරූපී වේ. ඒ අනුව, නෛතික හිමිකම් සඳහා කිසිදු ආපතික වගකීමක් නොමැත .

**46 <u>සමූහයේ මූල්‍ය අගයන්ගේ සාපේක්ෂතාවය යලි උපලේඛනගත කිරීම</u>**

2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් අනතුරුව පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්හි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලැබීමත් සමඟ පහත සඳහන් අයිතමයන් යලි උපලේඛනගත කර ඇත.

| | | සමූහය | |
|---|---|---|---|
| **2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයේ බලපෑම** | සටහන | විගණනය කරන ලද ගිණුම් සමඟ 2017 | විගණනය නොකරන ලද ගිණුම් සමඟ 2017 |
| දේපළ , පිරියත හා උපකරණ | | 149,445,346,188 | 149,469,781,120 |
| අස්පෘශ්‍ය වත්කම් | | 57,039,427 | 57,579,403 |
| ආශ්‍රිත සමාගම්හි ආයෝජනයන් | | 39,221,857,964 | 39,215,920,136 |
| වට්ටෝරු ලේඛන | | 2,497,221,609 | 2,971,202,423 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | | 115,568,661,254 | 114,635,412,269 |
| පෙර ගෙවුම් වියදම් | | 105,069,819 | 108,008,573 |
| සේවක ණය | | 4,297,024,012 | 4,296,739,607 |
| වෙනත් මූල්‍ය වත්කම් | | 22,491,559,843 | 22,345,520,484 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,736,048,989 | 1,762,527,731 |
| දේපළ , පිරියත හා උපකරණ - එම්පීඑම්සී සමාගම | | 998,823 | - |
| රඳවාගත් ඉපැයුම් | | 32,780,151,598 | 32,882,966,740 |
| ණයට ගැනීම් - මූල්‍ය ආයතන | | 11,363,752,700 | 14,296,509,447 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | 4,737,678,804 | 4,743,019,850 |
| භාණ්ඩ හා සේවා සැපයීම සහ වෙනත් ණයහිමියන් | | 106,228,718,883 | 105,806,896,751 |
| ණයට ගැනීම් - මූල්‍ය ආයතන | | 4,708,319,092 | 1,555,871,084 |
| ගෙවිය යුතු ප්‍රවර්තන බදු | | 298,733,479 | 294,334,230 |
| ප්‍රතිපාදන හා උපචිත වියදම් | | 4,074,771,871 | 4,054,392,146 |

**47 <u>පෙර වර්ෂයේ ගැලපුම්</u>**

| විස්තරය | අගය |
|---|---|
| DCE(OPP) විසින් යවන ලද 2018.04.10 දිනැති ලිපිය ප්‍රකාරව , අනුග්‍රාහාත්මක ගිවිසුමේ ඇතුලත් වන හම්බන්තොට වරායේ වත්කම් , වත්කම් ලේඛනයන් ඉවත් නොකරන ලද අතර 2018.07.24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක PA/HD/28 ප්‍රකාරව ඉහත වත්කම් වත්කම් ලේඛනයෙන් ඉවත් කර ගිණුම් ගලපන ලදී. (FD/AR/JE/09) | 11,753,391.64 |
| විදේශ මිලදී ගැනීම් නිවැරදි කිරීම | 14,945,540.11 |
| පසුගතම යෙදූ වත්කම්හි ගැලපුම් සිදු කිරීම | 14,849,521.08 |
| කුලිය සහ විදුලිබලය සඳහා බොල් සහ අඩමාන ණය ප්‍රතිපාදනයන් (NAV135) | (796,543.68) |
| ඔලුවිල් වරාය සඳහා වසර 30කට ලැබූ ප්‍රදානය ක්‍රමක්ෂය (FA_385) | (3,404,689.50) |
| සුභසාධනය සඳහා කුලිය සහ විදුලිබලය සැපයීම වෙනුවෙන් බොල් හා අඩමාන ණය ප්‍රතිපාදනය . ආපනශාලාව විසින් මෙම මුදල පෙර සුභසාධන ආපනශාලා ගිණුමට එකතු කිරීමට නියමිතය | 1,035,387.88 |
| ගාලු මුවදොර පිටිය සඳහා එකතුව | (1,653,872.00) |
| ආදායම් බදු වියදම් | 310,869,170.00 |
| **එකතුව** | 347,597,905.53 |

**47 විදේශ විනිමය ලාභ / පාඩු**

LKAS 1 ප්‍රකාරව , විදේශ විනිමය ලාභ / පාඩු ගැලපුම් සිදු කරන අතිරේක රේඛීය අයිතමය සවිස්තරාත්කම ආදායම් ප්‍රකාරව එක් කරන ලද්දේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ සමූහ මූල්‍ය කාර්යසාධනය අවබෝධ කර ගැනීම සඳහා මෙවැනි ඉදිරිපත් කිරීම් අවශ්‍ය වනුයේ වසර අවසානයේ ශුද්ධ ලාභයට මෙමගින් විශාල බලපෑමක් එල්ල වන බැවිනි .

**48 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2018**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගම් වන ජය බහළු පර්යන්ත සමාගමේ 2018 වර්ෂය සඳහා විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගම් වන මාගම්පුර වරාය කළමනාකරණ සමාගම (MPMC Ltd) සහ ලංකා ගෑස් ටර්මිනල් පුද්ගලික සමාගම සහ ආශ්‍රිත සමාගම් වන ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා සමාගම (SLMPCS) සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම (HIPS) යන සමාගම් තවමත් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර නොමැත . එම නිසා , ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ ජය බහළු පර්යන්තයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනයන් සලකා බලා වන අතර මාගම්පුර වරාය කළමනාකරණ සේවා සමාගම , ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගමේ ලාභය සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම නොසලකා හරින ලදී. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම පිළිබඳ විගණකාධිපති වාර්තාව වෙනුවෙන් 2019 ජනවාරි 14 දින තත්වාගණනය කරන ලද මතය ලබා දෙන ලදී.

**49 කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගමෙහි ඉඩම් අගය ප්‍රාග්ධනීකරණය කිරීම**

කලම්බු කන්ටේනර් ඉන්ටර්නැෂනල් ටර්මිනල් සමාගමට අයත් ඉඩම් , ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා නියාමනය කිරීම පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණයන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අපේක්ෂා කෙරේ . එවැනි තීරණයන් ලැබෙන තෙක් ඉහත ඉඩම ප්‍රාග්ධනීකරණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකියාවක් නොමැත .

**50 ඔලුවිල් වරාය ප්‍රාග්ධනීකරණය**

ඔලුවිල් වරායට අදාළව 2017.12.31 දිනට කාර්යය ප්‍රගති ගිණුමේ පිරිවැය යෙදවීම ප්‍රාග්ධනීකරණය කර ඇත.

**51 හැටන් නැෂනල් බැංකුවේ ණය පහසුකම් සඳහා ඉදිරිපත් කරන ලද ආයතනික ඇපය**

මාගම්පුර වරාය කළමනාකරණ උපදේශක සමාගම විසින් ලබා ගත් ණය පහසුකම් සඳහා හැටන් නැෂනල් බැංකුව වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආයතනික ඇපයක් ලබා දී ඇත. කෙසේ වුවද , ඉදිරිපත් කරන ලද ආයතනික ඇපය මාගම්පුර වරාය කළමනාකරණ උපදේශක සමාගම සහ හැටන් නැෂනල් බැංකුව අතර ප්‍රදානය කිරීමේ ලිපිය හා එකඟ නොවේ .

තවද , අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට පටහැනිව , ආයතනික ඇපය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොදු මුද්‍රාව යටතේ නිකුත් කර නොමැත . එබැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වගකීම ප්‍රශ්නගත වී ඇත. තවද , මෙම පහසුකම පියවීම මාගම්පුර වරාය කළමනාකරණ උපදේශක ආයතනයේ වගකීමක් නොවන අතර මේ සඳහා 2016.11.22 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

**52 හම්බන්තොට වරාය හා සම්බන්ධ අති විශේෂ ගනුදෙනුව**

1.අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල පරිදි , අනුග්‍රාහාත්මක ගිවිසුම (Concession Agreement) ක්‍රියාත්මක කිරීමත් සමඟ පහත සඳහන් ගනුදෙනු සිදු කරන ලදී.

i. හම්බන්තොට වරායේ ණය යලි ආපසු ගෙවීමේ වගකීම 2017.07.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මහා භාණ්ඩාගාරය වෙත පවරා ඇත.

ඒ අනුව , 2017.10.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අංක 17/2143/737/018-V සහ අනුග්‍රාහාත්මක ගිවිසුමේ 55.2 වගන්තිය ප්‍රකාරව , ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ HIPG/HIPS සමාගම අතර අත්සන් තබන ලද කල්බදු ගිවිසුම සඳහා වැයවූ මුද්දර ගාස්තු සමඟ 2017 ජූලි - දෙසැම්බර් දක්වා සිදු කරන ලද ආපසු ගෙවීම් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ලෙස දක්වා ඇත.

ii. අනුග්‍රාහාත්මක ගිවිසුම ප්‍රකාරව , HIPG සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 85%ක් වයිනා මර්චන්ට් පෝට් සමාගම විසින් මිලදී ගත් අතර 2017.12.31 දිනට රු. 104,960,332,400ක මුදලක් ලැබීමට නියමිතය .

iii.හම්බන්තොට වරාය හා අදාළ නිශ්චල දේපළෙහි කල්බදු අයිතින් අනුග්‍රාහාත්මක ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව HIPG සහ HIPS සමාගම් වෙත ලබා දී ඇත.

2. 2017 දෙසැම්බර් 12 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක PA/HD/28 ප්‍රකාරව , පහත සඳහන් කරුණු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

i. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වට්ටෝරු අයිතමයන් HIPS සමාගම වෙත පැවරීමට

ii. වෙන් වෙන්වූ කොන්ත්‍රාත් යටතේ නමුත් කල්බදු ප්‍රදේශය තුළ ස්ථානගතව ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සංවර්ධනය කරන ලද නිශ්චල දේපළ පැවරීමට

iii. රජයේ ඉඩම්හි කල්බදු අයිතින් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් යෝජිත බදු කුලිය භාවිතයෙන් ලබාගත් අගය මත HIPG සහ HIPS සමාගම් වෙත ලබා දීමට .

**53 වත්කම් භාවිතා කල හැකි ආයුකාලය පිළිබඳ සමාලෝචනය**

පාවෙන සහ මෙහෙයුම් උපකරණ , කාර්යමණ්ඩල නිල නිවාස සහ වෙනත් ගොඩනැගිලි , පරිගණක අඩාංග , මෘදුකාංග සහ රථවාහන වල භාවිතා කල හැකි ආයු කාලය වරසක් තුළදී සමාලෝචනය කර ඇති අතර පොත්වල ශුද්ධ වටිනාකම ඒ අනුව ගැලපුම් කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි වත්කම් සමාලෝචනය අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස සිදු කරනු ලැබේ .

**54 හම්බන්තොට වරායේ ගනුදෙනු අවසන් කිරීමේ දිනය**

හම්බන්තොට වරායේ මූල්‍ය ප්‍රකාශන අනුග්‍රාහාත්මක ගිවිසුමේ බලාත්මක දිනය වන (2017.12.09) දක්වා සිදු කල ගනුදෙනු සලකා බලා සකස් කර ඇත.

**55 හම්බන්තොට වරායේ ආයෝජන වත්කම් වල ආයුකාලය**

HIPG සහ HIPS සමාගම් වෙත වසර 99ක කාල සීමාවක් සඳහා කල්බදු පදනම මත ලබාදුන් දේපළෙහි ඇස්තමේන්තුගත ආයුකාලය කල්බදු අයිතියෙන් ලැබෙන ආදායම මෙම කාලසීමාව තුළදී

ක්‍රමක්‍ෂය කෙරෙන බැවින් වසර 100ක් ලෙස සලකනු ලැබේ .

**56 හම්බන්තොට වරාය ප්‍රදේශය ඇතුලත පිහිටා නොමැති ඉඩමක් සඳහා වන්දි ගෙවීම**

HIPG සමාගම වෙත පවරාදුන් හම්බන්තොට වරාය ව්‍යාපෘති ප්‍රදේශයට අයත් නොවන ඉඩම් ප්‍රදේශයක් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වන්දි මුදලක් ගෙවා ඇත.

මෙම ඉඩම ආයෝජන මණ්ඩලයට අයත් බැවින් එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත් වල ප්‍රාග්ධනීකරණය වී නොමැත .

**57 ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය (SLP-85 ණය)**

යෙන් මිලියන 14,495 ක් වන JICA ණය මුදලින් , යෙන් මිලියන 458ක් ගාල්ල වරාය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම බෙදා හැර යොදවන

ලද අතර මෙම මුදල මේ දක්වා ප්‍රාග්ධනීකරණය කර නොමැත .

**58 ආයෝජන වත්කම් වල සාධාරණ අගය තීරණය නොකිරීමට හේතුව**

ආයෝජන දේපළ යනු වරාය යටිතල පහසුකම් වන අතර ප්‍රධාන වරායෙන් සමුද්‍රීය සංවර්ධන කටයුතු සහ ව්‍යුහයන්ගෙන් සමන්විත වේ. මෑත කාලීනව

මෙම ස්වභාවයේ වරාය සංවර්ධන ව්‍යාපෘතීන් කිසිවක් ක්‍රියාත්මකව නොපවතී . එම නිසා මෙම ආයෝජන දේපලවල වෙළෙඳපොල අගය ගණනය සඳහා තාර්කික පදනමක් නොමැති බැවින් පවතින තොරතුරු අනුව පිරිවැය ක්‍රමය භාවිතා කරනු ලබ

**59 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති**

ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 91,651,500.00 ක ස්ථාවර තැන්පතුව නැගෙනහිර බහළු පර්යන්ත ණය මුදල් ගෙවීම සඳහාත් ජය බහළු පර්යන්තයේ V වන අදියරෙහි ඉදිකිරීම් සඳහාත්

නැගෙනහිර බහළු පර්යන්තය සඳහා දොඹකර මිලදී ගැනීම සඳහාත් පවත්වාගෙන යනු ලැබේ .

**60 වත්කම් නිරවුල් කිරීමේ ගිණුම**

වත්කම් නිරවුල් කිරීමේ ගිණුම යනු ප්‍රාග්ධනීකරණය කරන තෙක් මුදල් තබා ගැනීම සඳහා සපයනු ලබන තාවකාලික ගිණුමකි . භාණ්ඩ අදාළ කොට්ඨාශය වෙත බෙදා දෙන තුරු සහ ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා මුදල් කොට්ඨාශය වෙත ලේඛනයක් ලැබෙන තුරු වත්කම් නිරවුල් කිරීමේ ගිණුමේ පවතින ශේෂය පවත්වා ගෙන යනු ලැබේ

**61 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැසඳීම පිළිබඳ තොරතුරු**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන් හම්බන්තොට වරාය ඇතුලත් කොට සකස් කර ඇති අතර විගණකාධිපතිවරයා විසින් විගණනය කර ඇත. 2017.07.29 දිනැති අනුග්‍රාහාත්මක ගිවිසුම ප්‍රකාරව , හම්බන්තොට වරාය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස මෙහෙයුම් සිදු කරනු ලැබේ .

මේ නිසා , 2018/2017 මූල්‍ය ප්‍රකාශයන් අතර වඩාත් යහපත් සැසඳීමක් සිදු කිරීම සඳහා , හම්බන්තොට වරාය 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් ඉවත් කර ඇත.

**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**46 සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම**

ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය , රජයට සම්බන්ධිත ආයතන, පරිපාලිත සමාගම් , ආශ්‍රිත සමාගම් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධිකාරියේ සම්බන්ධිත පාර්ශ්වයන් ලෙස ඇතුලත් වේ.

**46.1 ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් සමඟ කරන ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24ට අනුකූලව "සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම" , සැලසුම් කිරීම", උපදේශනය සහ ඍජුව හා වක්‍රව ආයතනයේ කටයුතු පාලනය කිරීම සඳහා වගකීම් සහිත නිලධාරීන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වේ. ඒ අනුව, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත.

| ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ කර ඇති ගනුදෙනු පහත දැක්වේ . | 2018 | 2017 |
|---|---|---|
| පාරිශ්‍රමික හා වෙනත් කෙටිකාලීන වරප්‍රසාද | 38,888,689 | 32,138,677 |
| හිඟ ශේෂය - ණය හා අත්තිකාරම් | 299,860 | 499,900 |

**46.2 අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු**

අධිකාරිය විසින් අදාළ විශේෂ නිලධාරීන් සමඟ කල ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ .

| ආයතනයේ නම | සම්බන්ධතාවය | අධ්‍යක්ෂවරුන් / නියෝජිතයින්ගේ නම් | ගනුදෙනුවේ ස්වභාවය | ගනුදෙනුවේ අගය | ගෙවිය යුතු | ලැබිය යුතු |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය | ප්‍රධාන ආයතත්වය | | ප්‍රදානය කල ණය | | | |
| | | | ආපසු ගෙවූ ණය | 5,179,100,598 | | |
| | | | ගෙවූ පොලිය | 1,432,492,758 | | |
| රජයට සම්බන්ධ ආයතන | | | | | | |
| ශ්‍රී ලංකා රේගුව | සම්බන්ධිත ආයතන | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නැව් නියෝජිත ආයතනයන්ගේ මෙහෙයුම් | 311,180.00 | - | |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | සම්බන්ධිත ආයතන | | - | - | - | - |
| සීමාසහිත නාවික හා ගුවන් සේවා තොරතුරු පර්යේෂණ ආයතනය | සම්බන්ධිත ආයතන | | - | - | - | - |
| රජයට සම්බන්ධ වෙනත් ආයතන | සම්බන්ධිත ආයතන | | සපයන ලද සේවා | | | |
| | | | සපයන ලද සේවා සඳහා මුදල් ගෙවීම | | | - |
| | | | වරාය හා නාවික අමාත්‍යාංශය සඳහා ඉන්ධන සැපයීම | 1,824,239 | | 347,078.73 |
| වෙළඳ නාවික ලේකම්කාර්යාලයේ අධ්‍යක්ෂ ජෙනරාල් | | | වෙළඳ ලේකම් කාර්යාලය සඳහා ඉන්ධන සැපයීම | 141,183 | | 25,608.30 |
| | | | කිරුම් පාලම් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 100,000 | | |
| | | | වාර්ෂික ටොන් ගාස්තු | 311,180 | | |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නෞකා නියෝජිත ආයතන මෙහෙයුම් | | | |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නෞකා නියෝජිත ආයතන මෙහෙයුම් | | | |
| ලංකා නැව් සංස්ථාව | | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නෞකා නියෝජිත ආයතන මෙහෙයුම් | | | |
| මිනින්දෝරු දෙපාර්තමේන්තුව | | | මිනින්දෝරු ගාස්තු | 8,625 | 1,007,199 | |
| තක්සේරු දෙපාර්තමේන්තුව | | | තක්සේරු ගාස්තු | 174,730 | 2,676,800 | |
| ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම | ආශ්‍රිත සමාගම | | ලබාගත් පවිත්‍රතා සේවා සඳහා ගෙවීම් | 35,088,429 | 3,862,330 | - |
| | | | වැටුප් ගෙවීම් | 93,093,026 | 31,468,001 | |
| | | | ලබාගත් සේවා සඳහා ගෙවීම් | 109,687,525 | 10,985,151 | 255,466.77 |
| | | | නෞකා මෙහෙයුම් | 29,726,197 | 3,069,081 | |
| | | | ලැබිය යුතු ලාභාංශ | | | |
| | | | ගාලු මුවදොර පිටියේ නැරඹුම් වේදිකාව ප්‍රතිසංස්කරණය කිරීම | | | 7,609,036 |
| සීමාසහිත ජය බහළු පර්යන්ත සමාගම | පරිපාලිත සමාගම | | ගෙවන ලද පරිපාලන සහ යටිතල පහසුකම් ගාස්තු | 293,440,088 | 34,366,364 | - |
| | | | ලැබූ ලාභාංශ | 860,000 | | |
| | | | ඉන්ධන සැපයීම | 1,190,881 | | 90,576.40 |
| | | | ඖෂධ නිකුත් කිරීම | 59,801 | | 86,226 |
| | | | දූරකථන ගාස්තු | 600,000 | | 150,000 |
| සීමාසහිත සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් පුද්ගලික සමාගම | ආශ්‍රිත සමාගම | | ලැබූ කුලිය | 495,977,115 | - | 41,094,440 |
| | | | ලැබූ රාජ්‍ය භාග | 1,154,499,262 | - | 107,398,457 |
| | | | ලැබූ ලාභාංශ | 862,683,694 | - | 0 |
| | | | සැපයුම් නඩත්තු සේවා | 825,000 | - | 75,000 |
| | | | | | - | |
| සීමාසහිත ලංකා කෝල් පුද්ගලික සමාගම | ආශ්‍රිත සමාගම | | වර්ෂය තුළ කිසිදු ගණුදෙනුවක් සිදු කර නොමැත | | - | |
| කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම | ආශ්‍රිත සමාගම | ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා | ලැබූ බදු/කුලී | 1,447,840,698 | - | |
| | | පී ජී දසනායක මහතා | ලැබූ රාජ්‍ය භාග | 1,983,185,107 | - | 108,722,250 |
| | | ශිරාණි වන්නිආරච්චි මහත්මිය | ලැබූ විලම්භිත පොලිය | 36,669,050 | - | |
| | | | සීඅයිසීටී සමාගමේ පෙර ගෙවුම් ගාස්තු | 103,534,286 | - | - |
| | | | වරායේ ස්ථාපිත කරන උපකරණ වල මාසික නඩත්තුව | 1,650,000 | - | 150,000.00 |
| | | | ලැබූ ලාභාංශ | 1,373,772,086 | | |
| මාගම්පුර වරාය කළමනාකරණ සමාගම | පරිපාලිත සමාගම | නලින් ජ් එස් වික්‍රමසිංහ මහතා | ගෙවිය යුතු පරිපාලන ගාස්තු | | 71,819,156 | 5,800,921 |
| | | ශිරාණි වන්නිආරච්චි මහත්මිය | * පහත වියදම් අඩු කිරීමෙන් පසු ඉහත සඳහන් ගාස්තු ගෙවන ලදී. | | | |
| | | | වැටුප් | | | |
| | | | ජලය | | | |
| | | | විදුලිබලය | | | |
| | | | වෙනත් | | | |
| කලම්බු ඩොක්යාඩ් සමාගම | කොටස් ආයෝජන | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නැව් නියෝජිත මෙහෙයුම් | 9,481,712.15 | | 72.11 |
| | | | ලැබූ ලාභාංශ | | | |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් කම්පැනි | | ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා | නාවිකයන් සඳහා ගෙවන ලද වැටුප් | | | 4,306,510 |
| | | නලින් ජ් එස් වික්‍රමසිංහ මහතා | | | | |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් ලිමිටඩ් | | ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා | ටග් සේවා | 394,812,657.73 | | |
| | | නලින් ජ් එස් වික්‍රමසිංහ මහතා | රාජ්‍ය භාග | | | 5,028,366.24 |

**මූල්‍ය අවදානම් කළමනාකරණය**

මූල්‍ය ප්‍රකාශන භාවිතය හේතුවෙන් පහත සඳහන් අවදානම් වලට මුහුණදීමට අධිකාරියට සිදුවනු ඇත.

1. ණය අවදානම
2. ද්‍රවශීලතා අවදානම
3. වෙළඳපොළ අවදානම (මුදල් අවදානම සහ පොලී අනුපාත අවදානම)

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වන්නේ හිමිකම් ආයෝජන (ලේඛනගත සහ ලේඛනගත නොවූ), ණයකර සඳහා ආයෝජන, කාලීන තැන්පතු, මූල්‍ය වෙළඳපොළ ආයෝජන සහ මුදල් වලිනි. කාලීන තැන්පතු හා මූල්‍ය වෙළඳපොළේ ආයෝජනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ, මෙහෙයුම් සඳහා ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සහ පවත්වාගෙන යාමයි. හිමිකම්හි ආයෝජනය සහ ණයකර ආරක්ෂණයන් හි ආයෝජනය ක්‍රමෝපායික ආයෝජනයන් වන අතර, වෙළඳ සහ වෙනත් ලැබීම් වැනි අනෙකුත් මූල්‍යමය ලියවිලි සහ ඒවායේ ව්‍යාපාරික කටයුතු වලින් සෘජුවම පැනනඟින වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කළයුතුව ඇත. තවද, වරාය පුළුල් කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා රජයෙන් සහ මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය පොලිය ගෙවිය යුතු වේ.

## 1. ණය අවදානම

ණය අවදානම යනු ගණුදෙනුකරුවෙකු ගිවිසුම් ප්‍රකාර බැඳීම් හමුවේ ගෙවීම් කිරීමට අපොහොසත් වන්නේ නම්, අධිකාරියට සිදුවිය හැකි මූල්‍ය පාඩු පිළිබඳ අවදානම වන අතර, මෙය ප්‍රධාන වශයෙන් පැනනඟිනු ලබන්නේ ශ්‍රී ලංකා හමුදාවන්, වෙනත් රාජ්‍ය ආයතන සහ ආයෝජන සුරැකුම් ඇතුළුව ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ලැබීම් වලිනි.

**වෙළඳ ලැබීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය නැව් නියෝජිතයින් සහ රාජ්‍ය ආයතන සමඟ ප්‍රධාන වශයෙන් වෙළඳ කටයුතු වල නිරත වේ. අතීත පළපුරුද්ද සහ නැව් නියෝජිතයින්ගේ මූල්‍යමය සහතිකවීම් වැනි වෙනත් සාධක පදනම් කරගනිමින් නැව් නියෝජිතයින්ගේ ණය තත්ත්වය පිළිබඳව කළමනාකාරීත්වය තක්සේරු කරනු ලබයි. ඊට අමතරව කළමනාකරණ කමිටුවේ දී සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පවත්නා පදනම මත ගෙවීමට ඇති ශේෂයන් අධීක්ෂණය කරනු ලබයි.

වෙළඳ ලැබීම් සම්බන්ධයෙන් සිදුවන පාඩු, ඇස්තමේන්තු මගින් පෙන්වන හානිකිරීම් සඳහා (මූල්‍ය ප්‍රකාශනයේ 2.7 සටහන බලන්න) ප්‍රතිපාදන සඳහා අධිකාරිය විසින් ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත. විශේෂිත වූ ගණුදෙනුකරුවන් පුද්ගලික වශයෙන් තක්සේරු කිරීමට සම්බන්ධ තනි වශයෙන් වන හානි කිරීම් පාඩු සහ විශේෂිත නොවූ ගණුදෙනුකරුවන් සඳහා සාමූහික හානිකිරීම්, ප්‍රතිපාදන වල ප්‍රධාන ලක්ෂණයන් වේ. ගෙවීම් සිදුකිරීමේ ඓතිහාසික දත්ත පදනම් කරගෙන සාමූහික හානිකිරීමේ පාඩු තීරණය කෙරිණ. පිහිටුවන ලද හානිකිරීමේ ප්‍රතිපත්ති වලට අනුකූලව හානිකිරීම් පාඩු මැන බැලීම පිණිස ශ්‍රී ලංකා හමුදාවන්, වෙනත් රජයේ ආයතන, නීතිමය තත්ත්වයන්ට යටත් නැව් නියෝජිතයින් සහ විශේෂිත නැව් නියෝජිතයින් පෞද්ගලිකවම සමාලෝචනය කෙරිණ. අනෙත් ඒවා සාමූහිකව සමාලෝචනය කෙරිණ. වෙළඳ ලැබිය යුතු දේ සහ හානිකිරීමේ පාඩු වෙනුවෙන් වූ ප්‍රතිපාදන වල විස්තර සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශන සඳහා වන 12 සටහන බලන්න.

**වෙනත් මූල්‍ය වත්කම්**

අධිකාරියේ වෙනත් මූල්‍යමය වත්කම්වලින් පැන නගින ණය අවදානම සමන්විත වන්නේ කාලීන තැන්පතු, මුදල් සහ මුදල් හා සමාන ණයකර වල ආයෝජන වලිනි. මෙම මූල්‍යමය ලියකියවිලි වල ඉදිරියට ගෙන එන ලද මුදලට සමාන උපරිම අනාවරණයක් සහිතව, ගිවිසුම් ප්‍රකාර පාර්ශ්වයන්ගේ ගිවිසුම් ප්‍රකාර වගකීම් හමුවේ වූ පැහැර හැරීම් වලින් පැනනගින මූල්‍ය අවදානම හේතුවෙන් අධිකාරිය මූල්‍ය අවදානමට මුහුණ දේ. ප්‍රධාන වශයෙන් රාජ්‍ය මූල්‍ය ආයතනවල සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හි අරමුදල් යෙදවීම මගින් මෙම මූල්‍යමය ලියකියවිලි සම්බන්ධයෙන් ඇති ණය අවදානම අධිකාරිය විසින් පාලනය කරනු ලැබේ.

## 2. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු අධිකාරිය විසින් තම මූල්‍ය වගකීම්, ඒවා කල්ගතවීම හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වීම වේ. ද්‍රවශීලතාවය පාලනය කිරීමේදී අධිකාරියේ තත්ත්වය වන්නේ, සාමාන්‍ය සහ බලාපොරොත්තු නොවූ අවස්ථාවන් යටතේ, පිළිගත නොහැකි පාඩුවීම් රහිතව හෝ අධිකාරියේ කීර්තිනාමයට හානිවීම පිළිබඳ අවදානමකින් තොරව වගකීම් ගෙවීමට ඇති අවස්ථාවන්හි දී, ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් මුදල් අධිකාරිය සතුව තිබීම හැකිතාක් දුරට සහතික කිරීමයි.

මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහයන් (පුනරාවර්තන අයවැය) සහ ප්‍රාග්ධන අයවැයවල පුරෝකථනයන් වාර්ෂිකව පිළියෙල කෙරේ. මෙහෙයුම් අවශ්‍යතාවයන්ට මුහුණදීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ඇති බවට අධිකාරියට සහතික වනු වස් පුනරාවර්තන සහ ප්‍රාග්ධන යන අයවැය ද්විත්වය සහ ද්‍රවශීලතා අවශ්‍යතාවයන් මුදල් කොට්ඨාශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. වාර්තා සැකසීමේ කාලපරිච්ඡේදය අවසානයේ දී රු.37,870,049,694.00/- (2017 : රු.23,260,284,628.21) මුදලකට අධිකාරිය විසින් කාලීන තැන්පතු, කෙටි කාලීන රජයේ සුරැකුම්පත් සහ වෙනත් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යනු ලැබිණ.

වාර්තාකරනු ලබන කාලසීමාවේ අවසන් දින වනවිට, ගිවිසුම් ප්‍රකාරව කල් පිරෙන දිනය දක්වා ඇති ඉතිරි කාලසීමාව මත පදනම්ව අධිකාරියේ මූල්‍ය වගකීම් වල කල්පිරීමේ විශ්ලේෂණයන් පහත වගුවෙන් නිරූපනය කෙරේ. වට්ටම් නොලැබූ ගිවිසුම් ප්‍රකාර මුදල් ප්‍රවාහයන් වගුවේ අගයන්ගෙන් පෙන්නුම් කෙරේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇත

| මූල්‍ය වගකීම් | 2018 දෙසැම්බර් 31 | | | 2017 දෙසැම්බර් 31 | | |
|---|---|---|---|---|---|---|
| | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව |
| ණය ගැණුම් / රජය | 6,645,377,816 | 59,690,100,248 | 66,335,478,064 | 5,198,526,722 | 54,924,342,666 | 60,122,869,388 |
| ණය ගැණුම්/ මූල්‍ය ආයතන | 1,960,389,294 | 10,924,411,551 | 12,884,800,845 | 1,555,871,084 | 11,360,327,710 | 12,916,198,794 |
| වෙළඳ සහ වෙනත් ණය හිමියන් | 1,478,725,009 | - | 1,478,725,009 | 105,914,892,043 | - | 105,914,892,043 |
| එකතුව | 10,084,492,118.84 | 70,614,511,799 | 80,699,003,918 | 112,669,289,849 | 66,284,670,376 | 178,953,960,225 |

## 3. වෙළඳපොළ අවදානම

අධිකාරියේ ආදායමට හෝ මූල්‍ය ලියකියවිලි වල ඉදිරියට ගෙන ආ රඳවාගත් අගයට බලපෑමක් ඇතිකරනු ලබන, විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාතයන් වැනි වෙළඳපොළ මිළ වෙනස්වීමේ අවදානමක් සහිත දෑ වෙළඳපොළ අවදානම ලෙස සැලකේ.

### 3.1 මූල්‍ය අවදානම

වාර්තාකරනු ලබන කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල පාවීමට ඉඩහැරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇ.එ.ජ.ඩොලරයේ වටිනාකමේ උච්චාවචනයෙන් අධිකාරියේ මූල්‍ය අවදානම පැනනගියි. බොහෝ මුදල් ගණුදෙනු සිදුවන්නේ ශ්‍රී ලංකා රුපියල් මගින් වන අතර, මෙය සමාගමේ භාවිතා වන මුදල් ඒකකය වේ. කෙසේ නමුත්, වරායයන් පුළුල් කිරීම, සංවර්ධන ව්‍යාපෘතීන් හා නිශ්චිත බැංකු ශේෂයන් සහ නාවික නියෝජිත ලැබීම් (APL ලංකා පුද්ගලික සමාගම) වලට අදාළ පොළී සහිත ණය ගැණුම් විදේශ මුදල් ඒකක මගින් පෙන්නුම් කෙරේ. (ජපන් යෙන් සහ ඇ.එ.ජ. ඩොලර්)

ඇ.එ.ජ.ඩොලරය පාවීමේ ප්‍රතිඵලයක් ලෙස ණය ගැණුම් නැවත ගෙවීම් සහ නැව් නියෝජිතයින්ට (APL ලංකා පුද්ගලික සමාගම ආදිය) සැපයූ සේවාවන් ඉන්වොයිස්ගත කිරීම මගින් පැන නැගුණු රු.11,316,83,420.00 ක මුළු මුදල, ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්ෂය වීමෙන් 2018 වර්ෂයේ වාර්තා කරන ලද කාල සීමාව සඳහා මෙහෙයුම් ප්‍රතිඵල මත බලපෑමක් එල්ල කරන ලදී. කෙසේ නමුත්, එකම මුදල් ඒකකයක් මගින් පවත්වාගෙන යන මුදල් තැන්පතු හරහා යළි ගෙවීම් සහ ලබාගත් ණය නැවත ගෙවීම සිදුකිරීමට හා මුදල් සංචලනයේ බලපෑම අවම කිරීමට අධිකාරිය විසින් එකම මුදල් ඒකකයක් භාවිතා කරනු ලැබේ.

පොලී සහිත ණය හා විදේශ විනිමය මගින් නිරූපණයකොට ඇති ණය ගැනීම් පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 21 හා 22 බලන්න.

### 3.2 පොලී අවදානම

රාජ්‍ය සුරැකුම්පත්, බැංකු තැන්පතු සහ ස්ථාවර හා සංචරණ පොලී සහිත ණය ගැනීම් හා සම්බන්ධ වෙළඳපොළ පොලී අනුපාතයේ වෙනස්කම් අධිකාරියේ පොලී අවදානමට හේතු වේ.

රු.60,660,366,547/= (2017 : රු. 54,209,363,742/=) වන අධිකාරියේ පොලී සහිත ණය සහ ලබාගැනීම් වල පොලී වල අනුපාතයට අනුව ගණනය කෙරෙන අතර අනෙකුත් මුදල වන රු.18,559,912,362/= (2017: රු.18,829,704,439/=)හි අඩංගු පොලිය ස්ථාවර අනුපාතයට අනුව ගණනය කරනු ලැබේ.

රාජ්‍ය බැංකු සහ රජය සමග ඇති තැන්පතු ඇතුළුව මුදල් හා බැංකු ශේෂයන් අධිකාරිය සතුව ඇත. අධිකාරිය විසින් ක්‍රියාකාරි ලෙස පොලී අනුපාත චලනයන් අධීක්ෂණය තුළින් පොලී අනුපාත අවදානම අධීක්ෂණය කරනු ලබයි.

| ණය | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| **චල විනිමය අනුපාතය** | | |
| කොළඹ වරාය පුළුල් කිරීම (දකුණු වරාය) | 47,775,565,702 | 41,293,164,949 |
| පර්යන්ත ට්‍රක් රථ (මලයාසියාවේ එක්සිම් බැංකුව) | | |
| ලංකා බැංකුව - නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කිරීම | 8,933,941,975 | 8,960,970,082 |
| මහජන බැංකුව | 3,950,858,870 | 3,955,228,712 |
| **ස්ථාවර විනිමය අනුපාතය** | | |
| කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 18,559,912,362 | 18,829,704,439 |

**2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| ණය මුදලේ නම | | ණය ලබාදුන් ආයතනය | මුදල් ඒකකය | පොලී අනුපාතය | ණය මුදල (ණය ලබාදෙන මුදල් ඒකක වලින්) | ගෙවීමට ඇති ශේෂය 018.12.31 දිනට ගෙවීමට ඇති ශේෂ | ණය ගැනීමේ වියදම (රු) |
|---|---|---|---|---|---|---|---|
| JBIC | SLP-23 | JAICA | ජපන් යෙන් | 2.50% | 5,703,407,055 | 703,806,807 | |
| | SLP-27 | | ජපන් යෙන් | 2.50% | 10,432,338,189 | 2,145,615,895 | |
| | SLP-30 | | ජපන් යෙන් | 2.60% | 19,962,268,331 | 5,747,909,062 | |
| | SLP-33 | | ජපන් යෙන් | 2.60% | 6,828,220,432 | 2,808,713,965 | |
| | SLP-41 | | ජපන් යෙන් | 2.60% | 4,878,185,478 | 2,407,897,002 | |
| | SLP-46 | | ජපන් යෙන් | 2.60% | 2,644,187,565 | 2,501,573,645 | |
| | SLP-67 i | | ජපන් යෙන් | 1.80% | 1,354,512,318 | 1,416,457,620 | |
| | SLP-67 ii | | ජපන් යෙන් | 0.75% | 217,445,997 | - | |
| | SLP-85 | | ජපන් යෙන් | 0.30% | 14,495,000,000 | 679,476,457 | |
| ආසියානු සංවර්ධන බැංකුව -2319 | | ආසියානු සංවර්ධන බැංකුව | ඇ. එ. ජ. ඩොලර් | Libor+0.6% | 300,000,000 | 47,366,459,644 | |
| සූරියවැව ක්‍රීඩාංගනය ඉදිකිරීම | | මහජන බැංකුව | ශ්‍රීලරුපියල් | AWPLR+2.5% | 3,950,858,870 | 3,950,858,870 | |
| නැගෙනහිර බහළු පර්යන්තය | | ලංකා බැංකුව | ඇ. එ. ජ. ඩොලර් | මාස 6 ක Libor+4.25% | 80,000,000 | 8,933,941,975 | |
| | | | | එකතුව | | **78,662,710,942** | - |
| | | | උපචිත පොලිය | | | 557,567,967 | |
| | | | | | | **79,220,278,909** | |
| | | | සටහන 24 | ණය ලබා ගැනීම් -ශ්‍රී ලංකා රජයෙන් | | 66,335,478,064 | |
| | | | සටහන 25 | ණය ලබා ගැනීම් -මූල්‍ය ආයතනයන්ගෙන් | | 12,884,800,845 | |
| | | | | | | **79,220,278,909** | |

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා






දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා



පීඕඑස්/ඒ/එස්එල්පීඒ/1/2018/3 2019 මැයි 31 දින

**සභාපති,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය වියාචනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(2) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයන් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

**1.2 මතය වියාචනය සඳහා පදනම**

(අ) හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබූ විදේශ ණය වලින් 2017 නොවැම්බර් 30 දින අධිකාරියේ ගිණුම් වල ඉතිරිව පැවති රුපියල් මිලියන 147,746 ක ණය ශේෂය මහා භාණ්ඩාගාරයේ එකඟතාවකින් හෝ කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබූ අතර ඒ හේතුවෙන් රජයේ කිසිදු ගිණුමක එම ණය මුදල් ඇතුලත්ව නොතිබුණි. මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට මෙම ණය ශේෂය රුපියල් මිලියන 179,546 ක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද මෙම ණය ගිණුම්ගත කිරීම පිළිබඳව දෙපාර්ශ්වය අතර එකඟතාවයකට එළඹ නොතිබුණි.

ඉහත ණය මුදලට අදාළව 2017 නොවැම්බර් 30 දක්වා කාලයට ගණනය කරන ලද විදේශ විනිමය පරිවර්තන අලාභය රුපියල් මිලියන 31,544 ක්ද අධිකාරියේ ගිණුම්වලින් වෙන් කර තිබූ අතර 2017 නොවැම්බර් 30 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා විදේශ විනිමය සමුච්චිත අලාභය වූ රුපියල් මිලියන 28,396 ක් කිසිදු ගිණුමක ඇතුළත් කර නොතිබුණි. මේ අනුව මෙම ණය මුදල සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දිනට සමුච්චිත විදේශ විනිමය පරිවර්තන අලාභය රුපියල් මිලියන 59,940 ක් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 20 වන ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී සියළුම මූල්‍ය නොවන අයිතම බදු පෙර ලාභයට ගැලපිය යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ මුදල් ප්‍රවාහය සකස් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වල පරිපාලන වියදම් යටතේ දක්වා තිබූ රුපියල් 113,638,189 ක් වූ බොල් ණය හා අඩමාන ණය වෙන් කිරීම ගලපා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදය අනුව ස්ථාවර වත්කම් වල ඵලදායී ජීවකාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කර වෙනසක් සිදු වන්නේ නම් එම වෙනස ශ්‍රී ලංකා

ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ගිණුම් වලට ගැලපුම් කළ යුතු වුවත් අධිකාරිය සතු 2018 දෙසැම්බර් 31 දින ශුද්ධ අගය රුපියල් මිලියන 86,019 ක් වූ වත්කම් වර්ග 6 ක් සමාලෝචනයට භාජනය කර නොතිබුණි.

(ඇ) හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය වෙනුවෙන් අධිකාරිය 2017 වර්ෂයේදී ගෙවන ලද රුපියල් මිලියන 5,056 ක් ඇතුළුව 2018 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලිනය 5,149.9 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණ ද විගණිත දි තෙක් එම මුදල් අධිකාරිය වෙත ලැබී නොතිබුණි.

(ඉ) 2017 නොවැම්බර් සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් පුද්ගලික බැංකුවකින් ලබාගෙන තිබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 24 ක් වූ ණය මුදල එම සමාගම විසින් පියවා නොතිබූ අතර මෙම වාර්තාවේ දින වන විට ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් මුදල් නොපැවතුණි. කෙසේ වුවද ණය මුදල සඳහා ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට විරුද්ධව හිඟ ණය ශේෂය වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 22.3 ක් අයකර ගැනීම සඳහා නඩු පවරන බවට අදාළ බැංකුව විසින් එන්තරවාසියක් 2019 අප්‍රේල් 02 දින අධිකාරිය වෙත යොමු කර තිබුණි. තවද අධිකාරිය විසින් මේ සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන් කිරීමක්ද කර නොතිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයනගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩව පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටස් විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවඉකුත් වර්ෂය මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව නැත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිනවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | **නීති, නීතිරීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව** | **විස්තරය** |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරණ මුදල් පනත 11 වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් ස්ථාවර සහ කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය කරන ලද රුපියල් මිලියන 35,935 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබී නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරණ මුදල් පනත 10 (5) වගන්තිය | රාජ්‍ය සංස්ථාවක යම් වර්ෂයක අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එසේ වුවද 2016 සිට 2018 දක්වා වර්ෂවලදී අධිකාරිය ලබා තිබූ එකතුව රුපියල් මිලියන 18,607.12 ක් වූ ශුද්ධ ලාභ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද ඉහත ලාභ තුළ දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික අංශය වෙත ලබාදී ඇති දකුණු ආසියාතික පිවිසුම් පර්යන්තය (SAGT) හා කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT) යන පර්යන්තවල මෙහෙයුම් කටයුතු වල නිරතව සිටින සමාගම් දෙකෙන් |

| | | |
|---|---|---|
| | | අධිකාරිය විසින් 2016 සිට 2018 දක්වා අයකර තිබූ එකතුව රුපියල් මිලියන 5,989 ක් වූ බදු කුලී හා එම කාලය සඳහා රාජ්‍ය භාගය ලෙස අයකරගත් එකතුව රුපියල් මිලියන 7,617 ක් ද ඇතුලත් වී තිබුණි. මෙම ආදායම් වරාය සෘජු මෙහෙයුම් ආදායම් නොවන බව නිරීක්ෂණය විය. |
| (ඈ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 හා 3.1 වගන්ති | නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කර ගත් පරිදි චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මාසික ඉන්ධන දීමනා ලෙස නිලධාරීන් 135 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී පමණක් ඉන්ධන ලීටර් 10,764 ක් ලබාදී තිබුණි. |
| (ඉ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/03/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයන විට ගෙවීම් බදු, පුද්ගලික වැටුපෙන් අඩු කර ගෙවිය යුතු වුවද අධිකාරියේ අරමුදල්වලින් ගෙවා තිබුණි. 2018 වර්ෂය සඳහා එසේ ගෙවන ලද රුපියල් මිලියන 479 ක් ද ඇතුලුව 2011/2012 තක්සේරු වර්ෂයේ සිට 2018 දෙසැම්බර් මාසය දක්වා එකතුව රුපියල් මිලියන 2,841 ක උපයන විට ගෙවීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අධිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි. |
| (උ) | 2011 මාර්තු 07 වන දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති 2015 ජූලි 06 දිනැති අංක එස්ඊසී/2015/05 දරණ චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් වෙත ප්‍රසාද මුදල් ගෙවීමේදී ඒ මත උපයන විට බදු අඩු කල යුතු නමුත් එම බදු නිලධාරීන්ගෙන් අය කිරීමකින් තොරව අධිකාරියේ අරමුදල් වලින් ගෙවා තිබුණි. |
| (ඌ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | අධිකාරිය සතු පිරිවැය රුපියල් මිලියන 452 ක් වූ පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (එ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (1) හා (3) වගන්තිය, 2009 ඔක්තෝබර් 01 දිනැති අංක ඩීඑම්ඒ/2009 (3) දරණ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ | අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය ආරක්ෂාවීම පිණිස අභ්‍යන්තර විගණන වාර්තා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු වුවත් අධිකාරියේ අභ්‍යන්තර විගණන වාර්තා එක් එක් අංශ ප්‍රධානීන් වෙත නිකුත් කර තිබුණි. |

| | | |
|---|---|---|
| | අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් අංක 1110.A1 | |
| (ක) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛණයෙහි, 9.3.1 වගන්තිය | අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය 2019 අප්‍රේල් 30 දින දක්වාම අනුමත කරගෙන නොතිබුණි. |
| (ඛ) | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරණ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 2018 වර්ෂයේදී අධිකාරියේ නිලධාරීන් 560 දෙනෙකුට මාසිකව රු. 17,700 සිට රු. 31,150 බැගින් වැටුප් වැඩිකර තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

අධි ආරක්ෂිත කලාපයක් ලෙස නම් කර තිබෙන වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කර ගැනීම පිණිස 2017 වර්ෂයේ ප්‍රාග්ධන අයවැය තුළින් සියළු ගේට්ටු සහ බන්ධිත ගුදම් සඳහා රුපියල් මිලියන 60 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවි කිරීමට සැලසුම් කර තිබුණු අතර 2018 වර්ෂයේදී ඒ සඳහා රුපියල් මිලියන 150 ක්ද වෙන්කර තිබුණද අපේක්ෂිත පරිදි අදාළ කාර්යය සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් ආරක්ෂාව පිළිබඳ ගැටළුවකදී අවශ්‍ය තොරතුරු ලබාගැනීමට නොහැකි වීමේ අවධානම බැහැර කළ නොහැකි විය.

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) සේවා සැපයීමෙන් පසු ණය කාලසීමාව (Credit Period) අවසන් වීමට පෙර පියවීම් කල යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට පැවති නැව් නියෝජිත ණයගැති ශේෂයෙන් දින 30 ක් වූ ණය කාලසීමාව ඉක්මවූ මුළු නැව් නියෝජිත ණයගැති ශේෂය රු. 793,273,839 ක් විය. එය මුළු නැව් නියෝජිත ණයගැති ශේෂයෙන් සියයට 28 ක් විය.

(ආ) අධිකාරිය සතු කොළඹ වරායේ පිහිටි මෙට්‍රික් ටොන් 6,400 ක ධාරිතාවයකින් යුත් පැරණි තෙල් ටැංකි 10 ක් 2015 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුනි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයට අමතරව සේවකයින් 1782 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. තවද අධිකාරියේ මෙහෙයුම් කටයුතු (Operations)සඳහා සෘජුවම සම්බනධතාවයක් දක්වන අංශයන්හි සේවකයන් 384 දෙනෙකු පුරප්පාඩුව පැවතුණි. එසේම අධිකාරියේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සෘජුවම සම්බන්ධතාවයක් නොදක්වන අංශ 15 ක සේවකයන් 574 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. කෙසේ වුවද, 2018 වර්ෂය තුළදී සේවක අතිරික්තව පැවති අංශ වල සේවකයින් වෙනුවෙන් එකතුව රුපියල් මිලියන 971 ක අතිකාල දීමනා ඇතුළු රුපියල් මිලියන 4,688 ක් සේවකයන් වෙත අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඈ) හම්බන්තොට වරාය පරිශ්‍රයේ ගොඩ ගසා ඇති අධිකාරියට අයත් කැටගල් (Crushed Aggregate) ඝණ මීටර් 100,000 ක් ද කළුගල් කුඩු (Quarry Dust) ඝණ මීටර් 90,000 ක් ද හම්බන්තොට වරාය ඉදිකිරීමට සම්බන්ධ වූ චීන කොන්ත්‍රාත්කරුගේ දේශීය නියෝජිතයා වෙත නොමිලේ ලබාදීමට අවසර ලබාදී තිබුණි. ඉහත ද්‍රව්‍යවල පූර්ව අලෙවි මිල පදනම් කරගෙන

වටිනාකම ගණනය කල විට අධිකාරියට දළ වශයෙන් රු. 26,479,581 ක පාඩුවක් සිදු වන බව නිරීක්ෂණය විය. ඉහත පරිදි නොමිලේ කළුගල් ලබාදීම සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) කොළඹ වරායේ දැනට බහාළුම් හැසිරවීම සඳහා ක්‍රියාත්මක පර්යන්ත අතුරින් ගැඹුර (Draft) මීටර් 14.25 ට වඩා වැඩි නැව් පැමිණිය හැකි එකම පර්යන්තය, කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තය (CICT) පමණක් වන අතර එහි ධාරිතාවය වසරකට විසිසම ඒකක මිලියන 2.4 ක් වේ. 2018 වර්ෂයේ දී එම පර්යන්තය වෙත ගැඹුර මීටර් 14.25 ට වැඩි නැව් 308 ක් පැමිණ තිබූ අතර මුළු බහාළුම් ඒකක මිලියන 2.6 කට වැඩි සංඛ්‍යාවක් මෙහෙයවා තිබුණි. එය උපරිම ධාරිතාවයද අභිබවා ගිය තත්ත්වයක් බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2017 වර්ෂයට සාපේක්ෂව එම පර්යන්තයේ බහාළුම් හැසිරවීම සියයට 12 ක වර්ධනයක් සිදුව තිබූ අතර ඉදිරියේදීද පර්යන්ත සේවා ඉල්ලුමේ වර්ධනයක් පැවතියහොත් කොළඹ වරාය පර්යන්ත සේවා සැපයීමේ ගැටළුවකට මුහුණ දෙන බව නිරීක්ෂණය විය.

කෙසේ වුවද කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර එළැඹී ණය ගිවිසුමෙන් අරමුදල් සම්පාදිතව බහාළුම් ඒකක 800,000 ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම් පිරිවැය රුපියල් මිලියන 11,168 ක් වූ මීටර් 18 ක ගැඹුරැති හා මීටර් 440 ක් දිගැති නැගෙනහිර බහාළුම් පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් කර තිබුණද නැව් බඩු මෙහෙයවීම සඳහා අවශ්‍ය ග්‍රැන්ට් දොඹකර ඇතුළු උපකරණ සපයා ගෙන මෙම පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට 2019 අප්‍රේල් 30 දින දක්වාද අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඊ) 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුව දැනුවත් කිරීමකින් තොරව ආනයනය කරන ලද දොඹකර 27 ක් සම්බන්ධයෙන් රේගුව විසින් පනවා තිබූ රුපියල් මිලියන 1,580 ක් වූ රේගු දණ්ඩනය ලිහිල් කර ගැනීම සඳහා රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව රේගු විමර්ශනයක තීන්දුවක් මත මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් සිදු කල හැකි වුවද, අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් ගිණුම්වල රුපියල් මිලියන 1,577.7 ක අසම්භාව්‍ය බැරකම් වෙන්කර තිබුණි. ඉහත කරුණ සම්බන්ධයෙන් අධිකාරිය අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව නිශ්ප්‍රභා කොට තිබූ අතර ඉන් පසු අභියාචනාධිකරණයේ නියෝගයට එරෙහිව අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබුණි.

(උ) අංක PE/PS/JCTL/GEN/2018 හා 2018 අප්‍රේල් 24 දිනැති අධිකාරියේ සභාපතිතුමා වෙත පිටපතක් සහිතව වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය අමතන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය අනුව අධිකාරියට පූර්ණ අයිතියක් ඇති ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමෙන් 2017 වර්ෂය දක්වා ලාභාංශ ලෙස රුපියල් 56,299,347 ක් ලබාගෙන අධිකාරිය හරහා මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලෙස ඉල්ලා සිටියද මෙතෙක් අදාළ ප්‍රේෂණය කිරීම සිදු කර නොතිබුණි.

(ඌ) 2018 සැප්තැම්බර් 04 දිනැති අංක PE/EN/REV/REQ/2018 දරණ ලිපිය මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව රාජ්‍ය ව්‍යවසායන්ගේ ලාභාංශ දායකත්වය ලෙස රුපියල් මිලියන 350 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට ලබාදෙන ලෙස අධිකාරිය වෙත දන්වා තිබුණද එම මුදල ප්‍රේෂණය කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.



**ඩබ්ලිව් පී සී වික්‍රමරත්න**
**විගණකාධිපති**

**නම**

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**ව්‍යවස්ථානුකූල කාර්ය තත්ත්වය**

1979 අංක 51 දරණ පාර්ලිමේන්තු පනතේ ප්‍රතිපාදන යටතේ කොළඹ වරාය කොමිසම, වරාය(නැව්බඩු) සංස්ථාව, වරාය සැසඳුම් හා ආරක්‍ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට 1979 අගෝස්තු 1 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ථාපනය කරන ලදී.

**අපගේ ආයතනික අගය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වූ කලී ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ප්‍රධාන දායකත්වය සපයන ආයතනයන්ගෙන් එකකි. ආදායම් උත්පාදනය කරන සහ සේවා සපයන ප්‍රමුඛ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය එමගින් සපයන සේවාවන්ගේ විශිෂ්ටත්වය සමඟ ඍජුවම බැඳී පවතී. මේ සම්බන්ධයෙන් ගත් කල අධිකාරියේ ඇගයීම් රටාව පරදුභාරකරුවන් සමඟ එහි ඇති මෙහෙයුම් සබඳතාවයේ සාර්ථකත්වයට පදනම වේ. මෙම අගයයන්/ වටිනාකම් පහත පරිදි වර්ග කල හැක.

- විශ්වාසය තැබිය හැකි බව
- කාලානුරූපී බව සහ නිවැරදි බව
- අත්කරගත් ජයග්‍රහණ සඳහා වගවීම
- කණ්ඩායම් හැඟීම
- කැපවීම
- ඵලදායීබව සහ පිළිගැනීම
- ඍජුව කටයුතු කිරීම

ඉහත සඳහන් වටිනාකම්/අගයයන් අධිකාරියේ සෑම මට්ටමකම ප්‍රගුණ කරවීම සභාපති/විධායක නිලධාරී, කළමනාකාර අධ්‍යක්‍ෂ සහ අනෙකුත් ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලයේ වගකීම වනු ඇත.

**ප්‍රධාන කාර්යාලය**
**කොළඹ වරාය**

අංක 19, චෛත්‍ය පාර
කොළඹ – 01
දුරකථන: (+94 11) 2421201, 2421231
ෆැක්ස්: (+94 11) 2440651

**ගාලු වරාය**

ක්ලෝසන්බර්ග් ජැටිය
මාගාල්ල
ගාල්ල
දුරකථන: (+94 91) 2232213, 2234936

**ත්‍රිකුණාමලය වරාය**

නව ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල
චීන වරාය
ත්‍රිකුණාමලය
දුරකථන: (+94 26) 2222460

**බැංකුකරුවන්**

ලංකා බැංකුව (ප්‍රධාන බැංකුව)
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

**විගණනකරුවන්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක. 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

**වෙබ් අඩවිය**

www.slpa.lk